

අවස්ථාව සමඟ පුළුල්වීම

වාර්ෂික වාර්තාව 2021

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව
பிரதேச அபிவிருத்தி வங்கி
Regional Development Bank



අවස්ථාව සමඟ පුළුල්වීම

වසංගතය අතරතුර සමාජ හා ආර්ථික පද්ධතිය අභියෝගවලට මුහුණ දීම හේතුවෙන් බොහෝ දෙනෙකුගේ අනාගතය අවිනිශ්චිත බවක් පෙනෙන්නට තිබුණි මෙම අවිනිශ්චිත කාලය තුළ දැඩි ලෙස පීඩාවට පත් වූ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට සහ ක්ෂුද්‍ර සහ කාන්තා ව්‍යවසායකයින්ට සහාය වීම අත්‍යවශ්‍ය වූ බැවින් ද්‍රවශීලතා සීමාවන් තුල සිට, අපි අරමුදල් සැපැයුවෙමු. රට වසා දැමීම ඩිජිටල් ප්‍රසාරණය සඳහා අවස්ථාවක් කරගත් අප ඩිජිටල් විසඳුම් කිහිපයක් කඩිනම් කළ අතර ඒ මගින් පාරිභෝගිකයින්ට ඉක්මන් කාලීන සේවාවන් වෙත ප්‍රවේශ වීමට හැකි විය.

අනාගතය සඳහා වන අපගේ මාර්ග සිතියම දැන් හඳුනාගත් අවස්ථාවන් සමඟ සම්පූර්ණ වී ඇති අතර ඒහි තනි පාරිභෝගිකයින්ට සහ ව්‍යාපාරවලට සහයෝගය ලබා දීමේ කේන්ද්‍රීය ස්ථානය ඩිජිටල්කරණයයි. එපමණක් නොව, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සහ කාන්තා ව්‍යවසායකයින් ඇතුළු අපගේ කලාපීය ගනුදෙනුකරුවන්ට සමෘද්ධිය සහ සාර්ථකත්වයේ අවස්ථා කරා ළඟා වීමට හැකි වන පරිදි පරිමාණ මෙහෙයුම් වලදී අපගේ අඛණ්ඩ සහයෝගය තහවුරු කර ඇත.

මූල්‍ය සමෘද්ධිය සලසන අතරම අවස්ථා හරහා පුළුල් කිරීම සහ මෙම ප්‍රජාවන් අතර සමෘද්ධිය ඇති කිරීම මඟින් අපගේ ග්‍රාමීය අනුග්‍රාහකයින්ට සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ට අරමුණක් ලබා දීමටත් අප කැපවී සිටිමු.

අන්තර්ගතය

දැක්ම

"ජාතියේ විශ්වාසනීය සංවර්ධන මූල්‍ය හවුල්කරුවා වීම"

මෙහෙවර

"අන්තර්ගත සංවර්ධනය ප්‍රවර්ධනය කරන අතරම ව්‍යවසායන් සහ ව්‍යවසායකයින්ට මූල්‍ය හා අනුබද්ධ සේවාවන් සැපයීම"

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව ගැන

ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ (RDB) මූලාරම්භය, මෙරට ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු කාණ්ඩය යටතේ දිස්ත්‍රික් මට්ටමේ බැංකු පිහිටුවන ලද 1985 වර්ෂය දක්වා දිව යයි.

1997 දී එවැනි ප්‍රාදේශීය ග්‍රාම සංවර්ධන බැංකු 17ක් රජරට, රුහුණු, වයඹ, උඩ, කඳුරට සහ සබරගමුව සංවර්ධන බැංකු ලෙස පළාත් මට්ටමේ බැංකු හයකට ඒකාබද්ධ කරන ලදී. මෙම පළාත් බැංකු හය 2010 මැයි මාසයේදී ජාතික මට්ටමේ සංවර්ධන බැංකුවක් ලෙස තවදුරටත් ඒකාබද්ධ කර ප්‍රාදේශීය සංවර්ධන බැංකුව ලෙස නම් කරන ලදී. ප්‍රාදේශීය සංවර්ධන බැංකුව 2008 අංක 41 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත යටතේ පූර්ණ රාජ්‍ය හිමිකාරත්වය යටතේ පවතින ජාතික මට්ටමේ බැංකුවක් ලෙස ස්ථාපිත කරන ලද්දේ ග්‍රාමීය ආර්ථිකය නගා සිටුවීම උදෙසා ග්‍රාමීය ජනතාවට ප්‍රවේශ විය හැකි සහ දැරිය හැකි මූල්‍ය සේවා ලබා දෙමින් ඔවුන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමේ දිගුකාලීන අරමුණ ඇතිවය.

මුල සිටම "පාවහන් රහිත" නොහොත් බිම් මට්ටමේ බැංකු කරන සංකල්පය මත පදනම් වූ අප බැංකුවේ ආර්ථික පිරමීඩයේ මැද හා පතුලෙහි ස්ථානගතව සිටින පුද්ගලයන් වෙත නවෝත්පාදනාත්මක සරල හා සපලදායී මූල්‍ය උපකරණ (ප්‍රධාන වශයෙන් තැන්පතු සහ ණය) ලබාදීමට නිරතුරුව කැපවී සිටී. එමෙන්ම මෙරට ආර්ථික සංවර්ධනය කෙරෙහි දායකත්වයක් සැපයීමට හැකි ක්ෂුද්‍ර කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්තවල නිරත වී සිටින පාරිභෝගිකයන්, කාන්තා ව්‍යවසායිකාවන් සහ කෘෂිකර්මාන්තය, සත්ව පාලනය, ධීවර හා අනෙකුත් කර්මාන්තවල නියැලී සිටින්නන් සවිබල ගැන්වීම සම්බන්ධයෙන් බැංකුව දැඩි උනන්දුවකින් කටයුතු කරයි. ඉතුරුම් හා ස්ථාවර තැන්පතු සඳහා ඉහළ ප්‍රතිලාභ ලබා දෙන අතරම පාසල් සිසුන් හා බාල වයස්කරුවන් මුදල් ඉතිරි කිරීමට දිරිගන්වමින් ග්‍රාමීය ජනතාව අතර ඉතිරි කිරීමේ පුරුද්ද ප්‍රචලිත කිරීම සඳහාද බැංකුව පියවර ගෙන තිබේ.

අද වන විට ශාඛා 272 කින් සහ ස්ථිර කාර්ය මණ්ඩල සාමාජිකයන් 2600 කට අධික පිරිසක් වෙතින් නිරන්තර සේවා ලබන මිලියන හයකට අධික ගනුදෙනුකාර භවතුන් සංඛ්‍යාවක් සහිත ප්‍රාදේශීය සංවර්ධන බැංකුව අප රටෙහි සමාජ ආර්ථික යහ පැවැත්ම සාක්ෂාත් කර ගැනීමට දායක වන ව්‍යවසායකයන් පෝෂණය කිරීමේ දැක්ම සඵල කර ගැනීමට අවශ්‍ය සියලු පහසුකම් වලින් සමන්විත වේ.

අපි ගැන

4 අපගේ ගමන්මග / සන්ධිස්ථාන
6 විශේෂ මූල්‍ය අවස්ථා
8 සභාපතිතුමාගේ පණිවිඩය
12 සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී සමාලෝචනය

භාරකාරත්වය

18 අධ්‍යක්ෂ මණ්ඩලය
24 ආයතනික කළමනාකරණ කණ්ඩායම
26 ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරී/ජ්‍යෙෂ්ඨ සහකාර සාමාන්‍යාධිකාරී
28 සහකාර සාමාන්‍යාධිකාරී/අංශ ප්‍රධානීන්

කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණය

34 මූල්‍ය සමාලෝචනය
37 පාරිභෝගික සහ සම්බන්ධතා සමාලෝචනය
40 තොරතුරු තාක්ෂණ සමාලෝචනය
42 අලෙවිකරණ සමාලෝචනය
50 සමාජය සහ පාරිසරික සමාලෝචනය
51 සේවක සමාලෝචනය
53 විශේෂ සිදුවීම්
58 අවදානම් කළමනාකරණය

ඒකාබද්ධ පාලනය

68 ආයතනික පාලනය පිළිබඳ විගණකාධිපතිගේ වාර්තාව
69 ආයතනික පාලනය
93 අධ්‍යක්ෂ මණ්ඩල සහ අධ්‍යක්ෂ මණ්ඩල උප කමිටුවල සහභාගිත්වය
94 අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව
99 අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සහ වේතන කමිටුව (BHRRC), අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටු (BNC) වාර්තාව
101 අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කමිටු (BICTC) වාර්තාව
102 අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු (BAC) වාර්තාව
104 අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව
107 ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන මූල්‍ය නිලධාරීගේ වගකීම් ප්‍රකාශය
108 අභ්‍යන්තර පාලන ක්‍රියාවලිය පිළිබඳ විගණකාධිපති වාර්තාව
110 මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් වූ අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය
111 මූල්‍ය වාර්තාකරණයෙහි අධ්‍යක්ෂවරුන්ගේ වගකීම

මූල්‍ය වාර්තාව

114 විගණකාධිපති වාර්තාව
119 ආදායම් ප්‍රකාශනය
120 විස්තීරණ ආදායම් ප්‍රකාශනය
121 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය
122 මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය
124 ස්කන්ධය වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශනය
125 මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

අතිරේක තොරතුරු

208 තුන් අවුරුදු සාරාංශය
209 ආයෝජක තොරතුරු
210 ශාඛාවල භූගෝලීය ව්‍යාප්තිය
අභ්‍යන්තර පිටුපස කවරය - ආයතනික තොරතුරු

අපගේ ගමන්මග / සන්ධිස්ථාන

මුළු වත්කම් වර්ධනය

500%

රුපියල් බිලියන 41 සිට
රුපියල් බිලියන 246 දක්වා.

මුළු තැන්පතු වර්ධනය

488%

රුපියල් බිලියන 32 සිට
රුපියල් බිලියන 188 දක්වා

සම්පූර්ණ ණය සහ අත්තිකාරම් වර්ධනය

530%

රුපියල් බිලියන 30 සිට
රුපියල් බිලියන 189 දක්වා

මෙහෙයුම් ලාභ වර්ධනය

419%

රුපියල් මිලියන 37 සිට
රුපියල් මිලියන 1,927 දක්වා

සමස්ථ කොටස් වර්ධනය

413%

රුපියල් බිලියන 3 සිට
රුපියල් බිලියන 15.4 දක්වා

ජාතික මට්ටමේ සංවර්ධන බැංකුවක් ලෙස පළාත් සංවර්ධන බැංකු හයක් ඒකාබද්ධ කිරීමෙන් පසු සාර්ථක ගමන

1985 සිට 2009 දක්වා වසර විසි හතරක කාලය තුළ පළාත් සංවර්ධන බැංකු (එනම් රජරට, රුහුණු, වයඹ, කඳුරට, ඌව සහ සබරගමුව සංවර්ධන බැංකු) අත්පත් කරගත් ප්‍රතිඵල, 2010 දී පෙර පැවති සියලුම පළාත් සංවර්ධන බැංකු ඒකාබද්ධ කරමින් ප්‍රාදේශීය සංවර්ධන බැංකුව (RDB) පිහිටුවීමෙන් පසු එකොළොස් වසරක් වැනි කාලයක් තුළ (2010-2021) විශාල ලෙස දියුණු වී ඇත.

2010 මැයි සිට 2021 දෙසැම්බර් දක්වා

- ප්‍රාදේශීය සංවර්ධන බැංකුවෙහි මුළු තැන්පතු ප්‍රමාණය රුපියල් මිලියන 32,350 සිට රුපියල් මිලියන 187,752 දක්වා රුපියල් බිලියන 156කින් වැඩි වී ඇත.
- ප්‍රාදේශීය සංවර්ධන බැංකුවෙහි මුළු ණය සහ අත්තිකාරම් රුපියල් මිලියන 30,311 සිට රුපියල් මිලියන 189,040 දක්වා රුපියල් බිලියන 159 කින් වැඩි වී ඇත.
- ප්‍රාදේශීය සංවර්ධන බැංකුවෙහි මුළු වත්කම් රුපියල් මිලියන 41,018 සිට රුපියල් මිලියන 245,890 දක්වා රුපියල් බිලියන 205 කින් වැඩි වී ඇත.

ප්‍රාදේශීය සංවර්ධන බැංකුවෙහි ඉතිහාසය

1985 ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු 17ක් ස්ථාපිත කිරීම.

1997 පළාත් සංවර්ධන බැංකු හයක් පිහිටුවන ලදී

2010 ප්‍රාදේශීය සංවර්ධන බැංකුව ලෙස එක් ජාතික මට්ටමේ ආයතනයක් පිහිටුවන ලදී

2018 සීමාසහිත ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව අත්පත් කර ගන්නා ලදී.

ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ මූලාරම්භය, 1985 අංක 15 දරන ප්‍රාදේශීය ග්‍රාමය සංවර්ධන බැංකු පනතේ ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු කාණ්ඩය යටතේ දිස්ත්‍රික් මට්ටමේ බැංකුව ස්ථාපිත කළ 1985 වසර දක්වා ඈතට දිව යයි. ඉන් අනතුරුව 1997 වසරේදී 1997 අංක 6 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත යටතේ ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු දාහතක් රජරට, රුහුණු, වයඹ, කඳු රට, ඌව සහ සබරගමුව සංවර්ධන බැංකු ලෙස පළාත් මට්ටමේ සංවර්ධන බැංකු හයක් ලෙස ඒකාබද්ධ කරන ලදී. 2008 අංක 41 දරණ ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත හඳුන්වාදීමත් සමගින් ඉහත කී පළාත් මට්ටමේ බැංකු හය 2010 මැයි මස පළමු දින ප්‍රාදේශීය සංවර්ධන බැංකුව ලෙස ඒකාබද්ධ කර රජයේ හිමිකාරත්වය යටතේ පවතින ජාතික මට්ටමේ බැංකුවක් වශයෙන් පිහිටුවන ලදී.

2016 වර්ෂයේ රාජ්‍ය අයවැය යෝජනාවලට අනුව, ශ්‍රී ලංකාවේ සමාජ-ආර්ථික සමෘද්ධිය වඩාත් ඵලදායී ලෙස ඉහළ නැංවීම සඳහා සීමාසහිත ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව ප්‍රාදේශීය සංවර්ධන බැංකුව විසින් අත්පත් කර ගෙන තිබුණි.

ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ අරමුණ වන්නේ ක්ෂුද්‍ර මූල්‍ය ආයතන සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් වෙත මූල්‍ය සහාය ලබාදීම තුළින් කෘෂිකර්මාන්තය, කර්මාන්ත, වෙළඳ කටයුතු, වාණිජ්‍යය, සත්ව පාලනය, ධීවර කර්මාන්තය වැනි සංවර්ධන ක්‍රියාදාමයන් ප්‍රවර්ධනය කිරීම හා කාන්තාවන් සවි බල ගැන්වීම ඔස්සේ රටේ සමස්ථ ආර්ථික සංවර්ධනයට සහය දැක්වීමයි.

වැදගත් මූල්‍ය තොරතුරු

- සංවර්ධන බැංකුකරණය උදෙසාම කැපවූ මූල්‍ය ආයතනයක් වශයෙන් ප්‍රාදේශීය සංවර්ධන බැංකුව මෙරට සමාජ හා ආර්ථික කටයුතු නගා සිටුවීම සඳහා නිරතුරුව ප්‍රමුඛ භූමිකාවක නිරත වී සිටී. මූල්‍ය සේවා සම්පාදකයකු වශයෙන් ප්‍රමුඛ භූමිකාවක නිරත වෙමින් දිවයිනේ සංවර්ධන කටයුතු සියල්ලම ආශ්‍රිතව පෙරමුණේම රැඳී සිටීමට අප බැංකුවට හැකි වී ඇත. අප සතු ප්‍රධානතම වත්කම වන්නේ උතුරු සහ නැගෙනහිර පළාත ඇතුළුව මේ රට පුරාම විසිරී සිටින මිලියන හයක් පමණ වූ පාරිභෝගික පදනමයි. අප බැංකුවේ ප්‍රධාන ඉලක්කය වන්නේ ද අප රට සහ එහි ජනතාව සංවර්ධනය කිරීමයි. එම නිසා, ඔවුන් සවිබල ගැන්වීම තුළින් අපගේ දීප ව්‍යාප්ත 272ක ශාඛා ජාලය හරහා ජාතිය සංවර්ධනය කිරීම වෙනුවෙන් අපි ඇප කැප වී සිටින්නෙමු
- 2020 වසරට සාපේක්ෂව බැංකුවේ මුළු ආදායම 0.57% කින් ඉහළ ගොස් ඇති අතර, මෙහෙයුම් ලාභය රුපියල් මිලියන 1,927 දක්වා අඩු විය. එය 2020 දී වාර්තා වූ රුපියල් මිලියන 2,061ක මෙහෙයුම් ලාභයට වඩා 6.5%ක අඩු වීමකි. බදු වලට පෙර වත්කම් මත ප්‍රතිලාභ (ROA) 0.78% ලෙස වාර්තා වී ඇති අතර එය 2020 දී 1.09%ක් ව පැවතිනි.

අපගේ පාරිභෝගිකයින් සඳහා වූ උපකාරක සේවා

WESTERN UNION WU
moving money for better

- NDB සමග වෙස්ටර්න් යූනියන් - වෙස්ටර්න් යූනියන් හරහා මුදල් හුවමාරුව ඕනෑම විදෙස් රටක සිට අප රට වෙත පූර්ණ සුරක්ෂිතභාවයක් සහිතව මුදල් චිවීමට ඇති වඩා පහසු හා කඩිනම් ක්‍රමවේදයක් වන අතර ග්‍රාමීය හා අර්ධනාගරික ප්‍රදේශවල ව්‍යාප්තව පවතින ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ ඕනම ශාඛාවක් වෙතින් එම මුදල් ලබා ගැනීමේ අවස්ථාව ගනුදෙනුකරුවන්ට හිමිවේ.

LANKA MONEY TRANSFER

- DFCC සමග ලංකා මනි ට්‍රාන්ස්ෆර් (LMT) - ලංකා මනි ට්‍රාන්ස්ෆර් සේවාව මගින් කිසිදු සේවා බිඳවැටීම් කාලයකින් තොරව ගනුදෙනුකරුවන්ගේ බැංකු ගිණුම් වෙත කඩිනමින් මුදල් යැවීමට හැක.ලංකා මනි ට්‍රාන්ස්ෆර් සේවාව ස්ථාන 275කට අධික ප්‍රමාණයක් ආවරණය කෙරෙන පුළුල් ජාත්‍යන්තර ජාලයක් සමග එක්ව ක්‍රියාත්මක වන අතර දිවයින පුරා පිහිටි ප්‍රාදේශීය සංවර්ධන බැංකු ශාඛා 272 වෙතින් මෙම සේවාව ලබාගත හැක.

- උපයෝගිතා සේවා බිල්පත් ගෙවීම් සේවාව ශ්‍රී ලංකා ටෙලිකොම්, ලංකා විදුලි බල මණ්ඩලය හා ජාතික ජල සම්පාදන හා ජල ප්‍රවාහන මණ්ඩලය සමඟ එක්ව මෙම සේවාව ක්‍රියාත්මක වේ.

- ප්‍රාදේශීය සංවර්ධන බැංකු ATM සහ ලංකාපේ ATM පහසුකම - දැන් අපගේ ගනුදෙනුකරුවන්හට 4000කට අධික වූ දීප ව්‍යාප්තය ATM යන්ත්‍ර වලින් මුදල් ආපසු ලබා ගැනීමට හැක. මේ වනවිට ආසන්න වශයෙන් ATM කාඩ්පත් 287,000 ක් පමණ ගනුදෙනුකරුවන්හට ලබාදී තිබේ.

- පොදු ඉලෙක්ට්‍රොනික් මුදල් හුවමාරු (CEFT) පද්ධතිය - අපගේ ගනුදෙනුකරුවන් වෙනුවෙන් අන්තර් බැංකු මුදල් හුවමාරු පහසුකම් විවෘතව පවතී.

- මුදල් තැන්පත් යන්ත්‍ර (CDM) - තෝරාගත් ශාඛා ආශ්‍රිතව පිහිටුවා ඇත.

- RDB QR පහසුකම

RDB විසින් පාරිභෝගිකයින්ට LANKAQR අනුකූල ජංගම ගෙවීම් යෙදුමක් භාවිතා කරමින් ඔවුන්ගේ බැංකු ගිණුම් වලින් සෘජුවම වෙළඳුන්ට ගෙවීමට හැකියාව ලබා දේ. මෙම ගෙවීම වෙළෙන්දාගේ බැංකු ගිණුමට ක්ෂණිකව බැර කෙරේ.


RDB QR

මූල්‍යමය වැදගත් සිදුවීම්


දෙසැම්බර් 31 වන විට	2021	2020	වෙනස
	රු. 000	රු. 000	%
වසරට අදාළ මෙහෙයුම් ප්‍රතිඵල			
දළ ආදායම	**24,492,769**	24,354,247	0.57%
වැටි බද්දට පෙර මෙහෙයුම් ලාභය	**1,926,782**	2,060,859	-6.51%
බදු	**1,620,479**	1,656,823	-2.19%
බදුවලට පසු ලාභය	**306,303**	404,036	-24.19%
කොටස් හිමියන්ට හිමිවිය යුතු ලාභය	**279,005**	148,995	87.26%
වත්කම් සහ බැරකම්			
ගනුදෙනුකරුවන්ගේ තැන්පතු	**187,752,465**	172,882,607	8.60%
ණය සහ ලැබිය යුතු දෑ	**189,039,666**	167,099,050	13.13%
මුළු වත්කම්	**245,889,512**	221,109,151	11.21%
මුළු වගකීම්	**230,496,189**	205,994,834	11.89%
කොටස් හිමියන්ගේ අරමුදල	**15,393,322**	15,114,317	1.85%
ලාභදායීත්වය			
වත්කම් මත ප්‍රතිලාභ (මෙහෙයුම් ලාභ)	**0.78%**	1.09%	-0.31%
ස්කන්ධය මත ප්‍රතිලාභ	**1.99%**	2.72%	-0.73%
අක්‍රීය ණය අනුපාතය	**8.71%**	10.11%	-1.40%

ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය (BASEL III අනුව)	2021 (%)	අවම අවශ්‍යතාව	2020 (%)	අවම අවශ්‍යතාව	වෙනස %
නියාමන අනුපාත					
ප්‍රාග්ධනය සංරක්ෂණ බෆරය ඇතුළුව පොදු ස්කන්ධ ස්ථරය 1	**8.72%**	7.5%	10.34%	7.5%	-1.62%
ප්‍රාග්ධන සංරක්ෂණ බෆරය ඇතුළුව සම්පූර්ණ ස්ථරය 1	**8.72%**	8.5%	10.34%	8.5%	-1.62%
ප්‍රාග්ධන සංරක්ෂණය බෆරය ඇතුළුව මුළු ප්‍රාග්ධන අනුපාතය	**14.27%**	12.5%	14.94%	12.5%	-0.67%
ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාතය	**26.18%**	20.0%	29.30%	20.0%	-3.12%


දළ ආදායම




බදු වලට පෙර මෙහෙයුම් ලාභය




බදුවලට පසු ලාභය




ගනුදෙනුකරුවන්ගේ තැන්පතු



ණය සහ ලැබිය යුතු දෑ



කොටස් හිමියන්ගේ අරමුදල



සභාපතිතුමාගේ පණිවිඩය



2021 වසර යනු සමස්ත ලෝකයම කොවිඩ්-19 වසංගතය විසින් වල්ල කරන ලද අභියෝග සමඟ පොරබදමින් සිටි දෙවන වසර වන අතර සියලුම ගෝලීය ආර්ථිකයන්හි කැපී පෙනෙන පසුබෑමක් ඇති විය.ලොව පුරා මිලියන ගණනක ජීවිත අහිමි වීමත් සමඟ වසංගතය විසින් අවුලුවාලූ දරිද්‍රතාවයේ සහ සමාජ නොසන්සුන්තාවයේ ඉහළ මට්ටම් සමඟ මානව පිරිවැය ගෝලීය ආර්ථික වර්ධනයට බලපානු ඇත. බැංකු අංශය පෙර නොවූ විරූ අභියෝග හමුවේ ඉහළ මට්ටමේ ඔරොත්තු දීමේ හැකියාවක් පෙන්නුම් කළද ගෝලීය වෙළඳාමේ බාධා හමුවේ බැංකුවේ කාර්ය සාධනයට අහිතකර ලෙස බලපෑවේය. ධනාත්මකව ව්‍යාපාර, අධ්‍යාපනික සහ විනෝදාස්වාද ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම සඳහා සබැඳි මෙවලම් සහ තාක්ෂණ භාවිතය වැඩි වීම සාමාන්‍ය තත්ත්වය පිළිබඳ සාපේක්ෂ හැඟීමක් ඇති කළ අතර අද ඩිජිටල් ලෙස සම්බන්ධිත ලෝකයේ ජීවන මාර්ග යක් ලෙස සබැඳි අන්තර්ක්‍රියා වැළඳ ගත් ජනගහනයක් බිහිවීම අනාගතයට යහපත් වේ.

ශ්‍රී ලංකාවේ සමස්ත දළ දේශීය නිෂ්පාදිතය 2021 දී 3.7% ක වර්ධනයක් වාර්තා කළ අතර එය 2020 දී වාර්තා වූ දශම -3.6% හා සැසඳීමේ දී වඩා හොඳ කාර්ය සාධනයකි.ආර්ථිකයේ ප්‍රධාන ආදායම් උත්පාදකයක් වන සංචාරක අංශය වසංගතයෙන් පීඩා විඳි බොහෝ අංශවලින් එකකි. අපගේ බැංකුවේ ගනුදෙනුකරුවන් විශාල සංඛ්‍යාවක් මෙම කර්මාන්තයේ වෙළඳාම් කරන අතර සංචාරකයින්ගේ විශාල අඩුවීම හේතුවෙන් ඔවුන්ට කිව නොහැකි මූල්‍ය දුෂ්කරතාවයන්ට මුහුණ දීමට සිදු වූ අතර ජීවනෝපාය උපයා ගැනීමට නව මාර්ග සෙවීමට සිදු විය. වසංගතයේ අහිතකර බලපෑමට විරෙහිව සටන් කිරීම සඳහා අවදානමට ලක්විය හැකි කණ්ඩායම් සඳහා සෞඛ්‍ය සේවා සහ මූල්‍ය ආධාර සඳහා වන වියදම් 2020 දී පැවැති රු. බිලියන 117.5 කින් 2021 දී රු. බිලියන 165.6 දක්වා වැඩිකිරීමට රජයට සිදුවිය. කාලෝචිත හා කාර්යක්ෂම ලෙස සහනදායී ණය හරහා ව්‍යවසායකයින්ට උපකාර කරමින් ආර්ථික ක්‍රියාකාරකම්වල මන්දගාමී වර්ධනය පුනර්ජීවනය කිරීමට බැංකුව රජයට සිය උපරිම සහයෝගය ලබා දුන්නේය. ශ්‍රී ලංකා මහ බැංකුවේ මගපෙන්වීම යටතේ, වසංගතයේ තුන්වන රැල්ල හේතුවෙන් මූල්‍ය දුෂ්කරතාවලට මුහුණ දී සිටින සුදුසුකම් ලත් පුද්ගලයින් සහ ව්‍යාපාර සඳහා සහන සැලසීමේ පියවර බැංකුව විසින් ආරම්භ කරන ලදී. කෙසේ වෙතත්, ගනුදෙනුකරුට උපරිම ප්‍රතිලාභ ලබා දෙමින් ලාභදායීතාවය ආන්තික මට්ටමක පවත්වා ගැනීමට බැංකුව සමත් විය.

බැංකුවේ සියලුම අංශ නියෝජනය කරමින් අධ්‍යක්ෂක මණ්ඩලය, ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය සහ කාර්ය මණ්ඩලය අතර සහයෝගීතාවයේ ප්‍රතිඵලයක් වශයෙන් නව හැඩයකින් යුත් 2022-2024 ආයතනික සැලැස්ම නිර්මාණය කිරීම වසරේ ප්‍රධාන ජයග්‍රහණවලින් එකකි. "ජාතියේ විශ්වාසනීය සංවර්ධන මූල්‍ය සහකරු වීම" යන අපගේ දැක්ම වෙත අපගේ දායකත්වය ලබා දීමෙන් ඉදිරි වසර තුන තුළ අප අත්කර ගැනීමට අදහස් කරන්නේ කුමක්ද යන්න එහි දක්වා ඇත.

> වසර තුළදී, බැංකුව සිය ඩිජිටල් සේවා වැඩි දියුණු කිරීමේ අරමුණින් ඉදිරියට යාම නිසා තාක්ෂණික අංශයෙන් විශාල ප්‍රගතියක් ලබා ඇත. අපගේ වෙළඳ ගනුදෙනුකරුවන්ට ඔවුන්ගේ ව්‍යාපාර පවත්වාගෙන යාමේදී අමතර පහසුවක් ගෙන ඒම සඳහා ප්‍රයෝජනවත් තාක්ෂණික මෙවලමක් ලබා දීමෙන් ඔවුන් සවිබල ගැන්වීම සඳහා අපි RDB QR පහසුකම දියත් කළෙමු.

සභාපතිතුමාගේ පණිවිඩය

> කාන්තා ව්‍යවසායකයින් නඟා සිටුවීමේ මූල්‍ය ආයතනයක් ලෙස බැංකුව කීර්තියක් ගොඩනඟා ඇත. මෙම ප්‍රවේශයට අනුකූලව, ඔවුන්ගේ ව්‍යාපාර දියුණු කිරීමට ඔවුන් දිරිමත් කිරීම සහ සහාය දීම සඳහා සුවිශේෂී වැඩසටහනක් දියත් කිරීමට වසර තුළ පදනම දමන ලදී.

එම වසර තුළදී, බැංකුව සිය ඩිජිටල් සේවා වැඩි දියුණු කිරීමේ අරමුණින් ඉදිරියට යාම නිසා තාක්ෂණික අංශයෙන් විශාල ප්‍රගතියක් ලබා ඇත. අපගේ වෙළඳ ගනුදෙනුකරුවන්ට ඔවුන්ගේ ව්‍යාපාර පවත්වාගෙන යාමේදී අමතර පහසුවක් ගෙන දීමේදී ප්‍රයෝජනවත් තාක්ෂණික මෙවලම් ලබා දීමෙන් ඔවුන් සවිබල ගැන්වීම සඳහා අපි RDB QR පහසුකම දියත් කළෙමු. Lanka Clear විසින් සංවිධානය කරන ලද LankaPay Technnovation Awards 2022 හි "2021 වසරේ හොඳම ලංකාපේ ගෙවීම් කාඩ්පත් ක්‍රියාත්මක කරන්නා" ලෙස රන් සම්මානය හිමිකර ගැනීමත් සමඟම බැංකුවේ ඩිජිටල් විශිෂ්ටත්වය සඳහා වන කැපවීම ඉස්මතු විය. 2022 දී උපාය මාර්ගික ස්ථානවල යෙදවීමට නියමිත නව ATM යන්ත්‍ර 50ක් මිලදී ගැනීමට මූලික කටයුතු සිදු කරන ලදී. ණය ක්‍රියා පටිපාටි වේගවත් කරන ඉතා අවශ්‍ය තොරතුරු තාක්ෂණ පද්ධතියක් වන Loan Originating System (LOS) යෙදවීමේ ව්‍යාපෘතිය ස්ථාවර ප්‍රගතියක් ලබා ඇත. මෙම පද්ධතිය නව මූල්‍ය වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ. අපගේ තාක්ෂණික යටිතල පහසුකම් නංවාලීමේ අනෙකුත් කැපී පෙනෙන ආයෝජන අතරට වෙබ් යෙදුම් ෆයර්වෝල් සහ ග්ලෝබල් සර්වර් ලෝඩ් බැලන්සර් ක්‍රියාත්මක කිරීම මෙන්ම චිප් මත පදනම් වූ වීසා ඩෙබිට් කාඩ්පත මුද්‍රණය කිරීම, පුද්ගලානුබද්ධ කිරීම සහ බෙදා හැරීම ඇතුළත් විය.

වසර කිහිපයක් තිස්සේ බැංකුව මන්නාරම, කිලිනොච්චිය, මැදිරිගිරිය, උපුල්දෙණිය සහ බුත්තල යන ප්‍රදේශවල පිහිටි රජයේ ගබඩා 5ක් මෙට්‍රික් ටොන් 5,000 සිට ඉහළට ධාරිතාවයෙන් කළමනාකරණය කරයි. විවිධ හේතූන් මත මෙම ගබඩා අඩුවෙන් ප්‍රයෝජනයට ගෙන ඇත. මෙම වර්ෂය තුළ, ගොවීන්ට වැඩි ප්‍රතිලාභ ලබා දෙමින් මෙම ගබඩාවල මෙහෙයුම් විධිමත් කිරීමට සහ කාර්යක්ෂමතාව වැඩි කිරීමට සැලසුම් සකස් කරන ලදී.

කාන්තා ව්‍යවසායකයින් නඟා සිටුවීමේ මූල්‍ය ආයතනයක් ලෙස බැංකුව කීර්තියක් ගොඩනඟා ඇත. මෙම ප්‍රවේශයට අනුකූලව, ඔවුන්ගේ ව්‍යාපාර ව්‍යවසායන් දියුණු කිරීම සඳහා ඔවුන් දිරිමත් කිරීම සහ සහාය දීම සඳහා සුවිශේෂී වැඩසටහනක් දියත් කිරීමට වසර තුළ පදනම දමන ලදී. "RDB දිරි අභිමානී" ලෙස නම් කර ඇති මෙම වැඩසටහන මඟින් දිස්ත්‍රික්, පළාත් සහ ජාතික මට්ටමින් කාන්තා ව්‍යවසායකයින් 10,000ක් සංවර්ධනය කිරීමටත් මුදල් සම්මාන පිරිනැමීමෙන් ඔවුන්ගේ ව්‍යාපාර දියුණු කිරීමට ඔවුන් පෙළඹවීමටත් සැලසුම් කර ඇත. මෙම වැඩසටහනේ 2021 ජාතික මට්ටමේ තරඟය 2022 මාර්තු 8 වන දින රාජගිරිය CBSL විදුපියසේදී පවත්වන ලද අතර ජයග්‍රාහී කාන්තා ව්‍යවසායකයින් සඳහා වටිනා ත්‍යාග ප්‍රදානය කරන ලදී.

වර්ෂයේ මුල් භාගයේදී, පෑලියගොඩ මැනිං වෙළඳපොලේ අලුතින් ඉදිකරන ලද බැංකුවේ සේවා මධ්‍යස්ථානය ATM සහ CDM පහසුකම් සහිතව විවෘත කරන ලදී. පවතින අවිනිශ්චිත ආර්ථික තත්ත්වය වසරේ ඉතිරි කාලය තුළ බැංකුවේ ශාඛා ජාලය පුළුල් කිරීම සාධාරණීකරණය නොකළද, අපගේ වටිනා ගනුදෙනුකරුවන්ට ඔවුන්ගේ බැංකු කටයුතු දියත්කිරීමේ දී පහසුව සැලසීමේ අරමුණින් ශාඛා නැවත ස්ථානගත කිරීම්, ප්‍රධාන ප්‍රතිසංස්කරණ සහ තෝරාගත් නවීකරණයන් තුළින් පවත්නා ජාලය වැඩිදියුණු කරන ලදී.

එක් එක් ශාඛාව මත බර අඩු වන පරිදි ක්‍රමානුකූලව බැංකුවේ ශාඛා ජාලය ප්‍රතිව්‍යුහගත කළ යුතු බව මගේ දැඩි විශ්වාසයයි. දැනට, සෑම ශාඛාවක්ම දිස්ත්‍රික් කාර්යාලයට, ප්‍රාදේශීය කාර්යාලයට සහ ප්‍රධාන කාර්යාලයට වාර්තා කරන අතර එමඟින් ශාඛාවට සැලකිය යුතු බරක් පැටවෙන අතර බැංකු කටයුතු කරගෙන යාමේ ප්‍රමාදයන් ඇති වේ. ඒ අනුව, තවත් සංශෝධන කිහිපයක් සමඟින්, අවශ්‍ය සමාලෝචනය සහ ක්‍රියාමාර්ග සඳහා දැනටමත් මුදල් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇති කෙටුම්පත් සංශෝධන සහිත ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත සංශෝධනය කිරීමට අපි කටයුතු කර ඇත්තෙමු.

අනාගත ඉදිරි දැක්ම

නව තාක්ෂණයේ බලය උපයෝගී කරගනිමින් සහ නව්‍ය පාරිභෝගික සේවා ලබා දීමෙන් අපගේ ගනුදෙනුකරුවන් වෙත ළඟා වීමට අපි අදහස් කරමු. අපනයන කෘෂිකාර්මික අංශයේ සියලුම භෝග සඳහා අගය දාම සහ අගය එකතු කළ ව්‍යවසායන් සඳහා මූල්‍ය ආධාර සහ උපදේශන සේවා සපයන අතර ගුණාත්මක බව ලබා දෙමින් ධීවර හා වාණිජ අංශයේ සහ අනෙකුත් ක්ෂුද්‍ර හා කුඩා ව්‍යාපාරවල අගය එකතු කළ ව්‍යාපාර දියුණු කිරීමට ද අපි සූදානම් වෙමු. විධිමත් සැලසුම් කිරීම් තුළින් පාරිභෝගිකයින්ට ඔවුන්ගේ මූල්‍ය අවශ්‍යතා සපුරාලීම සඳහා වැඩි තේරීමක් ලබා දීම සඳහා නව නිෂ්පාදන සහ සේවා හඳුන්වා දෙනු ලැබේ. අවශ්‍ය ධාරිතා වර්ධනය සඳහා ආයෝජනය කිරීමෙන් බැංකුවේ මානව සම්පත් වැඩිදියුණු කිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කරනු ඇත. අනාගතයේ අභියෝගවලට වඩා හොඳින් මුහුණ දීම සඳහා අපගේ ණය කළඹේ ගුණාත්මක භාවය ඉහළ නැංවීමට අප දරන උත්සාහයන් කෙරෙහි බැංකුව තවදුරටත් අවධානය යොමු කරනු ඇත.

පිළිගැනීම්

මම මගේ පණිවිඩය අවසන් කිරීමට පෙර, මාරාන්තික වසංගතය හමුවේ ජීවිත දහස් ගණනක් බේරා ගැනීම සඳහා අඛණ්ඩව නිර්භීතව ක්‍රියා කළ සෞඛ්‍ය සේවා වෘත්තිකයන්, ත්‍රිවිධ හමුදාව සහ අනෙකුත් සියලුම පුද්ගලයින් ඇතුළු පෙරටුගාමී සේවකයින්ට මගේ හදපිරි ප්‍රශංසාව ප්‍රකාශ කිරීමට කැමැත්තෙමි. අපගේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන්, අපගේ සියලුම ගනුදෙනුකරුවන්ට සහ අපගේ අනෙකුත් පාර්ශවකරුවන්ට මෙම කැලඹිලි සහිත කාල පරිච්ඡේදය තුළදී පවා බැංකුවට අඛණ්ඩව පක්ෂපාතීව කටයුතු කිරීම පිළිබඳව මගේ කෘතඥතාව පළ කිරීමට කැමැත්තෙමි. අපගේ වටිනා පාරිභෝගිකයින්ට සේවය කිරීමට සහ ඔවුන්ගේ අවශ්‍යතාවලදී ඔවුන් සමඟ සිටීමට ප්‍රශංසනීය ලෙස ක්‍රියා කළ කළමනාකරණ කාර්ය මණ්ඩලයට සහ සියලුම ප්‍රාදේශීය සංවර්ධන බැංකු සේවකයින්ට මම ස්තූති වන්ත වෙමි. වසංගතයේ වසර දෙකක කාලයක් අප සාර්ථකව ගමන් කර ඇති අතර, එම බැඳියාව, වැඩ ආචාර ධර්ම සහ කැපවීම පෙන්නුම් කරන්නේ නම්, ශ්‍රී ලංකාව සමෘද්ධිමත් අනාගතයක් කරා ගෙන යාමට අපට හැකි වනු ඇතැයි මම විශ්වාස කරමි.



මහින්ද සාලිය
සභාපති

සාමාන්‍යාධිකාරී/ ප්‍රධාන විධායක නිලධාරි සමාලෝචනය



ජාතික මට්ටමේ සංවර්ධන බැංකුකරණයේ වසර 12ක් සම්පූර්ණ කරන අතරේ, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව 2021 වසරේ අභියෝග රැසකට මුහුණ දෙමින් අසමසම වසරක් සනිටුහන් කළේය. විශාල වෙනස්කම් සහ අභියෝග මධ්‍යයේ, දශක තුනකට අධික කාලයක් බැංකුවේ රැඳී සිටින සාමාජිකයෙකු ලෙස බැංකුවේ නව වගකීම් මෙහෙයවන අතරතුර මෙම පණිවිඩය ලිවීමට ලැබීම මට ඉමහත් සතුටක් ගෙන දෙයි.

කොවිඩ්-19 වසංගතය හේතුවෙන් අඛණ්ඩව ආර්ථික දුෂ්කරතාවලට ගොදුරු වූ 2021 වසර බැංකුවට පමණක් නොව සමස්ත බැංකු ක්ෂේත්‍රයටම දුෂ්කරතා ඇති වසරක් සනිටුහන් කළේය. කෙසේ වෙතත්, වසරේ සියලු විනාශයන් මධ්‍යයේ, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව සිය කටයුතු සාධාරණ ලෙස ඉහළ මට්ටමක පවත්වා ගෙන යාමට හැකි වූ අතර එමඟින් අපගේ සියලුම ගනුදෙනුකරුවන්ට බලාපොරොත්තුවක් ලබා දෙමින් සහ රටේ ආර්ථිකයට කාලෝචිත ප්‍රබෝධයක් ලබා දීමට හැකි වූ බව මම ආඩම්බරයෙන් සඳහන් කරමි.

කොවිඩ්-19 වසංගතය හේතුවෙන් අඛණ්ඩව ආර්ථික දුෂ්කරතාවලට ගොදුරු වූ 2021 බැංකුවට පමණක් නොව සමස්ත බැංකු ක්ෂේත්‍රයටම දුෂ්කරතා ඇති කළ වසරක් සනිටුහන් කළේය. කෙසේ වෙතත්, වසරේ සියලු අභාග්‍යයන් මැද ප්‍රාදේශීය සංවර්ධන බැංකුවට සිය ක්‍රියාකාරකම් සාධාරණ ලෙස ඉහළ මට්ටමක පවත්වා ගෙන යාමට හැකි වූ අතර එමඟින් අපගේ සියලුම ගනුදෙනුකරුවන්ට බලාපොරොත්තුවක් ලබා දෙමින් රටේ ආර්ථිකයට කාලෝචිත ප්‍රබෝධයක් ලබා දීමට හැකි වූ බව මම ආඩම්බරයෙන් සටහන් කරමි.

මෙවැනි කැළඹිලි සහිත පරිසරයක වුවද, ශ්‍රී ලංකා මහ බැංකුවේ මඟපෙන්වීම යටතේ ණය සහන ලබාදීමේ දී සහ ණය අත්හිටුවීම් ක්‍රියාත්මක කිරීමේ දී ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කරමින් අප සේවය කරන ප්‍රජාවන්ගේ මූල්‍ය කුළුණක් ලෙස ක්‍රියා කරන රාජ්‍ය සංවර්ධන බැංකුවක් වීමේ අමතර වගකීමට බැංකුව උර දුන්නේය. රජය විසින් හඳුන්වා දුන් නව ණය යෝජනා ක්‍රම ඉදිරියට ගෙන යාමට බැංකුව සහාය වූ අතර අනෙකුත් සමාජ වගකීම් ද ඉටු කළේය. දිවයින පුරා විවිධ දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරමින් මෙම ණය යෝජනා ක්‍රමවල ප්‍රතිලාභ සාමාන්‍ය ජනතාව වෙත නිසි ලෙස සන්නිවේදනය කිරීම සහතික කිරීම කෙරෙහි බැංකුව විශේෂ අවධානයක් යොමු කළේය.

වසරේ මූල්‍ය විශේෂ අවස්ථා

කර්මාන්තයේ අභියෝගාත්මක තත්ත්වයන් මධ්‍යයේ වුවද, පසුගිය වසරේ රුපියල් බිලියන 221 සිට සමාලෝචිත වර්ෂය තුළ රුපියල් බිලියන 246 දක්වා වත්කම් පදනමේ 11% වාර්ෂික වර්ධනයක් අත්පත් කරගන්නා අතරතුර බැංකුව 2021 වසර සඳහා රුපියල් මිලියන 306 ක පසු බදු ලාභයක් වාර්තා කළේය. ණය කළඹ රුපියල් බිලියන 189 දක්වා 13% වාර්ෂික වර්ධනයක් වාර්තා කළේය. තැන්පතු කළඹ රුපියල් බිලියන 188 දක්වා 8.6% වාර්ෂික වැඩිවීමත් සමඟ. බැංකුවේ ශුද්ධ පොලී ආදායම 2021 දී රුපියල් බිලියන 10.9 සිට රුපියල් බිලියන 13.7 දක්වා 26% කින් වර්ධනය විය. පසුගිය වසරේ සාක්ෂාත් කර ගන්නා ලද මෙහෙයුම් ලාභය රුපියල් බිලියන 2.1 සිට රුපියල් බිලියන 1.9 දක්වා සුළු වශයෙන් පහත වැටුණි. පහත වැටීම් සඳහා ප්‍රධාන සාධක වූයේ රුපියල් බිලියන 9.1ක මෙහෙයුම් වියදම් සහ අපහායන ගාස්තු රුපියල් බිලියන 3.2 කි. රටෙහි අඩු ආර්ථික වර්ධනයක් අඛණ්ඩව පැවැති දෙවන වසර යටතේ වුවද, 2020 දී වාර්තා වූ රුපියල් බිලියන 16.6 සිට රුපියල් බිලියන 16.3 දක්වා අක්‍රිය ණය කළඹ 1.8% කින් සුළු වශයෙන් අඩු විය. සමාලෝචිත වර්ෂයේදී අක්‍රිය ණය අනුපාතය පසුගිය වසරේ 10.11% සිට 8.71% දක්වා අඩු විය

සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී සමාලෝචනය

වසරේ මෙහෙයුම් විශේෂ අවස්ථා

බාහිර පරිසරයට ඉක්මන් ප්‍රතිචාර දැක්වීම අඛණ්ඩව පවත්වාගෙන යමින්, බැංකුව විසින් 2022-2024 ආයතනික සැලැස්ම සකස් කිරීම තුළින් සිය සැලසුම් ක්‍රියාවලිය සාක්ෂාත් කර ගැනීමට සමත් විය.මෙය බැංකුවේ සියලුම අංශ නියෝජනය කරමින් අධ්‍යක්ෂ මණ්ඩලය, ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය සහ කාර්ය මණ්ඩලය අතර වූ සහයෝගීතාවයේ ප්‍රතිඵලයක් වන අතර "ජාතියේ විශ්වාසදායී සංවර්ධන මූල්‍ය සහකරු වීම" යන අපගේ දැක්ම සඳහා අපගේ දායකත්වය ලබා දීම සඳහා ඉදිරි වසර තුන තුළ අපේක්ෂිත ජයග්‍රහණ විස්තර කරයි.

බැංකු කර්මාන්තයේ ඩිජිටල් නියෝජනය සනිටුහන් කරමින් වසර තුළ ඩිජිටල් මුල පිරීම් කිහිපයක් සිදු කිරීමට බැංකුවට හැකි විය. අපගේ වෙළඳ ගනුදෙනුකරුවන්ට ඔවුන්ගේ ව්‍යාපාර පවත්වාගෙන යාමේදී අමතර පහසුවක් ගෙන දීම සඳහා ප්‍රයෝජනවත් තාක්ෂණික මෙවලමක් ලබා දීම සඳහා RDB QR සහ Just Pay පදනම් කරගත් ගනුදෙනු පහසුකම දියත් කිරීම මෙයට ඇතුළත් විය. මෙම QR තාක්ෂණය භාවිතා කිරීමෙන්, වෙළෙන්දාගෙන් භාණ්ඩ හෝ සේවා මිලදී ගන්නා ඕනෑම පාරිභෝගිකයෙකුට වෙනත් බැංකුවක QR යෙදුමක් හරහා අදාල මුදල් වෙළෙන්දාගේ RDB ගිණුමට බැර කළ හැකිය.

අවසාන අදියරේ පවතින ණය සංවිධාන පද්ධතිය (LOS) සහ එකතු කළමණාකරණ පද්ධතිය (CMS) ක්‍රියාත්මක කිරීම මඟින් වේගවත් ලුහුබැඳීම සහ ණය පහසුකම් පහසු කිරීම සඳහා අවශ්‍ය සහය ලබා දෙන අතරම වැඩිදියුණු කළ පාරිභෝගික සේවාවක් ලබා දෙනු ඇත.

මූලික බැංකු පද්ධතියට පොදු යෙදුම් ක්‍රමලේඛන අතුරුමුහුණත (API) හඳුන්වාදීම, වෙබ් යෙදුම් ෆයර්වෝල් සහ ග්ලෝබල් සර්වර් ලෝඩ් බැලන්සර් මෙන්ම චිප් පාදක වීසා ඩෙබිට් කාඩ්පත මුද්‍රණය කිරීම, පුද්ගලානු බද්ධ කිරීම සහ බෙදා හැරීම සහ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පද්ධතිය (AML) ක්‍රියාත්මක කිරීම අනෙකුත් වේවා අපගේ තාක්ෂණික යටිතල පහසුකම් නංවාලීම සම්බන්ධයෙන් සැලකිය යුතු ආයෝජන ලෙස සලකුණු කෙරේ.

Lanka Clear විසින් සංවිධානය කරන ලද LankaPay Technnovation Awards 2022 හිදී "2021 වසරේ හොඳම ලංකා ගෙවීම් කාඩ්පත් ක්‍රියාත්මක කරන්නා" ලෙස රන් සම්මානය හිමිකර ගැනීමත් සමඟ ඩිජිටල් විශිෂ්ටත්වය සඳහා බැංකුවේ කැපවීම ඉස්මතු විය.

අඛණ්ඩ ප්‍රගතිය සඳහා වූ කැපවීම පවත්වා ගනිමින්, ප්‍රධාන කාර්ය සාධන දර්ශක (KPIs) සඳහා රාමුවක් ස්ථාපිත කිරීමට බැංකුව සමත් විය. වසංගතය හේතුවෙන් සමාජ දුරස්ථභාවය ඇතුළු දුෂ්කර තත්වයන් අතර පවා, මාර්ගගත පුහුණු පහසුකම් ක්‍රියාත්මක කිරීමෙන් බැංකුව සිය මානව සම්පත් පිළිබඳ දැනුම මට්ටම් ඉහළ නැංවීමට සමත් විය.

> Lanka Clear විසින් සංවිධානය කරන ලද LankaPay Technnovation Awards 2022 හිදී "2021 වසරේ හොඳම ලංකා ගෙවීම් කාඩ්පත් ක්‍රියාත්මක කරන්නා" ලෙස රන් සම්මානය හිමිකර ගැනීමත් සමඟ ඩිජිටල් විශිෂ්ටත්වය සඳහා බැංකුවේ කැපවීම ඉස්මතු විය.

කාන්තා සවිබල ගැන්වීම

බැංකුව කාන්තාවන් මූලික කරගත් ව්‍යවසායන් දිරිමත් කරමින් කාන්තා සවිබල ගැන්වීම් ප්‍රවර්ධනය කිරීමේ මූලපිරීම් කිහිපයක් දියත් කර ඇත. මහාපරිමාණ කාන්තා අභිමුඛ ව්‍යවසායකයින් සඳහා ලිය සවිය, දිරි අභිමානී ඇතුළු ණය සහ තැන්පතු නිෂ්පාදන හඳුන්වා දීමෙන්, මූල්‍ය ආධාර, නිපුණතා සංවර්ධන සහ තාක්ෂණික සහාය වැනි විවිධ ආකාරයෙන් ඔවුන් නඟා සිටුවීමට බැංකුවට හැකි විය. We-Fi නිශ්චිත අවශ්‍යතා සහ ඉලක්ක සපුරාලීම සම්බන්ධයෙන් ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ ඉහළම මට්ටමේ කාර්ය සාධනයක් (PFIs 10 න් 3 වන ස්ථානය) ලෙස හඳුනාගෙන ඇත:

- කාන්තාවන් බැංකුකරණය සඳහා උපාය මාර්ග සහ කාන්තාවන්ට සේවා සඳහා ඉලක්ක හෝ KPIs සැකසීම
- ස්ත්‍රී පුරුෂ පරතරය අවම කිරීම සඳහා රැකියා ස්ථානයේ සිටින කාන්තාවන්ට උපකාර කරන මානව සම්පත් ප්‍රතිපත්ති
- කාන්තා ගනුදෙනුකරුවන් සඳහා අලෙවිකරණය
- කාන්තා ව්‍යවසායකයින්ගේ අවශ්‍යතා සපුරාලන නිෂ්පාදන සහ සේවා
- කාන්තාවන්ගේ පුද්ගලික බැංකු අවශ්‍යතා සපුරාලන නිෂ්පාදන සහ සේවා
- කාන්තාවකගේ සම්පූර්ණ මුදල් පසුම්බියටම සේවය කිරීමේ හැකියාව (ව්‍යවසායක සහ පුද්ගලික බැංකු අවශ්‍යතා දෙකම)

අගය කිරීම්

මගේ සමාලෝචනය අවසන් කිරීමට පෙර, ශ්‍රී ලාංකේය ජනතාව වෙනුවෙන් නිර්භීතව තම යුතුකම ඉටු කරමින් අපට මේ මාරාන්තික වසංගතයෙන් ගොඩ වීමට උපකාර කළ දහස් සංඛ්‍යාත වීරෝදාර සෞඛ්‍ය සේවා වෘත්තිකයන්, ත්‍රිවිධ හමුදාව සහ අනෙකුත් සියලුම පුද්ගලයින්ට මගේ අවංක කෘතඥතාව පළ කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි. තවත් අභියෝගාත්මක වසරක් වූ කාලය තුළ මා වෙත ලබා දුන් උපදෙස් සහ මගපෙන්වීම පිළිබඳව වත්මන් සහ හිටපු සභාපතිවරුන්ට සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ට මාගේ කෘතඥතාව පළ කිරීමට කැමැත්තෙමි.පසුගිය වසර තුළ මට සහ බැංකුවට ලබා දුන් අඛණ්ඩ සහයෝගය වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ, මුදල් අමාත්‍යාංශයේ සහ අනෙකුත් රාජ්‍ය ආයතනවල නිලධාරීන්ට ද මම ස්තුති කිරීමට කැමැත්තෙමි.

බැංකුව කෙරෙහි අඛණ්ඩව විශ්වාසය තැබීම සහ ඔවුන්ට වඩා හොඳ අනාගතයක් ගෙන දීම සඳහා අපගේ හැකියාවන් කෙරෙහි විශ්වාසය තැබීම පිළිබඳව අපගේ විශ්වාසවන්ත ගනුදෙනුකරුවන්ට මම කෘතඥ වෙමි. සෑම විටම මෙන්, මෙම කරදරකාරී කාලයේදී අවිනිශ්චිතතාවයන්ට යම් තරමක විශ්වාසයෙන් යුතුව මුහුණ දීමට ඔබට උපකාර කිරීමට අප හැකි සෑම උත්සාහයක්ම ගත්තෙමු. එම සටහන මත, පසුගිය වසර සඳහා බැංකුවේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට කටයුතු කරන අතරම අපගේ වටිනා ගනුදෙනුකරුවන්ට උපකාර කිරීම සඳහා බැංකුවේ සමස්ත කාර්ය මණ්ඩලයේ සියලු වෙහෙස මහන්සි වී කැපවීම පිළිබඳව මගේ කෘතඥතාව පළ කිරීමට කැමැත්තෙමි. නැවත වරක්, අප සියල්ලම එම අවස්ථාවේදී නැඟී සිටි අතර, අප සියලුම දෙනා එකම පොදු අරමුණක් ඇතිව එකම කණ්ඩායමක් ලෙස එකට වැඩ කරන දුෂ්කරම කාලවලදී පවා සාක්ෂාත් කරගත හැකි දේ ලෝකයට පෙන්වා දුන්නෙමු. ඒ සියල්ල අපව ශක්තිමත් කර ඇති අතර අවුල් සහගත වසර දෙක පසෙකින් තබා බැංකුව සහ රට වෙනුවෙන් අනාගතයේදී බලාපොරොත්තු වන දෙයට මුහුණ දීමට වඩා හොඳින් සූදානම් වී ඇති බව මට විශ්වාසයි.



ඒ. එච්. එම්. එම්. බී. ජයසිංහ
සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී

භාරකාරත්වය



18 අධ්‍යක්ෂ මණ්ඩලය

24 ආයතනික කළමනාකරණ කණ්ඩායම

26 ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරී/ජ්‍යෙෂ්ඨ සහකාර සාමාන්‍යාධිකාරී

28 සහකාර සාමාන්‍යාධිකාරී/අංශ ප්‍රධානීන්



අධ්‍යක්ෂක මණ්ඩලය



1. මහින්ද සාලිය මහතා - සභාපති
2. ඩබ්ලිව්.එම්. කරුණාරත්න මහතා - අධ්‍යක්ෂක
3. කේ රවීන්ද්‍රන් මහතා - අධ්‍යක්ෂක
4. එම්.එස්.ඩී. රණසිරි මහතා - අධ්‍යක්ෂක
5. ක්‍රිෂානි නාරංගොඩ මිය - අධ්‍යක්ෂක
6. එම්.එස්.එස්.එස්. ප්‍රනාන්දු මහතා - අධ්‍යක්ෂක



7. ආචාර්ය නිර්මාල් ද සිල්වා මහතා - අධ්‍යක්ෂ
8. ජී.ඒ. ජයශාන්ත මහතා - අධ්‍යක්ෂක
9. මහාචාර්ය එච්.එම්.ඩබ්ලිව්. ආරියරත්න මහතා - අධ්‍යක්ෂක
10. ලලිත් අබේසිරිවර්ධන මහතා - අධ්‍යක්ෂක
11. හිරන්ති කරුණාරත්න මිය - අධ්‍යක්ෂක

අධ්‍යක්ෂක මණ්ඩලය

එම් මහින්ද සාලිය මහතා

සභාපති

මහින්ද සාලිය මහතා කැලණිය විශ්වවිද්‍යාලයේ වාණිජවේදී (විශේෂ) උපාධිධාරියෙකි. ඒ මහතා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති, රාජ්‍ය මූල්‍ය, සංඛ්‍යානය මෙන්ම වාර්ෂික රාජ්‍ය අයවැය සම්පාදනය ආදී ශ්‍රේෂ්ඨත්වල මනා පළපුරුදු වෘත්තිකයෙකි.

වසර 34ක් රාජ්‍ය අංශයේ සේවය නිරතව සිටින ඒ මහතා එම කාලය තුළ ආර්ථික විද්‍යාඥයකු, ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂවරයකු සහ ප්‍රාදේශීය කළමනාකාරවරයකු ලෙස සේවය කර තිබේ. එමෙන්ම ඔහු මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ සහ රාජ්‍ය ගිණුම් පිළිබඳ සහකාර අධ්‍යක්ෂකවරයෙකු ලෙස ද චිතුමා කටයුතු කර ඇත. මහා භාණ්ඩාගාරයේ නියෝජිතයා ලෙස ඒ මහතා රාජ්‍ය ආයතන කිහිපයකම අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු වශයෙන් සේවය කර ඇත.

රජරට සංවර්ධන බැංකුව, කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය, ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය, රක්නා ලංකා ආරක්ෂක සමාගම, ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධන සංස්ථාව, ටවර් හෝල් රඟහල පදනම සහ සෙලසින් රූපවාහිනී ආයතනය සාලිය මහතා අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙක් ලෙස නියෝජනය කළ රාජ්‍ය ආයතන කිහිපයකි.

ඩබ්ලිව් එම් කරුණාරත්න මහතා

ස්වාධීන/විධායක නොවන අධ්‍යක්ෂ

ඩබ්ලිව්.එම්. කරුණාරත්න මහතා 2020.01.03 දින ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ ස්වාධීන/විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් කරන ලදී. කරුණාරත්න මහතා ශ්‍රී ලංකා මහ බැංකුවේ විශ්‍රාමික සහකාර අධිපතිවරයකු වන අතර බැංකු කටයුතු පිළිබඳ වසර 30කට වැඩි පළපුරුද්දක් දරයි. ඔහු වසර තුනක කාලයක් මුදල් අමාත්‍යාංශය විසින් පාලනය කරනු ලබන " ගුදම් කුවිතාන්සි මූල්‍යකරණ ව්‍යාපෘතියේ" ලෝක බැංකු අරමුදල් ව්‍යාපෘතියක උපදේශකයෙකු ලෙස ද සේවය කර ඇත. ඔහු අනුරාධපුර - ග්‍රාමීය ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුවේ සභාපති/ප්‍රධාන විධායක නිලධාරී මෙන්ම රුහුණු සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයකු ද විය. තවද, ඔහු කැනේඩියානු රජයේ අනුග්‍රහය ඇතිව වසර 03ක කාලයක් සඳහා වටිනාකම් දාම සංවර්ධන ව්‍යාපෘතියක වටිනාකම් දාම මූල්‍ය විශේෂඥයා ලෙස සේවය කර ඇත.

ඔහු දුප්පතුන් සමඟ බැංකුකරණය (සමූහ ණය දීම) සහ ග්‍රාමීය ඉතුරුම් බලමුලු ගැන්වීම පිළිබඳ ග්‍රන්ථ දෙකක්, දරිද්‍රතා ණය දීම, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකත්ව මූල්‍යකරණය, වාරිමාර්ග නැංවීම ගෙවතු වගාව, කිරි ගව සංවර්ධන, මූල්‍ය සාක්ෂරතාව මෙන්ම ගුදම් කුවිතාන්සි මූල්‍යකරණය පිළිබඳ ග්‍රන්ථ 06 ක් ප්‍රකාශයට පත් කර ඇත.

කරුණාරත්න මහතා පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධියක් සහ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයෙන් එල්.එල්.බී. (ගෞරව) උපාධියක් ලබා ඇත. තවද කරුණාරත්න මහතා 2002 වසරේ සිට නීතීඥවරයෙක් ලෙස කටයුතු කරයි.

කේ රවීන්ද්‍රන් මහතා

ස්වාධීන නොවන / විධායක නොවන අධ්‍යක්ෂ

රවීන්ද්‍රන් මහතා මේ වන විට ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරයා ලෙස කටයුතු කරමින් ශාඛා මෙහෙයුම්, මූල්‍ය හා සැලසුම්, අධීක්ෂණ සහ පර්යේෂණ සහ සංවර්ධන කාර්යයන් කෙරෙහි අවධානය යොමු කරයි. ඔහු ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ වසර 19කට වැඩි සේවා කාලයක් සමඟ බැංකු හා මූල්‍ය අංශයේ වසර 24කට වැඩි පශ්චාත් පළපුරුද්දක් තමන් සතු කරගෙන තිබේ. ඉහත කාර්යයන් සඳහා වගකිව යුතු ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරයා ලෙස වැඩ භාර ගැනීමට පෙර, ඔහු මූල්‍ය, විගණන සහ පර්යේෂණ සහ සංවර්ධන යන ක්ෂේත්‍රවල සහකාර සාමාන්‍යාධිකාරී සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී ලෙස සේවය කර ඇත. ඔහු බැංකුවේ අවදානම් කළමනාකරණ කාර්යය ද අධීක්ෂණය කර ඇත.

රවීන්ද්‍රන් මහතා ජාතික ඉතිරිකිරීමේ බැංකුවට බැඳීමට පෙර පීපල්ස් මර්චන්ට් බැංකුවේ ආයතනික මූල්‍ය අංශයේ මූල්‍ය විශ්ලේෂකයෙකු ලෙස සහ CDIC Carson Cumberbatch Stock Brokers හි පර්යේෂණ විශ්ලේෂකයෙකු ලෙස සේවය කර ඇත.

රවීන්ද්‍රන් මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සහ ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ බාහිර කථිකාචාර්යවරයකු ලෙස සේවය කර ඇත. එසේම එම මහතා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් පවත්වනු ලබන විභාගයේ මූල්‍ය කළමනාකරණය විෂයයෙහි කැපී පෙනෙන ප්‍රමුක පෙළේ දේශකයෙකු ද වේ.

ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ (FCA) අධිසාමාජිකයෙකු වන අතර ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ (CMA) ආරම්භක සාමාජිකයෙකි. රවීන්ද්‍රන් මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ගෞරව උපාධි සහිතව සහ කොළඹ විශ්ව විද්‍යාලයෙන් බැංකු හා මූල්‍ය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා ඇත.

වෙනත් වත්මන් පත්වීම් ■ ශ්‍රී ලංකා වෘත්තීය බැංකුකරුවන්ගේ සංගමයේ (APB) පාලක මණ්ඩලයේ සාමාජික.

මීට පෙර දරා ඇති තනතුරු

- ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ (IBSL) විකල්ප අධ්‍යක්ෂවරයෙකු ලෙස එහි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකත්වය දරා ඇත.

එම්.එස්.ඩී.රණසිරි මහතා

ස්වාධීන/විධායක නොවන අධ්‍යක්ෂ

එම්.එස්.ඩී. රණසිරි මහතා, 2020.01.03 දින ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ ස්වාධීන/විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් කරන ලදී. රණසිරි මහතා දැනට ජාතික චැරිටේ කොමිෂන් සභාවේ අධිකාරලත් සාමාජිකයෙකු ලෙස කටයුතු කරන අතර ඔහු මුදල් අමාත්‍යාංශයේ භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ හිටපු අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු ද වේ.

ඔහු කොළඹ විශ්ව විද්‍යාලයෙන් වාණිජවේදී (විශේෂ) උපාධියක් ලබා ඇති අතර රාජ්‍ය අංශයේ වසර 30 කට වැඩි පළපුරුද්දක් ඇත. රණසිරි මහතා රාජ්‍ය උකස් සහ ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂවරයෙකු සහ සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ මහා භාණ්ඩාගාරයේ නියෝජිතයෙකු ලෙසද කටයුතු කර ඇත.

වී.කේ. නාරංගොඩ මහත්මිය

ස්වාධීන නොවන / විධායක නොවන අධ්‍යක්ෂ

ක්‍රිෂානි නාරංගොඩ මහත්මිය කළමනාකරණ අභ්‍යාසලාභිනියක ලෙස 1987 දී මහජන බැංකුවට බැඳුණු අතර බැංකුවේ වසර 35 කට වැඩි සේවා කාලයක් දරයි.

ඇය විවිධ කළමනාකරණ හැකියාවන් යටතේ ශාඛා බැංකුකරණය, විදේශීය පාරිභෝගික සේවා, Off-Shore Banking සහ Corporate Banking යන ක්ෂේත්‍ර ආවරණය කර ඇති අතර දැනට නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී ලෙස සේවය කරන අතර වාණිජ ණය, වාණිජ බැංකු, SME" සංවර්ධන මූල්‍ය සහ ක්ෂුද්‍ර මූල්‍ය යන ක්ෂේත්‍ර ආවරණය කරයි.

ඇය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් ගෞරව උපාධියක් (BSc' ව්‍යාපාර පරිපාලනය දෙවන පන්තියේ ඉහළ අංශය සමඟ) සහ කොළඹ විශ්වවිද්‍යාලයේ උපාධි අධ්‍යයන පීඨයෙන් ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ලබා ඇත. ඇය ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ සහ ශ්‍රී ලංකා ණය කළමනාකරණ ආයතනයේ සහකාර සාමාජිකාවක් ද වේ. ඇය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයෙන් පාරිභෝගික සබඳතා කළමනාකරණය පිළිබඳ උසස් සහතිකයක් ලබාගෙන ඇත.

ඇයගේ බැංකු දිවිය තුළ ඇය දේශීය හා ජාත්‍යන්තර වශයෙන් විවිධ බැංකු/කළමනාකරණ වැඩසටහන් සඳහා සහභාගී වී ඇත. ඇය ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල අධ්‍යක්ෂවරියක් ලෙස පත් කර ඇති අතර ඇය ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ලියාපදිංචි පරීක්ෂකවරියකි.

එස් ප්‍රනාන්දු මහතා

ස්වාධීන නොවන / විධායක නොවන අධ්‍යක්ෂ

සමන් ප්‍රනාන්දු මහතා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරියෙකි. 1991 වසරේ ශ්‍රී ලංකා පරිපාලන සේවයට එක් වූ ඔහු වසර 25කට අධික රාජ්‍ය සේවයේ පළපුරුද්ද ඇති අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු ගණනාවක විධායක මට්ටමේ විවිධ තනතුරු හොබවා ඇත. ඔහුගේ සේවා කාලය තුළ ඔහු මහා භාණ්ඩාගාරය යටතේ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ සේවය කර ඇත. ඔහු මානව සම්පත් අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස ද මුදල් අමාත්‍යාංශයේ සේවය කර ඇත.

සමන් ප්‍රනාන්දු මහතා කැලණිය විශ්වවිද්‍යාලයෙන් වාණිජවේදී උපාධිය පිළිබඳ ප්‍රථම උපාධිය ලබා ඇත. ඔහු විවෘත විශ්වවිද්‍යාලයෙන් නීති උපාධියක්ද ලබා ඇත. 2003 දී ඔහු නීතිඥයෙකු ලෙස දිවුරුම් දුන්නේය. ඔහු කොළඹ විශ්වවිද්‍යාලයෙන් මූල්‍ය ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය සහ SLIIT වෙතින් තොරතුරු කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව ලබා ඇත.

ආචාර්ය. නිර්මාල් ද සිල්වා

ස්වාධීන / විධායක නොවන අධ්‍යක්ෂ

ආචාර්ය නිර්මාල් ද සිල්වා මහතා බහුජාතික සහ Fortune 500 සමාගම් ගණනාවකට නායකත්වය සපයා ඇති ලොව පුරා දශක දෙකකට ආසන්න C මට්ටමේ අත්දැකීම් ඇති සම්මානලාභී ව්‍යාපාරික වෘත්තිකයෙක් සහ ව්‍යවසායකයෙකි. පසුගිය වසර කිහිපය තුළ ඔහුගේ අවධානය යොමු වී ඇත්තේ නිශ්චල දේපල කර්මාන්තය, උපාය මාර්ග උපදේශනය සහ ආරම්භක ව්‍යාපාර කෙරෙහි ය.

ආචාර්ය ද සිල්වා දැනට පැරමවුන්ට් රියල්ටි හි සම-සමාරම්භක කර්තෘ / ප්‍රධාන විධායක නිලධාරී ලෙස සේවය කරයි. ඔහු TYNA උපදේශන ආයතනයේ නිර්මාතෘවරයා වන අතර එය උපාය මාර්ග, නායකත්වය, බලපෑම් ආයෝජනය, උපාය මාර්ගික සැලසුම් සහ පරිවර්තන මැදිහත්වීම් (විශේෂයෙන් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා) සහ සමාජ ව්‍යවසායන් කෙරෙහි අවධානය යොමු කරන උපදේශන ආයතනයක් වේ. ඊට අමතරව ආචාර්ය ද සිල්වා කෘෂිකර්මය, ආහාර පාන, තාක්ෂණය, හස්ත කර්මාන්ත, අධ්‍යාපනය, ඉගෙනීම සහ සංවර්ධනය, පහසුකම් කළමනාකරණය, කළඹ ආයෝජනය, වෘත්තීය සේවා, ඩිජිටල් විනෝදාස්වාදය, පාරිභෝගික භාණ්ඩ සහ ජීවන රථා සේවා වැනි විවිධ කර්මාන්තවල සමාගම් ගණනාවක අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙක් ලෙසද කටයුතු කරයි.

ඔහු ගෞරවනීය චින්තන නායකයෙකු පමණක් නොව, ඔහු බොහෝ සෙයින් බොහෝ දෙනෙකු විසින් අපේක්ෂා කරන ව්‍යාපාරික මගපෙන්වන්නෙකු, බලපෑම් ආයෝජකයෙකු දක්ෂ කථිකයෙක්ද වේ. ඔහු මේ රට තුළ ආරම්භක ව්‍යාපාර සහ සමාජ ව්‍යවසාය පරිසර පද්ධතිය හැඩගැස්වීමෙහිලා ඉතා වැදගත් ආභාසයක් ලබා දුන් වෘත්තිකයෙකුද වේ.

ශාස්ත්‍රීය අංශයන් සම්බන්ධයෙන් ගත් කල, ආචාර්ය ද සිල්වා දේශීය හා ජාත්‍යන්තර විශ්ව විද්‍යාල ගණනාවක ආචාර්ය උපාධි වැඩසටහන් සඳහා සහකාර මහාචාර්යවරයෙක්, ආරාධිත කථිකාචාර්යවරයෙක් සහ ආචාර්ය උපාධි නිබන්ධන අධීක්ෂකවරයෙක් ලෙසද සේවය ලබා දෙයි.

ආචාර්ය ද සිල්වා මහතා සතු සුදුසුකම් පහත දක්වා ඇත.

- ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ආචාර්ය උපාධිය (මානව සම්පත් කළමණාකරණය පිළිබඳ විශේෂ)
- ව්‍යාපාර පරිපාලන පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (ඕස්ට්‍රේලියාව)
- ව්‍යාපාර පරිපාලනවේදී උපාධිය (ඕස්ට්‍රේලියාව)
- සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී (ඕස්ට්‍රේලියාව)
- අලෙවිකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (CIM-UK)
- ප්‍රධාන ව්‍යාපෘති කළමනාකරු (ඇමරිකා එක්සත් ජනපදය)
- ව්‍යාපාර විධායකයින්ගේ සාමාජික සංගමයයේ සමසාමාජික (එක්සත් රාජධානිය)
- ඇමරිකානු සංගමයේ ව්‍යාපෘති කළමනාකරණයේ සමසාමාජික (ඇමරිකා එක්සත් ජනපදය)
- වරලත් වෘත්තීය කළමනාකරුවන්ගේ ආයතනයේ සමසාමාජික (ශ්‍රී ලංකාව)
- ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනයයේ යාවජීව සාමාජික (SLIM)

අධ්‍යක්ෂක මණ්ඩලය

ජී ඒ ජයශාන්ත මහතා

ස්වාධීන / විධායක නොවන අධ්‍යක්ෂ

ජයශාන්ත මහතා වසර 24කට අධික බැංකු සේවා කාලයක් සම්පූර්ණ කර ඇති අතර ඔහුගේ වෘත්තීය ජීවිතයේ මුල් භාගයේ ශාඛා බැංකුකරණයේ නිරත වූ අතර පසුව භාණ්ඩාගාරය, ගනුදෙනු සහ ප්‍රාථමික අලෙවි නියෝජිත ඒකකය (PDU), වත්කම් සහ වගකීම් කළමනාකරණ ඒකකය (ALM), අවදානම් කළමනාකරණය, ආයතනික ප්‍රතිසාධනය, අක්වෙරළ බැංකුකරණය සහ ශාඛා මෙහෙයුම් පිළිබඳ විශේෂඥයෙකු විය.

ඔහු 1994 දී ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් පළමු පන්තියේ ව්‍යාපාර පරිපාලන පිළිබඳ ශාස්ත්‍රපති (විශේෂ) උපාධිය ලබා ගත්තේය. ඔහු කොළඹ විශ්වවිද්‍යාලයේ මූල්‍ය ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ලබා ඇති අතර ණය කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාවක් ද ලබා ඇත. ඔහු ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ සාමාජිකයෙකි.

ජයශාන්ත මහතා විවිධ කළමනාකරණ කමිටු සහ අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටුවල සාමාජික/නිරීක්ෂකයෙකු ලෙස කටයුතු කරන අතර ප්‍රතිපත්තිමය කරුණු/ උපාය මාර්ගික තීරණ පිළිබඳ අත්දැකීම් බෙදා ගනී.

ජයශාන්ත මහතා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ආයතනික ප්‍රතිසාධන), (අවදානම් කළමනාකරණය), (බස්නාහිර පළාත - දකුණ) සහ (අක්වෙරළ බැංකුකරණය) සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සිල්ලර බැංකු පරාසය - II) යන තනතුරු දරමින් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී/ ප්‍රධාන අවදානම් නිලධාරී ලෙස වැඩ භාර ගැනීමට පෙර කටයුතු කළේය.

ජයශාන්ත මහතා මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා සහ ෆිනෑන්ස් පීවිල්සී, ලංකා බැංකු දේපළ සංවර්ධනය සහ කළමණාකරන පෞද්ගලික ආයතනය සහ , Ceybank Asset Management Limited හි අධ්‍යක්ෂවරයෙකු ලෙස කටයුතු කරයි. ඔහු ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ පාලක මණ්ඩලයේ විකල්ප අධ්‍යක්ෂවරයෙක් ද වේ.

මහාචාර්ය එච්.එම්.ඩබ්ලිව්. ආරියරත්න හේරත්

ස්වාධීන / විධායක නොවන අධ්‍යක්ෂ

මහාචාර්ය එච්.එම්.ඩබ්ලිව්. ආරියරත්න හේරත් පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී විශේෂ උපාධියක් ද, පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් ආර්ථික විද්‍යාව පිළිබඳ දර්ශනපති උපාධියක් ද, නෝර්වීජියානු ජීව විද්‍යා විශ්වවිද්‍යාලයෙන් සංවර්ධන හා සම්පත් ආර්ථික විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධියක් ද, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනයෙන් ආචාර්ය උපාධියක් ද ලබා ඇත. ඔහු ප්‍රමුඛ පෙළේ ශාස්ත්‍රාලිකයෙකු වන අතර සංවර්ධන ආර්ථික විද්‍යාව, මුදල් සහ බැංකුකරණය, ව්‍යාපෘති විශ්ලේෂණය, ක්ෂුද්‍ර මූල්‍ය සහ දරිද්‍රතා විශ්ලේෂණය යන ක්ෂේත්‍රවල පර්යේෂකයෙකි.

ඔහු වසර 27ක් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කථිකාචාර්ය, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සහ මහාචාර්ය තනතුරුවල සේවය කර ඇත. මෙම කාලය තුළ ඔහු අධ්‍යක්ෂ (අධ්‍යයන හා සංවර්ධන) ලෙස පොල්ගොල්ල ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ (NICD) සහ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙකු ලෙස පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානයේ ද සේවය කර ඇත. දැනට ඔහු පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යා හා සංඛ්‍යාන දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා ලෙස කටයුතු කරයි.

මහාචාර්ය එච්.එම්.ඩබ්ලිව්. ආරියරත්න හේරත් උපදේශකයෙකු ලෙස සේවය කර ඇති අතර Pathfinder Foundation Colombo ; Plan international Sri Lanka : IFAD සහ තැපැල්, විදුලි සංදේශ සහ උඩරට සංවර්ධන අමාත්‍යාංශය; උතුරු මැද පළාත් සභාව; මාර්ග සංවර්ධන අධිකාරිය, UNDP, නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ සහ නවෝත්පාදන රාජ්‍ය අමාත්‍යාංශය, සහ මධ්‍යම පළාත් සභාව වැනි ජාතික සහ ජාත්‍යන්තර ආයතන රැසක් සඳහා වාර්ථා සම්පාදනය කර තිබේ.

ඔහු විවිධ ක්ෂේත්‍රවල විද්වත් කෘති කිහිපයක් ප්‍රකාශයට පත් කර ඇත. මූලධර්ම සහ ව්‍යාපෘති සැලසුම් කිරීම සහ ඇගයීම, ක්ෂුද්‍ර මූල්‍යකරණය: න්‍යාය සහ භාවිතය, ශ්‍රී ලංකාවේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය ප්‍රතිචාර දක්වන අයවැය ක්‍රියාවලිය ඒ අතර පොත් කිහිපයකි. ඔහු විවිධ ජාතික හා ජාත්‍යන්තර විනිසුරු සඟරාවල පර්යේෂණ ලිපි රාශියක් ද පළ කර ඇත.

ලලිත් අබේසිරිවර්ධන මහතා

ස්වාධීන/විධායක නොවන අධ්‍යක්ෂ

ලලිත් අබේසිරිවර්ධන මහතා 2020.01.03 දින අධ්‍යක්ෂ මණ්ඩලයට ස්වාධීන/විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් කරන ලදී. අබේසිරිවර්ධන මහතා 1996 වසරේ සිට වෘත්තියෙන් නීතීඥවරයෙකි. ඔහු කොළඹ විශ්වවිද්‍යාලයෙන් නීතිවේදී උපාධිය (LLB) ද ලබා ඇත.

දැනට අබේසිරිවර්ධන මහතා ලීඩ් බිස්නස් ඩිවලොප්මන්ට් ඇන්ඩ් මැනේජ්මන්ට් සමාගමෙහි, ලීඩ් ඇ(ර්)බන් ෆුඩිස් සමාගමෙහි සහ ලීඩ් හාඩ්වෙයාර් ඇන්ඩ් කන්ස්ට්‍රක්ෂන් සමාගමෙහි, වෙරෝසෝ හෝල්ඩිංග්ස් සමාගමේ, ස්පෙයාර් බිස්නස් ඩිවලප්මන්ට් ඇන්ඩ් මැනේජ්මන්ට් සමාගමෙහි අධ්‍යක්ෂ තනතුර දරයි.

හිරන්ති කරුණාරත්න මහත්මිය

ස්වාධීන/විධායක නොවන අධ්‍යක්ෂ

1985 ඔක්තෝම්බර් මාසයේ සිට ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතීඥවරයෙකු ලෙස වසර 36කට වැඩි කාලයක් නීතිමය ආභාසයක් (දේශීය සහ ජාත්‍යන්තර) ලබා ඇත.

සැම්බියා ජනරජයේ මහජන නඩු පැවරීමේ අධ්‍යක්ෂවරයාට අනුයුක්ත රාජ්‍ය නීතීඥයෙකු ලෙස සේවය කර ඇති අතර කෙන්යා ජනරජයේ නීතිපති දෙපාර්තමේන්තුවේ (සිවිල් දෙපාර්තමේන්තුව) ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නීතීඥවරයෙකු ලෙස සේවය කර ඇත.

2003 සිට 2014 දක්වා Pan Asia Banking Corporation PLC (කුරුණෑගල කලාපය) හි බැංකුවේ නීතිඥ මණ්ඩලයේ සේවය කර ඇත.

කොමර්ෂල් බැංකුවේ සහ ලංකා බැංකුවේ නීතිඥ මණ්ඩලයේ සේවය කර ඇත. (කුරුණෑගල කලාපය - 2003 සිට 2014, මහනුවර කලාපය - 2014 සිට 2020 දක්වා සහ කොළඹ කලාපය - 2020 සිට)

සම්පූර්ණ ලිඛිත ලේඛන සමාලෝචනය කිරීම, නිගමන උකහා ගැනීම සහ නීතිමය බලධාරීන් අතර සම්බන්ධතා ඇති කර ගැනීමෙහි දක්ෂතාවය දක්වයි.

තාර්කික තර්කයට ප්‍රමුඛත්වය ලබා දෙමින් ගැටළු විසඳීමට ඉතා දක්ෂ වන අතර සංකීර්ණ නීතිමය ලියකියවිලි පර්යේෂණ කිරීම සහ විශ්ලේෂණය කිරීම සහ සියලු වර්ගවල නෛතික ලේඛන සකස් කිරීමේ කාර්යය සිදු කරන අතරම ප්‍රකාශ කිරීම සම්බන්ධ කාර්යයන්හි අති දක්ෂතා දක්වයි.

ණය ගැනීම්වලට එරෙහිව සුරක්ෂිතභාවයක් ලෙස ඉදිරිපත් කරන ලද දේපල සඳහා හිමිකම් පරීක්ෂා කිරීම සහ බැංකු වෙත උනන්දුවක් දක්වන කරුණු පිළිබඳ අදහස් ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් මූලික වශයෙන් සහාය විය. සේවාදායකයින් සමඟ අන්තර් ක්‍රියා කිරීමේදී ඉහළම මට්ටමේ වෘත්තීයභාවයක් සහතික කරන අතරම, වෘත්තිය හා සම්බන්ධ වැඩ ආචාර ධර්ම පිළිබඳ උසස් පරමාදර්ශයන් පවත්වා ගැනීම සහ භාර දී ඇති කාර්යය සඳහා දැඩි කැපවීමකින් කටයුතු කරයි.

ආයතනික කළමනාකරණ කණ්ඩායම



ඒ.එච්.එම්.එම්.බී. ජයසිංහ මහතා

සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී

ජයසිංහ මහතා 1986 දී ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යායාලයෙන් ව්‍යාපාර පරිපාලන පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය ලබා ගත්තේය. ඔහු ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයෙන් බැංකු කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි විධායක ඩිප්ලෝමාව, වයඹ විශ්ව විද්‍යාලයෙන් කළමනාකරණ පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව, NIBM උසස් අධ්‍යාපන ආයතනයෙන් ප්‍රාදේශීය සංවර්ධන පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව ලබා ඇත. ඔහු EIPEL කැම්පස් සහ කාම්බෝජයේ IIC විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ද ලබා ඇත.

උපාධිය ලැබීමෙන් පසු 1987 දී ප්‍රාදේශීය සංවර්ධන බැංකුවට බැඳුණු ඔහු ශාඛා කළමනාකරු, කලාප කළමනාකරු, දිස්ත්‍රික් කළමනාකරු, ප්‍රධාන කළමනාකරු, සහකාර සාමාන්‍යාධිකාරී සහ ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරී යන මට්ටම්වල සේවය කළේය. ඒ.එච්.එම්.එම්.බී. ජයසිංහ මහතා බැංකු ක්ෂේත්‍රයේ වසර 33කට වැඩි පළපුරුද්දක් ඇත්තෙකි.



වී ජයසිංහ මහතා.

ප්‍රධාන තොරතුරු නිලධාරී

වසර 22 කට වැඩි පළපුරුද්දක් ඇති තොරතුරු තාක්ෂණ වෘත්තිකයෙකු වන ජයසිංහ මහතා 2011 ජූනි මාසයේදී ප්‍රාදේශීය සංවර්ධන බැංකුවට සම්බන්ධ විය. ඔහු මොරටුව විශ්ව විද්‍යාලයෙන් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධියක් ලබා ඇත. තායිලන්තයේ ආසියානු තාක්ෂණ ආයතනයෙන් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය සහ ඇමරිකා එක්සත් ජනපදයේ හවායි විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ද ලබා ඇත. උපාධිය ලැබීමෙන් පසු ඔහු IBM ලෝක වෙළඳ සංස්ථාවේ මෘදුකාංග ඉංජිනේරුවෙකු ලෙස සිය වෘත්තීය ජීවිතය ආරම්භ කළේය. ඔහුට මූල්‍ය සේවා සහ බැංකු කර්මාන්තයේ කළමනාකරණ තනතුරුවල වසර දහඅටකට වඩා වැඩි සේවා පළපුරුද්දක් තිබේ. බ්‍රිතාන්‍ය පරිගණක සංගමයේ සහතිකලත් තොරතුරු තාක්ෂණ වෘත්තිකයෙකු (CITP) සහ ඇමරිකා එක්සත් ජනපදයේ ව්‍යාපෘති කළමනාකරණ ආයතනයේ සහතිකලත් ව්‍යාපෘති කළමනාකරණ වෘත්තිකයෙකු වන ජයසිංහ මහතා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ වරලත් ඉංජිනේරුවරයෙකි.



පී.එස්. එදිරිසූරිය මහතා.

ප්‍රධාන මූල්‍ය නිලධාරී

එදිරිසූරිය මහතා 1992 දී ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විශේෂ උපාධියක් ලබා ඇත. ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සාමාජිකයෙකු වන අතර කොළඹ විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධියක් ද ලබා ඇත. එදිරිසූරිය මහතා අර්නස්ට් ඇන්ඩ් යං - කොළඹ, ජාතික සංවර්ධන බැංකුව සහ සෙලාන් බැංකුව ඇතුළු ප්‍රමුඛ පෙළේ ආයතනවල විගණන, ගිණුම්කරණය, බදුකරණය, කළමනාකරණ උපදේශනය සහ බැංකු හා මූල්‍යය යන ක්ෂේත්‍රවල වසර 31 කට අධික පළපුරුද්දක් ලබා ඇත.

ඔහු 2017 ජනවාරි මාසයේදී ප්‍රාදේශීය සංවර්ධන බැංකුවෙහි ප්‍රධාන මූල්‍ය නිලධාරී ලෙස පත්වීමට පෙර ඔහු ලංකාපුත්‍ර සංවර්ධන බැංකුවේ ප්‍රධාන මූල්‍ය නිලධාරී, අනුකූලතා නිලධාරී සහ වැඩබලන සාමාන්‍යාධිකාරී / ප්‍රධාන විධායක නිලධාරී තනතුරු හොබවා ඇත.



සී.එල්. පිහිල්ලන්ද මහතා.

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මෙහෙයුම් සහ බැංකු සහය සේවා

පිහිලන්ද මහතා කැලණිය විශ්ව විද්‍යාලයේ වාණිජ වේදී උපාධිය සාර්ථකව නිම කර ඇත. ඔහු පේරාදෙණිය විශ්ව විද්‍යායාලයේ කළමනාකරණ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව ලබා ඇත. එසේම ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයෙන් අන්තර් මාධ්‍ය විභාගය සමත් විය.

ඔහු බැංකුවට (මීට පෙර මහනුවර ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුව/ RRDB) කළමනාකරුවකු ලෙස සම්බන්ධ විය. සිය බැංකු ජීවිතය තුළ ශාඛා කළමනාකරුවකු, ප්‍රධාන කළමනාකරුවකු සහ සහකාර සාමාන්‍යාධිකාරිවරයකු ලෙසත් සබරගමුව සහ දකුණු පළාත්වල ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරිවරයකු ලෙසත් කළමනාකරණ මට්ටමේ පුළුල් අත්දැකීම් රාශියක් ලබා ඇත. ඔහු බැංකු ක්ෂේත්‍රයේ වසර 33 කට වැඩි පළපුරුද්දක් ලබා ඇත.



ඩී.එම්.ටී.එස්. කුමාර මහතා.

අංශ ප්‍රධානි - අයකරගැනීම්

කුමාර මහතාට බැංකු ක්ෂේත්‍රයේ වසර 30 කට වැඩි පළපුරුද්දක් ඇත. 1991 වර්ෂයේ දී බැංකුවට (මීට පෙර පොළොන්නරුව ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුව/ RRDB) බැඳුණු ඔහු බැංකු සහකාර, කළමනාකරු, ජ්‍යෙෂ්ඨ කළමනාකරු, ප්‍රධාන කළමනාකරු, සහකාර සාමාන්‍යාධිකාරී සහ උඹව සහ වයඹ පළාත්වල ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරීවරයෙකු ලෙස ද කටයුතු කළේය. ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් විද්‍යාවේදී (ව්‍යාපාර පරිපාලනය) විශේෂ උපාධිය සාර්ථකව සම්පූර්ණ කර ඇත. ඔහු කැලණිය විශ්ව විද්‍යාලයෙන් ශාස්ත්‍රපති උපාධිය ලබා ඇත. එසේම ඔහු ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයෙන් අන්තර්මාධ්‍ය විභාගය ද සමත් වී ඇත.



ඒ.එච්.එම්.ජී. අබේරත්න මහතා

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී ණය සහ විශේෂ ව්‍යාපෘති සහ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම

ඒ.එච්.එම්.පී. අබේරත්න මහතා 1986 දී කැලණිය විශ්වවිද්‍යාලයෙන් විශේෂ වාණිජ උපාධියක් ලබා ඇත. ඔහු 2016 වසරේ වයඹ විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය සාර්ථකව නිම කර ඇත.

1987 දී ඔහු ප්‍රාදේශීය සංවර්ධන බැංකුවට බැඳුණු අතර උතුරු මැද සහ සබරගමුව පළාත්වල ශාඛා කළමනාකරු, ප්‍රධාන කළමනාකරු, සහකාර සාමාන්‍යාධිකාරී සහ ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරී යන මට්ටම්වල සේවය කර ඇත. ඔහුට බැංකු ක්ෂේත්‍රයේ වසර 33කට වැඩි පළපුරුද්දක් ඇත.



ඩී.කේ.එස්. සේරසිංහ මහතා.

ප්‍රධාන මානව සම්පත් නිලධාරී

1999 වසරේ සිට මානව සම්පත් ක්ෂේත්‍රයේ වසර 20 කට අධික පළපුරුද්දක් ඇති ක්‍රිෂාන්ත සංජීව සේරසිංහ මහතා 2021 ජනවාරි මාසයේදී ප්‍රාදේශීය සංවර්ධන බැංකුවට සම්බන්ධ විය. ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් මානව සම්පත් කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධියක් ද එම විශ්වවිද්‍යාලයෙන් කළමනාකරණ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ද ලබා ඇත.ජපානයේ ටෝකියෝ නුවර දී සමස්ත තත්ව කළමනාකරණය තුළින් මානව සම්පත් කළමනාකරණය පිළිබඳ අධිසාමාජිකත්ව වැඩසටහන් පාඨමාලාවද සාර්ථකව අවසන් කර ඇත. ක්‍රිෂාන්ත මහතා සිය වෘත්තීය ජීවිතය ආරම්භ කළේ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතනවල ආයතනික සහ මධ්‍යම කළමනාකරණ තනතුරු වලිනි. 2014/2015 වසරවල ඔහු ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී- මානව සම්පත් සංවර්ධන ලෙස කටයුතු කර ඇත.



ඊ.ඒ.ඩී.ජේ. ප්‍රියශාන්ත මහතා.

ප්‍රධාන අභ්‍යන්තර විගණක

ප්‍රියශාන්ත මහතා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ අධි සාමාජිකයෙකු සහ ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ අධිසාමාජිකයෙකු සහ ඕස්ට්‍රේලියාවේ සහතික ලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ සහතිකලත් සාමාජිකයෙකු වන අතර දෙවන පෙළ ඉහළ අංශයක් සහිත බී.කොම් විශේෂ උපාධියක් ලබා ඇත. ඔහු 2022 ජුනි 27 වන දින සිට ප්‍රාදේශීය සංවර්ධන බැංකුවට සම්බන්ධ විය.මහජන බැංකුවේ සහ රාජ්‍ය අංශයේ ආයතනවල බැංකු මූල්‍ය සහ විගණනය පිළිබඳ වසර 30කට වැඩි පළපුරුද්දක් ඔහු සතුය.

ජ්‍යෙෂ්ඨ සහකාර සාමාන්‍යාධිකාරී / ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරී

ජ්‍යෙෂ්ඨ සහකාර සාමාන්‍යාධිකාරීවරු



1. ජී.එස්.ඩී. ද සිල්වා මහතා

ජ්‍යෙෂ්ඨ සහකාර සාමාන්‍යාධිකාරී - ණය පරිපාලනය

- ව්‍යාපාර පරිපාලන පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධිය - ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරීවරු



1. කේ.පී. දහනායක මහතා

ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරී - උතුරු මැද පළාත

- වාණිජවේදී (විශේෂ) උපාධිය - රුහුණු විශ්වවිද්‍යාලය
- කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව - රජරට විශ්වවිද්‍යාලය



2.. වේරගොඩ සී.එස් මහත්මිය

ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරී - සබරගමුව පළාත

- ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධිය - ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය



3. ආර්.එම්.ආර්. රන්දෙණිය මහතා

ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරී - නැගෙනහිර පළාත

ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරී - මධ්‍යම පළාත

- ශාස්ත්‍රවේදී උපාධිය - පේරාදෙණිය විශ්වවිද්‍යාලය
- බැංකුකරණය සහ මූල්‍යකරණය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව - ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය



4. කේ. ආරියතිලක මහතා

වැඩ බලන ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරී - දකුණු පළාත

- මානව සම්පත් සංවර්ධනය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව - ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ ජාතික ආයතනය



6. ඩබ්ලිව්.එම්.ඩී.එස්. වික්‍රමසිංහ මහතා

ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරී - උඟව පළාත (2021.11.10 දක්වා)

- වාණිජවේදී (විශේෂ) උපාධිය - රුහුණු විශ්වවිද්‍යාලය
- ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව - කොළඹ විශ්වවිද්‍යාලය
- බැංකුකරණයේ අවදානම් කළමනාකරණය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව - ස්වීඩනය



8. එම්.එම්.එස්. ආනන්ද මහතා

වැඩබලන ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරී - බස්නාහිර පළාත

- ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය



5. බී.ආර්.ඩී. පුෂ්පකුමාරි මහත්මිය

වැ.බ. ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරී - වයඹ පළාත

- වාණිජවේදී (විශේෂ) උපාධිය - කැලණිය විශ්වවිද්‍යාලය



7. බී.ජී.ඩබ්ලිව්.ඒ. කුමාර මහතා

වැ.බ ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරී - නැගෙනහිර පළාත

ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරී - උඟව පළාත (රාජකාරී ආවරණය) (2021.11.10 සිට)

- රාජ්‍ය පරිපාලනය පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධිය - ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

සහකාර සාමාන්‍යාධිකාරී/ අංශ ප්‍රධානීන්

සහකාර සාමාන්‍යාධිකාරිවරු



1. ඩී.එස්.පී.සී. හඳුන්නේවා

සහකාර සාමාන්‍යාධිකාරී - අලෙවිකරණය, පර්යේෂණ සහ නිෂ්පාදන සංවර්ධනය

- ක්ෂුද්‍ර මූල්‍ය පිළිබඳ ඩිප්ලෝමාව - ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය
- CBF - ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය



2. ඩබ්ලිව්.වී.ඊ.ජී. වරකාගොඩ මහතා

සහකාර සාමාන්‍යාධිකාරී - භාණ්ඩාගාරය (2021.08.24 දක්වා)

- ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධිය - ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
- අන්තර්මධ්‍ය විභාගය - ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය



3. පී.ඒස්.ටී. රණතුංග මහතා

සහකාර සාමාන්‍යාධිකාරී - මධ්‍යම පළාත

- ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධිය - කොළඹ විශ්වවිද්‍යාලය



4.කේ.සී.ඩී. ධර්මප්‍රිය මහතා

සහකාර සාමාන්‍යාධිකාරී - උතුරු මැද පළාත

- ශාස්ත්‍රවේදී උපාධිය - පේරාදෙණිය විශ්වවිද්‍යාලය
- ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ජ්‍යෙෂ්ඨ ආශ්‍රිත සාමාජික



5. පී. එම්. බී. සී. සිල්වා මහතා

සහකාර සාමාන්‍යාධිකාරී - පරිපාලනය

- වාණිජවේදී උපාධිය - ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
- ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය
- ව්‍යාපාර කළමනාකරණ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව -ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය
- ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය - ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය
- ක්ෂුද්‍ර මූල්‍ය සහතිකපත්‍ර පාඨමාලාව



6. පී.එම්.එස්. වික්‍රමරත්න මහතා

සහකාර සාමාන්‍යාධිකාරී - අයකර ගැනීම්

- වාණිජවේදී (විශේෂ) උපාධිය - කොළඹ විශ්වවිද්‍යාලය
- අන්තර් මධ්‍ය විභාගය - ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය
- CBF - ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය
- MAAT



7.එම්.ඒ. ඥානරත්න මහතා

සහකාර සාමාන්‍යාධිකාරී - සබරගමුව පළාත

- රාජ්‍ය පරිපාලනය (විශේෂ) උපාධිය - ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය



8. කේ.බී. විජේරත්න මහතා

සහකාර සාමාන්‍යාධිකාරී - මූල්‍ය

- ව්‍යාපාර කළමනාකරණ පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධිය - රජරට විශ්වවිද්‍යාලය
- අන්තර්මාධ්‍ය විභාගය - ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය
- DABF - ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය



9. ඩබ්ලිව්.එම්.එස්. විජේතුංග මහතා

සහකාර සාමාන්‍යාධිකාරී - තොරතුරු තාක්ෂණය

- ව්‍යවහාරික විද්‍යා පිළිබඳ විද්‍යාවේදී උපාධිය - ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය
- තොරතුරු තාක්ෂණය පිළිබඳ විද්‍යාපති උපාධිය - කොළඹ විශ්වවිද්‍යාලය
- තොරතුරු තාක්ෂණ විශේෂඥතාව සහිතව ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය - සික්කිනි මැනිපල් විශ්ව විද්‍යාලය
- බැංකු කළමනාකරණය පිළිබඳ PGEX ඩිප්ලෝමාව - ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය



10. ඩබ්ලිව්.පී.එම්.කේ.දසන්ත

සහකාර සාමාන්‍යාධිකාරී - ඉංජිනේරු

- විද්‍යාවේදී (ඉංජිනේරු ගෞරව) උපාධිය - මොරටුව විශ්වවිද්‍යාලය
- තාක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව - ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
- වරලත් ඉංජිනේරු - MIE (SL)
- අධිසාමාජික - SSE (SL)
- MBA - PIM (SJP)
- වරලත් සාමාජික - ILT (SL)



11. මේජර් ජෙනරාල් ජගත් පක්මෙවිර

ප්‍රධාන ආරක්ෂක නිලධාරි

- RSP, VSV, USP (විශ්‍රාමික)



12. ආර්.එම්.ටී. රාජපක්ෂ මහත්මිය.

අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

- නීතීඥ නීතිවේදී උපාධිය - කොළඹ විශ්ව විද්‍යාලය



13. ඩබ්ලිව්.වී.ඩී.පී. කුමුදිනි මහත්මිය

සහකාර සාමාන්‍යාධිකාරී - මානව සම්පත් සේවා සහ සංවර්ධන

- රාජ්‍ය පරිපාලනය පිළිබඳ විද්‍යාවේදී (විශේෂ)උපාධිය - ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය



14. සී.එල්.සී. මුතුබණ්ඩා මහතා

සහකාර සාමාන්‍යාධිකාරී - අභ්‍යන්තර විගණනය

- ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධිය - ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
- AIB - ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය



15. ඩබ්ලිව්.එම්.අයි.කේ. අබේරත්න මහත්මිය.

සහකාර සාමාන්‍යාධිකාරී - ප්‍රසම්පාදන

- විද්‍යාවේදී (භෞතික විද්‍යා) උපාධිය - පේරාදෙණිය විශ්වවිද්‍යාලය
- රාජ්‍ය ප්‍රසම්පාදන කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව - ශ්‍රී ලංකා පරිපාලන සංවර්ධන ආයතනය



16. පී.එච්. විජේතිලක මහතා

සහකාර සාමාන්‍යාධිකාරී - දකුණු පළාත

- විද්‍යාවේදී (රාජ්‍ය කළමනාකරණ හා තක්සේරු) උපාධිය - ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
- DBF - ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය

සහකාර සාමාන්‍යාධිකාරී/ අංශ ප්‍රධානීන්



17. එච්.එම්.පී.ඒ.ජී.යූ. බණ්ඩාර මහතා

සහකාර සාමාන්‍යාධිකාරී - උඟව පළාත

- AIB- ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය
- පශ්චාත් උපාධි ඩිප්ලෝමාව - රජරට විශ්වවිද්‍යාලය



18. ආර්.එම්.ඩී.එස්.පී. මහානාම මහතා

සහකාර සාමාන්‍යාධිකාරී - බස්නාහිර පළාත

- පශ්චාත් උපාධි ඩිප්ලෝමාව - පේරාදෙණිය විශ්වවිද්‍යාලය
- AIB- ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය
- ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනයේ ආශ්‍රිත සාමාජික



19. පී.බී.එම්.ඊ.කේ.විජේරත්න මහත්මිය.

සහකාර සාමාන්‍යාධිකාරී - අනුකූලතා

- ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධිය - පේරාදෙණිය විශ්වවිද්‍යාලය
- CBF - ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය



20. එච්.එම්.එන්.එම්. හේරත් මහත්මිය

සහකාර සාමාන්‍යාධිකාරී -අවදානම් කළමනාකරණය

- ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධිය - ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
- ව්‍යාපාර පරිපාලන පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය - වයඹ විශ්වවිද්‍යාලය.
- ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජික
- AIB- ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය
- සාමාජික - CMA ශ්‍රී ලංකා



21. ඒ.එස්.කේ.බී. රත්නායක මහතා

සහකාර සාමාන්‍යාධිකාරී - විශේෂ ව්‍යාෘති සහ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම්

- විද්‍යාවේදී - MIS - අයර්ලන්ත විශ්වවිද්‍යාලය
- ව්‍යාපාර පරිපාලන පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය - ලීඩ්ස් මෙට්රොපොලිෂන් විශ්ව විද්‍යාලය.
- ආචාර්ය උපාධිය - ඇල්ඩර්ස්ගේට් කොලෙජ්



22 එම්.ඒ තොටදෙණිය මහතා

සහකාර සාමාන්‍යාධිකාරී - ණය

- ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධිය - පේරාදෙණිය විශ්වවිද්‍යාලය



සහකාර සාමාන්‍යාධිකාරී - වයඹ පළාත

- ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධිය - පේරාදෙණිය විශ්වවිද්‍යාලය

23. ඒ.ඒ.පේ.අමරසිංහ මහතා



ප්‍රධාන නීති නිලධාරී (2022 මාර්තු 2 දක්වා)

- නීතිඥ

25 පී.එන්.ඒකනායක මහත්මිය



සහකාර සාමාන්‍යාධිකාරී -නීති (2022 මාර්තු 3 සිට)

- කම්කරු අධ්‍යයනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව - කොළඹ විශ්වවිද්‍යාලය
- විද්‍යාපති - මොරටුව විශ්වවිද්‍යාලය
- නීතිවේදී උපාධිය (LLB)
- නීතිඥ

24. ඒ.ආර්.ආර්. ප්‍රියසේකර මහත්මිය.

කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණය



34 මූල්‍ය සමාලෝචනය
37 පාරිභෝගික සහ සබඳතා සමාලෝචනය
40 තොරතුරු තාක්ෂණ සමාලෝචනය
42 අලෙවිකරණ සමාලෝචනය
50 සමාජ සහ පාරිසරික සමාලෝචනය
51 සේවක සමාලෝචනය
53 විශේෂ සිදුවීම්
58 අවදානම් කළමනාකරණය



මූල්‍ය සමාලෝචනය

සංවර්ධන මූල්‍ය සඳහා කැප වූ මූල්‍ය ආයතනයක් ලෙස, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව (RDB) රටේ සමාජ හා ආර්ථික සංවර්ධන ක්‍රියාකාරකම් නංවාලීම සඳහා අඛණ්ඩව වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. බැංකුව දිවයිනේ බොහෝ සංවර්ධන වැඩසටහන්වල ඉදිරියෙන්ම සිටින අතර මූල්‍ය සැපයුම්කරුවෙකු ලෙස වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. බොහෝ මූල්‍ය ආයතන මෙම සංවේදී සහ නවීන ක්ෂේත්‍රයට සක්‍රියව සහභාගී වීමට මැලිකමක් දක්වන ආර්ථිකයේ අංශවලට සේවය කරමින් දිවයිනේ ප්‍රාදේශීය සංවර්ධනය සඳහා වූ සුවිශේෂී මූල්‍ය ආයතනයක් ලෙස ප්‍රාදේශීය සංවර්ධන බැංකුව දැන් ඉස්මතුවී ඇත. අපගේ ප්‍රධාන වත්කම වන්නේ උතුරු නැගෙනහිර ද ඇතුළුව රට පුරා විසිරී සිටින මිලියන හයකට අධික අපගේ පාරිභෝගික පදනමයි. බැංකුවේ අවධානය රටේ සහ එහි ජනතාවගේ සංවර්ධනයයි. එබැවින්, බැංකු ශාඛා 272කින් සමන්විත දිවයින පුරා පිහිටි ශාඛා ජාලය හරහා ඔවුන් සවිබල ගැන්වීමට සහ එමඟින් ජාතිය සංවර්ධනය කිරීමට බැංකුව කැපවී සිටී.

ලාභය

බැංකුවේ බදු පසු ලාභය පෙර වසරට සාපේක්ෂව 24.19% කින් අඩු වී ඇත. 2021 වර්ෂයේදී මෙහෙයුම් ලාභය රු. මිලියන 1,926 දක්වා අඩු විය. එය 2020 දී වාර්තා වූ රු. මිලියන 2,060 මෙහෙයුම් ලාභයට වඩා 6.51% ක අඩුවීමකි. බදු වලට පෙර වත්කම් මත ප්‍රතිලාභය (ROA) 0.78% ලෙස වාර්තා වී ඇති අතර එය 2020 දී 1.09% ක් විය. එසේම, බැංකුව 2021.12.31 වන විට රු. බිලියන 246 ක මුළු වත්කම් කරා ළඟා විය. එය පෙර වසරට වඩා 11.21% වර්ධනයක් වාර්තා කළේය.

අයවැයට සාපේක්ෂව ලාභය

අයිතමය	සත්‍ය ලෙස	අයවැය ගත	සාක්ෂාත් කරගැනීම
	රු. 000	රු. 000	
දළ ආදායම	24,492,769	23,578,349	3.88%
මෙහෙයුම් ලාභය	1,926,782	1,530,681	25.88%
බදුවලට පසු ලාභය	306,303	99,808	206.89%

ප්‍රාදේශීය සංවර්ධන බැංකුවෙහි කාර්තුමය මූල්‍ය කාර්ය සාධනය

ප්‍රාදේශීය සංවර්ධන බැංකුවෙහි කාර්තුමය මූල්‍ය කාර්ය සාධනය 2021 වසර තුළ සුළු වශයෙන් වර්ධනය වී ඇත.

අයිතමය	2021 - රු. 000				31-දෙසැම්බර්-2020
	31-දෙසැම්බර්	30-සැප්	30-ජූනි	31-මාර්තු	රු. 000
ශුද්ධ මෙහෙයුම් ආදායම	11,030,507	7,280,569	4,527,818	3,156,715	9,777,002
බදු වලට පෙර ලාභය	1,926,781	424,377	114,172	938,490	2,060,859
බදු වලට පසු ලාභය /(අලාභය).	306,302	(673,505)	(537,306)	298,718	404,036
ණය සහ ලැබිය යුතු දේ	189,039,666	178,117,483	174,048,448	173,257,287	167,099,049
ගනුදෙනුකරුවන්ගේ තැන්පතු	187,752,465	181,285,031	178,356,961	176,489,724	172,882,632
මුළු වත්කම්	245,889,512	236,204,470	231,052,370	230,282,792	221,109,150
කොටස් හිමියන්ගේ අරමුදල	15,393,322	14,440,812	14,577,011	15,686,263	15,114,316

ආදායම්


බැංකුවේ මුළු ආදායම රුපියල් බිලියන 24.35 සිට බිලියන 24.49 දක්වා 0.57% කින් සුළු වර්ධනයක් පෙන්නුම් කළේය. රටේ අභියෝගාත්මක ආර්ථික තත්ත්වය තුළ පවා බැංකුව සමස්ත ආදායම පසුගිය මූල්‍ය වර්ෂයට සමානව පවත්වා ගෙන ගියේය.

මුළු ආදායමේ සංයුතිය

අයිතමය	2021 රු. 000	2020 රු. 000	වෙනස
පොලී ආදායම	23,545,299	23,182,459	1.57%
ගාස්තු සහ කොමිස් ආදායම්	935,136	1,143,098	-18.19%
අනෙකුත් මෙහෙයුම් ආදායම්	12,332	28,690	-57.02%
මුළු ආදායම	24,492,767	24,354,247	0.57%


ශුද්ධ පොලී ආදායම (NII)

2021 මූල්‍ය වර්ෂයේ ශුද්ධ පොලී ආදායම 25.38% කින් වැඩි වූ අතර එය රු. මිලියන 10,888 සිට රු. මිලියන 13,652 ක වැඩි වීමකි.



ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායම්

2021 මූල්‍ය වර්ෂයේ ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායම 28.49% කින් අඩු වූ අතර එය 2020 මූල්‍ය වර්ෂයේ රු.මිලියන 871 හා සැසඳීමේ දී රු. මිලියන 623 කි.




බදු වියදම්

අයිතමය	2021 රු. 000	2020 රු. 000	වෙනස
මූල්‍ය සේවා මත වැට් බදු	1,151,277	1,047,411	9.92%
ආදායම් බදු	469,201	609,412	-23.01%
මුළු බදු වියදම	1,620,479	1,656,823	-2.19%

2021 මූල්‍ය වර්ෂය තුළදී, බැංකුව විසින් මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බදු ගෙවා ඇති අතර, එය රු. මිලියන 1,151 සහ ආදායම් බදු රු. මිලියන 469 කි. කි. බදු වශයෙන් රු. මිලියන 1,620 ක් වසර තුල ගෙවා ඇත.

වත්කම් මත ප්‍රතිලාභ (ROA)

2020 මූල්‍ය වර්ෂය සඳහා 1.09%ක් වාර්තා කර තිබියදීත්, බැංකුව 2021 මූල්‍ය වර්ෂය සඳහා 0.78%ක ROA (මෙහෙයුම් ලාභ) වාර්තා කර ඇත.




මූල්‍ය සමාලෝචනය

ස්කන්ධ මත ප්‍රතිලාභ (ROE)

2021 මූල්‍ය වර්ෂයේදී බදු වලට පසු ලාභය රුපියල් මිලියන 98 කින් අඩුවීම, පෙර වසරට සාපේක්ෂව ROE හි 2.27% සිට 1.99% දක්වා සුළු වශයෙන් අඩු වීමක් පෙන්නුම් කරයි.

කොටස් මත ප්‍රතිලාභ (ROE)




මුළු වත්කම්

බැංකුව 2021 මූල්‍ය වර්ෂය අවසානයේදී, අනුරූප වර්ෂයට වඩා මුළු වත්කම්වල 11.21% ක වර්ධනයක් වාර්තා කළේය. ඒ අනුව, මූල්‍ය වර්ෂය තුළ මුළු වත්කම් පදනම රුපියල් බිලියන 221 සිට රුපියල් බිලියන 245 දක්වා වැඩි විය.

මුළු කොටස් හිමියන්ගේ මුළු ස්කන්ධය

බැංකුවේ සම්පූර්ණ කොටස් හිමියන්ගේ මුළු ස්කන්ධය 2021 වසරේ රු. මිලියන 15,393 ක් දක්වා ඉහළ ගිය අතර 2020 වසරේදී එය රු. මිලියන 15,114 ලෙස වාර්ථා විය.


කොටස් හිමියන්ගේ ප්‍රාග්ධනය




වත්කම්වල ගුණාත්මකභාවය

බැංකුවේ අක්‍රීය ණය අනුපාතිකය (NPL) පෙර වසර අවසානයේ පැවැති 10.11%ක් සාපේක්ෂව 2021 දෙසැම්බර් 31 වන විට 8.71% දක්වා සුළු වශයෙන් පහත වැටුණි.

NPL අනුපාතය



ශ්‍රී ලංකා මහ බැංකුවේ ණය අවදානම් වර්ගීකරණය මත පදනම්ව, බැංකුවේ අක්‍රීය ණය පිළිබඳ විශ්ලේෂණයක් පහත දැක්වේ.



ද්‍රවශීලතාවය


අයිතමය	2021	2020
ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාතය (SLAR)	26.18%	29.30%

2021 වසර තුළ රටේ පැවති දැඩි අර්බුදකාරී තත්ත්වය හමුවේ වුවද බැංකුව සිය ද්‍රවශීලතා මට්ටම් නියාමන අවශ්‍යතාවලට වඩා ඉහළින් පවත්වා ගෙන ගොස් ඇත.

පාරිභෝගික සහ සම්බන්ධතා සමාලෝචනය

ණය සහ අත්තිකාරම් වර්ධනය

ණය සහ අත්තිකාරම් වර්ධනය




ණය සහ අත්තිකාරම් කළඹ විශ්ලේෂණය - කර්මාන්තය අනුව

කාණ්ඩය	2021 රුපියල් මිලියන	2020 රුපියල් මිලියන
කෘෂිකර්මය සහ ධීවර	51,315	48,067
නිෂ්පාදනය	28,605	27,926
ලීසිං	969	961
ප්‍රවාහන	78	133
ඉදිකිරීම් / නිවාස/වෙළඳ	24,484	22,716
පරිභෝජන	31,526	30,585
තැන්පතු විරෙහි / කාර්ය මණ්ඩලය / සංචාරක	52,062	36,710
එකතුව	189,040	167,099


ණය සහ අත්තිකාරම් කළඹ විශ්ලේෂණය - නිෂ්පාදනය අනුව

කාණ්ඩය	2021 රුපියල් මිලියන	2020 රුපියල් මිලියන
උකස් කිරීම	20,174	15,432
කාර්ය මණ්ඩල ණය	4,615	4,123
ලීසිං	969	961
කෙටි කාලීන	9,989	10,307
දීර්ඝ කාලීන	153,292	136,274
එකතුව	189,040	167,099

ණය සහ අත්තිකාරම් කළඹ විශ්ලේෂණය - නිෂ්පාදනය අනුව



ණය සහ අත්තිකාරම් කළඹ විශ්ලේෂණය - කර්මාන්ත අනුව



පාරිභෝගික සහ සම්බන්ධතා සමාලෝචනය


අයකර ගැනීම

2021 වසර තුළදී, බැංකුවේ විශේෂ අවධානය, 2021 වසර අවසානය වන විට මුළු ණය කළඹින් 8.71%ක් පමණ වූ අක්‍රිය ණය අනුපාතය නිසිලෙස කළමණාකරණය කිරීම කෙරෙහි යොමු කරන ලදී. එහි දී දරන ලද විශේෂ ප්‍රයත්නයන් සහ අපගේ ගනුදෙනුකරුවන් බොහෝ දෙනෙකු කෝවිඩ්-19 වසංගතය නිසා මුහුණ දුන් දුෂ්කරතා හේතුවෙන් ඉස්මතු වූ පීඩනාත්මක තත්ත්වය කළමණාකරණය කරගැනීමෙහි ප්‍රතිඵලයක් වශයෙන් ණය කළඹ ආශ්‍රිතව සුළු වර්ධනයක් අත්පත් කරගන්නා අතරම 2021 දෙසැම්බර් 31 දින වන විට අපගේ අක්‍රීය ණය අනුපාතය 8.71%ක් වශයෙන් පවත්වා ගැනීමට බැංකුව සමත් විය.

අක්‍රීය ණය කාණ්ඩය	2021 රු. මි.	2020 රු. මි.
විශේෂයෙන් සඳහන් කළ ණය	1,230	4,581
අවප්‍රමාණය	3,367	2,300
අඩමාන	2,223	1,905
බොල් ණය	9,501	7,871
මුළු අක්‍රීය ණය	16,322	16,658
අක්‍රීය ණය අනුපාතිකය(%)	8.71%	10.11%


තැන්පතු වර්ධනය

බැංකුවේ තැන්පතු පදනම රුපියල් බිලියන 187 ක් දක්වා ඉහළ ගොස් ඇති අතර මෙය ගතවූ වසරට සාපේක්ෂව 8.6% ක වර්ධනයකි. මීට බලපා ඇති ප්‍රධානතම හේතු නම් ස්ථාවර තැන්පතු 10%කින් වර්ධනය වීම සහ ඉතුරුම් තැන්පතු 8% කින් ඉහළ යාමයි.



තැන්පතු මිශ්‍රය

කාණ්ඩය	2021 රු. මි.	2020 රු. මි.
ඉතුරුම් තැන්පතු	72,159	65,669
ස්ථාවර තැන්පතු	115,593	107,213
එකතුව	187,752	172,883



ණය හා මෙහෙයුම්

ණය යනු බැංකුව තම අරමුණු සපුරාලීමේදී භාවිතා කරනු ලබන වඩාත් වැදගත්ම කාර්යය හා මෙවලම වේ. මෙම අරමුණ සාක්ෂාත් කර ගැනීමට බැංකු යොදා ගන්නා ප්‍රධානතම උපකරණය වන්නේ ණය නිසා මෙහිදී ඉතාම වැදගත් කාර්යභාරයක් ඊට හිමි වේ. කෘෂි කර්මාන්තය, කුඩා කර්මාන්ත, ධීවර කර්මාන්තය, සත්ව පාලනය, නිවාස සහ සේවා අංශ ආදී වශයෙන් වැදගත් අංශ විසින් ජාතික ආදායම කෙරෙහි සපයනු ලබන දායකත්වය ඉහළ නංවමින් එකී අංශ වර්ධනය කිරීම උදෙසා ණය යොදා ගත හැක. අප බැංකුව සම්බන්ධයෙන් අවධානයට ලක් කළ තවත් සුවිශේෂී කාර්යයක් වන්නේ ග්‍රාමීය ප්‍රදේශවල විය ඉතා පුළුල් ලෙස ව්‍යාප්ත වී තිබීමයි. මෙය 1985 වසරේදී ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුවේ මෙහෙයුම් ආරම්භ කිරීමේ සිට මේ දක්වාම නොකඩවා වර්ධනය වන තත්ත්වයකි.

මේ නිසා, ණය දීමේ මෙහෙයුම් ද ඇතුළුව බැංකුව සෑම කාර්යභාරයක දීම පාහේ අදාළ අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා උපාය මාර්ග රාශියක් ක්‍රියාත්මක කර තිබේ.සහන පොළී අනුපාත ලබා දීම, සහනදායී කාල සීමා සහිතව ණය ආපසු ගෙවීමේ සැලසුම් ආදිය හඳුන්වාදීම තුළින් අදාළ අංශ වල අවශ්‍යතා ඉටු කළ හැකි පරිදි අපගේ ණය පහසුකම්වලට අදාළ නියමයන් හා කොන්දේසි සැලසුම් කර තිබේ. මීට අමතරව ව්‍යවසායකත්ව සංවර්ධනය, පුහුණු වැඩසටහන් සහ කළමනාකරණය හා අලෙවිකරණය පිළිබඳ උපදේශන සහාය ඇතුළු ණය පහසුකම් වලට අමතර පහසුකම් ද බැංකුව විසින් ලබාදෙන ලදී. ණය ලබා දීමේදී සුරැකුම් මත රඳා පැවතීමට සිදු වීමේ ප්‍රවණතාව අවම කරගනිමින් ණය දීමේ අවධානම් අඩු කිරීමටද මෙම ණය වලට අමතරව ලබාදෙන සේවා උපකාරී වේ.

මීට අමතරව, ණය සහ අයකර ගැනීම් දෙපාර්තමේන්තුව යටතේ, බැංකුව බැංකු රක්ෂණ ඒකකය නමින් උපාය මාර්ගික ව්‍යාපාර ඒකකයක් ක්‍රියාත්මක කරයි. 2021 වර්ෂයේදී බැංකුව විසින් ප්‍රදානය කරන ලද ණයවලට අදාළ රක්ෂණ ක්‍රියාකාරකම් හරහා බැංකුව සැලකිය යුතු ගාස්තු ආදායමක් උපයා ගත්තේය.

ප්‍රතිමූල්‍ය සහ පොළී සහනාධාර ණය යෝජනා ක්‍රම

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශය වැඩිදියුණු කිරීම සඳහා ඉතා තීරණාත්මක ප්‍රතිමූල්‍යකරණ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව (CBSL), මුදල් අමාත්‍යාංශය, කෘෂිකර්ම අමාත්‍යාංශය සහ විශේෂයෙන්ම ආසියානු සංවර්ධන බැංකුව (ADB) යන ආයතන කිහිපයක් සමඟ ප්‍රතිමූල්‍යකරණ යෝජනා ක්‍රම කිහිපයක් (පහත සඳහන් කර ඇත) දියත්කර ඇත.

සෞභාග්‍යා	SMILE 111 RF	ස්වශක්ති
SMELoC ADD මූල්‍යකරණ අදියර 11,111	SEPI අදියර 11	මොරගහකන්ද
SMELoCRF	අත්වැල	CBSLSV
PAMP RF	කෘෂි ශක්ති	NCRCS
කප්රුක අයෝජන	RSPGLOC	STARR
කප්රුක ජයඉසුර	SAPP 4P Seasonal	තුරුණු දිරිය

ADB සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම

SMELOC අතිරේක මූල්‍යකරණ අදියර III සහ ප්‍රාදේශීය සංවර්ධන බැංකුව ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය (SRDBP) යන නමින් ADB සමඟ වැඩසටහන් දෙකක් සාර්ථකව ක්‍රියාත්මක කරමින් පැවතුනි.

SRDBP යටතේ, කොවිඩ් 19 වසංගතයෙන් පීඩාවට පත් වූ ව්‍යාපෘති සඳහා කොවිඩ් 19 හදිසි ප්‍රතිචාර පහසුකම, කුඩා තේ හිමියන්ගේ සංවර්ධන ව්‍යාපෘතිය සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශයේ සංවර්ධන ව්‍යාපෘතිය ලෙස කාණ්ඩ තුනක් යටතේ SMELOC අතිරේක මූල්‍යකරණ අදියර III මගින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශයේ ණය වැඩි දියුණු කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව අරමුදල් සපයයි.

RDB ලීසිං

RDB ලීසිං 2021 වසර තුල ඉතා සාර්ථකව ක්‍රියාත්මක වේ. සියලුම ශාඛා ඉතා සාර්ථක ලෙස ලීසිං කළඹ වැඩිදියුණු කිරීමේ උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම සඳහා ආක්‍රමණශීලීව සහභාගී වූ අතර, 2021.12.31 වන විට ලීසිං කළඹ රු. මිලියන 1,133 ක් ලෙස පැවතුණේය.

අයකරගැනීම්

කොවිඩ් 19 වසංගතය හේතුවෙන් බැංකුවේ අයකරගැනීම් ක්‍රියාවලිය බලාපොරොත්තු වූ පරිදි සිදු නොවිය. කෙසේ වෙතත්, වසංගත තත්වයක් යටතේ වුවද, GOSL (ශ්‍රී ලංකා රජය) සහ CBSL (ශ්‍රී ලංකා මහ බැංකුව) විසින් වසංගත තත්ත්වයන් තුළ සහ පසු, ගනුදෙනුකරුවන්ට ණය ගෙවීම් අත්හිටුවීමේ වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත. එබැවින්, NPA අනුපාතය මධ්‍යස්ථ මට්ටමකට අඩු කිරීමට බැංකුවට හැකි විය.

තොරතුරු තාක්ෂණ සමාලෝචනය

2021 වසරේ තොරතුරු තාක්ෂණ ජයග්‍රහණ

2021 වසර, තාක්ෂණික දියුණුව තුළින් පාරිභෝගික සේවා වැඩිදියුණු කිරීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ වර්ධනයන් මෙන්ම පද්ධති වැඩිදියුණු කිරීම් සම්බන්ධයෙන් යම් උපායමාර්ගික තීරණ ගැනීමේදී බැංකුවට වැදගත් වසරක් විය. 2021 වසර තුළදී, කොවිඩ්-19 වසංගත තත්ත්වය සහ අයවැය සීමාවන් හේතුවෙන් අභියෝග මධ්‍යයේ වුවද, වඩාත් තීරණාත්මක සහ අත්‍යවශ්‍ය තොරතුරු තාක්ෂණ පද්ධති පමණක් ක්‍රියාත්මක කිරීම කෙරෙහි බැංකුව තම අවධානය යොමු කළේය.

Covid 19 සීමා කිරීම් සමඟින්, පාරිභෝගික පහසුව සහ ආරක්ෂාව සහතික කිරීම සඳහා මාර්ගගත ගනුදෙනු සඳහා අවකාශය සැලසීම බැංකුවේ අරමුණයි. යෝජිත මාර්ගගත ගනුදෙනු වේදිකා සපුරාලීම සඳහා වත්මන් තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා බැංකුව සැලකිය යුතු ආයෝජනයක් කර ඇත.

මෙම වසර තුළදී, බැංකුව විසින් නව EMV චිප් පාදක ATM කාඩ්පත් 50,000කට අධික ප්‍රමාණයක් ගනුදෙනුකරුවන් වෙත නිකුත් කර ඇති අතර වසර අවසන් වන විට සමස්ත ක්‍රියාකාරී ATM කාඩ්පත් සංඛ්‍යාව 290,000 දක්වා ළඟා වී ඇත. 2021 ඔක්තෝම්බර් මාසයේදී, බැංකුව වත්මන් ATM යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමට සහ VISA ප්‍රතිතනය ලත් ඩෙබිට් කාඩ්පත් නිකුත් කිරීමට කීර්තිමත් ගෙවීම් පහසුකම් සපයන්නෙකු සමඟ ව්‍යාපෘතියක් ආරම්භ කර ඇත. මෙම මුලපිරීම සමඟින්, 2022 ජූනි මාසය වන විට ගනුදෙනුකරුවන්ට සන්නාමගත ඩෙබිට් කාඩ්පතක් නිකුත් කිරීමට සහ දැනට පවතින JCB චිප් පාදක කාඩ්පත් ඩෙබිට් කාඩ්පත් ලෙසද පවත්වාගෙන යාමට බැංකුව සැලසුම් කරයි.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දියත් කරන ලද ඩිජිටල් බැංකුකරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ වැදගත්කම සැලකිල්ලට ගනිමින්, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව 2021-2023 සඳහා ඩිජිටල් බැංකුකරණ මාර්ග සිතියමක් සකස් කිරීමට සමත් විය. මෙම මාර්ග සිතියම වැදගත් ඩිජිටල් බැංකුකරණ මුලපිරීම් හඳුනා ගැනීමට සහ කඩිනම් ඩිජිටල් නිෂ්පාදන පෙළගැසීමට බැංකුවට උපකාර කරයි.

2021 සඳහා බැංකුවේ අනෙකුත් ප්‍රධාන ඩිජිටල් මුලපිරීම වූයේ ප්‍රාදේශීය සංවර්ධන බැංකුව ගනුදෙනුකරුවන්ට QR සහ Just pay පදනම් කරගත් ගනුදෙනු පහසුකම හඳුන්වා දීමයි. බැංකුව පළමු අදියර ලෙස වෙළඳ ආයතන ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කර ඇති අතර 2021 දෙසැම්බර් මාසයේදී ප්‍රාදේශීය සංවර්ධන බැංකු පාරිභෝගිකයින්ට QR පදනම් කරගත් ගෙවීම් සේවා හඳුන්වා දී ඇත. මෙම මුලපිරීමත් සමඟ ප්‍රාදේශීය සංවර්ධන බැංකුව වෙළඳ ආයතන සඳහා ප්‍රාදේශීය සංවර්ධන බැංකුව නිකුත් කරන ලද QR කේතය ඉදිරිපත් කිරීමෙන් ඔවුන්ගේ ප්‍රාදේශීය සංවර්ධන බැංකු ගිණුමට සෘජුවම මාර්ගගත ගෙවීම් ලබා ගත හැකිය. ඩිජිටල් බැංකුකරණ ව්‍යාපෘතියේ 2 වන අදියර ලෙස Lanka clear Just pay සේවා සමඟ සම්බන්ධ වී ඇත. මෙම මුලපිරීමත් සමඟ, බැංකුවේ ගනුදෙනුකරුවන්ට ඔවුන්ගේ ප්‍රාදේශීය සංවර්ධන බැංකු ගිණුම පිළිගත් ජංගම ගෙවීම් යෙදුම්වල (ජංගම යෙදුම්) ලියාපදිංචි කිරීමට සහ කරදරයකින් තොරව මාර්ගගත ගනුදෙනු සහ බිල්පත් ගෙවීමට හැකි විය.

2021 වැඩිදියුණු කළ පාරිභෝගික සේවාවක් සැපයීම සඳහා, 2021 ජූලි මාසයේදී නව දෘඩාංග සහ දත්ත සමුදාය වැඩිදියුණු කිරීම ඇතුළුව එහි වත්මන් මූලික බැංකු පද්ධති යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමට බැංකුව සමත් විය. මෙම වැඩිදියුණු කිරීමෙන් පසු බැංකුව 2021 නොවැම්බර් මාසයේදී පළමු පූර්ණ ක්‍රියාකාරී ආපදා ප්‍රතිසාධන (DR) වැඩසටහන සම්පූර්ණ කිරීමට සමත් විය.

2021 ඔක්තෝම්බර් මාසයේදී, බැංකුව ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්පූර්ණ කර Loan Origination (LOS) සහ Collection Management (CMS) පද්ධති ක්‍රියාත්මක කිරීම සඳහා සැපයුම්කරු ලෙස XGen Group තෝරාගෙන ඇත. මෙම පද්ධති දෙක ක්‍රියාත්මක කිරීම 2022 ජූනි මාසය වන විට අවසන් කිරීමට බලාපොරොත්තු වේ. LOS ක්‍රමය ක්‍රියාත්මක කිරීමත් සමඟම, බැංකුව විසින් ණය අනුමත කිරීමේ ක්‍රියාවලියේ කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම සහ ප්‍රාදේශීය සංවර්ධන බැංකු ණය පහසුකමක් සඳහා අයදුම් කිරීමේදී වඩා හොඳ අත්දැකීමක් සමඟින් වැඩිදියුණු කළ පාරිභෝගික සේවාවක් සපයයි.

මේ හැරුණු විට, බැංකුව විසින් සිදු කරන ලද තවත් ප්‍රධාන මුලපිරීමක් වන්නේ මූලික බැංකු පද්ධතියට පොදු යෙදුම් ක්‍රමලේඛන අතුරු මුහුණතක් (API) හඳුන්වා දීමයි. මෙම API වේදිකාව IBM - ESB නිර්මිතයන් මත පදනම් වන අතර වත්මන් මූලික බැංකු පද්ධතියට නව යෙදුම් ඒකාබද්ධ කිරීම් සඳහා පහසුකම් සපයයි.

අනුකූලතා අවශ්‍යතා සාක්ෂාත් කර ගැනීම සඳහා, බැංකුව ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්පූර්ණ කර ඇති අතර 'මුදල් විශුද්ධිකරණයට විරෙහි පද්ධතිය' (AML) ක්‍රියාත්මක කිරීම සඳහා සැපයුම්කරුවෙකු ලෙස 'KPMG' ආයතනය තෝරාගෙන ඇත. ව්‍යාපෘතිය 2021 දෙසැම්බර් මාසයේදී ආරම්භ කරන ලද අතර 2022 පළමු කාර්තුවේදී අදියර තුනක් යටතේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

2021 වසර තුළදී DR මධ්‍යස්ථානය සඳහා පරිමිතිය ෆයර්වෝල්, අභ්‍යන්තර ෆයර්වෝල් සහ නව WAN රවුටරය ක්‍රියාත්මක කිරීම වැනි තොරතුරු තාක්ෂණ ජාල යටිතල පහසුකම් සම්බන්ධ සංරචක වැඩිදියුණු කිරීමට බැංකුව සමත් වී ඇත. SD WAN ජාල ව්‍යාපෘතිය, වෙබ් යෙදුම් ෆයර්වෝල් ව්‍යාපෘතිය සහ නව ඉන්ටර්කොම් සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කර ඇත. ප්‍රාදේශීය සංවර්ධන බැංකු මෙම ව්‍යාපෘති 2022 වසර තුළ නිම කිරීමට සැලසුම් කරයි.

බැංකුවේ තොරතුරු තාක්ෂණ උපාය මාර්ගයට සහ ඩිජිටල් මාර්ග සිතියමට අනුව, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව විසින් 2021 වර්ෂය තුළ ICT ව්‍යාපෘති කිහිපයක් ආරම්භ කර ඇත. තොරතුරු තාක්ෂණ ආශ්‍රිත යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති බොහොමයක් වසර තුළදී නිම කරන ලදී සමහර DigiTech ව්‍යාපෘති 2022 දී සම්පූර්ණ ක්‍රියාවට නංවනු ඇත.



සාර්ථකත්වයට
දෑත් දිගු කිරීම

ඔබ දිවයිනේ කොහේ හිටියත්, ඔබේ හැකියාවන්
හා දක්ෂතාවයන් කුමක් වුවත් අප සැම විටම
ඔබට උපකාර කරන්නෙමු.
අප ව්‍යවසායකත්වය පෝෂණය කරමින් අනාගත පරම්පරාව
සවිබල ගන්වන්නා සේම සෑම
ශ්‍රී ලාංකිකයකුටම සහයෝගය දක්වන්නෙමු.

RDB බැංකුව
දීප ව්‍යාප්ත ශාඛා ජාලය සමඟින්
පුළුල් විවිධාංගීකරණයකින් යුතු සේවාවන් සපයයි.

RDB
ප්‍රාදේශීය සංවර්ධන බැංකුව
பிரதேச அபிவிருத்தி வங்கி
Regional Development Bank

අලෙවිකරණ සමාලෝචන

නිෂ්පාදන සහ සේවා

RDB කැකුළු - බාල වයස්කාර ඉතුරුම් ගිණුම

RDB කැකුළු ගිණුම වයස අවුරුදු 14 ට අඩු ළමුන් සඳහාම සකස් කරන ලද ඉතුරුම් ගිණුමකි. මෙමගින් අපේ මාතෘභූමියේ සෑම දරුවෙකුටම දීප්තිමත් අනාගතයක් උදෙසා ප්‍රාදේශීය සංවර්ධන බැංකුව සමඟ ඉතිරි කිරීමට හැකියාව ලැබේ. ප්‍රාදේශීය සංවර්ධන බැංකු, සෑම නව ගිණුමක් සඳහාම ආකර්ෂනයක් ලෙස ඉතුරුම් කැට ලබා දෙයි. තවද, විවිධ මට්ටම්වල ගිණුම්වල ශේෂයන් සැලකිල්ලට ගනිමින් ලිපි ද්‍රව්‍ය ඇසුරුම්, පාසල් බෑග්, ශබ්දකෝෂ, තෑගි වවුචර සහ ළමා බයිසිකල් වැනි තෑගි භාණ්ඩ රැසක් පිරිනැමේ. මීට අමතරව, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව විසින් කුඩා කල සිටම ඉතිරි කිරීමේ පුරුද්ද පුරුදු වීමට ළමුන් දිරිමත් කිරීම සඳහා පාසල් ඉතුරුම් මධ්‍යස්ථාන ස්ථාපිත කරනු ලබයි. ප්‍රාදේශීය සංවර්ධන බැංකුව 5 වසර ශිෂ්‍යත්ව විභාගයෙන් හොඳම ප්‍රතිඵල ලබා ගන්නා ගිණුම් හිමියන් සඳහා ත්‍යාග පිරිනමනු ලබයි. තවද, එම විභාගයට පෙනී සිටින ගිණුම් හිමියන් සඳහා අධ්‍යාපනික සම්මන්ත්‍රණ ද සංවිධානය කෙරේ.

RDB 4TEEN PLUS

RDB 14+ ගිණුම නව යොවුන් වියේ පසුවන්නන් අතර ඉතිරි කිරීමේ පුරුදු ඇති කිරීම සඳහා වයස අවුරුදු 14 සහ ඊට වැඩි යෞවනයන් සඳහා විශේෂයෙන් නිර්මාණය කර ඇත. RDB 14+ යෞවනයන් ආකර්ෂණය කර ගත හැකි අගය එකතු කිරීම් සමඟින් ක්‍රියාත්මක වේ. ගිණුමේ ශේෂයේ වර්ධනයට සාපේක්ෂව අමතර ප්‍රසාද පොලිය සමඟ ඉහළ පොලී අනුපාතයක් RDB 14+ ගිණුම මඟින් පිරිනමනු ලැබේ. ATM කාඩ්පතක් නිකුත් කරන බැවින් වයස අවුරුදු 14 ට වැඩි දරුවන්ට තම මූල්‍ය අවශ්‍යතා සඳහා මුදල් ලබා ගැනීමට අවස්ථාව ලැබී ඇත. ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර කාඩ්පතෙන් මුදල් ආපසු ගැනීමේදී භාරකරුගේ ජංගම දුරකථනයට මුදල් ආපසු ගැනීමේ විස්තර සහිත කෙටි පණිවිඩයක් යවන බැවින් පාසල් දරුවන්ට ඔවුන්ගේ හදිසි මුදල් අවශ්‍යතා සඳහා මෙම ගිණුම භාවිතා කළ හැකිය. තරුණ ප්‍රජාවට නිවසක්, වාහනයක්, ගෘහ භාණ්ඩ, ව්‍යාපාරයක්, ඉලෙක්ට්‍රොනික උපකරණ සහ උපාංග මිලදී ගැනීම, අධ්‍යාපනික අවශ්‍යතා සඳහා සහ විදේශ සංචාර සඳහා ඔවුන්ගේ සිහින සැබෑ කර ගැනීමට ණය පහසුකම් ලබා ගත හැකිය.

RDB ලිය සවිය - කාන්තා ඉතිරි කිරීමේ ගිණුම

මෙම ගිණුම හඳුන්වා දුන්නේ ශ්‍රී ලංකාවේ දිරිය කාන්තාවන් ඉලක්ක කර ගනිමිනි. මූල්‍ය පහසුකම්වලට අමතරව ස්වයං රැකියා තුළින් රටේ ආර්ථිකයට දායක වන කාන්තාවන් සඳහා බැංකුව උපදේශක සේවා සපයයි. ගිණුමේ ඇති විශේෂ ලක්ෂණ වන්නේ ඉහළ පොලී අනුපාත, ප්‍රසාද පොලී ලබා දීම සහ තරඟකාරී පොලී අනුපාත මත අත්තිකාරම් ලබාදීම යනාදියයි. තවද ජාත්‍යන්තර කාන්තා දිනයට සමගාමීව කාන්තා ව්‍යවසායකයින් සඳහා විශේෂ සම්මන්ත්‍රණ, කුසලතා සංවර්ධන වෘත්තීය පුහුණු වැඩසටහන් සහ තවත් කලාපීය හා ජාතික මට්ටමේ වැඩමුළු රැසක් සෑම වසරකම පවත්වනු ලැබේ.

RDB ලිය සවිය ප්ලස් - කාන්තා ආයෝජන ඉතිරි කිරීමේ ගිණුම

RDB ලිය සවිය ප්ලස් ආයෝජන ගිණුම වයස අවුරුදු 18 ට වැඩි කාන්තාවන් සඳහා විශේෂයෙන් නිර්මාණය කර ඇති ඉතිරි කිරීමේ ක්‍රමයකි. මෙම ගිණුමේ පරමාර්ථය වන්නේ සුරක්ෂිත මධ්‍ය කාලීන ආයෝජන අවස්ථාවන් සහ විශේෂ ණය යෝජනා ක්‍රම සමඟින් කාන්තාවන් සවිබල ගැන්වීමයි. මෙය ආකර්ෂනීය තෑගි පිරිනමන පස් අවුරුදු ආයෝජන සැලැස්මකි. බැංකුව විසින් දිවයින පුරා සංවිධානය කරනු ලබන හොඳම කාන්තා ව්‍යවසායක තරඟාවලියට ලියාපදිංචි වීමට මෙම ගිණුම් හිමියන්ට හිමිකම් ඇත.

RDB Victory ගිණුම

RDB Victory ගිණුම බැංකුව විසින් හඳුන්වා දී ඇත්තේ මුදල් ආපසු ගත හැකි මෙන්ම වැඩි පොලියක් ලබා ගත හැකි විශේෂ ඉතුරුම් ගිණුමක් ලෙසය. විශේෂ ප්‍රතිලාභයක් ලෙස, මෙම ගිණුම හරහා ප්‍රසාද පොලියක් පිරිනමනු ලැබේ. තවද, ගිණුම් හිමියන්ට විශේෂ ණය පහසුකම් ලබා ගත හැකිය. ඔවුන් පවත්වාගෙන යන ගිණුම් ශේෂය මෙන් දස ගුණයක ණයක් ලබා ගත හැක. තැන්පතුව තබා ඇති දින ගණන සඳහා පවා ප්‍රසාද පොලිය මෙම ගිණුම හරහා ගෙවනු ලැබේ. තවද, සියලුම ගනුදෙනු කෙටි පණිවුඩ මඟින් දැනුම් දෙනු ලැබේ. රටක පුරවැසියන්ගේ ඉතුරුම් පරිචය රටක සංවර්ධනයට අත්‍යවශ්‍ය වන අතර ජනතාවගේ ඉතුරුම් පුරුදු නඟා සිටුවීමේ ආකර්ශනීය තැන්පතු ක්‍රමයක් ලෙස RDB Victory ගිණුම හඳුන්වා දිය හැකිය.

RDB නිව් ලයිෆ් විශ්‍රාම සැලසුම

RDB NewLife විශ්‍රාම සැලැස්ම වැඩි පොලියක් ලබා ගත හැකි විශේෂ ඉතුරුම් ගිණුමක් ලෙස හඳුන්වා දෙන ලදී. එය සුවිශේෂී විශ්‍රාම ඉතුරුම් සැලැස්මකි. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මාසිකව ප්‍රකාශයට පත් කරන සාමාන්‍ය බර තැබූ තැන්පතු අනුපාතිකයෙහි මාස 6ක සාමාන්‍යයට අනුකූලව මෙහි පොලී අනුපාතිකය අර්ධ-වාර්ෂිකව සංශෝධනය කෙරේ. ගිණුම් හිමියා වයස අවුරුදු 55 හෝ 60ට සම්පූර්ණ කරන අවස්ථාවේ මූලික විශ්‍රාම ප්‍රතිලාභයක් ගෙවයි. එය ගිණුම්හිමියාගේ ජීවිතාන්තය දක්වාම ගෙවනු ලබන ප්‍රතිලාභයකි. එබැවින් ස්වයං රැකියාලාභීන්, වෙළෙන්දන්, ගොවීන්, කර්මාන්තකරුවන්, විශ්‍රාම වැටුප් නොලබන කම්කරුවන් ආදී කිසිදු විශ්‍රාම වැටුප් ලැබීමකට හිමිකම් නොලබන අයට මෙම ගිණුම ඉතා යෝග්‍ය වේ.වයස 16 සිට 60 දක්වා මෙම ගිණුම විවෘත කළ හැකි අතර තැන්පත් කළ හැක. ගිණුම් හිමියාගේ මුදල් ප්‍රවාහය අනුව, නිත්‍ය වාරික හෝ එකවර ගෙවීමක් ලෙස තැන්පත් කළ හැක. ආයෝජන ගිණුම් හිමියාගේ වෘත්තීය ජීවිත කාලය තුල ඉතාම පහසුවෙන් හා සාර්ථකව මුදල් වර්ධනය කරයි. විශ්‍රාම යාමේදී, මෙම ඉතුරුම් වලින් කොටසක් හෝ සම්පූර්ණ ශේෂය වන නිත්‍ය විශ්‍රාම ආදායමක් උපයා ගත හැක.ගිණුමේ ශේෂය මත මාසිකව විශ්‍රාම වැටුප් ප්‍රතිලාභය සකස් කෙරෙනු ඇත.

RDB උත්තම ජෞෂ්ඨ පුරවැසි ගිණුම

RDB උත්තම ජ්‍යෙෂ්ඨ පුරවැසි ගිණුම සඳහා වෙළඳපොලේ තරඟකාරී පොලී අනුපාත පිරිනමයි. මූලික තැන්පතුව රු.500/-කි. වයස අවුරුදු 55 ට වැඩි ඕනෑම පුද්ගලයෙකු ජ්‍යෙෂ්ඨ පුරවැසියෙකුගේ ඉතුරුම් ගිණුමක් විවෘත කිරීමට සුදුසුකම් ලබයි. ගිණුම් හිමියන්ට ඔවුන්ගේ ආයෝජන සඳහා ඉහළ පොලී අනුපාත ලබා දෙනු ලැබේ. තවද, සේවා ගාස්තු නොමැතිව තමන්ගේම උපයෝගිතා බිල්පත් ගෙවීමට ඔවුන්ට අවස්ථාව ලබා දී ඇත. ඔවුන්ට වෛද්‍ය පරීක්ෂණ නොමිලේ සිදුකර ගත හැකි අතර විශ්‍රාමිකයින්ට "RDB Detusavi" ණය පහසුකම් ලබාගැනීමට හිමිකම් ඇත.

RDB ආයෝජන ගිණුම

ණය පහසුකම් ලබන ගනුදෙනුකරුවන් සඳහා බැංකුව හඳුන්වා දුන් සාමාන්‍ය ආයෝජන ගිණුමකි. මෙම තැන්පතු සඳහා ආකර්ෂණීය පොලී අනුපාතයක් සහ ඉලක්කගත පිරිස සඳහා අභිරුචිකරණය කරන ලද විශේෂ ණය යෝජනා ක්‍රමයන් ලබා දෙනු ඇත.

අලෙවිකරණ සමාලෝචනය

නිෂ්පාදන සහ සේවා

RDB ජය නිධාන තැන්පතු සහතිකය

මෙය සියලු ආර්ථික මට්ටම් වල පාරිභෝගිකයින් ආකර්ෂණය කරනු ලබන ප්‍රාදේශීය සංවර්ධන බැංකු නිපැයුමකි. මෙය රුපියල් 5,000/-, රු. 10,000/-, රු. 25,000/-, රුපියල් 100,000/- , රුපියල් 500,000/- රුපියල් 1,000,000/- වැනි මුහුනත වටිනාකම් කල් පිරෙන විට ලබා දෙන සහතිකයකි. ප්‍රධාන වශයෙන්ම මෙම නිෂ්පාදනයේ අරමුණ වන්නේ රටේ කුඩා පරිමාණ ව්‍යවසායකයින්ගේ සංවර්ධනයට අත්වැලක් සැපයීම සඳහා අරමුදල් සපයාගනු වස් බැංකුවේ ස්ථාවර තැන්පතු කළඹ වැඩිදියුණු කිරීමයි. මෙම තැන්පතු සහතිකයේ විශේෂත්වය වන්නේ පවතින පොලී අනුපාතයට කල් පිරෙන විට එය අලුත් කළ හැකි වීමයි. RDB ජය නිධාන සහතික පුද්ගලික තැන්පතු ලෙස පමණක් තනි තනිව සහ ඒකාබද්ධව විවෘත කළ හැක.

RDB ස්ථාවර තැන්පතු

RDB ස්ථාවර තැන්පතු එහි කේවල මෙන්ම ආයතනික ගනුදෙනුකරුවන් අතර ද ජනප්‍රිය ආයෝජන ක්‍රමයක් ලෙස හඳුනාගෙන ඇත. RDB හි මාස 1, 2, 3 සහ 6 කාල සීමාවන් සඳහා මෙන්ම වසර 1-5 දක්වා ස්ථාවර තැන්පතු ආරම්භ කළ හැකිය. ආරම්භයේ සිටම අනෙකුත් බැංකු හා සසඳන විට ඉතා ආකර්ශනීය පොලී අනුපාත ලබා දීමට බැංකුවට හැකි විය. වසර 1 සහ ඊට වැඩි කල් පිරෙන කාල සීමාවන් සහිත ස්ථාවර තැන්පතු සඳහා විශේෂ පොලී අනුපාත පිරිනමනු ලැබේ.

RDB දොරින් දොර සේවාව

මෙය ශ්‍රී ලංකාවේ දොරින් දොර බැංකු සේවා සපයන්නාගේ පුරෝගාමියා ලෙස ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ ප්‍රමුඛතම සේවාව වේ. මෙම පද්ධතිය ක්‍රියාත්මක වන්නේ කැපවූ සේවා සපයන්නන් සමූහයක් හරහා වන අතර ඔවුන් දිනපතාම අදාළ ශාඛාවල බල ප්‍රදේශවල ව්‍යාපාරික පරිශ්‍ර සහ වාසස්ථාන වෙත පැමිණේ. මෙම නිරන්තර පැමිණීම මගින් ඉලක්ක කණ්ඩායමට විශාල සහනයක් සහ පහසුවක් සැලසෙන අතර ඔවුන්ගේ ආවස්ථික පිරිවැයද ඉතිරි වේ. දොරින් දොර සේවාව තැන්පතු එකතු කිරීමට පමණක් සීමා නොවී, ඉලක්කගත ගනුදෙනුකරුවන්ට සංවර්ධන අරමුණු සඳහා ණය ලබා ගැනීමටත්, ණය ගිණුමට සේවා සැපයීමටත්, වාරික සහ පොළිය ඔවුන්ගේ පහසුව පරිදි කඩිනමින් ගෙවීමටත් උපකාර කර ඇත. ඊට අමතරව උපයෝගිතා බිල්පත් ගෙවීම් මෙම සේවාව හරහා සිදුකර ගත හැකිය. මෙම සුවිශේෂී සේවාව බොහෝ කුඩා පරිමාණ ව්‍යවසායකයින්ට සහ පුද්ගලයන්ට වැඩි වෙහෙසක් හා කරදරයකින් තොරව දිගු කාලයක් පුරා සෞඛ්‍ය සම්පන්න ගිණුම් ශේෂයක් ගොඩනගා ගැනීමට උපකාරී විය. මීට අමතරව, මෙම ගනුදෙනු ඉලෙක්ට්‍රොනික අතේ ගෙන යා හැකි උපකරණයක් හරහා සිදු කෙරෙන අතර ගනුදෙනුව ස්වයංක්‍රීයව බැංකුවේ පද්ධතියට යාවත්කාලීන වේ. මේ අනුව "ව්‍යවසායකයින් පෝෂණය කිරීමේ" බැංකුවේ දැක්ම ඉටු කිරීමට විය සමත් වී ඇත.

RDB ලීසිං

"RDB ලීසිං" යනු ක්ෂුද්‍ර ව්‍යවසායකයින්, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්, වෘත්තිකයන්, ඉහළ ශුද්ධ ආදායමක් ඇති පුද්ගලයින්, රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ සේවකයින් සඳහා ඔවුන්ගේ ව්‍යාපාර සහ වෘත්තීය ක්‍රියාකාරකම් සඳහා අත්‍යවශ්‍ය ලියාපදිංචි සහ ලියාපදිංචි නොකළ වාහන මිලදී ගැනීම සඳහා උපකාරී වේ. රජය සතු විශාලතම සංවර්ධන බැංකුව වන ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, ලොරි, අධිශීතකරණ ට්‍රක් රථ, ට්‍රක් රථ, කැබ් රථ, බස් රථ, වෑන් රථ මෙන්ම ඕෆ් රෝඩ් වාහන සහ ඉඩම් වාහන වැනි වාණිජ වාහන පරාසයකට පහසුකම් සලසමින් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශය වැඩිදියුණු කිරීමට උපකාර කරනු ඇත.

RDB රන් සරණ

"RDB රන් සරණ" සැලසුම් කර ඇත්තේ රත්‍රන් වල වටිනාකම මත හදිසි මුදල් අවශ්‍යතා සපුරා ගැනීම සඳහා ණය පහසුකම් ලබා ගැනීමටය. ප්‍රාදේශීය සංවර්ධන බැංකුව අඩුම පොලී අනුපාතයකට රත්‍රන් සඳහා ඉහළම වටිනාකමක් ලබා දෙයි. නම්‍යශීලී ආපසු ගෙවීමේ කොන්දේසි මෙම පහසුකම සඳහා ඇත.

ගබඩා පහසුකම්


උපුල්දෙණිය, මුරුන්කන්, බුත්තල, කිලිනොච්චි, මැදිරිගිරිය හා ඇඹිලිපිටිය යන ප්‍රදේශවල ගබඩා හයක් ප්‍රාදේශීය සංවර්ධන බැංකුව විසින් කළමනාකරණය කරනු ලබන අතර එහිදී ගමේ සහ අවට ප්‍රදේශවල ගොවීන්ට ධාන්‍ය වර්ගය අනුව ඉතා අවම ගාස්තුවකට අස්වැන්න ගබඩා කිරීමට ස්ථානයක් ලබා දී ඇත. මෙම ගබඩාව වියළන යන්ත්‍ර, බොයිලේරු, හලර් වැනි නවීන යන්ත්‍ර සූත්‍රවලින් සමන්විත වන අතර අස්වැන්නේ ප්‍රමිතිය පරීක්ෂා කිරීම සඳහා රසායනාගාරයක් ද ඇත.

ධාන්‍ය ගබඩා කිරීමට ආරක්ෂිත ස්ථානයක් සැපයීමට අමතරව, ගොවීන්ට තම අස්වැන්න තරගකාරී මිලකට අලෙවි කිරීමට බැංකුව උපකාර කරයි. ගබඩා කුවිතාන්සි මූල්‍ය පහසුකම් යටතේ ගබඩා කර ඇති නිෂ්පාදනවල වටිනාකම මත ප්‍රාදේශීය සංවර්ධන බැංකුව මූල්‍ය ආධාර සපයයි.



RDB බැංකු රක්ෂණ ඒකකය

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, තම ගනුදෙනුකරුවන් සමඟ බැංකු කටයුතු සිදුකරන අතරම ඔවුන්ගේ රක්ෂණ අවශ්‍යතා සඳහා පහසුකම් සපයනු ලබයි. බැංකු රක්ෂණ ඒකකය හරහා රක්ෂණ සමාගම් මගින් පුළුල් පරාසයක පවතින ඔවුන්ගේ රක්ෂණ අවශ්‍යතා සපුරා ගත හැකිය.



අලෙවිකරණ සමාලෝචනය

නිෂ්පාදන සහ සේවා

ATMs සහ CDMs

2015 වසරේ සිට, LankaPay ලාංඡනය සහිත ඕනෑම ATM යන්ත්‍රයක් හරහා ප්‍රාදේශීය සංවර්ධන බැංකු ATM කාඩ්පත භාවිතයෙන් ගනුදෙනුකරුවන්ට ඔවුන්ගේ ගිණුම්වලින් මුදල් ලබා ගැනීමට හැකිය. ප්‍රාදේශීය සංවර්ධන බැංකුවෙහි ගනුදෙනුකරුවන් බහුතරයක් ග්‍රාමීය හා අර්ධ නාගරික ව්‍යවසායකයන්ගෙන් සැදුම්ලත් බැවින් මෙම ATM පහසුකම වඩා හොඳ සේවාවක් මෙන්ම ආරක්ෂාවක් ලබා දෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. මේ වන විට බැංකුව දිවයින පුරා ප්‍රාදේශීය සංවර්ධන බැංකු ATM යන්ත්‍ර 51ක් ස්ථාපිත කර ඇත.

ඊට අමතරව, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව විසින් 2018 දී මුදල් තැන්පතු යන්ත්‍ර ජාලය (CDM) හඳුන්වා දී ඇත. ගනුදෙනුකරුවන්ගේ පහසුව සඳහා බොහෝ කාර්යබහුල නගරවල මෙය හඳුන්වා දෙනු ඇත. තවද පදවි පරාක්‍රමපුර සහ වැලිඔය යන ප්‍රදේශවල ජනතාවට නිසි බැංකු සේවාවක් නොමැති හෙයින් ඔවුන් සඳහා ස්වයංක්‍රීය බැංකු මධ්‍යස්ථාන දෙකක් විවෘත කර ඇත.

ජංගම බැංකු ඒකකය

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව විසින් ගනුදෙනුකරුවන්ට කවුන්ටරය හරහා සිදුවන මූලික බැංකු පහසුකම් සැපයීම සඳහා ජංගම බැංකුකරණ ඒකකය හඳුන්වා දී ඇත. මුදල් තැන්පතු, මුදල් ආපසු ගැනීම්, බැංකු ගිණුම් විවෘත කිරීම, උපයෝගිතා බිල්පත් සහ ප්‍රේෂණ ගෙවීම් යනාදිය සඳහා පහසුකම් සලසන බැංකු කවුළුවක් එහි ඇත. මෙම ඒකකය ආපදා අවස්ථාවන්හි පහසුකම් සලසන ජංගම ඒකකයක් ලෙස ද ක්‍රියා කරයි.



උපයෝගිතා බිල්පත් සේවාව

එකම වහලක් යටදී සියලු උපයෝගිතා බිල්පත් ගෙවීමේ පහසුකම RDB බැංකුව ලබා දී ඇත. බැංකු ශාඛා ජාලය හරහා සහ දොරින් දොර හා ග්‍රාමීය නායිකා ජංගම සේවා මඟින් විදුලි බිල්පත්, ජල බිල්පත්, දුරකථන බිල්පත් මෙන්ම රක්ෂණ වාරික පහසුවෙන් ගෙවිය හැක.



මුදල් හුවමාරු සේවා

වෙස්ටර්න් යුනියන්

වෙස්ටර්න් යුනියන් (WU) යනු ග්‍රාමීය සහ අර්ධ නාගරික ප්‍රදේශවල පුළුල් ලෙස ව්‍යාප්ත වී ඇති අපගේ ප්‍රාදේශීය සංවර්ධන බැංකුවෙහි සියලුම ශාඛා හරහා විදේශයන්හි සිට අපේ රටට මුදල් එවීම සඳහා ඇති පහසු සහ වේගවත් ක්‍රමයකි.

ලංකා මුදල් හුවමාරුව (LMT)

Lanka Money Transfer (LMT) යනු ග්‍රාමීය සහ අර්ධ නාගරික ප්‍රදේශවල පුළුල් ලෙස ව්‍යාප්ත වී ඇති අපගේ ප්‍රාදේශීය සංවර්ධන බැංකුවෙහි සියලුම ශාඛා හරහා විදේශයන්හි සිට අපේ රටට මුදල් එවීම සඳහා ඇති පහසු සහ වේගවත් ක්‍රමයකි.

සියලුම ප්‍රේෂණ ප්‍රතිලාභීන්ගේ ඉතුරුම් ගිණුම් වෙත සෘජුවම බැර කෙරේ.

SLIPS මුදල් ප්‍රේෂණය

RDB SLIPS යනු අන්තර් බැංකු ඉලෙක්ට්‍රොනික අරමුදල් හුවමාරු පද්ධතියක් වන අතර එය ශ්‍රී ලංකාවේ දේශීය නිෂ්කාශන ජාලය තුළ ආරක්ෂිතව සහ පහසුවෙන් මුදල් මාරු කිරීමට අවස්ථාව සලසා දෙයි. ශ්‍රී ලංකාව තුල ක්‍රියාත්මකවන ඕනෑම බැංකුවක් වෙත මුදල් යැවීමට SLIPS පද්ධතිය භාවිතා කළ හැක.

CEFTS මුදල් ප්‍රේෂණය

විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණය (CEFTS) යනු ගනුදෙනුකරුවන්ට ඔවුන්ගේ පහසුව අනුව දේශීය අන්තර් බැංකු මුදල් මාරු කිරීම් එසැනින් සිදු කිරීමට ඉඩ සලසන මුදල් හුවමාරු පද්ධතියකි.

අලෙවිකරණ සමාලෝචනය

නිෂ්පාදන සහ සේවා

නව නිමැවුම් සංවර්ධනය

RDB QR පහසුකම

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව වෙළඳුන් සඳහා RDB QR පහසුකම 2021 දෙසැම්බර් 15 වන දින පානදුර ශාඛාවේදී දියත් කරන ලදී. එය නියමු ව්‍යාපෘතියක් ලෙස පානදුරෙන් ආරම්භ කර ඇති අතර නුදුරු අනාගතයේ දී වෙළඳුන්ට සහ පාරිභෝගිකයින්ට අවශ්‍ය වැඩි දියුණු කළ විශේෂාංග සහිතව අනෙකුත් ප්‍රදේශවලට ව්‍යාප්ත කිරීමට අපේක්ෂා කෙරේ.



"සරු පස" ණය යෝජනා ක්‍රමය

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව විසින් ''ජාතික වස විස නැති ආහාර සහ ගොවිතැන් සංකල්පයට'' සහාය වීම සඳහා ජාතික මට්ටමේ කාබනික පොහොර නිෂ්පාදකයින් හඳුන්වා දීමේ වැඩසටහන දියත් කරන ලදී. එම වැඩසටහන යටතේ ප්‍රාදේශීය සංවර්ධන බැංකුව විසින් විදේශ විනිමය පිටරටට ගලා යෑම අවම කිරීමේ අරමුණින් දේශීය කාබනික, පොහොර, පළිබෝධනාශක සහ වල්නාශක නිෂ්පාදකයින්ට නව ව්‍යාපාර ආරම්භ කිරීමට හෝ පවතින ව්‍යාපාර වැඩිදියුණු කිරීමට සහාය වීම සඳහා "සරු පස" නමින් විශේෂ ණය යෝජනා ක්‍රමයක් හඳුන්වා දී ඇත.



"කිරි ශක්ති" ණය යෝජනා ක්‍රමය

කුඩා හා මධ්‍ය පරිමාණ කිරි ගොවීන් නගා සිටුවීම සඳහා ප්‍රාදේශීය සංවර්ධන බැංකුව කිරි ශක්ති ණය යෝජනා ක්‍රමය දියත් කරන ලදී. කිරි ගොවීන් සහ කිරි ගොවිපළ සංවර්ධනය කිරීම තුළින් රටේ කිරි නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා මෙම ණය යෝජනා ක්‍රමය හඳුන්වා දෙන ලදී.



RDB මැක්ස් ස්ථාවර තැන්පතු

බැංකුවේ තැන්පතු පදනම ඉහළ නැංවීමේ අරමුණින් නව දිගු කාලීන තැන්පතු ආකර්ෂණය කර ගැනීම සඳහා ප්‍රාදේශීය සංවර්ධන බැංකුව විසින් නත්තල් සමයේදී තරඟකාරී පොලී අනුපාතයක් සහිතව "RDB Max" ස්ථාවර තැන්පතු හඳුන්වා දෙන ලදී.

සමාජය සහ පාරිසරික සමාලෝචනය

ආයතනික සමාජ වගකීම - CSR

නල්ලතන්නිය ප්‍රදේශයේ ව්‍යාපාරික ප්‍රජාව සඳහා මූල්‍ය සාක්ෂරතා වැඩසටහන



ප්‍රදේශයේ වෙළඳසැල් හිමියන් අතර ඉතුරුම් පුරුදු ඇතිකිරීම සහ ඔවුන්ගේ මුදල් ප්‍රවාහය කළමනාකරණය කිරීම සඳහා මූල්‍ය සාක්ෂරතා වැඩසටහන සිරිපාද වාරයේ ආරම්භක දිනයේ දී නල්ලතන්නියේදී පැවැත්විණි. ඊට අමතරව තම වටපිටාව පිරිසිදුව තබා ගැනීම දැනුවත් කිරීමද සිදු කරන ලදී.

සිංහල සහ දෙමළ අලුත් අවුරුදු දිනයේ පැල බෙදා හැරීමේ වැඩසටහන



ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ සියලුම ශාඛාවන් විසින් 2021 අප්‍රේල් 16 වන දින සුබ මොහොතින් ගස් සිටුවීම සඳහා 2021 අප්‍රේල් 15 වන දින සිංහල සහ දෙමළ අලුත් අවුරුද්දට සමගාමීව පැල බෙදා දෙන ලදී. වනාන්තර ආරක්ෂා කිරීමේ වැදගත්කම සහ ජීවිත සුරැකීමට ගස් සිටුවීමේ වැදගත්කම පිළිබඳව සමාජය දැනුවත් කිරීමට මෙය ඉවහල් විය.

මුහුදුමහා විහාරයේ සිදුකරන ලද ආයතනික හා සමාජ වගකීම් වැඩසටහන



ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ ඉසුරු ආයතනික සමාජ වගකීම් පදනම විසින් නැගෙනහිර පළාතේ ප්‍රජාව තුළ ධනාත්මක ප්‍රතිරූපයක් ගොඩනැගීම සඳහා කළමනාකාරිත්වයේ සහ කාර්ය මණ්ඩලයේ සහභාගිත්වයෙන් 2021 ඔක්තෝම්බර් 23 සහ 24 යන දිනවල මුහුදු මහා විහාරයේදී වැඩසටහන් කිහිපයක් දියත් කරන ලදී. ඒ අනුව රුක් රෝපණ වැඩසටහනක්, දානමය පිංකමක්, මඟ පෙන්වීම් දැන්වීම් පුවරුවක් ස්ථාපිත කිරීම සහ ප්‍රාදේශීය සංවර්ධන බැංකුව විසින් ඉදිකරන ලද අත් සෝදන ස්ථානය පරිත්‍යාග කිරීම එම දින දෙක තුළ සිදු විය.

දිර අභිමානි වැඩසටහන



දිවයින පුරා කාන්තා ව්‍යවසායකයින් සවිබල ගැන්වීම සඳහා දිර අභිමානී වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. මෙම වැඩසටහන යටතේ, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව විසින් කාන්තා ව්‍යවසායකයින්ට මාර්ගෝපදේශ, උපදේශන සේවා සහ පුහුණුව තුළින් ව්‍යාපාරික ලෝකයේ ඔවුන්ගේ අභිලාෂයන් සාක්ෂාත් කර ගැනීමට ඔවුන්ව යොමු කරයි.

සේවක සමාලෝචනය

හැඳින්වීම

බැංකුවේ ආයතනික ව්‍යාපාර අරමුණු සාක්ෂාත් කර ගැනීමේ දී ප්‍රධානතම දායකත්වයක් අපගේ මානව සම්පත් වෙතින් ලැබේ. එබැවින්, හොඳම මානව සම්පත් මෙවලම්, නිසි ප්‍රතිපත්ති භාවිතයන් සහ ක්‍රියාවලීන් හරහා දක්ෂතා අත්පත් කර ගැනීම, සංවර්ධනය කිරීම සහ සම්බන්ධ වීම සඳහා උපායමාර්ගිකව ඒකාබද්ධ ප්‍රවේශයක් යෙදීමෙන් පරමාදර්ශී මානව ප්‍රාග්ධනයේ අවශ්‍යතාව සහ බැංකු සේවකයින්ගේ යහපැවැත්ම සහතික කිරීම සඳහා මානව සම්පත් අංශය කැපවී සිටී.

2017 - 2021 අතර කාලය සඳහා මානව සම්පතට අදාළව මූල්‍යමය වශයෙන් ප්‍රධාන කාර්යසාධන දර්ශක

	2017	2018	2019	2020	2021
මුළු මෙහෙයුම් ලාභය (රු. මි.)	3,307	3,606	2,960	3,164	**1,926**
මුළු ආදායම (රු. මි.)	22,016	26,071	27,508	24,210	**24,492**
ණය කළඹ (රු. මි.)	130,325	137,770	144,694	164,771	**189,039**
තැන්පතු කළඹ (රු. මි.)	139,827	141,560	149,600	169,264	**187,752**
මුළු සේවක සංඛ්‍යාව	2,395	2,345	2,735	2,660	**2,600**
FTE අනුව ආදායම (රු. මි.)	9.19	11.02	10.06	9.10	**9.42**
FTE අනුව ලාභය (රු. මි.)	1.38	1.43	1.08	1.19	**0.74**
FTE අනුව තැන්පතු කළඹ (රු. මි.)	57.17	58.82	52.90	61.94	**72.21**
FTE අනුව ණය කළඹ (රු. මි.)	53.72	57.78	54.70	63.63	**72.71**

(FTE = පූර්ණ කාලීන-සේවකයා)

පිරිස් බල ශක්තිය

බැංකුවේ පිරිස් බලය ස්ථිර හා කොන්ත්‍රාත් පදනම මත සේවක සංඛ්‍යා තනතුරු සඳහා යොදවා ඇති සේවකයින්ගෙන් සමන්විත වේ. ඊට අමතරව දොරින් දොර සේවා ලබාදෙන ක්ෂේත්‍ර සහකාරවරුන් (නිෂ්චිත කාලීන කොන්ත්‍රාත් පදනම මත) සහ ග්‍රාමීය නායකයින් (ක්ෂුද්‍ර මූල්‍ය පද්ධතියට සම්බන්ධ) බැංකුවට මිනිස් බල සේවා සපයනු ඇත. එසේම විශ්ව විද්‍යාල, කාර්මික විද්‍යාල, පිළිගත් වෘත්තීය පුහුණු ආයතනවල පාඨමාලා සඳහා වන පුහුණු අවශ්‍යතා සම්පූර්ණ කිරීම වෙනුවෙන් සහ විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබන පාසල් අධ්‍යාපනය අවසන් කළ සිසුන් සඳහා මාස 6 සිට 12 දක්වා පුහුණු වැඩසටහන්ද අභ්‍යාසලාභීන් වෙත ලබා දීමට බැංකුව කටයුතු කරයි.

මෙම සේවක කාණ්ඩ බැංකුවේ කාර්ය සාධනය උදෙසා වටිනා කාර්යභාරයක් ඉටු කරයි. ගතවූ වසර හා සැසැඳීමේදී පිරිස්බල සේවක ශක්තිය පහත දැක්වේ.

පිරිස් බල කාණ්ඩය	සේවක සංඛ්‍යාව	
	2020	2021
ස්ථිර /කොන්ත්‍රාත් පදනම මත සේවකයන්	2660	**2600**
දොරින් දොර ක්ෂේත්‍ර සහකාරවරුන්	445	**455**
ග්‍රාමීය නායකයන්	180	**171**
එකතුව	3310	**3226**

සේවක සමාලෝචනය

කළමනාකරණ මට්ටම අනුව සේවක සංඛ්‍යා බෙදී යාම පහත දැක්වේ.

කළමනාකරණ මට්ටම	සේවක සංඛ්‍යාව බෙදී යාම	
	2020	2021
ආයතනික කළමනාකාරීත්වය	7	**7**
ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය	33	**31**
විධායක කළමනාකාරීත්වය	154	**154**
විධායක සේවකයන්	970	**923**
ලිපිකරු සහ සමගාමී	1351	**1356**
වෙනත් ශ්‍රේණි	145	**129**
මුළු එකතුව	2660	**2600**

බැංකුව කාන්තා සහ පිරිමි දෙපාර්ශවයටම සමාන වෘත්තිය අවස්ථා ලබාදෙයි. 2021 වසරේදී පිරිස්බල කාණ්ඩයේ සංයුතිය පහත දක්වා ඇත.

පිරිස්බල කාණ්ඩය	2020		2021	
	සේවක සංඛ්‍යාව	%	සේවක සංඛ්‍යාව	%
පිරිමි	1489	55.98	**1447**	**55.65**
කාන්තා	1171	44.02	**1153**	**44.35**
මුළු එකතුව	2660	100.00	**2600**	**100.00**

බැංකුවේ සේවක කළඹට අදාළ වයස සහ පළපුරුද්ද පහත දැක්වේ.

වයස් කළඹ

වයස් කාණ්ඩය	සේවක සංඛ්‍යාව	%
වයස අවුරුදු 21 ට අඩු	02	0.03
අවුරුදු 21 - 30	344	13.24
අවුරුදු 31 - 40	990	38.09
අවුරුදු 41 - 50	368	14.16
අවුරුදු 51 - 55	600	23.09
වයස අවුරුදු 55 ට වැඩි	296	11.39
මුළු එකතුව	2600	100.00

පළපුරුද්ද

පළපුරුදු කාණ්ඩය	සේවක සංඛ්‍යාව	%
අවුරුදු 30 කට වැඩි	357	13.73
අවුරුදු 20 - 29	683	26.27
අවුරුදු 10 - 19	588	22.62
අවුරුදු 5 - 9	506	19.46
අවුරුදු 5 ට අඩු	466	17.92
මුළු එකතුව	2600	100.00

වෘත්තීය දියුණුව

කාර්ය මණ්ඩලය සතු වෘත්තීය ආකල්ප සාධනීය ලෙස වෙනස් කිරීමේ සහ බැංකු මෙහෙයුම් හා වඩා හොඳ පාරිභෝගික සේවාවක් ලබාදීම සම්බන්ධයෙන් දැනුම හා ඉගෙනුම් අවස්ථා ප්‍රචලිත කරනු පිණිස අබණ්ඩව පුහුණු අවස්ථා ලබා දීමට ද බැංකුව කටයුතු කර ඇත. අදාළ වර්ෂයේ දී සේවකයන් 715ක සහභාගිත්වයකින් යුතුව එවැනි වැඩසටහන් 28ක් පවත්වා තිබේ. මේ වෙනුවෙන් කරන ලද මුළු ආයෝජනය රු. මිලියන 2.39ක් විය.

මානව සම්පත් මණ්ඩල උප කමිටු

ආයතනික පාලන පරිචයන් හා ශ්‍රී ලංකා මහ බැංකුවේ නියමය පරිදි අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව හා අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුව ලෙස වෙනම උප කමිටු දෙකක් පිහිටුවන ලදී.

අදාළ වර්ෂයේ දී අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව හා අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුවල සභාපතිත්වය එම්. මහින්ද සාලිය මහතා විසින් මෙහෙයවනු ලැබීය.

කමිටු ලේකම් ලෙස අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයා කටයුතු කරයි. 2021 වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩල නාම යෝජනා කමිටු රැස්වීම් හතරක් (04) සහ අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු රැස්වීම් පහක් (05) පැවැත්විණි.

විශේෂ සිදුවීම්

පැලියගොඩ, මැනිං වෙළඳ සංකීර්ණයේ නව සේවා මධ්‍යස්ථානයක් විවෘත කෙරේ



වෙළෙඳුන්ට සහ මහජනතාවට බැංකු සේවා සැපයීම සඳහා ප්‍රාදේශීය සංවර්ධන බැංකු සේවා මධ්‍යස්ථානය සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සහ CDM ස්මාර්ට් මධ්‍යස්ථානය පැලියගොඩ, නව මැනිං වෙළඳ සංකීර්ණයේ විවෘත කරන ලදී.සමෘද්ධි, ගෘහ, ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන ගරු රාජ්‍ය අමාත්‍ය ෂෙහාන් සේරසිංහ මහතා, සභාපති මහින්ද සාලිය මහතා සහ වැඩබලන සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී දමිතා කුමාරි රත්නායක මහත්මිය විසින් 2021 ජනවාරි මස 15 වන දින උත්සවාකාරයෙන් මෙය විවෘත කරන ලදී.

දෙහිඅත්තකණ්ඩිය ශාඛාව



දෙහිඅත්තකණ්ඩිය ශාඛාව පාරිභෝගිකයන්ට වැඩි සේවාවක් සැපයීම සඳහා ප්‍රතිසංස්කරණය කරන ලද අතර, සමෘද්ධි, ගෘහ, ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා සහ ව්‍යාපාර සංවර්ධන ගරු රාජ්‍ය අමාත්‍ය ෂෙහාන් සේමසිංහ මහතා, ගරු රාජ්‍ය අමාත්‍ය විමලවීර දිසානායක මහතා, ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී තිලක් රාජපක්ෂ මහතා සභාපති මහින්ද සාලිය මහතා සහ වැඩබලන සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී දමිතා කුමාරි රත්නායක මහත්මිය විසින් 2021 ඔක්තෝබර් 18 වන දින උත්සවාකාරයෙන් විවෘත කරන ලදී.

තංගල්ල නව ශාඛා පරිශ්‍රයට සහ දිස්ත්‍රික් කාර්යාල පරිශ්‍රයට මුල්ගල් තැබීම



තංගල්ල නව ශාඛා පරිශ්‍රය සහ දිස්ත්‍රික් කාර්යාල පරිශ්‍රය සඳහා මුල්ගල තැබීම 2021 නොවැම්බර් මස 7 වන දින ගරු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සිදු කෙරිණි. මෙම අවස්ථාව සඳහා සභාපති මහින්ද සාලිය මහතා, බැංකුවේ වැඩ බලන සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී දමිතා කුමාරි රත්නායක මහත්මිය, කාර්ය මණ්ඩලය සහ ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ ගනුදෙනුකරුවන් සහභාගී විය.

සබරගමුව පළාත් කාර්යාලය



සබරගමුව ප්‍රදේශීය කාර්යාලය ගනුදෙනුකරුවන්ට කඩිනම් සේවා සැපයීම සඳහා වඩාත් පහසු ස්ථානයක් වෙත ගෙන ගිය අතර 2021 අගෝස්තු මස 02 වන දින සභාපති මහින්ද සාලිය මහතා සහ වැඩබලන සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී දමිතා කුමාරි රත්නායක මහත්මිය විසින් උත්සවාකාරයෙන් විවෘත කරන ලදී.

විශේෂ සිදුවීම්

ශාඛා නැවත ස්ථාපිත කිරීම

රිදීගම ශාඛාව



රිදීගම ශාඛාව ගනුදෙනුකරුවන්ට වැඩි සේවාවක් සැපයීම සඳහා වඩාත් පහසු ස්ථානයකට ගෙන ගිය අතර සමෘද්ධි, ගෘහ, ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන ගරු රාජ්‍ය අමාත්‍ය ෂෙහාන් සේමසිංහ මහතා, සභාපති මහින්ද සාලිය මහතා සහ වැඩබලන සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී දමිතා කුමාරි රත්නායක මහත්මිය විසින් 2021 මාර්තු මස 5 වන දින උත්සවාකාරයෙන් විවෘත කරන ලදී.

හල්දුම්මුල්ල ශාඛාව



හල්දුම්මුල්ල ශාඛාව පාරිභෝගිකයන්ට වැඩි සේවාවක් සැපයීම සඳහා වඩාත් පහසු ස්ථානයකට ගෙන ගිය අතර 2021 නොවැම්බර් මස 8 වන දින සභාපති මහින්ද සාලිය මහතා සහ වැඩබලන සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී දමිතා කුමාරි රත්නායක මහත්මිය විසින් උත්සවාකාරයෙන් විවෘත කරන ලදී.

වෙනත් සිදුවීම්

ජාත්‍යන්තර කාන්තා දින වැඩසටහන්

සියලුම ප්‍රාදේශීය සංවර්ධන බැංකු ශාඛා සිය කාන්තා ගනුදෙනුකරුවන් සමඟ ජාත්‍යන්තර කාන්තා දින වැඩසටහන සමරනු ලැබීය.ඒ අනුව කාන්තා ව්‍යවසායකයින් ශක්තිමත් කිරීම සඳහා මූල්‍ය පහසුකම් ප්‍රදානය කිරීම සහ කාන්තා ව්‍යවසායකයින් කේන්ද්‍ර කර ගනිමින් පුහුණු වැඩසටහන් ඇතුළු ඊට සමාන්තරව වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කරන ලදී.

මෙම වැඩසටහන 2021 මාර්තු මස 8 වන දින කඩවත රන්දුල ග්‍රෑන්ඩ් වීනස් හෝටලයේදී කළමනාකාරිත්වය, කාර්ය මණ්ඩලය සහ ගනුදෙනුකරුවන්ගේ සහභාගීත්වයෙන් පැවැත්විණි.

"දිරි අභිමානී" කාන්තා ව්‍යවසායක තරඟාවලිය 2021 දියත් කිරීමට සමගාමීව, එම අවස්ථාවෙහිදී පවත්වන ලද විශේෂ වැඩසටහන් පහත දැක්වේ.

- දිරි අභිමානී 2020 වැඩසටහනේ ජාතික මට්ටමේ ජයග්‍රාහිකයින් සඳහා ත්‍යාග ප්‍රදානය කිරීම.
- ව්‍යවසායකත්වය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන්
- කාන්තා ව්‍යවසායකයින් අතර ණය පහසුකම් බෙදාදීම



- ව්‍යවසායකයින්ගේ නිෂ්පාදන සහ සේවාවන් මිලදී ගැනීමේ සහ විකිණීමේ ක්‍රියාකාරකම් සඳහා පහසුකම් සැලසීම සඳහා ''seilama.lk'' නමින් වෙබ් අඩවියක් දියත් කිරීම



- ප්‍රාදේශීය සංවර්ධන බැංකු ගනුදෙනුකරුවන් සහ රජයේ විශ්‍රාම වැටුප් නොලබන වෙනත් අය සඳහා විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ ලබා දීම සඳහා ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම



වෙනත් සිදුවීම්

ප්‍රාදේශීය සංවර්ධන බැංකු ශාඛා ජාලය හරහා විශ්‍රාමිකයන්ගේ ජීවිත සහතිකය ලබා ගැනීම සඳහා 2021 පෙබරවාරි 1 වන දින විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව සමඟ අවබෝධතා ගිවිසුමකට අත්සන් තැබීය.



කිරි ශක්ති ණය යෝජනා ක්‍රමය 2021 පෙබරවාරි මස 02 වන දින වාරියපොල දී ආරම්භ කරන ලදී.

පශු සම්පත් හා ගොවිපල ප්‍රවර්ධන සහ කිරි නිෂ්පාදන හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශයේ සහයෝගය ඇතිව "කිරෙන් සපිරි දැයක්" තේමාව යටතේ කිරි ගොවීන් සඳහා මූල්‍ය ආධාර ලබාදීම සඳහා "කිරි ශක්ති ණය යෝජනා ක්‍රමය" 2021 පෙබරවාරි මස 02 වන දින වාරියපොළ දී ආරම්භ කරන ලදී.



2021 මාර්තු මස 04 වන දින කැලණිය විශ්ව විද්‍යාලයේ වාණිජ හා කළමනාකරණ පීඨයේ "Incubation and Internship Centre" විවෘත කිරීම.



සිංහල හා දෙමළ අලුත් අවුරුද්ද වෙනුවෙන් "පැයෙන් පැයට බඩු මල්ල" වැඩසටහන ක්‍රියාත්මක කිරීම



සිංහල හා දෙමළ අලුත් අවුරුද්දට සමගාමීව 2021 අප්‍රේල් මස 15 වන දින ජයග්‍රාහකයින්ට දෛනික අත්‍යවශ්‍ය ද්‍රව්‍ය පිරවූ බඩු මල්ලක් බෙදාදීමේ ''පැයෙන් පැයට බඩු මල්ල'' වැඩසටහන සෑම ශාඛාවකම ක්‍රියාත්මක කරන ලදී.

සෞභාග්‍ය සතිය වැඩසටහන්

සමෘද්ධි, ගෘහ, ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ උපදෙස් පරිදි ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට පහසුකම් සැලසීම සඳහා සෞභාග්‍ය සතිය වැඩසටහන් හතරක් ප්‍රාදේශීය සංවර්ධන බැංකුව විසින් සියලුම RDB බැංකු ශාඛා හරහා පවත්වන ලදී.





ජංගම බැංකුකරණ සේවාව

කොවිඩ්-19 වසංගත කාල පරිච්ඡේදය තුළ හුදෙකලා වූ පුද්ගලයින් සඳහා ප්‍රාදේශීය සංවර්ධන බැංකු ජංගම බැංකුකරණ ඒකකය විසින් බැංකු පහසුකම් සපයන ලදී.



ජාත්‍යන්තර ළමා දිනයට සමගාමීව බාල වයස්කරුවන් අතර ඉතුරුම් පුරුදු සහ නිර්මාණාත්මක කුසලතා ඇති කිරීම සඳහා බාල වයස්කරුවන් සඳහා සිත්තම් පැංචා චිත්‍ර තරඟයක් පැවැත්වීනි. මෙම තරඟාවලිය 2021 ඔක්තෝම්බර්, නොවැම්බර් සහ දෙසැම්බර් කාල පරිච්ඡේදය තුළ පැවැත්වීනි.



අවදානම් කළමනාකරණය

කොවිඩ්-19 වසංගතය 2021 වසර මෑත ඉතිහාසයේ පෙර නොවූ විරූ ලෙස පුද්ගලයන්, ප්‍රජාවන් සහ සංවිධානවලින් අතිමහත් බහුතරයක් ඔවුන්ගේ ජීවිත හා ජීවනෝපාය සම්බන්ධයෙන් දැඩි ලෙස පීඩාවට පත් කළේය. බැංකුවේ ප්‍රධාන අවදානම් කාණ්ඩ සියල්ලටම පාහේ ද්‍රව්‍යමය වශයෙන් බලපෑ කොවිඩ්-19, බැංකුවේ අවදානම් පැතිකඩ ඉහළ නංවා ඇති අතර, අවදානම සහ ප්‍රතිලාභ අතර වෙළඳාම ප්‍රශස්ත කිරීමට සහ අනාගතයේ තිරසාර ලෙස වටිනාකමක් නිර්මාණය කිරීමට එය සක්‍රිය කිරීමට ශක්තිමත් අවදානම් පාලන රාමුවක් සහ ඒ හා සම්බන්ධ අවදානම් කළමනාකරණය කිරීම සඳහා දැඩි අවදානම් කළමනාකරණ කාර්යයක් ඇති අතර විමඟින් වෙළඳාම ප්‍රශස්ත කිරීමට හැකි විය.

පිරිහෙන ආර්ථික ක්‍රියාකාරකම් සහ අඩු වාසිදායක ආර්ථික දැක්ම ඇතැම් කර්මාන්ත මත විශාල පීඩනයක් ඇති කළ අතර, වත්කම් වල ගුණාත්මකභාවයට බලපෑම් ඇති කළ අතර බැංකු නිෂ්පාදන සහ සේවා සඳහා ඇති ඉල්ලුම අඩු විය. තවමත් වසංගතයේ පරිණාමය වන ස්වභාවය සහ එය වටා ඇති අබණ්ඩ අවිනිශ්චිතතාවය මූල්‍ය ආයතනවල අවදානම් පැතිකඩයන් ඉහළ නංවා ඇති අතර, ඔවුන් මේ පිළිබඳව වැඩිපුර විමසිලිමත් විය යුතුය.

මෙම සන්දර්භය සහ ඉදිරි දැක්ම සැලකිල්ලට ගනිමින් පවතින අවදානම් පාලනය සහ අවදානම් කළමනාකරණ රාමුව අනුව බැංකුව සිය අවදානම් කළමනාකරණ උපාය මාර්ගය සකස් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස, සිය එදිනෙදා කටයුතු සඳහා කොවිඩ්-19 හි බලපෑම අවම කිරීම, අවම බාධා සහිතව පාරිභෝගිකයාට අබණ්ඩව සේවය කිරීම සහ වත්කම් වල ගුණාත්මකභාවය සහ සිය මෙහෙයුම්වල ශක්‍යතාව පවත්වා ගැනීම සඳහා කාලෝචිත පියවර ගැනීමට බැංකුවට හැකි විය.

අවදානම් කළමනාකරණ රාමුව


අරමුණු

බැංකුවේ අවදානම් පාලන රාමුව සහ අවදානම් කළමනාකරණ කාර්යයේ මූලික අරමුණු වන්නේ පිළිගත් අවදානම්, බැංකුවේ අවදානම් රුචිය සහ අවදානම් කළමනාකරණ පැතිකඩ තුළ ඇති බව සහතික කිරීමයි.

- සංවිධානය පුරා ඉහළ මට්ටමේ අවදානම් දැනුවත් කිරීම සඳහා පහසුකම් සැලසීම සහ අවදානම් කළමනාකරණ රාමුව ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම ස්වාධීනව අධීක්ෂණය කිරීම.
- අවදානම් මූර්තිමත් වටිනාකම් කළමනාකරණය හා අධීක්ෂණය සඳහා අවශ්‍ය ආයතනික සංස්කෘතිය ස්ථාපිත කිරීම,
- අවදානම් රුචිය සහ අවදානම් ඉවසීමේ මට්ටම් අනුව අපේක්ෂිත අවදානම් පැතිකඩ නිර්වචනය කිරීම
- අවදානම් පිළිගැනීම, මාරු කිරීම, අවම කිරීම සහ වසේ කිරීමට හොඳම ක්‍රම නිර්දේශ කිරීම සම්බන්ධ තීරණ සඳහා ක්‍රියාකාරී වගකීම ස්ථාපිත කිරීම
- අබණ්ඩ පදනමක් මත අනුමත අවදානම් රුචියට වරෙහිව අවදානම් පැතිකඩ ඇගයීමට ලක් කිරීම.
- උපකල්පනය කරන ලද අවදානම් නිරාවරණ වලින් ඇති විය හැකි පාඩු ඇස්තමේන්තු කිරීම, අභ්‍යන්තර පාලනයන් සමීපව අධීක්ෂණය කිරීම සහ පසු විපරම් කිරීම, ආතතිය පරීක්ෂා කිරීම කෙරෙහි අවධානය යොමු කිරීම.
- කොන්ත්‍රාත් බැඳීම් වලට ගරු කිරීම සහ අනපේක්ෂිත පාඩු සපුරාලීම සඳහා බැංකුව සතුව ද්‍රවශීලතාව සහ ප්‍රාග්ධනය මත ප්‍රමාණවත් ස්වාරක්ෂක ඇති බව සහතික කිරීම සඳහා වරින් වර ආතති පරීක්ෂණ පැවැත්වීම;

අවදානම් කළමනාකරණය සඳහා ප්‍රවේශය

ත්‍රිත්ව ආරක්ෂණ සීමා ආකෘතිය



අවදානම් පාලනය

ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ අවදානම් පාලන ව්‍යුහය අධ්‍යක්ෂ මණ්ඩලයෙන් ආරම්භ වන අතර අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති, ක්‍රියාපටිපාටි, කමිටු සහ පැවරී ඇති අධිකාරී මට්ටම් හරහා ශාඛා මට්ටම දක්වා පහලට විහිදී යයි.සමස්ත බැංකුවේ අවදානම පාලනය කිරීමේ අවසන් වගකීම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයට පැවරේ.

අවදානම් කළමනාකරණය සඳහා වන අධීක්ෂණ වගකීම් ඉටු කිරීම සහ අභ්‍යන්තර පාලන පද්ධතිවල ප්‍රමාණවත් බව සහ ඵලදායීතාව සහතික කිරීම පිණිස සහාය වීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පහත සඳහන් අධ්‍යක්ෂ කමිටු හතරක් පිහිටුවා ඇත.

- අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (BIRMC)
- අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව (BAC)
- අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් කමිටුව (BHRC)
- අධ්‍යක්ෂ මණ්ඩල නාම යෝජනා කමිටුව (BNC)

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව(BIRMC)
අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ සභාපතිත්වය විධායක නොවන අධ්‍යක්ෂකවරයෙකු දරන අතර එය බැංකු අවදානම් කළමනාකරණ රාමුව පිළිබඳ තීරණ ගැනීමට සහාය දක්වයි. මෙම කමිටුව බැංකුවේ සමස්ත අවදානම් කළඹ පිළිබඳ නිර්දේශය ලබා දෙන අතර බැංකුවේ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති, ක්‍රියාපටිපාටි සහ අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා තක්සේරු ක්‍රියාවලිය (ICAAP) නිර්දේශ කර ඇත. ප්‍රතිපත්ති ක්‍රියාපටිපාටි සහ අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා තක්සේරු ක්‍රියාවලිය සකස් කිරීම, සමාලෝචනය කිරීම සඳහා ප්‍රධාන අවධානම් කළමණාකරන නිලධාරි සහ ඔහුගේ අංශය විසින් වරින් වර ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.


අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව (BAC) ප්‍රාදේශිය සංවර්ධන බැංකු අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් බැංකුවේ අභ්‍යන්තර පාලනය සහ නියාමන අනුකූලතාව පරීක්ෂා කරයි. බැංකුවේ අභ්‍යයන්තර විගණනයේ කාර්ය සාධනය, නිරවද්‍යයතාව සහ ස්වාධීනව තක්සේරු කිරීමද මෙම කමිටුව විසින් සිදු කෙරේ.

මානව සම්පත් ප්‍රධානියාගේ ප්‍රධානත්වයෙන් යුත් අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් කමිටුව (BHRC) දේශීය හා රටේ පොදු නීතිය හා සේවකයින් සම්බන්ධ පොදු නීතිය අනුගමනය කරන බව සහතික කිරීම සහ වර්තමාන හා අනාගත සේවකයින් සඳහා ආකර්ෂණීය පරිසරයක් නිර්මාණය කිරීම සහතික කිරීම සඳහා සාරධර්ම මත පදනම් වූ පද්ධති සහ ප්‍රතිපත්ති නිර්මාණය කිරීම සහ / හෝ අධීක්ෂණය කිරීම සඳහා වගකිව යුතුය. විධායකයට අදාළ වැටුප් ප්‍රතිපත්තිය (වැටුප්, දීමනා සහ අනෙකුත් මූල්‍ය ගෙවීම්) කමිටුව විසින් තීරණය කළ යුතුය.

අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුව (BNC) නව අධ්‍යක්ෂවරුන් සහ ජ්‍යේෂ්ඨ කළමනාකාරිත්වය තෝරා ගැනීම / පත් කිරීම සඳහා විධිමත් හා විනිවිද භාවයකින් යුත් ක්‍රියාපටිපාටියක් කමිටුව විසින් ක්‍රියාත්මක කර ඇත. ප්‍රධාන අභ්‍යන්තර විගණන නිලධාරී, ප්‍රධාන අවධානම් කළමනාකරණ නිලධාරී සහ අනුකූලතා නිලධාරියා හැර, ප්‍රධාන විධායක නිලධාරියාගේ නිර්දේශය මත ජ්‍යේෂ්ඨ කළමනාකාරිත්වය පත් කළ යුතුය.

අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව (RMD) - ප්‍රධාන අවධානම් කළමනාකරණ නිලධාරී යටතේ පවතින අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව සතුව ණය අවදානම, මෙහෙයුම් අවදානම සහ වෙළඳපොළ සහ පොලී අනුපාත අවදානම යන අවදානම් කළමනාකරණයේ ප්‍රධාන වගකීම් තුනක් පවතී. අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව වරින් වර අවදානම් දරාගැනීමේ සීමා, අවදානම් පැතිකඩ, උපාය මාර්ග, අවදානම් කළමනාකරණය සහ අභ්‍යන්තර පාලන රාමුව, අවදානම් ප්‍රතිපත්ති, සීමාවන් සහ පවරා ඇති අධිකාරිය පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ ඉදිරිපත් කරයි.

අවදානම් පාලන ව්‍යුහය



අවදානම් කළමනාකරණය

ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ ප්‍රධාන අවදානම් සාධක සහ පාලන ව්‍යුහය පිළිබඳ සමාලෝචනය


බැංකුවේ ප්‍රධාන අවදානම් නිලධාරියා විසින් මෙහෙයවනු ලබන අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අවදානම් දරාගැනීමේ සීමාව තුළ බැංකුවේ අවදානම් පරාමිතීන් පවත්වා ගෙන යන බව ස්වාධීනව සහතික වේ. බැංකුවේ අවදානම් කළමනාකරණ රාමුවෙහි බහුවිධ අංශ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව වගකීම දරයි.

අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව පහත ලැයිස්තු ගත කර ඇති පරිදි එහි ප්‍රධාන අවදානම් නිරාවරණ මැනීම සඳහා මෙවලම් සහ ශිල්පීය ක්‍රම රාශියක් අනුගමනය කරයි.

ණය අවදානම	ආරෝපිත ණය අවදානම් ප්‍රාග්ධනය ගණනය කිරීම සඳහා ප්‍රමිතිගත ප්‍රවේශය භාවිතා කරයි.
වෙළඳපල අවදානම	ප්‍රමිතිගත මිනුම් ප්‍රවේශය අය කරන ලද වෙළඳපල අවදානම් ප්‍රාග්ධනය ගණනය කිරීම සඳහා භාවිතා කරයි.
මෙහෙයුම් අවදානම	මූලික දර්ශක ප්‍රවේශය මෙහෙයුම් අවදානම් ප්‍රාග්ධන අය ගණනය කිරීම සඳහා භාවිතා වේ.
ණය කේන්ද්‍රීය අවදානම	හර්ෆින්ඩාහල් - හර්ෂ්මන් දර්ශකය (HHI)
පොලී අනුපාත අවදානම	ආතතිය පරීක්ෂා කිරීම මත පදනම් වූ සංවේදීතා පරතර විශ්ලේෂණය.
විදේශ විනිමය අවදානම	බැංකුවේ විදේශ විනිමය ගනුදෙනු වලට අදාල ශුද්ධ විවෘත ස්ථානය (NOP) මනිනු ලබන්නේ ශුද්ධ විදේශ විනිමය කෙටි ස්ථාන වල එකතුව හෝ ශුද්ධ විදේශ විනිමය දිගු ස්ථාන වල එකතුව එකතු කිරීමෙනි.
ද්‍රවශීලතා අවදානම	කොටස් ප්‍රවේශය -ද්‍රවශීලතා අනුපාත හරහා ද්‍රවශීලතා තත්වය මැනීම. ප්‍රවාහ ප්‍රවේශය - කාල පරාසවල ප්‍රක්ෂේපිත ගලා ඒම් සහ පිටාර ගැලීම් තක්සේරු කිරීම. ද්‍රවශීලතා අනුපාත මත පීඩනය පරීක්ෂා කිරීම.

අවදානම් විශ්වය

සමාලෝචනයට භාජනය වන විෂය තුළ බැංකුවේ ප්‍රධාන අවදානම් නිරාවරණ වල ආකෘතිය ඉදිරිපත් කිරීම පහත දැක්වේ,



බැංකුව මුහුණ දෙන අවදානම් ලැයිස්තුව සහ බැංකුව පවතින පදනම මත ක්‍රමානුකූලව අවදානම කළමනාකරණය කළ ආකාරය පහත දැක්වේ,

ණය අවදානම

සංවර්ධන බැංකුවක් වන ප්‍රාදේශීය සංවර්ධන බැංකුව සතු ප්‍රධාන ව්‍යාපාරික මාර්ගය වන්නේ ණය ආශ්‍රිත මෙහෙයුම් වේ. ඒ සමස්ත ණය ආවරණය අප සතු මුළු වත්කම් වලින් 74%කි. බැංකුවේ ප්‍රධාන ව්‍යාපාරික කාර්යය වන්නේ ණය ලබා දීම වන හෙයින් කළමනාකරණය කරගත යුතු ඉතාම වැදගත් අවදානම් වර්ගය වන්නේ ණය අවදානමයි. එම නිසා ණය අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය කෙරෙහි බැංකුව සැලකිය යුතු බර තැබීමක් සිදු කරයි.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලදුව සමාලෝචනය කර ඇති ණය අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති ණය අවදානම් කළමනාකරණය කිරීම සඳහා වන ප්‍රධානතම මාර්ගෝපදේශය වන අතර ණය අවදානම් හඳුනා ගැනීම සඳහා වන ප්‍රතිපත්ති හා ක්‍රිමවේද සියල්ලම ඊට ඇතුළත් වේ.

බැංකුවේ ණය අවදානම් කළමනාකරණ රාමුව පහත සඳහන් ප්‍රධාන කාර්යයන්ගෙන් සමන්විත වන අතර එය බැංකුවේ ණය කළඹ අවදානම් කළමනාකරණය සඳහා විශාල දායකත්වයක් ලබා දුන්නේය.

පූර්ව ණය අනුමත කිරීම	අනුමත කිරීමේ අධිකාරිත්ව මට්ටම්	පළපුරුදු ණය නිලධාරීන් විසින් ණය යෝජනා විශ්ලේෂණය කර අදාළ අනුමත කිරීමේ අධිකාරී මට්ටමට භාර දෙනු ලැබේ. කෙසේ වෙතත්, ඉහළ වටිනාකමක් සහිත ණය යෝජනා ණය කමිටුව සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරනු ලැබේ.
	ප්‍රධාන අවදානම නිලධාරී (CRO) විසින් කරන ස්වාධීන සමාලෝචනය	ආරක්ෂණ අවදානම, මූල්‍ය අවදානම, කළමනාකරණ අවදානම, ව්‍යාපෘති අවදානම, වෙළඳපල අවදානම සහ ණය ගැනුම්කරු ශ්‍රේණිගත කිරීමේ ආකෘති වැනි ණය අවදානම් කාණ්ඩ සඳහා වූ සීමාවන් පිළිබඳ සමාලෝචනයන්
	අවදානම් ශ්‍රේණිගත කිරීම	බැංකුව විසින් 2016 අගෝස්තු මාසයේ සිට බැංකු විශේෂිත ආකෘතිය මත පදනම්ව ගනුදෙනුකරුවන් ශ්‍රේණිගත කිරීම හඳුන්වා දී ඇත. ගනුදෙනුකරුවන් AAA" AA" A සහ BBB ලෙස ශ්‍රේණිගත කර ඇත. චක්‍රලේඛයේ දක්වා ඇති උපදෙස් වලට අනුව BBB ශ්‍රේණිගත කිරීම් ඇති ගනුදෙනුකරුවෝ බැංකුවෙන් ණය පහසුකමක් ලබා ගැනීමට සුදුසුකම් නොලබති.
	අවදානම් මත පදනම් මිල ගණන්	ගනුදෙනුකාර අවදානම් ශ්‍රේණිගත කිරීම මත පදනම්ව බැංකුව විසින් මෙම ණය පහසුකමේහි මිල ගලපා ඇත. මෙම මිල කරන ක්‍රමය අදාළ වනුයේ බැංකු අරමුදල් යටතේ සලකා බැලෙන ණය පහසුකම් සඳහා පමණක් වන අතර අනෙකුත් ප්‍රතිමූල්‍ය යෝජනා ක්‍රම යටතේ සලකා බැලෙන ණය පහසුකම් අවදානම් පාදක මිලකරණ ක්‍රමවේදයෙන් බැහැර කෙරේ.
පසු ණය අනුමත කිරීම	ණය පරිපාලන ඒකකය	ණය කළඹේ පරිපාලන ක්‍රියාවලිය ඉහළ නැංවීමේ අරමුණින් 2016 මාර්තු මාසයේදී බැංකුව විසින්
	අබණ්ඩ හා ශක්තිමත් ණය සමාලෝචන ක්‍රියාවලියක්	ණය පරිපාලන ඒකකය පිහිටුවන ලද අතර එය දැනට නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරයෙකුගේ ප්‍රධානත්වයෙන් ක්‍රියාත්මක වේ.
	ණය සමාලෝචන යාන්ත්‍රණය (LRM)	2017 වසරේ සිට ණය කළඹෙහි ගුණාත්මක භාවය පවත්වා ගනු පිණිස ප්‍රාදේශීය සංවර්ධන බැංකුව විසින් විස්තීර්ණ ණය
	ණය තත්ව සහතිකය යටතේ කළඹ ඇගයීමේ ණය සමාලෝචන යාන්ත්‍රණය	සමාලෝචන යාන්ත්‍රණයක් ස්ථාපිත කරන ලදී. ඒ අනුව ගුණාත්මක හා ප්‍රමාණාත්මක ණය පරිපාලන ක්‍රමවේදය වැඩි දියුණු කරනු පිණිස ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ ණය සමාලෝචන ප්‍රතිපත්තියට අනුව සමාලෝචන යාන්ත්‍රණය වෙනුවෙන් පොදු කාර්ය රාමුවක් පිහිටුවන ලදී. මෙම සමාලෝචනය මගින් බැංකුවේ ණය කළඹෙන් 40% කට අධිකව තිබිය යුතු නියමිත සීමාවට ඉහළින් පවතින සක්‍රිය ණය සියල්ලම ආවරණය විය යුතුය. එකී සීමාව ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ නිර්දේශිය සහිතව අධ්‍යක්ෂක මණ්ඩලය විසින් තීරණය අනුමත කළ යුතු වේ.
	නිගමනය කළ යුතු ගණුදෙනුකරුවන් අධීක්ෂණය	අවශ්‍යතා සහ ආතතීන් හඳුනා ගැනීම සඳහා ගනුදෙනුකරුවන් සමඟ ක්‍රියාශීලීව කටයුතු කිරීම. ආතති පරීක්ෂා කිරීම් සහ දර්ශන විශ්ලේෂණයන්.

ණය අලාභ සඳහා ප්‍රතිපාදන (හානිකරන ප්‍රතිපාදන සහ ශ්‍රී ලංකා මහ බැංකුව ප්‍රතිපාදන)

ශ්‍රී ලංකාවේ දැනට පවතින ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලතාව දැක්වීම උදෙසා අප බැංකුව ක්‍රම දෙකක් පදනම් කරගනිමින් ණය අලාභ සඳහා හානිකරන ගණනය කර තිබේ.

- කේවල හානි කරණය.
- ඒකාබද්ධ හානිකරණය

ශ්‍රී ලංකා මහ බැංකුවේ මාර්ගෝපදේශ වලට අනුව මීට අදාළ ප්‍රතිපාදන සැකසීමේ ක්‍රම දෙකක් බැංකුව සතු වේ. එම ප්‍රතිපාදන කාණ්ඩ වන්නේ.

- සාමාන්‍ය ප්‍රතිපාදන (ශ්‍රී ලංකා මහ බැංකුවේ මාර්ගෝපදේශ වලට අනුව)
- විශේෂිත ප්‍රතිපාදන (ශ්‍රී ලංකා මහ බැංකුවේ මාර්ගෝපදේශ වලට අනුව)

අවදානම් කළමනාකරණය

බැංකුවේ වෙන්කිරීම ආවරණ අනුපාතය සහ විවෘත ණය නිරාවරණ අනුපාතය අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් වරින් වර ගණනය කර විශ්ලේෂණය කරනු ලැබේ. අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව සිය නිරීක්ෂණ සමඟ මෙම අනුපාතයන් මාසිකව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරයි.

SLFR 9 ක්‍රියාත්මක කිරීම

බැංකුව විසින් 2018 ජනවාරි මාසයේ සිට SLFR 9 ක්‍රියාත්මක කරන ලදී. මෙම වෙන්කිරීම් ක්‍රමය පැහැර හැරීමට ලක්වූ නිරාවරණ (EAD) ණය පැහැර හැරීමේ සම්භාවිතාව (PD), අලාභ ගෙන එන ලද පැහැර හැරීම සහ 1 වැනි 2 වැනි සහ 3 වැනි වාරික හිඟවීම් භාවිතා කරමින් දරන ලද ණය අලාභය මත වූ ඉදිරි දැක්ම මත පදනම් වේ.

අංශ සීමාවන් සහ සංකේන්ද්‍රණ අවදානම කළමනාකරණය

ණය අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය මගින් ණය ලබා ගැනීම සඳහා බැංකුව විසින් අනුමත කරන ලද ආංශික සීමාවන් ස්ථාපිත කර ඇත. ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව වරින් වර ආර්ථික හා කර්මාන්ත ප්‍රවණතාවන් අනුව මෙම සීමාවන් අනුමත කළේය. ව්‍යාපාරික ඒකක මෙම අංශයේ සීමාවන්ට අනුව ඔවුන්ගේ තනි ණය කළඹ කළමනාකරණය කරයි.

2021 දී ණය අවදානම් කළමනාකරණය

2021 වර්ෂයේදී ප්‍රාදේශීය සංවර්ධන බැංකුව විසින් සමීප ගනුදෙනුකරුවන්ගේ සහභාගිත්වය තුළින් සියලු ණය ගැනීම් අඛණ්ඩව අධීක්ෂණය කරන ලද අතර, බලපෑමට ලක් වූ ගනුදෙනුකරුවන් සඳහා නම්‍යශීලී ආපසු ගෙවීමේ යෝජනා ක්‍රම සහ පහසුකම් ප්‍රතිව්‍යුහගත කිරීම සිදු කරන ලදී.

අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව බැංකුවේ ණය කළඹ විශ්ලේෂණය කරන අතර මාසිකව ස්වාධීන නිරීක්ෂණ සහිතව KRI (ප්‍රධාන අවදානම් දර්ශක) වාර්තාව යටතේ අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කරයි. KRI වාර්තාවේ මුළු ණය කළඹ විශ්ලේෂණය, NPA විශ්ලේෂණය, ණය ප්‍රතිපාදන විශ්ලේෂණය, තැන්පතු කළඹ විශ්ලේෂණය සහ ද්‍රවශීලතා අවදානම් විශ්ලේෂණය යනාදිය ඇතුළත් වේ. අවදානම් කළමනාකරණ අංශය මාසික පදනම මත පදනම්ව නිගමනය කළ යුතු ගනුදෙනුකරුවන් සමීපව අධීක්ෂණය කරන අතර අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කරයි.

කොවිඩ්-19 ගෝලීය වසංගත තත්ත්වය හේතුවෙන් රට මුහුණ දී සිටින ආර්ථික අභියෝග මධ්‍යයේ කර්මාන්තයේ පිරිහුණු ණය තත්ත්ව මට්ටම කෙරෙහි 2021 වර්ෂයේ දී ප්‍රධාන අවධානය යොමු කරන ලදී. ණය ප්‍රමිතිය පිරිහීම වැළැක්වීමේ අරමුණින් බලපෑමට ලක්වූ ක්ෂේත්‍ර සහ අවදානම් අවම කිරීම සඳහා බැංකුවේ පාලනය යටතේ පවතින සාධක පිළිබඳ සාකච්ඡා නිසි ලෙස සලකා බලන ලදී.

ණය සහන (Moratorium)වලට භාජනය වූ ණය පහසුකම් අඛණ්ඩව පසු විපරම් කිරීම, දිරිගැන්වීම් ලබා දීම වැනි අයකර ගැනීමේ මූලපිරීම් සහ ණය අනුමත කිරීම් සඳහා ලබා දී ඇති ඉහළ මට්ටමේ අවධානය සහ පශ්චාත් අනුමත අධීක්ෂණය සහ අයකර ගැනීමේ උත්සාහයන් සහ ආතතියට පත් ණය ගැනියන් කලින් හඳුනා ගැනීම සැලසුම් සහගතව ක්‍රියාත්මක කිරීම මගින් විභව ණය අවදානම අවම කිරීම සඳහා බැංකුවට සහාය වනු ඇත.

ද්‍රවශීලතා අවදානම

ද්‍රවශීලතා අවදානම යනු මුදල් හෝ මූල්‍ය වත්කම් ලබාදීම තුළින් සිය මූල්‍යමය වගකීම් පියවීමට අසීරු වීම නිසා බැංකුවට මුහුණදීමට සිදුවන අවදානමයි. අප බැංකුව ද්‍රවශීලතාව සම්බන්ධයෙන් සෑම විටම බැංකුවේ ද්‍රවශීලතා කළමනාකරණ කාර්ය රාමුව සහ ශ්‍රී ලංකා මහා බැංකු මාර්ගෝපදේශ වලට අනුකූලතාව දක්වමින් කටයුතු කර ඇත. එම අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා බැංකුව අඛණ්ඩ පදනමක් මත ද්‍රවශීල වත්කම් සහ වගකීම් ඇගයීමට ලක් කරයි.

ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි, මිනුම් ප්‍රවේශයන්, අවම කිරීමේ ක්‍රියාමාර්ග, ආතති පරීක්ෂණ ක්‍රමවේදයන් සහ හදිසි අරමුදල් විධිවිධාන හරහා බැංකුව ද්‍රවශීලතා අවදානම කළමනාකරණය කරයි.

ද්‍රවශීලතා අවදානම් කළමනාකරණය කිරීමේ වගකීම වත්කම් හා වගකීම් කළමනාකරණ කමිටුව වෙත පැවරේ. නියාමන අවශ්‍යතා සහ අභ්‍යන්තර ඉලක්කවලට අනුකූල වීම සහතික කිරීම සඳහා බැංකුවේ ද්‍රවශීලතා තත්ත්වය අඛණ්ඩව අධීක්ෂණය කරයි. ද්‍රවශීලතා දර්ශක පවත්වා ගෙන යාම සහතික කිරීමට මණ්ඩලයට හැකි වන පරිදි අධ්‍යක්ෂ මණ්ඩලය ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවට සහ මණ්ඩලයට නිතිපතා යාවත්කාලීන කිරීම් ඇතුළු ව වාර්තා කිරීමේ අවශ්‍යතාව ඇත.

2021 දී ද්‍රවශීලතා අවදානම් කළමනාකරණය

ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් එහි ද්‍රවශීලතාව කළමනාකරණය කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා පහත සඳහන් අධීක්ෂණ යාන්ත්‍රණය සහ ප්‍රවේශයන් භාවිතා කරනු ලැබේ.

- ද්‍රවශීලතා අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය සහ වත්කම් බැරකම් කළමනාකරණ ප්‍රතිපත්තිය වැනි ප්‍රතිපත්ති, ද්‍රවශීලතා අවදානම් නිරාවරණ කළමනාකරණය කිරීමේදී අනුගමනය කළ යුතු යාන්ත්‍රණයන්, මෙවලම් සහ පීඩන පරීක්ෂණ ක්‍රමවේදයන් පිළිබඳ මාර්ගෝපදේශනය සපයයි.
- කොටස් ප්‍රවේශය -ද්‍රවශීලතා අනුපාත හරහා ද්‍රවශීලතා තත්ත්වය මැනීම.
- ප්‍රවාහ ප්‍රවේශය - කාල පරාසවල ප්‍රක්ෂේපිත ගලාවීම් සහ පිටාර ගැලීම් තක්සේරු කිරීම.
- හදිසි අරමුදල - ද්‍රවශීලතා පීඩනයකදී මෙහෙයුම් සුමටව පවත්වාගෙන යාම සහතික කිරීම සඳහා හදිසි අරමුදලක් ලබා ගත හැකිය

අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් විවිධ බරපතල තත්වයන් හා සබැඳි අවස්ථා තුනක් යටතේ බැංකුවේ ද්‍රවශීලතාව සම්බන්ධ පීඩන පරීක්ෂාවක් සිදුකරනු ලැබේ. සෑම මසකම එම දෙපාර්තමේන්තුව පීඩන පරීක්ෂාවේ ප්‍රතිඵල ඇගයීමට ලක්කරන අතර අනපේක්ෂිත තත්ත්ව මගින් බැංකුවේ ද්‍රවශීලතාව වෙත විල්ලවීමට ඉඩ ඇති බලපෑම් මිනුම් ගත කරයි. ඒ පීඩන පරීක්ෂාවේ ප්‍රතිඵලවලට අනුව එවැනි අවස්ථාවලදී අනුගමනය කිරීමට සුදුසු පියවර සහ අරමුදල් යෙදීම් සම්බන්ධයෙන් අවදානම් කළමණාකරණ දෙපාර්තමේන්තුව විසින් වත්කම් හා වගකීම් කළමනාකරණ කමිටුව හරහා අධ්‍යක්ෂක මණ්ඩලය දැනුවත් කරනු ලැබේ.

සියලු ද්‍රවශීලතා දර්ශක ද්‍රවශීලතා ප්‍රතිපත්තිය මගින් නිර්වචනය කර ඇති පරාමිතීන් හා සීමාවන් සමඟ සහ අදාළ සියලු නියාමන අවශ්‍යතාවලට අනුකූලව සුමටලෙස පවත්වා ගෙන යන ලදී.

	දෙසැම්බර් 31 2020	දෙසැම්බර් 31 2021
ණය සහ තැන්පතු අනුපාතය	97.35%	**101.65%**
ව්‍යවස්ථාපිත ද්‍රවශීලතා වත්කම් අනුපාතය	29.30%	**26.18%**
ද්‍රවශීලතා ආවරණ අනුපාතය	145.71%	**174.36%**
මුළු වත්කම් සඳහා මුළු ණය	70.65%	**75.86%**

කල්පිරීමේ පරතර විශ්ලේෂණය

බැංකුවේ මූල්‍ය වත්කම් හා බැරකම් පිළිබඳ කල්පිරීමේ විශ්ලේෂණය මගින් නිරීක්ෂණය කරන ලද නියමිත හැසිරීම් රටාවන් මත පදනම්ව අපේක්ෂා කළ හැකි අහිතකර තත්වයන් සඳහා ප්‍රමාණවත් අරමුදල් ලබා දීම පෙන්නුම් කරයි. බැංකුවේ මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් පිළිබඳ කල්පිරීමේ විශ්ලේෂණය මගින් චෙතිහාසික චර්යා රටා මත පදනම් වූ කිසිදු අහිතකර තත්ත්වයක් පෙන්නුම් නොකෙරේ.

මෙහෙයුම් අවදානම

මෙහෙයුම් අවදානම යනු අභ්‍යන්තර පාලන ක්‍රියාවලීන්, පුද්ගලයින් සහ පද්ධති හා ස්වාභාවික ආපදා, සමාජ හෝ දේශපාලන සිදුවීම් වැනි බාහිර සිදුවීම් හෝ අසාර්ථක හෝ ප්‍රමාණවත් නොවීම හේතුවෙන් ණය හෝ වෙළඳපොළ වශයෙන් අනපේක්ෂිත ඍජු හෝ වක්‍ර අලාභ වෙතින් ඉස්මතු විය හැකි අවදානම ගම්‍ය කරන්නකි. එය සියලු බැංකු නිෂ්පාදන හා ක්‍රියාවලීන් හි ආවේණික වන අතර බැංකුවේ පරමාර්ථය වන්නේ පිරිවැය ඵලදායී ආකාරයකින් එය පාලනය කිරීමයි.

2,600කට අධික කාර්ය මණ්ඩලයක් සහිත දීප ව්‍යාප්ත ශාඛා 272ක් සහ උපකාරක සේවා සඳහා සම්මත තාක්ෂණික විසඳුම් (බැංකු පද්ධතිය, ATM සහ CDM හා මානව සම්පත් පද්ධතිය) බැංකුව සතු වේ.

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව 2013 දී විස්තීර්ණ මෙහෙයුම් අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තියක් ස්ථාපිත කර ඇති අතර එය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇත. බැංකුවේ මෙහෙයුම් අවදානම් කළමනාකරණය සඳහා මෙය ප්‍රධාන මග පෙන්වීමක් වන අතර එය වරින් වර සමාලෝචනය කරනු ලැබේ. ප්‍රතිපත්ති, අවදානම් ඇගයීම, රක්ෂණ ආවරණය ඇතුළු අවදානම් අවම කිරීම, ව්‍යාපාර කටයුතු බාහිරකරණය ට අදාළ ක්‍රියා පටිපාටි, තාක්ෂණික අවදානම කළමනාකරණය කිරීම, පුළුල් ව්‍යාපාර අඛණ්ඩ සැලැස්මක් (BCP) සහ ආපදා ප්‍රතිසාධන සැලැස්ම (DRP), බැංකුව පුරා අවදානම් පිළිබඳ දැනුවත් කිරීමේ සංස්කෘතියක් ඇති කිරීම, පීඩනය පරීක්ෂා කිරීම සහ අධීක්ෂණය සහ වාර්තාකිරීම තුළින් බැංකුව මෙහෙයුම් අවදානම කළමනාකරණය කරයි.

2021 දී මෙහෙයුම් අවදානම් කළමනාකරණය

වසංගත තත්ත්වය සහ නිවසේ සිට වැඩ කිරීම වැනි වැඩ කිරීමේ නව ක්‍රම වෙත මාරුවීම හේතුවෙන් පැවති තත්වයන් නොතකා බැංකුව නියමිත සීමාවන් තුළ මෙහෙයුම් අවදානම් පරාමිතීන් සාර්ථකව පවත්වා ගෙන ගියේය. 2021 වර්ෂය තුළ, නියාමන උල්ලංඝනය කිරීම්, බෙදාහැරීමේ සහ ක්‍රියාවලි කළමනාකරණය, ශාඛා මෙහෙයුම් පිළිබඳ පැමිණිලි කිරීම, ජාලගත කාලය සහ අභ්‍යන්තර අලාභ දත්ත සිදුවීම් යටතේ වර්ගීකරණය කර ඇති මෙහෙයුම් අවදානම අධ්‍යක්ෂ මණ්ඩලය ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව සහ මණ්ඩලය නිතිපතා යාවත්කාලීන කරනු ලැබේ. මෙම වසරේ සිදුවූ අලාභ මූලික වශයෙන් මෙම කාණ්ඩවල සීමිත සිදුවීම් සංඛ්‍යාවක් විසින් මෙහෙයවනු ලැබූ අතර ඒ සියල්ල බැංකුවට අවම මූල්‍යය බලපෑමක් සහිතව පසුකාලීනව යථා තත්ත්වයට පත් කිරීමට / නිවැරදි කිරීම තුළින් විසඳීමට බැංකුව සමත් විය.

තාක්ෂණය සහ සයිබර් ආරක්ෂණ අවදානම්

තොරතුරු තාක්ෂණ සහ සයිබර් ආරක්ෂණ අවදානම යනු පද්ධති බාධා / අසමත්වීම්, දෝෂ, පද්ධති හැසිරවීම් හරහා වංචා, සයිබර් ප්‍රහාර, යෙදුම්වල නොගැලපීම වැනි තොරතුරු තාක්ෂණ ආශ්‍රිත සිදුවීම් වලින් සමන්විත මෙහෙයුම් අවදානමේ ප්‍රධාන අංගයක් වන අතර එය සමස්ත ව්‍යාපාරයටම බලපෑම් කළ හැකිය.

තොරතුරු තාක්ෂණ අවදානම කළමනාකරණය කිරීම අභියෝගයක් වන අතර එම නිසා, තොරතුරු තාක්ෂණ අවදානම විසඳීම, සයිබර් ආරක්ෂණ උපාය මාර්ග කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම සහ සයිබර් ආරක්ෂණ හැකියාවන් වැඩිදියුණු කිරීම සඳහා අඛණ්ඩව ආයෝජනය කිරීම සඳහා බැංකුව ඉහළ ප්‍රමුඛතාවයක් ලබා දී ඇත. තොරතුරු තාක්ෂණ අවදානම මණ්ඩලය විසින් අනුමත කරන ලද තොරතුරු ආරක්ෂණ කළමනාකරණ රාමුව හරහා කළමනාකරණය කරනු ලබන අතර එය ශක්තිමත් අවදානම් පාලන ව්‍යුහයක්, තොරතුරු ආරක්ෂණ කළමනාකරණ ප්‍රතිපත්තියක් සහ පිළිගත හැකි භාවිත ප්‍රතිපත්තියකින් සමන්විත වේ.

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව දැනට මධ්‍යගත තොරතුරු තාක්ෂණ විසඳුමක් මත සිටින අතර ඔවුන්ගේ පාරිභෝගික කොටස් සඳහා ඩිජිටල් බැංකුකරණ විකල්ප ලබා දෙයි. 2015 වසරේ සිට ප්‍රාදේශීය සංවර්ධන බැංකුව ලංකා පේ (Lankapay)සේවා ජාලය හා සම්බන්ධ වෙමින් හා බැංකුවටම අයත් ස්වයංක්‍රිය ටෙලර් යන්ත්‍ර හරහා දිවයින පුරා සිටින ගනුදෙනුකරුවන් වෙත ස්වයංක්‍රිය ටෙලර් යන්ත්‍ර පහසුකම් සපයා ඇත. මේ වන විට ප්‍රාදේශීය සංවර්ධන බැංකුව මුදල් තැන්පතු යන්ත්‍ර (CDM) හරහා ද සිය ගනුදෙනුකරුවන්ට පහසුකම් සපයා ඇත. තවද, දැනට බාහිරින් ලබා දී ඇති පහත දැක්වෙන මෙහෙයුම් පද්ධති බැංකුව සතුව ඇත.

- දොරින් දොර තැන්පතු යෙදවුම
- QR මත පදනම් වූ ගනුදෙනු පහසුකම
- මුදල් තැන්පතු යන්ත්‍රය (CDM)
- කෙටි පණිවුඩ දොරටුව යෙදවුම
- සේවක දත්ත පදනම හා වැටුප් කළමනාකරණය කිරීම සඳහා මානව සම්පත් කළමනාකරණ පද්ධතිය (HCM)

අවදානම් කළමනාකරණය

තොරතුරු තාක්ෂණ මෙහෙයුම් කමිටුව යනු බැංකුවේ තොරතුරු හා තොරතුරු පද්ධතිවල ප්‍රධාන පාලන ව්‍යුහයයි. බැංකුව විසින් 2013 දී බැංකුවේ ප්‍රධාන තොරතුරු නිලධාරී (CIO) ගේ ප්‍රධානත්වයෙන් තොරතුරු තාක්ෂණ මෙහෙයුම් කමිටුවක් පිහිටුවා ඇති අතර එය සියලුම තාක්ෂණික පුද්ගලයින් සහ ප්‍රධාන අවදානම් නිලධාරී (CRO) නියෝජනය කරන අතර වරින් වර බැංකුවේ තොරතුරු තාක්ෂණ සම්බන්ධ සියලු ගැටළු සාකච්ඡා කර අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ සහ විසඳුම් ලබා දෙයි.

ආරක්ෂක අංශ වාර්ෂික අවදානම් තක්සේරු කිරීම් සහ විනිවිද යාමේ පරීක්ෂණය මගින් ආවරණය කරනු ලැබේ. තවද, බැංකුවේ ව්‍යාපාර කටයුතු බාහිරකරණයට අදාළ ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි මගින් බැංකුවේ බාහිර සේවා විධිවිධාන වලින් පැන නගින සියලු සැලකිය යුතු අවදානම් අඛණ්ඩව හඳුනාගෙන ඵලදායී ලෙස කළමනාකරණය කිරීම සහතික කරනු ලැබේ. නව ගිවිසුම් ක්‍රියාත්මක කිරීමට සහ පවතින ගිවිසුම් අළුත් කිරීමට පෙර බාහිරින් ලබා ගත් වෙළෙන්දන් පිළිබඳ නිසි කඩිනම් පරීක්ෂණ අදාළ අවදානම් හිමිකරුවන් විසින් සිදු කරනු ලැබේ.

වෙළඳපොළ අවදානම්

ඉපැයීම් වල වෙනස්කම් හෝ පොලී අනුපාත, විදේශ විනිමය අනුපාත, කොටස් මිල ගණන් සහ භාණ්ඩ මිල ගණන් වැනි වෙළඳපල විචල්‍යන්හි අහිතකර චලනයන් හේතුවෙන් මූල්‍ය උපකරණ කළඹක අනාගත මුදල් ප්‍රවාහයන් වැනි වෙළඳපොළ මෙහෙයවන විචල්‍යයන්හි චලනයන්ගෙන් පැන නගින අලාභයේ අවදානම් වේ.

පොලී අනුපාත අවදානම

පොලී අනුපාත ආශ්‍රිත බරපතල ගණයේ විචල්‍යතා වෙත බැංකුවේ මූල්‍ය තත්වය නිරාවරණය වීම පොලී අනුපාත අවදානම ලෙස හැඳින්වේ. පොලී අනුපාත වෙනස් වීම හේතුවෙන් බැංකුවේ ඉපැයීම් මෙන්ම වත්කම්, වගකීම් (බැරකම්) සහ ශේෂ පත්‍රයෙන් බැහැර අයිතම කෙරේ බලපෑමක් එල්ලවිය හැක.

විදේශ විනිමය අවදානම

විදේශ විනිමය අවදානම යනු මුදල් උච්චාවචනයන් හේතුවෙන් ප්‍රාදේශීය සංවර්ධන බැංකුව පාඩු ලැබීමට ඇති හැකියාවයි. නිශ්චිත විදේශ මුදල් වල වත්කම් හා බැරකම් වල නොගැලපීම් හේතුවෙන් මෙම අවදානම පැන නගී. එපමණක් නොව, විනිමය අනුපාත චලනයන් සමඟ ශුද්ධ නිරාවරණ අගයන්හි උච්චාවචනයන්, ආසියානු සංවර්ධන බැංකුව විසින් ලබා දී ඇති ණය අරමුදල් හේතුවෙන් මහා පරිමාණයෙන් බැංකුවට අහිතකර ලෙස බලපෑම් කිරීම හේතුවෙන් ද මෙය මතු විය හැකිය.

2021 දී වෙළඳපොළ අවදානම් කළමනාකරණය

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද වෙළඳපල අවදානම් කළමනාකරණ රාමුව හරහා වෙළඳපල අවදානම කළමනාකරණය කරනු ලබන අතර එය ශක්තිමත් අවදානම් පාලන ව්‍යුහයක් සහ පොලී අනුපාත අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය, විදේශ විනිමය අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය, වත්කම් හා වගකීම් කමිටු (ALCO) ප්‍රකාශය පිළිබඳ අලුතින් හඳුන්වා දුන් ප්‍රතිපත්ති වලින් සමන්විත වේ.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද පොලී අනුපාත අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තියට අනුව බැංකුවේ පරතරය සහ කාලසීමා විශ්ලේෂණය මත පදනම්ව පොලී අනුපාත තීරණය කිරීමේ වගකීම වත්කම් හා වගකීම් කමිටුව (ALCO) වෙත පැවරේ. මෙම විශ්ලේෂණය මත පදනම්ව, අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව පොලී අනුපාත උච්චාවචනයන් සහ විදේශ මුදල් උච්චාවචනයන් පිළිබඳ අවදානම් ඇගයීම සිදු කරනු ඇත.

දැනට වත්කම් හා වගකීම් කමිටුව (ALCO) විසින් ණය සහ තැන්පතු යන දෙකම සඳහා පොලී අනුපාත තීරණය කරනු ලබන්නේ වෙළඳපොළ තත්වයන් සහ ණය තැන්පතු අනුපාතය මත පදනම්වය.

RDB හි අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් එහි වෙළඳපල අවදානම කළමනාකරණය කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා පහත සඳහන් අධීක්ෂණ යාන්ත්‍රණය සහ ප්‍රවේශයන් භාවිතා කරනු ලැබේ.

පොලී අනුපාත අවදානම - කල්පිරීමේ පරතරය පිළිබඳ වාර්තාව සකස් කරනු ලබන්නේ කල්පිරීම අනුව අනුපාත සංවේදී වත්කම් (RSA) සහ අනුපාත සංවේදී වගකීම් (RSL) විවිධ කාල රාමුවලට බෙදීමෙනි. ඉතුරුම් තැන්පතු වල ශේෂය බැංකුව විසින් සිදු කරන ලද චර්යාත්මක විශ්ලේෂණයක සොයාගැනීම් වලට අනුකූලව බෙදා හරිනු ලැබේ.

විදේශ විනිමය අවදානම් - අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් විදේශ විනිමය හි පීඩන තත්වයන්හි බලපෑම මැනීම සඳහා "පීඩන පරීක්ෂණ සැකිල්ල" ක්‍රියාත්මක කර ඇත. ශුද්ධ විදේශ විනිමය වාසිය හෝ අවාසිය මැනීමට ශුද්ධ විදේශ විනිමය ලැබීම් හා ගෙවීම් සැලකිල්ලට ගනී. එවිට බැංකුව එහි ශුද්ධ විවෘත තත්ත්වය සහ ප්‍රාග්ධන ගාස්තුව නිශ්චිත පීඩන තත්වයන් මත පදනම්ව අවධාරණය කරනු ඇත.

අනුකූලතා අවදානම් කළමනාකරණය

අනුකූලතාව සහ නියාමන අවදානම සෘජුවම සිදුවන්නේ අදාළ නීති හා රෙගුලාසි, උපදෙස්, ප්‍රතිපත්ති හා චර්යා ධර්ම බැංකු ක්ෂේත්‍රයේ ප්‍රයෝගික ප්‍රමිතීන්ට අනුකූල නොවීමෙනි.බැංකුව කෙරෙහි ඇති වගකීම් අසාර්ථක වීම හෝ උල්ලංඝනය වීම වළක්වා ගැනීම සඳහා නියාමන අධිකාරිය මෙන්ම අනෙකුත් නෛතික / රාජ්‍ය ආයතන විසින් පනවා ඇති නීති රීති සහ රෙගුලාසි වලට විකඟව බැංකුව ගමන් කරන බව සහතික කිරීම කෙරෙහි බැංකුවේ කළමනාකාරිත්වය විශාල අවධානයක් යොමු කරයි.

අනුකූලතා නිලධාරීන් සතු ප්‍රධානතම අරමුණ වන්නේ අභ්‍යන්තර පාලනයන්/ නියාමන. අවශ්‍යතා වෙත නිසි අනුකූලතාව දක්වනු ලැබෙන්නේද යන්න සහතික කිරීමයි. බැංකුව අනුකූලතා කාර්යභාරය පවතින්නේ ජ්‍යෙෂ්ඨ සහකාර සාමාන්‍යාධිකාරි - අනුකූලතාගේ ප්‍රධානත්වයෙන් යුතු ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව යටතේය. එම අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා අනුකූලතා නිලධාරී විසින් අදාළ අනුකූලතා අවශ්‍යතා අධීක්ෂණය කොට තක්සේරු කරනු ලැබෙන අතර ඊට අදාල කාර්තුමය වාර්තා සමාලෝචනය සඳහා ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව වෙත යොමු කරනු ලැබේ. බැංකුවේ ව්‍යවස්ථාපිත වාර්තා නියමිත කලට නියාමන අධිකාරිය වෙත ඉදිරිපත් කෙරෙන්නේ ද යන්න අධීක්ෂණය කිරීමද අනුකූලතා නිලධාරී විසින් සිදු කෙරේ.

බැංකු අනුකූලතා ප්‍රතිපත්ති රාමුවට අනුකූලව අවදානම බැංකුව විසින් කළමනාකරණය කරනු ලබන ආකාරය පිළිබඳව සඳහන් කරන අධ්‍යක්ෂ මණ්ඩල අනුමත අනුකූලතා ප්‍රතිපත්තිය, AML ප්‍රතිපත්තිය, අදාළ පාර්ශවීය ගනුදෙනු සමාලෝචන ප්‍රතිපත්තිය සහ අනුකූලතා අත්පොත ඇතුළත් වේ.

2021 වර්ෂයේ අනුකූලතා අවදානම් කළමනාකරණය

බැංකුවේ අනුකූලතාව සහ නියාමන අවදානම අවම කිරීම සඳහා පහත සඳහන් ක්‍රියාමාර්ග ගෙන ඇත

- අදාළ ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටි කාලෝචිත ලෙස සමාලෝචනය කිරීම සහතික කිරීම.
- බැංකුව තුළ මුදල් විශුද්ධිකරණය (ML)/ත්‍රස්තවාදයට මුදල් සැපයීම (TF)අවදානම් ඇගයීම අනුගමනය කිරීම.
- බැංකුවේ ශාඛා, අංශ සහ නිෂ්පාදන පිළිබඳ අනුකූලතා ඇගයීම් සිදු කිරීම
- පුහුණු සැසි මගින් දැනුවත් කිරීම
- අධීක්ෂණ සැලකිල්ල තක්සේරු කිරීම සහ අධීක්ෂණය කිරීම

ප්‍රාග්ධන කළමනාකරණය

නියාමන ප්‍රග්ධන අවශ්‍යතා සපුරාලීම, එහි තැන්පත්කරුවන්ට/ණය හිමියන්ට මූල්‍ය සුරක්ෂිතතාව ලබා දීම, අනාගත ව්‍යාපාර ව්‍යාප්තිය සඳහා සහන සැලසීම සහ කොටස් හිමියන්ට ප්‍රමාණවත් ප්‍රතිලාභයක් උත්පාදනය කිරීම සඳහා බැංකුවට ශක්තිමත් ප්‍රාග්ධන තත්වයක් අවශ්‍ය වේ. එබැවින්, කාර්ය සාධන අවදානම අතර ප්‍රශස්ත සමතුලිතතාවය සාක්ෂාත් කර ගැනීම සහ අවදානම් මත බර තැබූ වත්කම් (RWA) මිශ්‍රණය සහ අවදානම් පැතිකඩෙහි වෙනස්කම් පිළිබඳ දැඩි අධීක්ෂණයක් සිදු කිරීම මගින් ප්‍රාග්ධනය වඩාත් කාර්යක්ෂමව කළමනාකරණය කිරීමට බැංකුව උත්සාහ කරයි. ප්‍රාග්ධන හා අවදානම් බර තැබූ වත්කම් අනුපාතය බැංකුවේ මූල්‍ය ස්ථාවරත්වය සහ කාර්යක්ෂමතාව ප්‍රවර්ධනය කරයි.

නියාමන අවශ්‍යතාවයට අනුකූල වීම සඳහා ක්‍රියාකාරී ප්‍රාග්ධන කළමනාකරණයක් ඇති කිරීම සඳහා වරින් වර ප්‍රාදේශීය සංවර්ධන බැංකුව සිය ප්‍රාග්ධන වැඩි කිරීමේ සැලැස්ම සංශෝධනය කර ඇත. ප්‍රාග්ධන කළමනාකරණ ක්‍රියාවලිය CBSL විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශයන්ට අනුකූලව වේ. 2019 අංක 11 දරණ බැංකු පනතේ උපදෙස් සහ බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා බාසල් III යටතේ ප්‍රාග්ධන අවශ්‍යතා පිළිබඳ උපදෙස් සංශෝධන වලට අනුව පහත වගුවේ දක්වා ඇති පරිදි අවම ප්‍රාග්ධන අනුපාත පවත්වා ගැනීම අවශ්‍යය වේ.

	නියාමන අවශ්‍යතාව	2020-දෙසැම්බර් වන විට සතය	2021-දෙසැම්බර් වන විට සතය
ස්ථර 1 ප්‍රාග්ධනය	8.50%	10.30%	**8.72%**
මුළු ප්‍රාග්ධන වකතුව	12.50%	14.84%	**14.27%**

අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවය තක්සේරු ක්‍රියාවලිය (ICAAP)

අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවය තක්සේරු කිරීමේ ක්‍රියාවලිය අවදානම් දරාගැනීමේ සීමාව, පීඩනය පරීක්ෂා කිරීම සහ ප්‍රාග්ධන සැලසුම් සංකල්ප වලින් සමන්විත වන අතර සියලු ද්‍රව්‍යමය අවදානම් ග්‍රහණය කර ගැනීම සඳහා හිතකර අවදානම් කළමනාකරණ රාමුවක් ඇත .ප්‍රාග්ධන අවශ්‍යතා තක්සේරු කිරීම සඳහා බැංකුව අභ්‍යන්තර ආකෘති භාවිතා කළේය. මෙය ව්‍යාපාර කාර්ය සාධනය, අවදානම් කළමනාකරණ ක්‍රියාවන් සහ අවදානම් සංවේදී ප්‍රාග්ධනය ඒකාබද්ධ කිරීමට උපකාරී වේ.

පුළුල් ලෙස ලේඛනගත අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණවත් තක්සේරු ක්‍රියාවලිය නියාමකයා වෙත ඉදිරිපත් කිරීමට පෙර වත්කම් හා වගකීම් කමිටුව (ALCO) සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධ්‍යක්ෂ මණ්ඩලය ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව හරහා සාකච්ඡා කර අනුමත කරනු ලැබේ. මණ්ඩලය සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ අධීක්ෂණය, අවදානම් පිළිබඳ පුළුල් තක්සේරුව, පීඩනය පරීක්ෂා කිරීම, අධීක්ෂණය, වාර්තාකිරීම, අභ්‍යන්තර පාලන සමාලෝචනය සහ එමගින් එහි උපායමාර්ගික න්‍යාය පත්‍රය ලබා දීම සඳහා ප්‍රමාණවත් ප්‍රාග්ධනයක් පවත්වා ගෙන යාම සහතික කිරීම යනාදිය මෙම ක්‍රියාවලියට ඇතුළත් වේ.

ඉදිරි වසර පහ සඳහා ප්‍රාග්ධන අවශ්‍යතා වරින් වර ඇගයීමට ලක් කිරීමටත්, ඒ මත පදනම්ව ප්‍රාග්ධන වැඩි කිරීමේ සැලසුම් සකස් කිරීමටත්, ශ්‍රී ලංකා මහ බැංකුව (CBSL) විසින් සමාලෝචනය සඳහා ඉදිරිපත් කිරීමටත් අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණවත් තක්සේරු ක්‍රියාවලිය බැංකුවට උපකාරී වේ.

සිය වර්ධන සැලසුම්/ පීඩනයට ලක්වූ වෙළඳපොළ තත්ත්වයන්ට ඔරොත්තු දීම සඳහා බැංකුවට ලබා ගත හැකි ප්‍රාග්ධන ස්වාරක්ෂකය (Capital Buffer)සමඟ බැංකුව සුරක්ෂිත වේ.

පීඩනය පරීක්ෂා කිරීම

ස්ථරය 11 (මුළු ප්‍රාග්ධනය)යටතේ පීඩනය පරීක්ෂා කිරීම අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණවත් තක්සේරු ක්‍රියාවලියෙහි අනිවාර්ය අංගයකි. පීඩනය පරීක්ෂා කිරීම අධීක්ෂණ සමාලෝචනයේ වැදගත් අංගයක් වන අතර විචල්‍යයන් රාශියකට බැංකුවේ අවදානම් පැතිකඩෙහි සංවේදීතාව ප්‍රදර්ශනය කරයි.බැංකුවේ පීඩන පරීක්ෂණ රාමුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද පීඩන පරීක්ෂණ ප්‍රතිපත්තිය සහ මණ්ඩලය විසින් අනුමත කරන ලද මාර්ගෝපදේශ මගින් පාලනය කරනු ලැබේ. ආපතති පරීක්ෂණ මගින් එය ක්‍රියාත්මක වන පරිසරයේ අහිතකර ආර්ථික, දේශපාලන හා භෞතික වෙනස්කම් යටතේ විවිධ බරපතලකමකින් යුත් අනපේක්ෂිත තත්වයන්ට ඔරොත්තු දීමේ බැංකුවට ඇති හැකියාව පිළිබඳ අවබෝධයක් ලබා දේ.

කොවිඩ්-19 වසංගතය හේතුවෙන් ඇති වූ ආර්ථික පසුබෑම පිළිබඳව නිසි අවධානය යොමු කරමින්, අපි පහත සඳහන් දෑ හරහා අපගේ පීඩන පරීක්ෂණ යාන්ත්‍රණය ශක්තිමත් කළෙමු,

- ණය අවදානම, පොලී අනුපාත අවදානම, මෙහෙයුම් අවදානම, ද්‍රවශීලතා අවදානම සහ විදේශ විනිමය අවදානම වැනි සියලු ද්‍රව්‍යමය අවදානම් පිළිබඳ පීඩන පරීක්ෂණ බැංකුවේ පීඩන පරීක්ෂණ රාමුවට ඇතුළත් වේ.
- ව්‍යාපාරික රේඛාව සහ අවදානම් වර්ගයේ මට්ටම් මත පදනම්ව ඇති විය හැකි නව අවස්ථා ඇතුළත් කිරීමෙන් පීඩන පරීක්ෂණ සිදු කිරීම.
- විදේශ විනිමය අවදානම තක්සේරු කිරීම සඳහා නිශ්චිතව දක්වා ඇති පීඩන තත්වයන් මත පදනම්ව බැංකුව සිය ශුද්ධ විවෘත තත්ත්වය සහ ප්‍රාග්ධන ගාස්තුව අවධාරණය කරයි.
- වෙළඳපොළ සහ ස්ථිර ද්‍රවශීලතා ආතතිය පවතින කාල පරිච්ඡේදයන් තුළ බලපෑමට ලක්විය හැකි දැනට පවතින අරමුදල් ප්‍රභවයන්ට අදාළ ගලා ඒම සහ පිටතට ගලා යාම සඳහා උපකල්පන භාවිතා කරමින් බැංකු ද්‍රවශීලතා පීඩන පරීක්ෂණ ආකෘති ක්‍රියාත්මක කර ඇත.
- ද්‍රවශීලතා ආවරණ අනුපාතය (LCR), ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාතය (SLAR), ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාතය (CAR) අහිතකර වෙළඳපල තත්ත්වය කෙරෙහි ඇති කරන බලපෑමට අනුකූලව පරීක්ෂා කිරීම සඳහා නව තත්වයන් නිර්මාණය කරන ලදී.

ආයතනික පරිපාලනය



68 ආයතනික පාලනය පිළිබඳ විගණකාධිපති වාර්තාව

69 ආයතනික පරිපාලනය

93 අධ්‍යක්ෂ මණ්ඩල හා අධ්‍යක්ෂ කමිටුවල පැමිණීම

94 අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

99 අධ්‍යක්ෂ මණ්ඩලය මානව සම්පත් හා වැටුප් කමිටුව,

100 අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටු වාර්තාව

101 අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කමිටු වාර්තාව

102 අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාව

104 අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව

107 ප්‍රධාන විධායක නිලධාරි සහ ප්‍රධාන මූල්‍ය නිලධාරිගේ වගකීම් ප්‍රකාශය

108 අභ්‍යන්තර පාලන ප්‍රකාශය පිළිබඳ විගණකාධිපති වාර්තාව

110 මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය

111 මූල්‍ය වාර්තාකරණය කෙරෙහි අධ්‍යක්ෂවරුන්ගේ වගකීම

ආයතනික පාලනය පිළිබඳ විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. BAN/E/RDB/CG/2021

මඹෙ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 09 September 2022

ජාතික විගණන කාර්යාලය
සභාපති

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2021 දෙසැම්බර් 31 වැනි දින නිකුත් කරන ලද ආයතනික පාලනය පිළිබඳ නියමය වෙත අනුකූලතාව දැක්වීමේ අවශ්‍යතාව පිළිබඳව ප්‍රාදේශීය සංවර්ධන බැංකුවට අදාළ සිද්ධි වාචක ප්‍රතිචල පිළිබඳ විගණකාධිපති වාර්තාව.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද පාලන නියමයන්ට අනුකූලතාව දැක්වීමේ අවශ්‍යතාවය වෙනුවෙන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පිළියෙල කරන ලදුව ඉදිරිපත් කරන ලද ආයතනික පාලන වාර්තාවට අදාළව මා විසින් මෙම වාර්තාවේ ඇමුණුමෙහි දක්වා ඇති ක්‍රමවේද ක්‍රියාත්මක කරන ලදී. මාගේ කාර්ය භාරය ඉටුකරන ලද්දේ එකඟ වූ ක්‍රමවේදීය සංවිධානයන්ට අදාළ වන සම්බන්ධිත සේවා පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රමිති (SLSRS 4400) වල දක්වා ඇති මූලධර්ම වලට අනුකූලව වේ. එම ක්‍රමවේදය ක්‍රියාත්මක කරන ලද්දේ හුදෙක්ම ආයතනික පාලන අනුකූලතා නියමයන්හි අවශ්‍යතාව පවත්වාගනු පිණිස වේ.

මාගේ සොයා ගැනීම් මෙම වාර්තාවේ ඇමුණුමේ වාර්තා කරන්නෙමි.

ඉහත කී ක්‍රමවේද යොදා ගැනීම මගින් සමලෝචන කටයුතු පිළිබඳ ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූලව සිදු කරන ලද විගණනයක් හෝ සමාලෝචනයක් සිදු නොවන හෙයින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කර ආයතනික පාලන නියමයන්වල දක්වා ඇති අනුකූලතාව සම්බන්ධයෙන් මා විසින් කිසිදු සහතිකයක් ප්‍රකාශයට පත් නොකරමි.

මා විසින් අතිරේක ක්‍රමවේද ක්‍රියාත්මක කරන ලද්දේ නම් හෝ ශ්‍රී ලංකා විගණන ප්‍රමිති හෝ සමාලෝචන කටයුතු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රමිතිවලට අනුව විගණනයක් හෝ සමාලෝචන කටයුත්තක් කරන ලද්දේ නම් ඔබ වෙත ඉදිරිපත් කරන්නට ඉඩ තිබුණු අනෙකුත් කාරණා මාගේ අවධානයට ලක් වන්නට ඉඩ තිබුණි. මාගේ වාර්තාව හුදෙක්ම මෙම වාර්තාවෙහි පළමු ඡේදයෙහි දක්වා ඇති අරමුණ හා ඔබේ දැන ගැනීම පිණිස පමණක් වන අතර එය වෙනත් අරමුණක් සඳහා භාවිතා කිරීම හෝ වෙනත් කවර හෝ පාර්ශවයක් වෙත බෙදා හැරීම හෝ පිණිස නොවන්නකි.

මෙම වාර්තාව සම්බන්ධ වන්නේ ඉහත නිශ්චය කොට දක්වා ඇති අයිතමයන්ට පමණක් වන අතර සමස්ථයක් ලෙස ගත් කළ ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ මූල්‍ය ප්‍රකාශන කිසිවකට මෙය අදාළ නොවේ.

ඩබ්ලිව් පී සී. වික්‍රමරත්න.
විගණකාධිපති.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34
+94 11 2 88 72 23
ag@auditorgeneral.gov.lk
www.naosl.gov.lk

ආයතනික පාලනය

සිද්ධිවාචක සොයා ගැනීම් පිළිබඳව වාර්තාවට ඇමුණුම්

අංශය	මූලධර්මය	2021 වර්ෂය තුළ අනුකූලතා මට්ටම
3(1)	අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම්	
3(1)(i)	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බැංකුවේ සුරක්ෂිතභාවය සහ ශක්තිමත් භාවය සහතික කරනු පිණිස කරන ලද විකඟ වූ ක්‍රමවේද	
	(අ) අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය, බැංකුවේ උපාය මාර්ගික අරමුණු සහ ආයතනික වටිනාකම්.	2022-2024 කාලය සඳහා පිළියෙල කරන ලද අධ්‍යක්ෂක මණ්ඩලය විසින් අනුමත කරන ලද ආයතනික සැලැස්ම ක්‍රියාත්මකව පැවතිණි. ඊට අමතරව, බැංකුවේ උපාය මාර්ගික අරමුණු, වාර්ෂිකව ක්‍රියාත්මක කෙරෙන වාර්ෂික අයවැයට සංගෘහිත කර තිබේ. එම අරමුණු බැංකුවේ උපාය මාර්ගික අරමුණු සහ ආයතනික වටිනාකම් හා සංගත වේ. කෙසේ වෙතත්, ආයතනික සැලැස්ම සකස් කර නොතිබූ බැවින් 2021 වර්ෂයේ ඉලක්ක සහ අරමුණු වාර්ෂික අයවැයෙන් ක්‍රියාත්මක කරන ලදී.
	බැංකුවේ උපාය මාර්ගික අරමුණු සහ ආයතනික වටිනාකම් බැංකුව මඟින් දැනුම් දීම	බැංකුවේ උපාය මාර්ගික අරමුණු සහ ආයතනික වටිනාකම් දැනටමත් සියලුම ප්‍රධාන කළමනාකාර නිලධාරීවෙත දැනුම් දී ඇති අතර ප්‍රධාන කාර්යාල මට්ටමින් මෙන්ම පළාත් මට්ටමින් දැනුවත් කිරීමේ රැස්වීම් මඟින් අනෙකුත් කාර්ය මණ්ඩලය වෙත දැනුම් දෙනු ලැබේ.
	(ආ) බැංකුවේ සමස්ත ව්‍යාපාර උපායමාර්ග සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබීම	මණ්ඩලය විසින් අනුමත කරන ලද ආයතනික සැලැස්ම (2022-2024) බැංකුවේ සමස්ත ව්‍යාපාරික උපාය මාර්ගයට ඇතුළත් වේ.
	සමස්ත ව්‍යාපාරික උපාය මාර්ගයට අවදානම් ප්‍රතිපත්තිය, අවදානම් කළමනාකරණ ක්‍රමවේද හා යාන්ත්‍රණ ඇතුළත් වීම සහ ඒවා ලේඛනගත කර තිබීම.	සමස්ථ අවදානම් ප්‍රතිපත්ති සහ අවදානම් කළමනාකරණ ක්‍රියා පටිපාටි සකස් කරන ලදුව ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු නිර්දේශය ඇතිව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇති අතර එය වරින් වර සමාලෝචනය කෙරේ.
	යටත් පිරිමෙයින් ඉදිරි වසර තුනක කාලය සඳහා වන මැනිය හැකි ඉලක්ක සමස්ත ව්‍යාපාරික උපාය මාර්ගයට අන්තර්ගත වීම.	ආයතනික සැලැස්මේ මැනිය හැකි ඉලක්ක 2024 මූල්‍ය වර්ෂය දක්වා පුරෝකථනය කර ඇත.
	(ඇ)හඳුනාගෙන ඇති අවදානම්,කළමනාකරණය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇති පද්ධති යෝග්‍ය හා ඒවා නිසි ලෙස ක්‍රියාත්මක කර ඇති බව.	පහත කාරණා සහිතව අනුකූලතාව දක්වා ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති හා ක්‍රමවේදවලට අඛණ්ඩ හා තක්සේරු ක්‍රියාවලියක් ඇතුළත් වේ. එසේම එය අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව විසින් සමාලෝචනය කරනු ලැබේ. පහත වාර්තා මේ සම්බන්ධව තවදුරටත් විස්තර සපයයි. ◉ අවදානම් කළමනාකරණ වාර්තාව ◉ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව

ආයතනික පාලනය

අංශය	මූලධර්මය	2021 වර්ෂය තුළ අනුකූලතා මට්ටම
	(ඈ)අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තැන්පත්කරුවන්, ණයහිමියන්, කොටස් හිමියන් සහ ණය ගැණුම්කරුවන් ඇතුළු සියලුම පාර්ශවකරුවන් සියලුම දෙනා සමඟ සන්නිවේදන කිරීමේ ප්‍රතිපත්තියක් අනුමත කර ක්‍රියාත්මක කර ඇත.	පහත කාරණාව සහිතව අනුකූලතා දක්වා ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තැන්පත්කරුවන්, ණයහිමියන්, කොටස් හිමියන් සහ ණය ගැණුම්කරුවන් ඇතුළු සියලුම පාර්ශවකරුවන් සියලුම දෙනා සමඟ සන්නිවේදන කිරීමේ ප්‍රතිපත්තියක් අනුමත කර ක්‍රියාත්මක කර ඇත. කෙසේ වෙතත්, ප්‍රතිපත්ති ලේඛනයේ සඳහන් පරිදි සන්නිවේදන ප්‍රතිපත්ති සමාලෝචනය කළ යුතුව ඇත.
	(ඉ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බැංකුවේ අභ්‍යන්තර පාලන පද්ධති සහ කළමනාකරණ තොරතුරු පද්ධතිවල ප්‍රමාණාත්මතාව සහ අඛණ්ඩතාව සමාලෝචනය කිරීම.	පහත කාරණාව සහිතව අනුකූලතා දක්වා ඇත. බැංකුවේ අභ්‍යන්තර පාලන පද්ධතිය ස්ථාපිත කිරීම සහ එය යාවත්කාලීන කිරීම සම්බන්ධයෙන් කළමනාකාරිත්වයේ නිලධාරීන් සියලු දෙනාම විශේෂයෙන්ම නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි -මෙහෙයුම් වගකීම දරයි. එසේම, අභ්‍යන්තර විගණන කණ්ඩායම බැංකුවේ අභ්‍යන්තර පාලන පද්ධති සහ කළමනාකරණ තොරතුරු පද්ධතියේ ප්‍රමාණාත්මතාව සහ අඛණ්ඩතාව සමාලෝචනය කරයි. කෙසේ වෙතත් මෙම ක්‍රියාවලිය තවදුරටත් ශක්තිමත් විය යුතුය. තවද අභ්‍යන්තර විගණන වාර්තා අධ්‍යක්ෂ මණ්ඩල විගණන උප කමිටුවට (BAC) ඉදිරිපත් කරන අතර ප්‍රධාන සොයාගැනීම් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබේ.
	(ඊ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවල නිර්වචනය කර ඇති පරිදි අධ්‍යක්ෂ මණ්ඩල විසින් (i) ප්‍රතිපත්ති වෙත සැලකිය යුතු ලෙස බලපෑමක් වැල්ල කිරීම; (ii) සෘජු ක්‍රියාකාරකම් මෙහෙයවිය හැකිවීම (iii) ව්‍යාපාර ක්‍රියාකාරකම්, මෙහෙයුම් සහ අවදානම් කළමනාකරණය අරබයා පාලනයක් පවත්වා ගැනීමට හැකියාවක් ඇති පුද්ගලයින් හඳුනාගෙන ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් ලෙස පත් කර තිබීම.	පහත කාරණාව සහිතව අනුකූලතා දක්වා ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බැංකුවේ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් හඳුනාගෙන ඔවුන් වෙත වගකීම් පවරා ඇත.
	උ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධ්‍යක්ෂවරුන් සහ ප්‍රධාන කළමනාකාරිත්වයේ නිලධාරීන් සඳහා අදාල ප්‍රධාන අධිකාරිත්ව ක්ෂේත්‍ර සහ ප්‍රධාන වගකීම් නිශ්චය කර ඇත;	පහත කාරණාව සහිතව අනුකූලතා දක්වා ඇත. අධ්‍යක්ෂ මණ්ඩල සහ සාමාන්‍යාධිකාරි/ප්‍රධාන විධායක නිලධාරි සඳහා අදාල ප්‍රධාන අධිකාරිත්ව ක්ෂේත්‍ර සහ ප්‍රධාන වගකීම් අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තිය මඟින් නිශ්චය කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කළ අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තිය ක්‍රියාත්මක වේ. ප්‍රධාන කළමණාකරන නිලධාරීන් සඳහා අදාල අධිකාරිත්ව ක්ෂේත්‍ර සහ ප්‍රධාන වගකීම් ඔවුන්ගේ රැකියා විස්තර වල සඳහන් කර ඇත.

අංශය	මූලධර්මය	2021 වර්ෂය තුළ අනුකූලතා මට්ටම
	උ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රතිපත්තිවලට අනුකූලව බැංකුවේ ප්‍රධාන කළමනාකාරිත්වයේ නිලධාරීන්ගේ කටයුතු නිසි පරිදි අධීක්ෂණය කර තිබීම;	පහත කාරණාව සහිතව අනුකූලතා දක්වා ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු හරහා බැංකුවේ කටයුතු නිසි ලෙස අධීක්ෂණය කර තිබේ. ඒසේම, පැහැදිලි කිරීම් අවශ්‍ය වේ නම්, අමතර පැහැදිලි කිරීම් සැපයීම සඳහා කළමනාකරණ කණ්ඩායමේ සාමාජිකයින්ට අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා ආරාධනා කෙරේ.
	(i) පහත කාර්යයන් ඇතුළුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධ්‍යක්ෂවරුන්ට අදාල පාලන පරිචයන්වල කාර්යක්ෂමතාව කලින් කලට තක්සේරු කර තිබීම. (i) අධ්‍යක්ෂවරුන් සහ ප්‍රධාන කළමනාකරණ පුද්ගලයින් තෝරා ගැනීම, නම් කිරීම සහ පත් කිරීම. (ii) බැඳියා ගැටුම් කළමනාකරණය කිරීම; (iii) දුර්වලතා හඳුනා ගැනීම සහ අවශ්‍ය අවස්ථාවලදී වෙනස්කම් සිදු කිරීම.	පහත කාරණාව සහිතව අනුකූලතා දක්වා ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ඔවුන්ගේ කාර්යක්ෂමතාවය තක්සේරු කර ඇත.
	ඒ) ප්‍රධාන කළමනාකාරිත්ව නිලධාරීන් සඳහා අනුප්‍රාප්තික සැලැස්මක් අධ්‍යක්ෂ මණ්ඩලය සතුව ඇත.	අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කරන ලද අනුප්‍රාප්තික සැලැස්ම ක්‍රියාත්මක වන අතර, එය 2021 වර්ෂයේදී සමාලෝචනය කරන ලදී. කෙසේ වෙතත්, එය අධ්‍යක්ෂ මණ්ඩලයේ අදහස් සමඟ යාවත්කාලීන කර ඇති අතර අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුවේ නිර්දේශය සමඟ නැවත අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කළ යුතුය.
	ඔ) ප්‍රතිපත්ති සමාලෝචනය කිරීම, සන්නිවේදන මාර්ග ස්ථාපිත කිරීම සහ ආයතනික අරමුණු ප්‍රගතිය නිරීක්ෂණය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රධාන කළමනාකාරිත්වයේ නිලධාරීන් සමඟ නිතිපතා රැස්වීම් සැලසුම් කර ඇත.	පහත කාරණාව සහිතව අනුකූලතා දක්වා ඇත. ආයතනික අරමුණුවල ප්‍රගතිය සාකච්ඡා කිරීමට සහ සමාලෝචනය කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය නිරතුරුව රැස්වන අතර වැඩිදුර තොරතුරු සහ උපදෙස් සඳහා ප්‍රධාන කළමනාකරණ පුද්ගලයින්ට ඇරයුම් කරයි.
	ඕ) නියාමන පරිසරය අවබෝධ කර ගැනීම සඳහා සහ බැංකුව නියාමකයින් සමඟ මනා සබඳතාවක් පවත්වාගෙන යන බව සහතික කරනු පිණිස අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිසි ක්‍රියාමාර්ග සහ ක්‍රියාදාමයන් ගෙන තිබීම.	පහත කාරණාව සහිතව අනුකූලතා දක්වා ඇත. නියාමන පරිසරය අවබෝධ කර ගැනීම සඳහා සහ බැංකුව නියාමකයින් සමඟ මනා සබඳතාවක් පවත්වාගෙන යන බව සහතික කරනු පිණිස අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිසි ක්‍රියාමාර්ග සහ ක්‍රියාදාමයන් ගෙන ඇත.
	(ක) බාහිර විගණකවරුන් බඳවා ගැනීම සහ අධීක්ෂණය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය සතුව ක්‍රියාවලියක් පැවැතීම.	අදාළ නොවේ. ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතේ 33 වැනි වගන්තිය යටතේ විගණකාධිපතිවරයා බැංකුවේ බාහිර විගණකවරයා වේ.

ආයතනික පාලනය

ඡේදය	මූලධර්මය	2021 වර්ෂය තුළ අනුකූලතා මට්ටම
3(i) (ii)	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරියා (CEO) පත් කරනු ලැබීම. සභාපතිවරයාගේ සහ ප්‍රධාන විධායක නිලධාරියාගේ කාර්යභාරයන් සහ වගකීම් මෙම 3(5)නියමයන්ට අනුකූල වීම.	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බැංකුවේ සාමාන්‍යාධිකාරී/ ප්‍රධාන විධායක නිලධාරියෙකු පත් කළ යුතුය. කෙසේ වෙතත්, 2022.01.31 දක්වා සේවය කළ වැඩබලන සාමාන්‍යාධිකාරීවරයා 2020 වර්ෂයේ දී මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් පත් කර ඇත. ඒ අනුව, 2022.02.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි රාජ්‍ය බැංකු පනතට අනුව ස්ථිර සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී පත් කිරීමට මණ්ඩලය කටයුතු කර ඇත. පහත කාරණාව සහිතව අනුකූලතා දක්වා ඇත. රාජ්‍ය බැංකු පනතේ විධිවිධාන ප්‍රකාරව සභාපතිවරයා පත් කර ඇත්තේ රාජ්‍ය බැංකු විෂය භාර ගරු අමාත්‍යවරයා විසිනි. සභාපතිවරයා විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු වන අතර ප්‍රධාන විධායක නිලධාරියා බැංකුවේ මෙහෙයුම් සහ ව්‍යාපාරික කටයුතු දෛනික කළමනාකරණය සම්බන්ධයෙන් වගකීම් දරන විධායක නිලධාරියා ලෙස ක්‍රියා කරයි. කෙසේ වෙතත්, 2018 නොවැම්බර් 30 වන දින පැවති අධ්‍යයක්ෂ මණ්ඩල ණය කමිටු රැස්වීමේ ගන්නා ලද තීරණය අනුව ප්‍රා.සං.බැ. පනතේ 3 වගන්තියට අනුව සභාපතිවරයා බැංකුව වෙනුවෙන් ගිවිසුම්, බැඳුම්කර, ඔප්පු සහ අනෙකුත් උපකරණ අත්සන් කිරීම සඳහා සම්බන්ධ වේ.
3(I)(iii)	අධ්‍යක්ෂ මණ්ඩලය නිරතුරුව රැස්විය යුතු අතර ආසන්න වශයෙන් මාසික විරාම සහිතව යටත් පිරිසෙයින් වසරකට දොළොස් වතාවක් වත් අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් පවැත්විය යුතු වීම.	පහත කාරණාව සහිතව අනුකූලතා දක්වා ඇත. සාමාන්‍යයෙන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් මාසිකව පැවැත්වේ. ඊට අතිරේකව හා අවශ්‍ය අවස්ථාවන්හිදී විශේෂ රැස්වීම් පවත්වනු ලැබේ. 2021 වර්ෂය තුළ රැස්වීම් 12 ක් පවත්වා ඇත.
3(I)(iv)	බැංකුවේ ව්‍යාපාර ප්‍රවර්ධනය හා අවදානම් කළමනාකරණය ට අදාළ කරුණු සහ යෝජනා ඇති විට ඒකී කාරණා හා යෝජනා නිරන්තර අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් න්‍යාය පත්‍රයන්හි ඇතුළත් කිරීමට සියලු අධ්‍යක්ෂවරුන්ට හැකි වන පරිදි අධ්‍යක්ෂ මණ්ඩලය සතුව ක්‍රියා පටිපාටියක් ඇත.	පහත කාරණාව සහිතව අනුකූලතා දක්වා ඇත. නිරන්තර අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත්වීමට නියමිත අතර, නිරන්තර අධ්‍යක්ෂකවරුන්ට මෙකී කරුණු සහ යෝජනා ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි ඉදිරි රැස්වීම් දිනය ලිත් වර්ෂයකම ආරම්භයේ දී මණ්ඩලය වී සම්බන්ධයෙන් දැනුවත් කරනු ලැබේ.

අංශය	මූලධර්මය	2021 වර්ෂය තුළ අනුකූලතා මට්ටම
3(l)(v)	සියලුම අධ්‍යක්ෂවරුන්ට සහභාගී වීමට අවස්ථාව ලබා දීම සඳහා අධ්‍යක්ෂක මණ්ඩලය විසින් නිරතුරුවම පැවැත්වෙන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලට අවම වශයෙන් දින 7 කට පෙර අදාළ දැනුම් දීම සිදු කළ යුතු අතර අනෙක් සියලුම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා ද දැනුම් දීමක් සිදු කිරීම.	පහත කාරණාව සහිතව අනුකූලතා දක්වා ඇත. රැස්වීම් පිළිබඳ දැන්වීම වසර ආරම්භයේදී වාර්ෂික දින දර්ශනයක් හරහා ලබා දෙනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩල සහ අනුකමිටු රැස්වීම් සඳහා වූ න්‍යාය පත්‍ර සහ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා රැස්වීම්වලට දින හතකට පෙර අධ්‍යක්ෂවරුන් වෙත සුරක්ෂිත විද්‍යුත් විසඳුමක් (අධ්‍යක්ෂ කමිටු වෙත උඩුගත කිරීම) මගින් බෙදා හරිනු ලැබේ. ඕනෑම විශේෂ රැස්වීමකට පෙර සාධාරණ දැනුම් දීමක් සිදු කරනු ලබන අතර විශේෂ රැස්වීමක් පැවැත්වීමට පෙර සියලුම අධ්‍යක්ෂවරුන්ගේ කැමැත්ත ලබා ගනු ලැබේ.
3(l)(vi)	මීට පෙර මාස 12 ක කාලය තුළ අවම වශයෙන් තුනෙන් දෙකක රැස්වීම්වලට සහභාගී නොවූ හෝ ඊට පෙර පැවති අඛණ්ඩ රැස්වීම් තුනට සහභාගී නොවූ අධ්‍යක්ෂවරුන් සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත. කෙසේ වෙතත්, විකල්ප අධ්‍යයක්ෂවරයෙකු හරහා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලට සහභාගී වීමද පැමිණීම ලෙස පිළිගත හැකිය.	පහත කාරණාව සහිතව අනුකූලතා දක්වා ඇත. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලින් තුනෙන් දෙකකට වඩා හෝ අඛණ්ඩව පෙර රැස්වීම් තුනකට සහභාගී නොවූ අවස්ථා නොමැත.
3(l)(vii)	1988 අංක 30 දරණ බැංකු පනතේ 43 වන වගන්තියේ විධිවිධාන සපුරාලන සහ සමාගම් ලේකම්වරයෙකු මණ්ඩලය විසින් පත් කර ඇති අතර, ඔහුගේ මූලික වගකීම් වන්නේ අධ්‍යක්ෂ මණ්ඩල සහ කොටස් හිමියන්ගේ රැස්වීම් සඳහා ලේකම් කාර්යාල සේවාවන් මෙහෙයවීම සහ ප්‍රඥප්ති සහ වෙනත් රෙගුලාසිවල දක්වා ඇති අනෙකුත් කාර්යයන් ඉටු කිරීමයි.	පහත කාරණාව සහිතව අනුකූලතා දක්වා ඇත. 1988 අංක 30 දරණ බැංකු පනතේ 43 වන වගන්තිය අනුව සහ ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතේ 19 වන වගන්තිය ප්‍රකාරව අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයෙකු මණ්ඩලය විසින් පත් කර ඇත. ලේකම් පූර්ණකාලීන පදනම මත වූ නිලධාරියෙකු විය යුතුය.
3(l)(viii)	සියලුම අධ්‍යක්ෂවරුන්ට සමාගම් ලේකම්ගේ උපදෙස් හා සේවාවන් ලබා ගැනීමට හැකි වන පරිදි ප්‍රවේශයක් තිබීම.	පහත කාරණාව සහිතව අනුකූලතා දක්වා ඇත. සියලුම අධ්‍යක්ෂවරුන්ට අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්ගේ උපදෙස් හා සේවා සඳහා ප්‍රවේශය ඇත.
3(l)(ix)	සමාගම් ලේකම්වරයා විසින් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල වාර්තා පවත්වාගෙන යනු ලබන අතර අධ්‍යක්ෂවරුන් විසින් එවැනි වාර්තා පරීක්ෂා කිරීමේ ක්‍රියාවලියක් පවතී.	පහත කාරණාව සහිතව අනුකූලතා දක්වා ඇත. අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් විසින් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වල විස්තර පවත්වාගෙන යනු ලැබේ. තවද එවැනි වාර්තාවන් ඕනෑම අධ්‍යක්ෂවරයෙකුගේ ඉල්ලීම මත පරීක්ෂා කිරීම සඳහා ලබා ගත හැකිය.

ආයතනික පාලනය

අංශය	මූලධර්මය	2021 වර්ෂය තුළ අනුකූලතා මට්ටම
3(I)(x)	අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්ථාවල පහත සඳහන් කාරණා හෝ යොමු ඇතුලත්වේ: (අ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිය සාකච්ඡා වලදී භාවිතා කරන ලද දත්ත සහ තොරතුරු වල සාරාංශයක් (ආ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සලකා බලනු ලබන කරුණු (ඇ) සත්‍ය සෙවීමේ සාකච්ඡා සහ අධ්‍යක්ෂ මණ්ඩලය නිසි සැලකිල්ලෙන් හා විචක්ෂණභාවයෙන් යුතුව සිය වගකීම් ඉටු කළේ ද යන්න පැහැදිලි කළ හැකි විවාද හෝ විසම්මුතිය පිළිබඳ කරුණු. (ඈ) අධ්‍යක්ෂ මණ්ඩලයේ උපාය මාර්ග හා ප්‍රතිපත්තිවලට අනුකූල වීම සහ අදාළ නීති හා රෙගුලාසි පිළිපැදීම පෙන්නුම් කරන කරුණු. (ඉ) බැංකුව නිරාවරණය වන අවදානම් පිළිබඳ අවබෝධය සහ අනුගමනය කරන ලද අවදානම් කළමනාකරණ ක්‍රියාමාර්ග පිළිබඳ දළ විශ්ලේෂණයක්; සහ (ඊ) තීරණ සහ අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා.	පහත කාරණාව සහිතව අනුකූලතා දක්වා ඇත. අධ්‍යක්ෂ මණ්ඩල වාර්තා පහත සඳහන් අවශ්‍යතා ආවරණය කරනු ඇත, I. විශේෂිත විෂයයන් මත ගනු ලබන ව්‍යාපාරික තීරණ. II. විශේෂ විෂයයන් පිළිබඳ සම්මත වූ යෝජනා. III. කළමනාකරණය වෙත යොමු කරන ලද උපදෙස් සහ කරුණු. IV. කාරණා පිළිබඳ ප්‍රතිපත්තිමය තීරණ ගැනීම සහ කාර්ය සාධනය සමාලෝචනය කිරීම්. V. අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු වාර්තා පිළිබඳ නිර්දේශ. VI. අවදානම් කළමනාකරණ පියවර පිළිබඳ දළ විශ්ලේෂණය. VII. අධ්‍යක්ෂ මණ්ඩලයේ උපාය මාර්ගයට අනුකූල වීම
3(I)(xi)	සාධාරණ ඉල්ලීමක් මත, බැංකුවේ වියදමින්, සුදුසු තත්වයන් යටතේ ස්වාධීන වෘත්තීය උපදෙස් ලබා ගැනීමට අධ්‍යක්ෂවරුන්ට හැකි වන පරිදි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එකඟ වූ ක්‍රියා පටිපාටි තිබේ.	පහත කාරණාව සහිතව අනුකූලතා දක්වා ඇත. ස්වාධීන වෘත්තීය උපදෙස් ලබා ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ක්‍රිටිපාටියක් තිබේ.
3(I)(xii)	අධ්‍යක්ෂවරුන්ට සම්බන්ධව බැඳියා ගැටුම් හඳුනා ගැනීමට වාර්තා කිරීමට, නිරාකරණය කිරීමට සහ ඒවැනි ගැටුම් හෝ ඒවා උද්ගත වීමට ඇති ඉඩ වළක්වා ගැනීම උදෙසා සුදුසු ක්‍රියාමාර්ග ගැනීම සඳහා ක්‍රමවේදයක් ඇත, කිසියම් අධ්‍යක්ෂවරයෙකු, ඔහු/ඇය හෝ ඔහුගේ/ඇයගේ සමීප සම්බන්ධතාවයක් හෝ අධ්‍යක්ෂවරයෙකුට සැලකිය යුතු තරමේ පිළිබැඳියාවක් පවතින ඕනෑම අධ්‍යක්ෂ මණ්ඩල යෝජනාවකට ඡන්දය දීමෙන් වැළකී සිටිය යුතුය. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අදාළ න්‍යාය පත්‍ර අයිතමය සඳහා අවශ්‍ය ගණපූරණයේ ඔහු / ඇය සැලකිල්ලට ගෙන තිබේද?	පහත කාරණාව සහිතව අනුකූලතා දක්වා ඇත. අධ්‍යක්ෂවරුන්හට පෞද්ගලිකව පිළිබැඳියාවක් පවතින යම් කරුණක් සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී යෝජනාවක් සම්මත වූ විට, ඔහු / ඇය යෝජනාවට ඡන්දය දීමෙන් වැළකී සිටී. කවර හෝ කාරණයක් පිළිබඳ පෞද්ගලික පිළිබැඳියාවක් පවතින අධ්‍යක්ෂවරයා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අදාළ න්‍යාය පත්‍ර අයිතමය සඳහා වූ ගණපූරණය සඳහා සලකා නොබැලේ. කෙසේ වෙතත්, වසර තුළ එවැනි අවස්ථා සිදු වී නැත.
3(I)(xiii)	බැංකුවේ මෙහෙයවීම සහ පාලනය හඳුනා ගැනීම සඳහා ගන්නා තීරණය වෙනුවෙන් නමන් වෙත විශේෂයෙන් වෙන් කර ඇති කරුණු පිළිබඳ විධිමත් කාර්ය සැලස්මක් මුළුමනින්ම අධ්‍යක්ෂ මණ්ඩල අධිකාරිත්වය යටතේ පැවතිය යුතුය.	පහත කාරණාව සහිතව අනුකූලතා දක්වා ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා වෙන් කර ඇති බලතල මණ්ඩල න්‍යායපත්‍රයට ඇතුළත් වේ.

අංශය	මූලධර්මය	2021 වර්ෂය තුළ අනුකූලතා මට්ටම
3(I)(xiv)	බැංකුව සිය වගකීම් ඉටු කිරීමට නොහැකි බව හෝ ඒසේ නොකිරීමට ඉඩක් ඇති බව හෝ නුඛුන්වත්භාවයට පත් වීමට හෝ තැන්පත්කරුවන්ට සහ අනෙකුත් ණය හිමියන්ට ගෙවිය යුතු ගෙවීම් අත්හිටුවීමට නියමිත ව ඇති විට යම් තීරණයක් හෝ ක්‍රියාමාර්ගයක් ගැනීමට පෙර බැංකුවේ තත්ත්වය පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා වෙත වහාම දැනුම් දිය යුතුය.	අදාළ නැත. ඒවැනි තත්ත්වයක් උද්ගත වී නොමැති වූවද, බැංකුව බංකොලොත් වීමට යන්නේ නම් හෝ එහි තැන්පත්කරුවන්ට සහ අනෙකුත් ණය හිමියන්ට ගෙවීම් අත්හිටුවීමට යන්නේ නම්, යම් තීරණයක් හෝ ක්‍රිමාර්ගයක් ගැනීමට පෙර, බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා දැනුවත් කිරීමේ අවශ්‍යයතාවය පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය අවබෝධයෙන් පසුවේ
3(I)(xv)	මුදල් මණ්ඩලයට අවශ්‍ය මට්ටම දක්වා බැංකුව ප්‍රාග්ධනීකරණය කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය කටයුතු කළ යුතුය.	පහත කාරණාව සහිතව අනුකූලතා දක්වා ඇත. මූල්‍ය මණ්ඩලය විසින් තීරණය කරනු ලබන ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතිකය පවත්වා ගැනීමට බැංකුව සමත් වී ඇත.
3(I)(xvi)	මෙම නියමයන්හි 3 වන නියමයට අනුකූල වීම පිළිබඳ වාර්ෂික ආයතනික පාලන වාර්තාවක් බැංකුවේ වාර්ෂික වාර්තාවහි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතුය.	පහත කාරණාව සහිතව අනුකූලතා දක්වා ඇත. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලද ආයතනික පාලන නියෝගයට අනුකූලවීමේ අවශ්‍යයතාව වෙත දක්වන අනුකූලතාව පැහැදිලි කරන ආයතනික පාලන වාර්තාව මෙම වාර්ෂික වාර්තාවට ඇතුළත් වේ.
3(I)(xvii)	වාර්ෂිකව එක් එක් අධ්‍යක්ෂවරයා විසින් සිදු කරනු ලබන ස්වයං ඇගයීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීමටත් ඒකී ඇගයීම් පිළිබඳ වාර්තා පවත්වා ගැනීමටත් අධ්‍යක්ෂක මණ්ඩලය කටයුතු කළ යුතු වීම.	පහත කාරණාව සහිතව අනුකූලතා දක්වා ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයේ ස්වයං ඇගයීම් ආකෘති පත්‍ර ලබා ගත හැකිය.
3(2)	අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය	
3(2)(i)	අධ්‍යක්ෂවරු 7 දෙනෙකුට නොඅඩු සහ අධ්‍යක්ෂවරුන් 11 දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් අධ්‍යක්ෂ මණ්ඩල සමන්විත වේ.	පහත කාරණාව සහිතව අනුකූලතා දක්වා ඇත. 2021.12.31 දිනට අධ්‍යක්ෂවරුන් 10 දෙනෙකුගෙන් සමන්විත වන මෙම අධ්‍යක්ෂ මණ්ඩලය වසර පුරා අධ්‍යක්ෂවරුන් 7ට නොඅඩු සහ 11 ට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත වේ.
3(2)(ii)	(අ) ප්‍රධාන විධායක නිලධාරී තනතුර දරන අධ්‍යක්ෂකවරයෙකු හැර වෙනත් අධ්‍යක්ෂවරයෙකුගේ මුළු සේවා කාලය වසර නවයක් නොඉක්මවිය යුතුය.	පහත කාරණාව සහිතව අනුකූලතා දක්වා ඇත. අධ්‍යක්ෂවරුන් කිසිවෙක් නියමයෙහි විස්තර කර ඇති පරිදි වසර නවය ඉක්මවා නැත.
	(ආ) යම් අධ්‍යක්ෂවරයෙකු වසර 9 කට වඩා සේවය කරන්නේ නම්, අදාළ සංක්‍රාන්තිමය විධිවිධානවලට අනුකූලව ඇද්දැයි පරීක්ෂා කිරීම.	අදාළ නොවේ. ඒවැනි තත්ත්වයක් උද්ගත වී නොමැත.
3(2)(iii)	ප්‍රධාන විධායක නිලධාරියා ඇතුළු විධායක අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව මණ්ඩලයේ අධ්‍යක්ෂවරුන්ගේ සංඛ්‍යාවෙන් තුනෙන් එකක් නොඉක්මවිය යුතුය.	පහත කාරණාව සහිතව අනුකූලතා දක්වා ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයේ විධායක අධ්‍යක්ෂවරයෙක් හිටියේ නැත.

ආයතනික පාලනය

අංශය	මූලධර්මය	2021 වර්ෂය තුළ අනුකූලතා මට්ටම
3(2)(iv)	අවම වශයෙන් ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකු හෝ මුළු අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාවෙන් තුනෙන් එකක් හෝ දෙකින් වැඩි සංඛ්‍යාවක විධායක නොවන අධ්‍යක්ෂවරුන් අධ්‍යක්ෂ මණ්ඩලයට ඇතුලත් විය යුතුය. කිසියම් පුද්ගලයෙකු විධායක නොවන අධ්‍යක්ෂවරුන් ලෙස සැලකිය හැකිදැයි පරීක්ෂා කරන්න: අ) බැංකුවේ සියයට 1 කට වඩා සෘජු හා වක්‍ර කොටස් හිමිකාරිත්වයක් දරයි; ආ) අධ්‍යක්ෂ ලෙස පත් කරනු ලැබීමෙන් පසුව එළඹෙන ආසන්නතම වසර දෙකක කාලය තුළ, මෙහි 3(7) දිශාවෙහි විස්තර කර ඇති පරිදි බැංකුවේ නියාමන ප්‍රාග්ධනයෙන් සියයට 10 ඉක්මවන කවර හෝ ගනුදෙනුවක් සිදුකර ඇත. ඇ) අධ්‍යක්ෂවරයා ලෙස පත්වීමෙන් පසුව එළඹෙන අසාන්නතම වසර දෙකක කාලය තුළ බැංකුවේ සේවකයෙකු ලෙස සේවයේ යෙදී තිබීම. ඈ) බැංකුවේ හෝ වෙනත් බැංකුවක අධ්‍යක්ෂවරයෙකු, ප්‍රධාන විධායක නිලධාරයෙකු, ප්‍රධාන කළමනාකාර නිලධාරියෙකු හෝ සැලකිය යුතු කොටස් හිමියෙකු සමග සමීප සම්බන්ධතාවයක් පැවැතීම.(මේ සඳහා, "සමීප සම්බන්ධතාවයක්" යන්නෙන් අදහස් කරන්නේ කාලත්‍රයා හෝ මූල්‍යමය වශයෙන් අධ්‍යක්ෂවරයාගෙන් යැපෙන දරුවෙකු වේ) ඉ) බැංකුවේ සුවිශේෂී පාර්ශවකරුවෙකු නියෝජනය කිරීම	පහත කාරණාව සහිතව අනුකූලතා දක්වා ඇත. අවම වශයෙන් ස්වාධීන/ විධායක නොවන අධ්‍යක්ෂවරුන් හය දෙනෙකු වසර පුරා අධ්‍යක්ෂක මණ්ඩලය නියෝජනය කර ඇත. 2008 අංක 41 දරණ ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතට අනුව එක් කොටස් හිමි බැංකුවකින් ස්වාධීන නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකු පත් කරනු ලබන අතර මහා භාණ්ඩාගාරයෙන් එක් ස්වාධීන නොවන අධ්‍යයක්ෂවරයෙකු පත් කරනු ලැබේ.
	ඊ) සමාගමක හෝ ව්‍යාපාරික සංවිධානයක සේවකයෙකු හෝ අධ්‍යක්ෂවරයෙකු හෝ සැලකිය යුතු කොටස් හිමියෙකු වීම: I. 3(7) නියමයෙහි දක්වා ඇති පරිදි අනෙකුත් ඕනෑම අධ්‍යක්ෂකවරයෙකු බැංකුවේ නියාමන ප්‍රාග්ධනයෙන් සියයට 10 ඉක්මවන ගනුදෙනු සබඳතාවයක් බැංකුව සමග පවත්වා ගනු ලබන හෝ II. බැංකුවේ වෙනත් අධ්‍යක්ෂවරුන්ගෙන් කවරෙකු හෝ සේවයේ යෙදී සිටින හෝ අධ්‍යක්ෂවරුන් හෝ කොටස් හිමියන් වන; හෝ III. 3 (7) විධානයේ දක්වා ඇති පරිදි බැංකුවේ අනෙකුත් අධ්‍යක්ෂවරුන්ගෙන් ඕනෑම අයෙකු බැංකුවේ නියාමන ප්‍රාග්ධනයෙන් සියයට 10 ඉක්මවන ගනුදෙනු සබඳතාවක් බැංකුව සමඟ පවත්වා ගනු ලබන හෝ	
3(2)(v)	ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු නියෝජනය කිරීම සඳහා විකල්ප අධ්‍යක්ෂවරයෙකු පත් කර ඇත්නම්, එසේ පත් කරන ලද පුද්ගලයා ස්වාධීන අධ්‍යක්ෂවරයාට අදාළ වන නිර්ණායක සපුරාලන්නේදැයි පරීක්ෂා කරන්න.	අදාළ නොවේ. 2008 අංක 41 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතට අනුව විකල්ප අධ්‍යක්ෂවරුන් පත් කිරීමට ප්‍රතිපාදන නොමැත.
3(2)(vi)	ස්වාධීන අධ්‍යක්ෂවරුන් පත්කිරීමේ ක්‍රියාවලියක් බැංකුව සතුව පවතින්නේද යන්න	අදාළ නොවේ. ස්වාධීන අධ්‍යක්ෂවරුන් පත් කරනු ලබන්නේ ප්‍රා.සං.බැ. පනතේ විධිවිධාන අනුව ගරු අමාත්‍යවරයා විසිනි.

අංශය	මූලධර්මය	2021 වර්ෂය තුළ අනුකූලතා මට්ටම
3(2)(vii)	බැංකුවේ නියම කර ඇති ගණපූරණයට අධ්‍යක්ෂවරුන්ගෙන් 50%ක් ඇතුළත් වන්නේද යන්න සහ එම ගණපූරණයෙන් 50%කට වඩා වැඩි ප්‍රමාණයක් විධායක නොවන අධ්‍යක්ෂවරුන් වන්නේද යන්න.	පහත කාරණාව සහිතව අනුකූලතා දක්වා ඇත. ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතේ 16 වැනි වගන්තියට අනුව, අධ්‍යක්ෂ මණ්ඩලය අධ්‍යක්ෂවරුන් 7 දෙනෙකුගෙන් සමන්විත වන්නේ නම් ගණපූරණය 5ක් ද, අධ්‍යක්ෂවරුන් 7ට වැඩි සංඛ්‍යාව නම් ගණපූරණය 6 ද වශයෙන් වේ.
3(2)(viii)	සභාපති, විධායක අධ්‍යක්ෂවරුන්, විධායක නොවන අධ්‍යක්ෂවරුන් සහ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ නම් ඇතුළුව අධ්‍යක්ෂවරුන්ගේ කාණ්ඩ අනුව වාර්ෂික ආයතනික පාලන වාර්තාවේ අනාවරණය කරන්නේද යන්න.	පහත කාරණාව සහිතව අනුකූලතා දක්වා ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය සහ ඒවායේ තොරතුරු වාර්ෂික වාර්තාවේ අනාවරණය කර ඇත.
3(2)(ix)	අධ්‍යක්ෂ මණ්ඩලයට නව අධ්‍යක්ෂවරුන් පත්කිරීමේ ක්‍රියා පටිපාටිය.	අදාළ නොවේ. අධ්‍යක්ෂවරුන් පත් කරනු ලබන්නේ ප්‍රා.සං.බැ. පනතේ විධිවිධාන අනුව ගරු අමාත්‍යවරයා විසිනි.
3(2) (x)	අනියම් පුරප්පාඩුවක් පිරවීම සඳහා පත් කරන ලද සියලුම අධ්‍යක්ෂවරුන් ඔවුන්ගේ පත්වීමෙන් පසු පළමු මහා සභා රැස්වීමේදී කොටස් හිමියන් විසින් ප්‍රත්‍යක්ෂයෙන් තෝරා පත් කර ගැනීමට යටත් වේ.	අදාළ නොවේ. අධ්‍යක්ෂවරුන් පත්කිරීම් සහ ඉවත්කිරීම් සිදු කරනු ලබන්නේ ප්‍රා.සං.බැ. පනතේ විධිවිධාන අනුව ගරු අමාත්‍යතුමා විසිනි.
3(2)(xi)	අධ්‍යක්ෂවරයෙකු ඉල්ලා අස් වුවහොත් හෝ තනතුරෙන් ඉවත් කරනු ලැබුවහොත්, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පහත පියවරයන් ගත යුතුවේ. (අ) අධ්‍යක්ෂවරයාගේ ඉල්ලා අස්වීම හෝ ඉවත් කිරීම සහ බැංකුව සමඟ අදාළ අධ්‍යක්ෂවරයාගේ විසම්මුතියක් වේ නම්, එකඟ නොවීම සම්බන්ධ තොරතුරු ඇතුළුව නමුත් ඒවාට සීමා නොවී එවැනි ඉවත් කිරීමට හෝ ඉල්ලා අස්වීමට හේතු නිවේදනය කිරීම; සහ (ආ) කොටස් හිමියන්ගේ අවධානයට යොමු කළ යුතු කරුණු තිබේද නැද්ද යන්න තහවුරු කරන ප්‍රකාශයක් නිකුත් කිරීම.	පහත කාරණාව සහිතව අනුකූලතා දක්වා ඇත. අධ්‍යක්ෂවරුන් පත්කිරීම් සහ ඉවත්කිරීම් සිදු කරනු ලබන්නේ ප්‍රා.සං.බැ. පනතේ විධිවිධාන අනුව ගරු අමාත්‍යතුමා විසිනි ඉල්ලා අස්වන අධ්‍යක්ෂවරයා /වරිය සිය ඉල්ලා අස්වීම ලිඛිතව බැංකුවට දැනුම් දෙන අතර එම ලිපිය මත පදනම්ව අධ්‍යක්ෂවරයා ඉල්ලා අස්වී ඇති බව බැංකුව විසින් අමාත්‍යාංශයට දැනුම් දෙයි.
3(2)(xii)	බැංකුවක අධ්‍යක්ෂවරයෙකු හෝ සේවකයෙකු වෙනත් බැංකුවක අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් කර, ප්‍රත්‍යක්ෂයෙන් තේරී පත්වන්නේද නැතහොත් නම් කරන්නේද යන්න හඳුනාගැනීමේ ක්‍රියාවලියක් තිබේදැයි පරීක්ෂා කිරීම.	පහත කාරණාව සහිතව අනුකූලතා දක්වා ඇත. අධ්‍යක්ෂවරුන් පත් කරනු ලබන්නේ මහා භාණ්ඩාගාර ලේකම්වරයාගේ උපදෙස් අනුව ගරු අමාත්‍යවරයා විසින් බැවින් එවැනි තත්ත්වයක් ඇති නොවනු ඇත. එසේම, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අධ්‍යක්ෂවරුන්ගෙන් සහ ප්‍රධාන කළමණාකරන පුද්ගලයින්ගෙන් ලබාගත් ප්‍රකාශ මත පදනම්ව සුදුසුකම සහ යෝග්‍යතාවය තක්සේරු කරයි.
3(3)	අධ්‍යක්ෂවරුන්ගේ යෝග්‍යතාවය සහ උචිතබව ඇගයීමට අනුකූලතා මට්ටම යොදා ගැනෙන නිර්ණායක	
3(3)(i)	අධ්‍යක්ෂක ලෙස සේවය කරන පුද්ගලයෙකුගේ වයස අවුරුදු 70 නොඉක්මවිය යුතුය.	පහත කාරණාව සහිතව අනුකූලතා දක්වා ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයේ කිසිදු අධ්‍යක්ෂවරයකු වයස අවුරුදු 70 ට වැඩි නැත.
	(අ) සංක්‍රාන්ති විධිවිධානවලට අනුකූලව කටයුතු කර තිබේද යන්න.	අදාළ නොවේ.
3(3)(ii)	යම් පුද්ගලයෙක් බැංකුවේ අනුබද්ධ සමාගම් හෝ පරිපාලිත සමාගම් ඇතුළුව සමාගම්/ ආයතන/ ආයතන 20කට වැඩි ගණනක අධ්‍යක්ෂවරයෙකු ලෙස නිලතල දරන්නේ නම්.	පහත කාරණාව සහිතව අනුකූලතා දක්වා ඇත. අධ්‍යක්ෂවරුන් කිසිවෙක් ඔවුන්ගේ ප්‍රකාශයන්ට අනුව සමාගම් 20 ක අධ්‍යක්ෂ ධුර දරන්නේ නැත.

ආයතනික පාලනය

අංශය	මූලධර්මය	2021 වර්ෂය තුළ අනුකූලතා මට්ටම
3 (3)(iii)	ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන වෙනත් බලපත්‍රලාභී බැංකුවක අධ්‍යක්ෂවරයෙකු හෝ ප්‍රධාන විධායක නිලධාරියෙකු ලෙස පෙර සේවයේ නියුතු තැනැත්තෙකු මුල්‍ය සමාගමේ අධ්‍යක්ෂ හෝ ප්‍රධාන විධායක නිලධාරියා ලෙස පත් කිරීමට පෙර මාස 6ක විරාම කාලයක් තිබිය යුතුය.	2022.02.01 දින සිට බලපැවැත්වෙන පරිදි නව සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කර ඇත. අනුකූල නොවේ. 2021 වර්ෂය තුළ සේවය කළ වැඩ බලන සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරියා ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ඔහුගේ/ඇයගේ සේවා කාලය අවසන් වූ දින සිට මාස 6ක කාලයක් ඉකුත් වීමට පෙර මුදල් අමාත්‍යාංශය විසින් පත් කරන ලදී.
3(4)	**අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවරනු ලබන කළමනාකරණ කාර්යයන්**	
3(4)(i)	වගකීම් පැවරීමේ විධිවිධාන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇත.	පහත කාරණාව සහිතව අනුකූලතා දක්වා ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බැංකුවේ කටයුතුවලට අදාළ කරුණු අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු වෙත ද ප්‍රධාන විධායක නිලධාරී සහ අනෙකුත් ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් වෙත ද පවරා ඇත.
3(4)(ii)	එවැනි වගකීම් පවරනු ලබන අවස්ථා වලදී පවා අධ්‍යක්ෂ මණ්ඩලය 3 (1) (ඍ) හි කාරණා සම්බන්ධයෙන් වගකීම භාරගත යුතුය.	පහත කාරණාව සහිතව අනුකූලතා දක්වා ඇත. එවැනි වගකීම් පවරනු ලබන අවස්ථා වලදී පවා අධ්‍යක්ෂ මණ්ඩලය 3 (1) (ඍ) හි කාරණා සම්බන්ධයෙන් වගකීම දරයි.
3(4)(iii)	වගකීම් පැවරීමේ ක්‍රියාවලිය බැංකුවේ අවශ්‍යතාවලට අදාළව පවතින බව සහතික කිරීම සඳහා අධ්‍යක්ෂක මණ්ඩලය කලාන්තර පදනමක් මත එම සමාලෝචනය කළ යුතු වීම.	පහත කාරණාව සහිතව අනුකූලතා දක්වා ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය කාලාන්තර පදනමක් මත වගකීම් පැවරීමේ ක්‍රියාවලිය සමාලෝචනය කර අනුමත කරයි. අධිකාරියේ මට්ටම අනුව අනුමත සීමාවන් තීරණය කර ඇත.
3(5)	**සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරියා**	
3(5)(i)	සභාපති විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු විය යුතුය.	පහත කාරණාව සහිතව අනුකූලතා දක්වා ඇත. සභාපතිවරයාගේ සහ ප්‍රධාන විධායක නිලධාරියාගේ තනතුරු එකින් එක වෙන්කර එකී භූමිකාවල කාර්යභාරයන් පුද්ගලයන් දෙදෙනෙකු විසින් ඉටු කරනු ලැබේ. සභාපතිවරයා විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු වන අතර ප්‍රධාන විධායක නිලධාරියා බැංකුවේ මෙහෙයුම් සහ ව්‍යාපාරයේ දෛනික කළමනාකරණය භාර විධායක ලෙස ක්‍රියා කරයි. කෙසේ වෙතත්, 2018 නොවැම්බර් 30 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල ණය කමිටු රැස්වීමේ තීරණයට අනුව ප්‍රා.සං.බැ. පනතේ 3 වන වගන්තියට අනුකූලව සභාපතිවරයා බැංකුව වෙනුවෙන් ගිවිසුම්, බැඳුම්කර, ඔප්පු සහ වෙනත් උපකරණ අත්සන් කරයි.

අංශය	මූලධර්මය	2021 වර්ෂය තුළ අනුකූලතා මට්ටම
3(5)(ii)	සභාපතිවරයා ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු නොවන අවස්ථාවක, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යොමු කිරීමේ නියමයන් සුදුසු පරිදි ලේඛනගත කොට ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂවරයා ලෙස නම් කරන්නේදැයි පරීක්ෂා කිරීම.	පහත කාරණාව සහිතව අනුකූලතා දක්වා ඇත. සභාපතිවරයා ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු වන අතර බැංකුව විසින් ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂවරයෙකු ලෙස කිසිදු අධ්‍යක්ෂවරයෙකු නම් කර නොමැත.
3(5)(iii)	සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් අතර කිසියම් සම්බන්ධතාවයක් පවතී නම් මූල්‍ය, ව්‍යාපාර, පවුල හෝ වෙනත් සැලකිය යුතු/අදාළ සම්බන්ධතා(ය) ඇතුළුව) ඒ බව මණ්ඩලයේ සාමාජිකයන් ඇතුළුව එකී සම්බන්ධතාවයේ ස්වභාවය වාර්ෂික වාර්තාවේ කොටසක් වන ආයතනික පාලන වාර්තාවේ හඳුනාගෙන හෙළිදරව් කිරීමේ ක්‍රියාවලියක් අධ්‍යක්ෂක මණ්ඩලය සතුව තිබිය යුතුය.	පහත කාරණාව සහිතව අනුකූලතා දක්වා ඇත. එවැනි සබඳතා හඳුනා ගැනීමට වාර්ෂික ප්‍රකාශයන් උපකාරී වේ.
3(5)(iv)	අධ්‍යක්ෂ මණ්ඩලයට ස්වයං ඇගයීම් ක්‍රියාවලියක් ඇති අතර එහිදී සභාපතිවරයා: (අ) අධ්‍යක්ෂ මණ්ඩලයට නායකත්වය සපයයි. (ආ) අධ්‍යක්ෂ මණ්ඩලය ඵලදායී ලෙස ක්‍රියා කරන බව සහ එහි වගකීම් ඉටු කරන බව සහතික කරයි; (ඇ) සියලුම වැදගත් සහ යෝග්‍ය ගැටළු මණ්ඩලය විසින් නියමිත වේලාවට සාකච්ඡා කරන බව සහතික කරයි.	පහත කාරණාව සහිතව අනුකූලතා දක්වා ඇත. අධ්‍යක්ෂක මණ්ඩලය ස්වයං තක්සේරු ක්‍රියාවලිය හරහා ඔවුන්ගේ කාර්ය සාධනය ඇගයීමට ලක් කර තිබේ.
3(5)(v)	සභාපති විසින් අනුමත කරන විධිමත් න්‍යාය පත්‍රයක් ප්‍රචාරය කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් විසින් කටයුතු කළ යුතු වීම.	පහත කාරණාව සහිතව අනුකූලතා දක්වා ඇත. සෑම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක් සඳහාම න්‍යාය පත්‍රය සභාපතිවරයා සමඟ සාකච්ඡා කර අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් විසින් සකස් කර බෙදා හරිනු ලැබේ.
3(5)(vi)	අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලදී පැන නගින ගැටළු පිළිබඳව නිසි පරිදි සියලුම අධ්‍යක්ෂවරුන් දැනුවත් කිරීමට නියමිත වේලාවට ඉදිරිපත් කිරීම සභාපතිවරයා සහතික කල යුතුය.	පහත කාරණාව සහිතව අනුකූලතා දක්වා ඇත. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී සාකච්ඡා සඳහා ගත යුතු කරුණු හදිසි කාරණා හැර රැස්වීමට අවම වශයෙන් දින 07කට පෙර රැස්වීම්වල දී සලකා බැලීම නියමිත කාරණා අධ්‍යක්ෂකවරුන් අතර බෙදා හරිනු ලැබේ.
3(5)(vii)	අධ්‍යක්ෂ මණ්ඩලයේ කටයුතු සඳහා පූර්ණ සහ ක්‍රියාකාරී දායකත්වයක් ලබා දීමට සියලුම අධ්‍යක්ෂවරුන් දිරිමත් කරන ස්වයං ඇගයීම් ක්‍රියාවලියක් මණ්ඩලය සතු වන අතර බැංකුවේ යහපත වෙනුවෙන් ක්‍රියා කිරීමට සභාපතිවරයා පෙරමුණ ගත යුතුය.	පහත කාරණාව සහිතව අනුකූලතා දක්වා ඇත. ස්වයං-ඇගයීමේ ක්‍රියාවලිය හරහා අධ්‍යක්ෂ මණ්ඩලය එහි සාමාජිකයන්ගේ කාර්යසාධනය ඇගයීමට ලක් කර තිබේ.
3(5)(viii)	විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ දායකත්වය ඇගයීමට ලක් කරන ස්වයං ඇගයීම් ක්‍රියාවලියක් අධ්‍යක්ෂ මණ්ඩලය සතුව ඇත.	පහත කාරණාව සහිතව අනුකූලතා දක්වා ඇත. ස්වයං-ඇගයීමේ ක්‍රියාවලිය හරහා අධ්‍යක්ෂ මණ්ඩලය එහි සාමාජිකයන්ගේ කාර්යසාධනය ඇගයීමට ලක් කර තිබේ.

ආයතනික පාලනය

අංශය	මූලධර්මය	2021 වර්ෂය තුළ අනුකූලතා මට්ටම
3(5)(ix)	සභාපතිවරයා ප්‍රධාන කළමනාකාරිත්වයේ හෝ වෙනත් විධායක රාජකාරිවල සෘජු අධීක්ෂණය සම්බන්ධ ක්‍රියාකාරකම්වල නිරත වේ.	පහත කාරණාව සහිතව අනුකූලතා දක්වා ඇත. සභාපතිවරයා විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු වන අතර ඔහු ප්‍රධාන කළමනාකාරිත්වයේ පුද්ගලයන්ගේ සෘජු අධීක්ෂණයට සම්බන්ධ නොවේ. කෙසේ වෙතත්, 2018 නොවැම්බර් 30 දින පැවති මණ්ඩල ණය කමිටු රැස්වීමේ තීරණයට අනුව ප්‍රා.සං.බැ. පනතේ 3 වන වගන්තියට අනුකූල සභාපතිවරයා බැංකුව වෙනුවෙන් ගිවිසුම්, බැඳුම්කර, ඔප්පු සහ වෙනත් මෙවලම් අත්සන් කිරීම සිදු කරයි.
3(5)(x)	කොටස් හිමියන් සමඟ ඵලදායී සන්නිවේදනයක් පවත්වාගෙන යාමේ ක්‍රියාවලියක් පැවතිය යුතු අතර කොටස් හිමියන්ගේ අදහස් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත දැනුම් දිය යුතුය.	පහත කාරණාව සහිතව අනුකූලතා දක්වා ඇත. 2008 අංක 41 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතට අනුව, කොටස් හිමි බැංකු තුනක් සහ මහා භාණ්ඩාගාරය නියෝජනය කරමින් නිල නොවන සාමාජිකයින් හතර දෙනෙකු පත් කර ඇත. එබැවින් ඔවුන් මණ්ඩලය සහ කොටස් හිමියන් අතර සංනිවේදන නාලිකාවක් ලෙස ක්‍රියා කරයි. මහා භාණ්ඩාගාරය නියෝජනය කරන අධ්‍යක්ෂවරයා 2021 නොවැම්බර් මාසයේ සිට පත් කර තිබූ අතර වැඩ බලන සමානාධිකාරී පත් කරනු ලැබුවේ මහා භාණ්ඩාගාරයෙනි.
3(5)(xi)	ප්‍රධාන විධායක නිලධාරියා බැංකුවේ මෙහෙයුම් සහ ව්‍යාපාරවල එදිනෙදා කළමනාකාරිත්වයේ ඉහළ විධායක නිලධාරියා ලෙස ක්‍රියා කරයි.	ප්‍රධාන විධායක නිලධාරියා යනු බැංකු ක්‍රියාකාරිත්වයේ දෛනික කළමනාකරණය භාරව සිටින විධායක නිලධාරියෙකි. වැඩ බලන සාමානාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරියා මුදල් අමාත්‍යාංශය විසින් පත් කරන ලදී. කෙසේ වෙතත්, මෙම පත් කිරීම 2008 අංක 41 ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතේ 26 වැනි වගන්තියට අනුව සිදු කර නොමැති අතර ප්‍රධාන විධායක නිලධාරියාගේ යෝග්‍යතාවය සහ උචිතභාවය පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ඉදිරිපත් කර නොමැත. ඒ අනුව, 2022.02.01 දින සිට බලපැවැත්වෙන පරිදි ප්‍රා.සං.බැ. පනතට අනුව ස්ථිර සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරියෙකු පත් කිරීමට ප්‍රා.සං.බැ. අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇති අතර ඔහුගේ යෝග්‍යතාවය සහ සුදුසුකම 2022.03.28 දින ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කර ඇත.
3(6)	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරන ලද කමිටු	
3(6)(i)	3(6)(i) 3(6)(ii), 3(6) (iii), 3(6)(iv) සහ 3(6)(v) මෙම නියමයන්හි දක්වා ඇති පරිදි බැංකුව අවම වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩල කමිටු හතරක් පිහිටුවා තිබිය යුතුව. සෑම අධ්‍යක්ෂ මණ්ඩල කමිටු වාර්තාවක්ම සෘජුවම අධ්‍යකෂ මණ්ඩලය වෙත යොමු කර ඇත්දැයි පරීක්ෂා කළ යුතුය. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එක් එක් කමිටුවේ රාජකාරීන් සහ භූමිකා පිළිබඳ කාර්ය සාධන වාර්තාවක් වාර්ෂිකව මහා සභා රැස්වීමේ දී ඉදිරිපත් කළ යුතුය.	පහත කාරණාව සහිතව අනුකූලතා දක්වා ඇත. 3(6)(ii), 3(6)(iii), 3(6) (iv) සහ 3(6)(v) නියමයන්හි දක්වා ඇති පරිදි මණ්ඩලය වෙත සෘජුවම වාර්තා කරන පහත අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු බැංකුව විසින් පිහිටුවා ඇත.) අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලය මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටුව අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුව වීකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව එක් එක් කමිටුවේ රාජකාරි සහ භූමිකාවන් පිළිබඳ කාර්ය සාධන වාර්තාව එහි වාර්ෂික වාර්තාවට ඇතුළත් වේ. එසේම, වාර්ෂික වාර්තාව වාර්ෂික මහා සභා රැස්වීමට ඉදිරිපත් කරනු ලැබේ.

අංශය	මූලධර්මය	2021 වර්ෂය තුළ අනුකූලතා මට්ටම
3(6)(ii)	විගණන කමිටුව:	
	අ) විගණන කමිටුවේ සභාපති නිසි සුදුසුකම් සහ පළපුරුද්ද සහිත ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු විය යුතුය.	පහත කාරණාව සහිතව අනුකූලතා දක්වා ඇත. විගණන කමිටුවේ සභාපති ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු වූ අතර ඔහු 2021/12/21 දින සිට ඉල්ලා අස්විය.
	ආ) කමිටුවේ සියලුම සාමාජිකයින් විධායක නොවන අධ්‍යක්ෂවරුන් වේ.	පහත කාරණාව සහිතව අනුකූලතා දක්වා ඇත. කමිටුවේ සියලුම සාමාජිකයින් විධායක නොවන අධ්‍යක්ෂවරුන් වේ.
	ඇ) කමිටුව විසින් පහත කරුණු සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කර ඇත: (i) අදාළ ප්‍රඥප්තිවලට අනුකූලව විගණන සේවා සඳහා බාහිර විගණකවරයා පත් කළ යුතුය. (ii) විගණකවරුන් වෙත වරින් වර නිකුත් කරන ලද මහ බැංකු මාර්ගෝපදේශ ක්‍රියාත්මක කළ යුතුය. (iii) අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන් යෙදීම ; සහ (iv) විගණන සහකරුගේ සේවය වසර පහකට නොවැඩි විය යුතු බවත්, පූර්ව සේවා කාලය අවසන් වූ දින සිට වසර තුනක් ඉකුත් වීමට පෙර එම විගණන සහකරු නැවත විගණනය සඳහා සම්බන්ධ කර නොගන්නා බවත් යන කොන්දේසිවලට යටත්ව විගණකගේ සේවා කාලය, විගණන ගාස්තුව සහ විගණකවරයාගේ යම් ඉල්ලා අස්වීමක් හෝ සේවයෙන් පහ කිරීමක් සිදු කළ යුතු වේ.	අදාළ නොවේ. 2008 අංක 41 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතේ 33 වැනි වගන්තියට අනුව විගණකාධිපතිවරයා බැංකුවේ බාහිර විගණකවරයා වේ. රජයේ විගණකවරයා ආරාධනය මත අධ්‍යක්ෂ මණ්ඩල විගණන උපකමිටුව නියෝජනය කරන අතර අදාළ වන රජයේ / මහ බැංකු මාර්ගෝපදේශ කලින් කලට විගණකවරුන් වෙත නිකුත් කරනු ලබන අතර අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන් අදාල රැස්වීම්වලදී සාකච්ඡා කෙරේ.
	ඈ) කමිටුව විසින් බාහිර විගණකවරුන්ගෙන් ඔවුන්ගේ ස්වාධීනත්වය පිළිබඳ ප්‍රකාශ ලබාගෙන ඇති අතර, විගණනය කටයුතු ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුව සිදු කරනු ලැබේ.	අදාළ නොවේ. 2008 අංක 41 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතේ 33 වැනි වගන්තියට අනුව විගණකාධිපතිවරයා බැංකුවේ බාහිර විගණකවරයා වේ.
	ඉ) කමිටුව විසින් අදාළ රෙගුලාසිවලට අනුකූලව විගණන නොවන සේවා සැපයීම සඳහා බාහිර විගණකවරයෙකු සම්බන්ධ කර ගැනීම පිළිබඳ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කර තිබිය යුතුය.	අදාළ නොවේ. විගණකාධිපතිවරයා බැංකුවේ විගණකාධිපතිවරයා බැවින් එවැනි තත්ත්වයක් උද්ගත වී නැත.
	ඊ) කමිටුව විසින් විගණනය ආරම්භ වීමට පෙර ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූලව බාහිර විගණකවරුන් සමඟ විගණනයේ ස්වභාවය සහ විෂය පථය සාකච්ඡා කර තීරණය කළ යුතුය.	අදාළ නොවේ. 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වැනි වගන්තියේ (3) සහ (4) උප වගන්ති මගින් විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා විගණකාධිපතිවරයාට අභිතානුසාරී බලතල ලබා දී තිබේ.

ආයතනික පාලනය

අංශය	මූලධර්මය	2021 වර්ෂය තුළ අනුකූලතා මට්ටම
	උ) බැංකුවේ මූල්‍ය ප්‍රකාශනවල අඛණ්ඩතාව, එහි වාර්ෂික වාර්තාව, හෙළිදරව් කිරීම සඳහා සකස් කර ඇති ගිණුම් සහ ත්‍රෛමාසික වාර්තාවල අඛණ්ඩතාව අධීක්ෂණය කිරීම සඳහා බැංකුවේ මූල්‍ය තොරතුරු සමාලෝචනය කිරීමේ සහ ප්‍ර.වි.නි. වෙතින් පහත සඳහන් තොරතුරු ලබා ගැනීමේ ක්‍රියාවලියක් කමිටුව සතු විය යුතුය.	පහත කාරණාව සහිතව අනුකූලතා දක්වා ඇත. මණ්ඩලයේ විගණන කමිටුව ප්‍රධාන විනිශ්චය ක්ෂේත්‍ර, ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්කම්, අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන් සහ අනෙකුත් නෛතික අවශ්‍යතා සැලකිල්ලට ගනිමින් බැංකුවේ කාර්තුමය සහ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කරයි.
	(i) ප්‍රධාන විනිශ්චය ක්ෂේත්‍ර; (ii) ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පරිචයන්හි යම් වෙනසක් තිබේද; (iii) ව්‍යාපාරික අඛණ්ඩතා උපකල්පනය; සහ (iv) අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන් සහ අනෙකුත් නෛතික අවශ්‍යතාවලට අනුකූල වීම සහ; (v) වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණනයෙන් පැන නගින සැලකිය යුතු ගැලපීම්.	තවද, විගණනය කරන ලද අවසන් ප්‍රතිඵල හෙළිදරව් කිරීම් සමඟ අධ්‍යක්ෂක මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබේ.
	ඌ) විගණනයට අදාළව විධායක කළමනාකාරිත්වය නොමැති අවස්ථාවක කිසියම් ගැටලුවක් සම්බන්ධයෙන් කමිටුව බාහිර විගණකවරුන් සමඟ සාකච්ඡා කළ යුතුය.	පහත කාරණාව සහිතව අනුකූලතා දක්වා ඇත. විධායක කළමනාකාරිත්වය නොමැතිව කමිටුව බාහිර විගණකවරයා සමඟ රැස්වීම් පැවැත් විය.
	එ) කමිටුව විසින් බාහිර විගණකගේ කළමනාකරණ ලිපිය සහ කළමනාකාරිත්වයේ ප්‍රතිචාරය සමාලෝචනය කර ඇත.	පහත කාරණාව සහිතව අනුකූලතා දක්වා ඇත. කමිටුව 2020 වර්ෂය සඳහා වන කළමනාකරණ ලිපිය සහ එහි ප්‍රතිචාර සමාලෝචනය කර ඇත.
	ඒ) බැංකුවේ අභ්‍යන්තර විගණන කාර්යය සම්බන්ධයෙන් කමිටුව පහත පියවර ගත යුතුය:	
	I. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ විෂය පථය, කාර්යයන් සහ සම්පත්වල ප්‍රමාණවත් බව සමාලෝචනය කිරීම සහ එකී ස්වකීය වගකීම ඉටු කරනු පිණිස අවශ්‍ය අධිකාරිත්වය දෙපාර්තමේන්තුව සතුව ඇති බවට සෑහීමකට පත්වීම	පහත කාරණාව සහිතව අනුකූලතා දක්වා ඇත.
	II. අභ්‍යන්තර විගණන වැඩසටහන සහ අභ්‍යන්තර විගණන ක්‍රියාවලියේ ප්‍රතිඵල සමාලෝචනය කිරීම සහ අවශ්‍ය අවස්ථාවලදී අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ නිර්දේශ මත සුදුසු ක්‍රියාමාර්ග ගෙන ඇති බව සහතික වීම;	පහත කාරණාව සහිතව අනුකූලතා දක්වා ඇත.
	III. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාගේ සහ ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ කාර්ය සාධනය පිළිබඳ කිසියම් තක්සේරුවක් හෝ ඇගයීමක් සමාලෝචනය කිරීම;	පහත කාරණාව සහිතව අනුකූලතා දක්වා ඇත. ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ රාජකාරීන් ආවරණය කරන සහකාර සාමාන්‍යාධිකාරීවරයාගේ 2020/2021 වර්ෂයේ ඇගයීම අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් සමාලෝචනය කර ඇත.
	IV. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා, ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල සාමාජිකයින් සහ එකී කාර්යභාරය සඳහා බාහිරින් පත්කරන ලද සේවා සපයන්නන්ගේ කිසියම් පත්වීමක් හෝ සේවයෙන් පහ කිරීමක් නිර්දේශ කිරීම;	පහත කාරණාව සහිතව අනුකූලතා දක්වා ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයේ විගණන උප කමිටුවේ නිර්දේශය ඇතිව මෙම පත්කිරීම් පූර්ණ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කරන ලදී.

අංශය	මූලධර්මය	2021 වර්ෂය තුළ අනුකූලතා මට්ටම
	V. ඉල්ලා අස්වන ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල සාමාජිකයින්ට සහ බාහිරින් සේවා සපයන්නන්ට ඉල්ලා අස්වීමට හේතු ඉදිරිපත් කිරීමට අවස්ථාවක් ලබා දීම සඳහා ප්‍රධාන අභ්‍යන්තර විගණක සහ බාහිරින් ලබාගත් සේවා සපයන්නන් ඇතුළු අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ ඉල්ලා අස්වීම් කමිටුව විසින් ඇගයීමට ලක් කිරීම.	පහත කාරණාව සහිතව අනුකූලතා දක්වා ඇත. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ විගණන ප්‍රධානියාගේ කාර්ය සාධනය කමිටුව විසින් ඇගයීමට ලක් කර තිබේ.
	VI අභ්‍යන්තර විගණන කාර්යය එය විගණන ක්‍රියාකාරකම් වලින් ස්වාධීන වේ.	පහත කාරණාව සහිතව අනුකූලතා දක්වා ඇත. අභ්‍යන්තර විගණන කාර්යය එමඟින් විගණනය කරන ක්‍රියාකාරකම්වලින් ස්වාධීන වන අතර, අදාළ ප්‍රතිඵල අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව වෙත සෘජුවම වාර්තා කෙරේ.
	ඒ) අභ්‍යන්තර විමර්ශනවල ප්‍රධාන සොයා ගැනීම් සහ ඒ සඳහා කළමනාකාරිත්වයේ ප්‍රතිචාර කමිටුව විසින් සලකා බලා තිබේද යන්න තීරණය කිරීමට වාර්තා පවත්වා ගත යුතුය.	පහත කාරණාව සහිතව අනුකූලතා දක්වා ඇත. ප්‍රධාන අභ්‍යන්තර විගණන සොයාගැනීම් සහ කළමනාකරණ ප්‍රතිචාර විගණන කමිටුව විසින් සාකච්ඡා කර අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කරන ලදී.
	ඔ) විධායක අධ්‍යක්ෂවරුන්ගේ සහභාගීත්වයෙන් තොරව කමිටුව අවම වශයෙන් බාහිර විගණකවරුන් සමඟ රැස්වීම් දෙකක් පවත්වා තිබිය යුතුය.	පහත කාරණාව සහිතව අනුකූලතා දක්වා ඇත. විධායක අධ්‍යක්ෂවරුන් නොමැතිව කමිටුව බාහිර විගණකවරයා සමඟ රැස්වීම් දෙකක් පවත්වා ඇත.
	ඕ) පහත කාරණා සහතික කිරීම සඳහා කමිටුවේ නියමයන්; (i) එහි යොමු නියමයන් තුළ ඕනෑම කරුණක් විමර්ශනය කිරීමට පරම අධිකාරිය; (ii) ඒ සඳහා අවශ්‍ය සම්පත් කවරේද; (iii) තොරතුරු සඳහා පූර්ණ ප්‍රවේශය; සහ (iv) බාහිර වෘත්තීය උපදෙස් ලබා ගැනීමට සහ අවශ්‍ය නම් අදාළ පළපුරුද්ද ඇති පිටස්තර පුද්ගලයින්ට සහභාගී වන ලෙස ආරාධනා කිරීමේ අධිකාරිය.	පහත කාරණාව සහිතව අනුකූලතා දක්වා ඇත. විගණන කමිටුවට අදාළ යොමු කිරීමේ නියම මඟින් මෙම සියලු ක්ෂේත්‍ර ආවරණය කරයි.
	ඛ) කමිටුව අවම වශයෙන් හතර වතාවක්වත් රැස්වී අදාළ වාර්ථා පවත්වා ගත යුතුවීම.	පහත කාරණාව සහිතව අනුකූලතා දක්වා ඇත. 2021 වර්ෂය තුළ කමිටු රැස්වීම් හතරක් පවත්වා වාර්තා පවත්වාගෙන ගොස් ඇත.
	ග) අධ්‍යක්ෂ මණ්ඩලය වාර්ෂික වාර්තාවේ පහත කරුණු අනාවරණය කර ඇත, (i) විගණන කමිටුවේ කටයුතු පිළිබඳ විස්තර; (ii) වර්ෂය තුළ පැවති විගණන කමිටු රැස්වීම් සංඛ්‍යාව කොපමණද; සහ (iii) එවැනි රැස්වීම්වලට එක් එක් අධ්‍යක්ෂවරයාගේ සහභාගිවීම පිළිබඳ විස්තර	පහත කාරණාව සහිතව අනුකූලතා දක්වා ඇත. විගණන කමිටුවේ ක්‍රියාකාරකම් පිළිබඳ විස්තර, වසර තුල පවත්වන ලද විගණන කමිටු රැස්වීම් සංඛ්‍යාව සහ අධ්‍යක්ෂකවරුන්ගේ සහභාගිත්වය පිළිබඳ විස්තර වාර්ෂික වාර්තාවේ අනාවරණය කර ඇත.
	ච) සමාගම් ලේකම් හෝ අභ්‍යන්තර විගණනය භාර ප්‍රධානියා කමිටුවේ ලේකම් ලෙස කටයුතු කළ යුතු වීම.	පහත කාරණාව සහිතව අනුකූලතා දක්වා ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් විගණන කමිටුවේ ලේකම් ලෙස කටයුතු කරයි.

ආයතනික පාලනය

අංශය	මූලධර්මය	2021 වර්ෂය තුළ අනුකූලතා මට්ටම
	(ට)"විස්ල් බ්ලෝවර්" ප්‍රතිපත්තිය මගින් පහත කාරණාවලට අදාළ ක්‍රියාවලිය ආවරණය කෙරේ; i) මූල්‍ය වාර්තාකරණය, අභ්‍යන්තර පාලනය හෝ වෙනත් කාරණාවල නුසුදුසුකම්. ii) එකී කාරණා සම්බන්ධයෙන් සාධාරණ හා ස්වාධීන විමර්ශනය සඳහා නිසි විධිවිධාන ක්‍රියාත්මක වන බවට සහතික කිරීමට කමිටුව ඉහත (i) නියමයට අදාළ කටයුතු කළ යුතුය. iii) සුදුසු පසු විපරම් ක්‍රියාමාර්ග.	පහත කාරණාව සහිතව අනුකූලතා දක්වා ඇත. මණ්ඩලය අනුමත "විස්ල් බ්ලෝවර්" ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වේ.
3(6)(iii)	මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටුවට පහත සඳහන් රීති අදාළ වන්නේද:	
	අ) කමිටුව විසින් "යොමු කිරීමේ නියම" සහ රැස්වීම් වාර්ථා සමාලෝචනය කිරීමෙන් බැංකුවේ ප්‍ර.වි.නි. සහ ප්‍රධාන කළමණාකරන නිලධාරීන්ගේ පාරිශ්‍රමික (වැටුප්, දීමනා සහ අනෙකුත් මුල්‍යමය ගෙවීම්) තීරණය කිරීමට කමිටුව විසින් ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කර තිබේද යන්න.	පහත කාරණාව සහිතව අනුකූලතා දක්වා ඇත. අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික පාලනය වන්නේ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තු චක්‍රලේඛ මගිනි. කමිටුව විසින් ප්‍රධාන කළමනාකාරීත්වයේ නිලධාරීන්ට අදාළ පාරිශ්‍රමික (වේතන, දීමනා සහ අනෙකුත් මුල්‍ය ගෙවීම්) තීරණය කිරීම සඳහා ප්‍රතිපත්තියක් අනුමත කර ඇත. 2020 වර්ෂය තුළ වේතන ප්‍රතිපත්තිය සමාලෝචනය කළ යුතු අතර, තවමත් එය සමාලෝචනය කර නොමැති අතර එය සමාලෝචනය කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය.
	ආ) අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිලධාරීන් සහ ප්‍රධාන කළමනාකාරීත්වයේ නිලධාරීන් සඳහා පවරා ඇති ඉලක්ක ලේඛනගත කර තිබිය යුතුය.	අධ්‍යක්ෂවරුන් විධායක නොවන අධ්‍යක්ෂවරුන් වන අතර ඔවුන් සඳහා නිශ්චිත ඉලක්ක සකසා නොමැත. පහත කාරණාව සහිතව අනුකූලතා දක්වා ඇත. ප්‍රධාන කළමනාකරණ පිරිස් සඳහා ඉලක්ක සහ පරමාර්ථ වාර්ෂික අයවැය සහ ආංශික ක්‍රියාකාරී සැලසුම් අනුව ලේඛනගත කර ඇත.
	ඇ) ප්‍රධාන විධායක නිලධාරියාගේ සහ ප්‍රධාන කළමනාකාරීත්වයේ වේතනය, ප්‍රතිලාභ සහ කාර්ය සාධනය මත පදනම් වූ දිරි දීමනා සංශෝධනය කිරීමේ පදනම තීරණය කිරීම සඳහා නියමිත ඉලක්ක සහ ඉලක්කවලට සාපේක්ෂව ප්‍රධාන විධායක නිලධාරියාගේ සහ ප්‍රධාන කළමනාකාරීත්වයේ කාර්ය සාධනය පිළිබඳ ඇගයීම් කමිටුව විසින් වරින් වර සලකා බලා ඇත.	පහත කාරණාව සහිතව අනුකූලතා දක්වා ඇත. ප්‍රධාන අවදානම් කළමනාකරණ නිලධාරී, අනුකූලතා නිලධාරී සහ ප්‍රධාන අභ්‍යන්තර විගණක නිලධාරී හැර අනෙකුත් ප්‍රධාන කළමනාකරණ පුද්ගලයින්ගේ කාර්ය සාධනය මානව සම්පත් අධ්‍යක්ෂ මණ්ඩලය සහ පාරිශ්‍රමික කමිටුව මගින් ඇගයීමට ලක් කෙරේ. ස්වාධීන කාර්යයන්හි යෙදී සිටින ප්‍රධාන අවදානම් කළමනාකරණ නිලධාරී, අනුකූලතා නිලධාරී සහ ප්‍රධාන අභ්‍යන්තර විගණක නිලධාරීන්ගේ කාර්ය සාධන ඇගයීම අදාළ අධ්‍යක්ෂක මණ්ඩල අනු කමිටු මගින් සමාලෝචනය කෙරේ.
	ඈ) ප්‍රධාන විධායක නිලධාරියාට අදාළ කරුණු සමාලෝචන කරන කමිටු රැස්වීම්වලට ප්‍රධාන විධායක නිලධාරියා නොපැමිණෙන බව "යොමු කිරීමේ නියම" මඟින් සපයයි.	පහත කාරණාව සහිතව අනුකූලතා දක්වා ඇත. මෙම විධිවිධාන අනුව ප්‍රධාන විධායක නිලධාරියා සම්බන්ධ කරුණු සාකච්ඡා කරන විට, ප්‍රධාන විධායක නිලධාරියා එම කමිටුවේ රැස්වීම්වලට සහභාගි නොවේ.

අංශය	මූලධර්මය	2021 වර්ෂය තුළ අනුකූලතා මට්ටම
3(6)(iv)	නාමයෝජනා කමිටුවට පහත සඳහන් නීති අදාළ වන්නේද:	
	අ) කමිටුව විසින් නව අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිලධාරීන් සහ ප්‍රධාන කළමනාකාරීත්වයේ පුද්ගලයන් තෝරා ගැනීම/පත් කිරීම සඳහා ක්‍රියා පටිපාටියක් ක්‍රියාත්මක කර තිබීම.	අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රධාන විධායක නිලධාරියා පත් කරයි. කෙසේ වෙතත්, සාමාන්‍යාධිකාරී තනතුරේ ඇති වූ හදිසි තත්ත්වය හේතුවෙන් 2021 වර්ෂයේදී සේවය කළ වැඩ බලන සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරියා 2020 වර්ෂයේදී මුදල් අමාත්‍යාංශය විසින් පත් කර තිබුණි. පහත කාරණාව සහිතව අනුකූලතා දක්වා ඇත. අධ්‍යක්ෂවරුන් පත්කිරීම් සිදු කරනු ලබන්නේ ප්‍රා.සං.බැ. පනතේ විධිවිධාන අනුව ගරු අමාත්‍යතුමා විසිනි.ප්‍රා.සං.බැංකු පනතේ විධිවිධාන අනුව 2022.02.01 දින සිට සාමාන්‍යාධිකාරීවරයා පත් කර තිබුණි. ප්‍රධාන කළමනාකාරීත්වයේ නිලධාරීන් තෝරා ගැනීමට/පත් කිරීමට/ප්‍රවර්ධනය කිරීමට කමිටුව විසින් නිර්ණායක සකසයි.
	ආ) වත්මන් අධ්‍යක්ෂවරුන් නැවත තේරී පත් කිරීම පිළිබඳව කමිටුව විසින් සලකා බලා නිර්දේශ ලබා දී තිබීම. (හෝ නොතිබීම)	අදාළ නොවේ. මහා භාණ්ඩාගාර ලේකම්වරයාගේ උපදෙස් සහිතව ගරු අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂ මණ්ඩලය පත්කරනු ලැබේ.
	ඇ) කමිටුව විසින් ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකාරීත්ව තනතුරු පත් කිරීම හෝ උසස් කිරීම සඳහා සලකා බැලිය යුතු සුදුසුකම්, පළපුරුද්ද සහ ප්‍රධාන ගුණාංග වැනි නිර්ණායක සහ රැකියා විස්තර සමාලෝචනය කිරීමෙන් සකසා ඇත.	පහත කාරණාව සහිතව අනුකූලතා දක්වා ඇත. ප්‍රධාන විධායක නිලධාරී, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී සහ ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරී තනතුරු සඳහා තෝරා ගැනීම සඳහා සුදුසුකම් ලැබීමට අවශ්‍ය සුදුසුකම් සහ පළපුරුද්ද 2008 අංක 41 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත මගින් නිශ්චය කර ඇත. ප්‍රධාන කළමනාකාරීත්වයේ නිලධාරීන් පත්කිරීමට අවශ්‍ය තෝරා ගැනීම් සඳහා සුදුසුකම්/තේරීමේ නිර්ණායක නාමයෝජනා කමිටුව / අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලැබේ.
	ඈ) මෙම 3(3) නියමයෙහි දක්වා ඇති පරිදි සහ අදාළ ව්‍යවස්ථාවන්හි දක්වා ඇති පරිදි ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකාර නිලධාරීන් එම නිලතල දැරීමට යෝග්‍ය හා සුදුසු පුද්ගලයින් බවට ඔවුන්ගේ අත්සන් සහිත ප්‍රකාශ ලබා ගැනීමට කමිටුව කටයුතු කළ යුතුය.	වැඩබලන ප්‍රධාන විධායක නිලධාරියාගේ යෝග්‍යතාවය සහ උචිතභාවය පිළිබඳ ප්‍රකාශන මහ බැංකුව වෙත ඉදිරිපත් නොකළ අතර 2021 වසරේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලද ප්‍රධාන කළමණාකාර නිලධාරීන්ගේ දිවුරුම් ප්‍රකාශ 2022.02.09 දින අනුමත කර ඇත. පහත කාරණාව සහිතව අනුකූලතා දක්වා ඇත. අධ්‍යක්ෂවරුන්ගේ සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ගේ යෝග්‍යතාවය සහ උචිතභාවය පිළිබඳ ප්‍රකාශයන් ඔවුන්ගෙන් ලබාගෙන බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද අතර එකී ප්‍රකාශ තනතුරු / සුදුසුකම් වෙනස් කිරීමේදී බැංකුව විසින් යාවත්කාලීන කරනු ලබයි.

ආයතනික පාලනය

අංශය	මූලධර්මය	2021 වර්ෂය තුළ අනුකූලතා මට්ටම
	ඉ) විශ්‍රාම යන අධ්‍යක්ෂවරුන් සහ ප්‍රධාන කළමනාකාරීත්වය සඳහා විධිමත් අනුප්‍රාප්තික සැලැස්මක් කමිටුව විසින් සලකා බලනු ලැබීම.	ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත අනුප්‍රාප්තික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වේ. කෙසේ වෙතත්, එය අධ්‍යක්ෂ මණ්ඩලයේ අදහස් සමඟ යාවත්කාලීන කර ඇති අතර එය නිර්දේශ කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුව වෙත ඉදිරිපත් කළ යුතුය. පහත කාරණාව සහිතව අනුකූලතා දක්වා ඇත. අධ්‍යක්ෂවරුන් සඳහා අනුප්‍රාප්තික කටයුතු ප්‍රා.සං.බැ. පනත අනුව ගරු අමාත්‍යතුමා විසින් සිදු කරනු ලැබේ
	ඊ) ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු විසින් කමිටුවේ සභාපතිත්වය දරනු ලබන අතර ස්වාධීන අධ්‍යක්ෂවරුන්ගෙන් බහුතරයක් සමඟ එය පිහිටුවීම වඩාත් සුදුසුය. ප්‍රධාන විධායක නිලධාරියාට ආරාධනාවකින් රැස්වීම්වලට සහභාගි විය හැකිය.	පහත කාරණාව සහිතව අනුකූලතා දක්වා ඇත. ස්වාධීන අධ්‍යක්ෂවරයෙක් රැස්වීම්වල මුලසුන දරා ඇත. යොමු කිරීම් නියමයන්ට අනුව, ප්‍රධාන විධායක නිලධාරී රැස්වීම්වලට සහභාගි වන්නේ ආරාධනව මතය. කෙසේ වෙතත්, ප්‍රධාන විධායක නිලධාරී සියලුම රැස්වීම්වලට සහභාගී වී ඇත.
3(6)(v)	ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (IRMC) සම්බන්ධයෙන් පහත සඳහන් නීති අදාළ වන්නේද:	
	අ) කමිටුව අවම වශයෙන් විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සමන්විත විය යුතුය, ප්‍රධාන විධායක නිලධාරී, ණය, වෙළෙඳපොළ, ද්‍රවශීලතාව, මෙහෙයුම් සහ උපාය මාර්ගික යන පුළුල් අවදානම් කාණ්ඩ අධීක්ෂණය කරන කමිටුව වෙත පවරා ඇති අධිකාරිය සහ වගකීම යන රාමුව තුළ වැඩ කරන ප්‍රධාන කළමනාකරණ පුද්ගලයින්ගෙන් මෙම කමිටුව සමන්විත විය යුතුය.	පහත කාරණාව සහිතව අනුකූලතා දක්වා ඇත. මෙම කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරුන් 04 දෙනෙකුගෙන්, ප්‍රධාන විධායක නිලධාරී සහ අවදානම් කළමණාකරණ සහකාර සාමාන්‍යාධිකාරිගෙන් සමන්විත වේ. අනුකූලතා නිලධාරී ආරාධනය මත රැස්වීම්වලට සහභාගී වේ.
	ආ) සුදුසු අවදානම් දර්ශක සහ කළමනාකරණ තොරතුරු හරහා මාසික පදනමින් බැංකුව වෙත සියලුම අවදානම්, විනම් ණය, වෙළෙඳපොළ, ද්‍රවශීලතාවය, මෙහෙයුම් සහ උපාය මාර්ගික අවදානම් තක්සේරු කිරීමේ ක්‍රියාවලියක් කමිටුවට ඇත. අනුබද්ධ සමාගම් සහ ආශ්‍රිත සමාගම් සම්බන්ධයෙන්, අවදානම් කළමනාකරණය බැංකු පදනමින් සහ සමූහ පදනමින් සිදු කළ යුතුය.	පහත කාරණාව සහිතව අනුකූලතා දක්වා ඇත. කමිටුව සහකාර සාමාන්‍යාධිකාරී - අවදානම් කළමනාකරණ සඳහා මාසික පදනමක් මත අවදානම් තක්සේරු කොට බැංකුවේ ප්‍රධාන අවදානම් දර්ශක පිළිබඳ වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරයි. එසේම, ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ නිර්දේශ ද අධ්‍යක්ෂ මණ්ඩලයේ සමාලෝචනය සඳහා ඉදිරිපත් කෙරේ. තවද, බැංකුවේ අවදානම් පැතිකඩ පිළිබිඹු වනු පිණිස ඇතැම් අවදානම් වැඩිදියුණු කර ඇත.
	ඇ) කමිටුව විසින් ණය කමිටුව සහ වත්කම් හා වගකීම් කමිටු වැනි සියලුම කළමනාකරණ මට්ටමේ කමිටු සඳහා නිශ්චිත ප්‍රමාණාත්මක සහ ගුණාත්මක අවදානම් සීමාවන් සමාලෝචනය කර පවතින කවර හෝ අවදානම් දර්ශක වරින් වර වාර්තා කිරීම.	පහත කාරණාව සහිතව අනුකූලතා දක්වා ඇත. කමිටු මෙහෙයුම්වල ප්‍රමාණවත් බව සහ සඵලතාවය සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව විසින් වත්කම් සහ වගකීම් කමිටුව (ALCO), කළමනාකරණ කමිටුව, මෙහෙයුම් අවදානම් කමිටුව සහ මෙහෙයුම් සහ පරිශ්‍ර කමිටුවේ රැස්වීම් සටහන් සහ නිශ්චිත ප්‍රමාණාත්මක හා ගුණාත්මක අවදානම් සමාලෝචනය කරන ලදී. තවද, එම කමිටුවල කමිටු ප්‍රඥප්තිය හෝ TOR මත පදනම්ව ඔවුන්ගේ කාර්ය සාධනය සහ මිණුම් ලකුණ කමිටුව විසින් අධීක්ෂණය කරනු ලැබේ.

අංශය	මූලධර්මය	2021 වර්ෂය තුළ අනුකූලතා මට්ටම
	ඈ) කමිටුව විසින් නියමිත ප්‍රමාණාත්මක සහ ගුණාත්මක අවදානම් සීමාවන් ඉක්මවා ගොස් ඇති සියලුම අවදානම් දර්ශක සමාලෝචනය කර සලකා ඇත.	පහත කාරණාව සහිතව අනුකූලතා දක්වා ඇත. ප්‍රධාන අවදානම් දර්ශක පිළිබඳ වාර්තා කමිටුව විසින් සමාලෝචනය කරන ලදී.
	ඉ) කමිටුව අවම වශයෙන් කාර්තුවකට කී වතාවක් රැස්වී තිබේද?	පහත කාරණාව සහිතව අනුකූලතා දක්වා ඇත. 2021 වර්ෂය තුළ කමිටුව 05 වතාවක් රැස්වී ඇත.
	ඊ) කමිටුව විසින් නිශ්චිත අවදානම් හඳුනා ගැනීමට අපොහොසත් වීම සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් විධිමත් ලේඛනගත විනය ක්‍රියා පටිපාටියක් සමාලෝචනය කර සම්මත කර ඇත.	පහත කාරණාව සහිතව අනුකූලතා දක්වා ඇත. විධිමත් විනය සංග්‍රහය ක්‍රියාත්මකයි. කමිටු පත්‍රිකා හරහා අවදානම් කරුණු සම්බන්ධයෙන් කමිටුව තීරණ ගෙන ඇත. කෙසේ වෙතත්, 2021 වර්ෂය සඳහා හඳුනාගත් සිදුවීම් කිසිවක් නොමැත.
	උ) අධ්‍යක්ෂ මණ්ඩලයේ අදහස්, විකඟතාවය සහ/හෝ නිශ්චිත උපදෙස් අපේක්ෂා කරන කමිටුව විසින් සෑම රැස්වීමකින්ම සතියක් ඇතුළත අවදානම් තක්සේරු වාර්තාවක් මණ්ඩලය වෙත ඉදිරිපත් කරයි.	පහත කාරණාව සහිතව අනුකූලතා දක්වා ඇත. බැංකුවේ ප්‍රධාන අවදානම් දර්ශක පිළිබඳ වාර්තාව මාසික පදනමින්- සහකාර සාමාන්‍යාධිකාරී - අවදානම් කළමනාකරන විසින් සකස් කර ඊළඟ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ඉදිරිපත් කරනු ලැබේ. තවද, ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ රැස්වීම්වල සටහන්ද අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබේ.
	ඌ) ව්‍යාපාර මෙහෙයුම්වල සියලුම ක්ෂේත්‍රවල නීති, රෙගුලාසි, නියාමන මාර්ගෝපදේශ, අභ්‍යන්තර පාලන සහ අනුමත ප්‍රතිපත්තිවලට බැංකුව අනුකූල වීම තක්සේරු කිරීම සඳහා කමිටුව අනුකූලතා කාර්යයක් ස්ථාපිත කර ඇති අතර එය ක්‍රියාත්මක කිරීම සඳහා සහ අනුකූලතා කාර්යය වරින් වර කමිටුව වෙත වාර්තා කිරීම සඳහා ප්‍රධාන කළමනාකාරිත්වයේ නිලධාරීන්ගෙන් තෝරාගත් කැපවූ අනුකූලතා නිලධාරියෙකු සිටී.	පහත කාරණාව සහිතව අනුකූලතා දක්වා ඇත. අනුකූලතා කාර්යය බැංකුවේ අනුකූලතා නිලධාරී විසින් මෙහෙයවනු ලබන අතර එම නිලධාරී විසින් අධ්‍යක්ෂ මණ්ඩල අවදානම් කළමණාකරන කමිටුව වෙත වරින් වර අනුකූලතා අවදානම් තක්සේරු වාර්තාවක් ඉදිරිපත් කරනු ලැබේ.
3(7)	සම්බන්ධිත පාර්ශව ගනුදෙනු	අනුකූල වේ.
3(7)(i)	ඕනෑම පුද්ගලයෙකු සමඟ සහ විශේෂයෙන්ම පහත සඳහන් පුද්ගලයින් සමඟ "සම්බන්ධිත පාර්ශව ලෙස සලකනු ලබන කාණ්ඩ සමඟ පවත්වනු ලබන ගනුදෙනුවක් සමඟ ඇති විය හැකි බැඳියාව පිළිබඳ ගැටුම් වළක්වා ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ස්ථාපිත ලේඛනගත ක්‍රියාවලියක් ඇත.	2021 වර්ෂයේදී යාවත්කාලීන කරන ලද සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත ප්‍රතිපත්තීන් පවතී. කෙසේ වෙතත්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් KMP වෙත ණය ප්‍රදානය කිරීම පිළිබඳ අදහස් ලැබීමෙන් පසු 2022 වර්ෂයේ සමහර කරුණු යාවත්කාලීන කර ඇත.
	(අ) බැංකුවේ ඕනෑම අනු සමාගමක්; (ආ) බැංකුවේ ඕනෑම සම්බන්ධිත සමාගමක්; (ඇ) බැංකුවේ ඕනෑම අධ්‍යක්ෂවරයෙකු; (ඈ) බැංකුවේ ප්‍රධාන කළමනාකාරිත්වයේ ඕනෑම නිලධාරියෙකු; (ඉ) බැංකුවේ ඕනෑම අධ්‍යක්ෂවරයකුගේ හෝ ප්‍රධාන කළමනාකාරිත්වයේ අයකුගේ සමීප ඥාතියෙකු; (ඊ) බැංකුවට සැලකිය යුතු ඇල්මක් හිමි කොටස් හිමියෙකු; (උ) බැංකුවේ ඕනෑම අධ්‍යක්ෂවරයෙකුට හෝ බැංකුවේ ඕනෑම අධ්‍යක්ෂවරයෙකුගේ හෝ එහි සැලකිය යුතු කොටස් හිමියෙකුගේ සමීප ඥාතියෙකුට සැලකිය යුතු බැඳියාවක් ඇති කාරණයක්.	අදාළ පාර්ශ්වයන්ට අයත් ගනුදෙනු ඔවුන්ගේ ප්‍රකාශය මත පදනම්ව ජාතික හැඳුනුම්පත භාවිතා කර පද්ධතිය හරහා ග්‍රහණය කර ගත හැක.

ආයතනික පාලනය

අංශය	මූලධර්මය	2021 වර්ෂය තුළ අනුකූලතා මට්ටම
3(7)(ii)	මෙම විධානය මගින් ආවරණය වන අදාළ පාර්ශව සමඟ ගනුදෙනු ලෙස හඳුනාගෙන ඇති පහත සඳහන් ආකාරයේ ගනුදෙනු හඳුනාගෙන වාර්තා කිරීමේ ක්‍රියාවලියක් ඇත.	පහත කාරණාව සහිතව අනුකූලතා දක්වා ඇත. 2021 දී යාවත්කාලීන කරන ලද සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද සම්බන්ධිත පාර්ශව ගනුදෙනු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වේ. සපයා ඇති ප්‍රකාශ මත පදනම්ව සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු හඳුනා ගත හැක.
	අ) උපරිම පහසුකම් ප්‍රමාණය පිළිබඳ මුදල් මණ්ඩලයේ උපදෙස්වල අර්ථ දක්වා ඇති පරිදි ඕනෑම ආකාරයක පහසුකමක් ප්‍රදානය කිරීම. ආ) තැන්පතු, ණය ගැනීම් සහ ආයෝජන ආකාරයෙන් බැංකුවේ ඕනෑම වගකීමක් නිර්මාණය කිරීම. ඇ) බැංකුවට සපයන ලද හෝ බැංකුවෙන් ලැබුණු මූල්‍ය හෝ මූල්‍ය නොවන ස්වභාවයේ ඕනෑම සේවාවක් ඈ) බැංකුව සහ ඒ ආශ්‍රිත ඕනෑම පාර්ශ්වයක් අතර වාර්තාකරණ රේඛා සහ තොරතුරු ප්‍රවාහයන් නිර්මාණය කිරීම හෝ නඩත්තු කිරීම, එවැනි සම්බන්ධ පාර්ශ්වයන්ට ප්‍රතිලාභ ලබා දිය හැකි හිමිකාර, රහස්‍ය හෝ වෙනත් සංවේදී තොරතුරු හුවමාරු කර ගැනීමට හේතු විය හැක.	
3(7)(iii)	ඉහත 3(7)(i) හි අර්ථ දක්වා ඇති පරිදි බැංකුව සම්බන්ධිත පාර්ශ්ව සමඟ ගනුදෙනු කිරීමේදී අදාළ පාර්ශවයන් හට ඊට සමාන ගනුදෙනු සිදු කරනු ලබන අනෙකුත් ගනුදෙනුකරුවන්ට වඩා වැඩි වාසිදායක සැලකිල්ලක් සිදු නොවන ආකාරයෙන් සිදු කිරීමට බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය වගබලා ගත යුතුය.	පහත කාරණාව සහිතව අනුකූලතා දක්වා ඇත. අධ්‍යක්ෂවරුන් හෝ ඔවුන්ගේ සමීප ඥාතීන්ට ණය පහසුකම් ලබා දීමේදී අධ්‍යක්ෂ මණ්ඩලයේ සංඛ්‍යාවෙන් තුනෙන් දෙකකට නොඅඩු අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකදී අනුමත කළ යුතුය. අනුකූලතා අංශය විසින් අධීක්ෂණය කරනු ලබන සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු අධීක්ෂණය කිරීමේ ක්‍රියාවලිය බැංකුව විසින් ක්‍රියාත්මක කර ඇති අතර අනුකූලතා වාර්තාවේ දක්වා ඇති අනුකූලතා තත්ත්වය 2022.01.01 දින සිට කාර්තුමය වශයෙන් BIRMC වෙත ඉදිරිපත් කෙරේ. 2021 වර්ෂය තුළදී (යාවත්කාලීන කරන ලද සම්බන්ධිත පාර්ශව ගනුදෙනු ප්‍රතිපත්තිය අනුමත කිරීමෙන් පසු) බැංකුව කිසිදු සම්බන්ධිත පාර්ශ්වයකට වඩාත් හිතකර සැලකිල්ලක් ලබා දී නොමැත.

අංශය	මූලධර්මය	2021 වර්ෂය තුළ අනුකූලතා මට්ටම
	අ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි, බැංකුවේ නියාමන ප්‍රාග්ධනයේ විචක්ෂණ ප්‍රතිශතයක් ඉක්මවන, සම්බන්ධිත පාර්ශ්වයන්ට "මුලු ශුද්ධ ණය" ප්‍රදානය කිරීම. මෙම උප නියමයන්හි අරමුණු සඳහා: I. "ණය පහසුකම්" යන්නෙන් අදහස් වන්නේ 2007 අංක 7 දරන ශ්‍රී ලංකා මහ බැංකු නියමයන්ට අනුව උපරිම සීමා යටතේ දක්වා ඇති ණය පහසුකම් පිළිබඳ නිර්වචනය අදහස් වේ. II. "මුළු ශුද්ධ ණය පහසුකම්" ගණනය කරනු ලබන්නේ මුළු ණය පහසුකම් වටිනාකමෙන් එවැනි සම්බන්ධිත පාර්ශ්වයන් විසින් බැංකුවේ කොටස් ප්‍රාග්ධනය සහ ණය උපකරණවල කරන ලද වසර 5ක් හෝ ඊට වැඩි කාලයක් සහිතව සිදු කරන ලද මුදල් ඇප සහ ආයෝජන අඩු කිරීමෙනි. ආ) බැංකුවේ ණය දීමේ අනුපාතයට වඩා අඩු පොලී අනුපාතයක් අය කිරීම හෝ නොබැඳි සැසඳිය හැකි ප්‍රති පාර්ශවයක් සමඟ සැසඳිය හැකි ගනුදෙනුවක් සඳහා බැංකුවේ තැන්පතු අනුපාතයට වඩා වැඩි මුදලක් ගෙවීම. ඇ) සම්බන්ධ නොවන පාර්ශ්වයන් සමඟ සිදු කරන සාමාන්‍ය ව්‍යාපාරයේ දී ලබා දී ඇති නියමයන් ඉක්මවා යමින් හිතකර කොන්දේසි, වෙළඳ පාඩු ආවරණය කිරීම සහ/හෝ ගාස්තු/කොමිස් අත්හැරීම වැනි වාසිදායක සැලකීමක් සිදු කිරීම. ඈ) ඇගයීම් පටිපාටියකින් තොරව අදාළ පාර්ශ්වයකට සේවා සැපයීම හෝ ලබා ගැනීම; ඉ) නීත්‍යානුකූල රාජකාරි සහ කාර්යයන් ඉටු කිරීම සඳහා අවශ්‍ය පරිදි, අදාළ පාර්ශ්ව සමඟ විභව හිමිකාර, රහස්‍ය හෝ වෙනත් සංවේදී තොරතුරු හුවමාරු කර ගැනීමට හේතු විය හැකි වාර්තාකරණ රේඛා සහ තොරතුරු ප්‍රවාහයන් පවත්වාගෙන යාම.	
3(7)(iv)	බැංකුවට එහි ඕනෑම අධ්‍යක්ෂවරයෙකුට සහ ප්‍රධාන කළමනාකාරිත්වයේ නිලධාරියෙකුට ණය පහසුකම් ලබාදීමේ ක්‍රියාවලියක් ඇති අතර, අදාළ අධ්‍යක්ෂවරයා හැර අනෙකුත් අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාවෙන් තුනෙන් දෙකකට නොඅඩු සංඛ්‍යාවකින් එවැනි ණය පහසුකම් සඳහා පක්ෂව ඡන්දය දීමෙන් එහි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමකදී එවැනි ණය පහසුකම් සඳහා අවසර දෙනු ලැබේ. මුදල් මණ්ඩලය විසින් කලින් කලට තීරණය කරනු ලබන ආරක්ෂාවක් මගින් මෙම නවාතැන් සුරක්ෂිත කරනු ලැබේ.	පහත කාරණාව සහිතව අනුකූලතා දක්වා ඇත. ප්‍රතිපත්තිය මගින් මෙම අවශ්‍යතාවය ආවරණය වන අතර අධ්‍යක්ෂවරුන් සම්බන්ධයෙන් එවැනි අවස්ථා වර්ෂය තුළ වාර්තා වී නොමැත. කාර්ය මණ්ඩල ණයවලට අදාළව නිකුත් කර ඇති චක්‍රලේඛ මාර්ගෝපදේශ මත පදනම්ව KMP සඳහා ලබා දෙන ණය පහසුකම් බැංකුවේ අදාළ අධිකාරී මට්ටම් විසින් අනුමත කරනු ලැබේ.

ආයතනික පාලනය

අංශය	මූලධර්මය	2021 වර්ෂය තුළ අනුකූලතා මට්ටම
3(7)(v)	අ) බැංකුව විසින් යම් පුද්ගලයෙකුට හෝ පුද්ගලයෙකුගේ සමීප ඥාතියෙකුට හෝ පුද්ගලයාට සැලකිය යුතු බැඳියාවක් දක්වන ඕනෑම පුද්ගලයෙකුට බැංකුවක් විසින් ඕනෑම ණය පහසුකම් ලබා දීමේදී පසුව එකී පුද්ගලයා බැංකුවේ අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් කරනු ලබන්නේ නම්, එම පුද්ගලයා අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් කළ දින සිට වසරක් ඇතුළත මුදල් මණ්ඩලය විසින් ඒ සඳහා අනුමත කළ හැකි පරිදි අවශ්‍ය ඇප ලබා ගැනීමට බැංකුව විසින් පියවර ගෙන ඇත.	පහත කාරණාව සහිතව අනුකූලතා දක්වා ඇත. අදාළ පාර්ශ්ව ගනුදෙනු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ප්‍රතිපත්තිය මෙම අවශ්‍යතාවය ආවරණය කරයි. 2021 වසර තුළ එවැනි තත්ත්වයක් උද්ගත වී නැත.
	ආ) ඉහත 3(7) (v)(අ) විධානයේ දක්වා ඇති කාලසීමාව මඟින් එවැනි ඇපයක් සපයා නොමැති අවස්ථාවක, ණය පහසුකම් ලබා දුන් අවස්ථාවේ නිශ්චිතව දක්වා ඇති කාල සීමාව අවසානයේ වටිනාකම හෝ එම අධ්‍යක්ෂවරයා පත් කළ දින සිට මාස දහඅටක කාල සීමාවක් ඉකුත් වන විට ඇති වටිනාකම් යන දෙකෙන් ඉහල වටිනාකම පොලී සමඟ (ඇත්නම්) ඒවා අයකර ගැනීමට බැංකුව පියවර ගෙන තිබිය යුතු බව	එවැනි තත්ත්වයක් උද්ගත වී නැත. ඉහත ප්‍රතිපත්තිය මෙම අවශ්‍යතාවය ආවරණය කරයි.
	ඇ) ඉහත උප නියමයන්ට අනුකූලව කටයුතු කිරීමට අපොහොසත් වන ඕනෑම අධ්‍යක්ෂවරයකු අධ්‍යක්ෂ ධුරයෙන් ඉවත් වූවා සේ සලකනු ලබන අතර බැංකුව විසින් එම කරුණු මහජනතාවට අනාවරණය කර තිබේ නම් හඳුනා ගැනීමේ ක්‍රියාවලියක් ඇත.	එවැනි තත්ත්වයක් උද්ගත වී නැත. ඉහත ප්‍රතිපත්තිය මෙම අවශ්‍යතාවය ආවරණය කරයි.
	ඈ) අධ්‍යක්ෂකවරයෙකුට ණය පහසුකම් ප්‍රදානය කරන අවස්ථාවේ බැංකුවේ සේවකයෙකු ලෙස කටයුතු කරන්නේ නම් සහ එවැනි බැංකුවක සියලුම සේවකයින්ට අදාළ යෝජනා ක්‍රමයක් යටතේ ණය පහසුකම් ලබා දුන්නේ නම්, කිසිදු අධ්‍යක්ෂවරයකුට 3 (7) (v) (ඇ) නියම අදාළ නොවේ යන්න සහතික කිරීම සඳහා ක්‍රියාත්මක වන ක්‍රියාවලියක් තිබිය යුතුය.	එවැනි තත්ත්වයක් උදාවී නොමැත. කෙසේ වෙතත්, ඉහත ප්‍රතිපත්තිය මෙම අවශ්‍යතාවය ආවරණය කරයි.
3(7)(vi)	බැංකුවක කිසියම් සේවකයෙකුට හෝ එම සේවකයාගේ සමීප ඥාතියෙකුට හෝ ඕනෑම අයෙකුට එම බැංකුවේ සේවකයන්ට අදාළ වන යෝජනා ක්‍රමයක පදනම මත හෝ මුදල් මණ්ඩලය විසින් අනුමත කළ සුරකුමට අනුව 3 (3) නියමය අනුව ලබා දී ඇති ණය පහසුකමක් සම්බන්ධයෙන් හැර සේවකයාට හෝ සමීප ඥාතියාට සැලකිය යුතු බැඳියාවක් දක්වන වෙනත් කාරණාවකට අදාලව ගාස්තු සහ/හෝ කොමිස් මුදල් අත්හැරීමට අදාළව යම් ණය පහසුමක් ලබා දීම හෝ "වඩා වාසිදායක අයුරින් සැලකීම යන්න හඳුනාගැනීමේ ක්‍රියාවලියක් පවතීම බැංකුවක කිසියම් සේවකයෙකුට හෝ එම සේවකයාගේ සමීප ඥාතියෙකුට හෝ ඕනෑම අයෙකුට එම බැංකුවේ සේවකයන්ට අදාළ වන යෝජනා ක්‍රමයක පදනම මත හෝ මුදල් මණ්ඩලය විසින් අනුමත කළ සුරකුමට අනුව 3 (3) නියමය අනුව ලබා දී ඇති ණය පහසුකමක් සම්බන්ධයෙන් හැර සේවකයාට හෝ සමීප ඥාතියාට සැලකිය යුතු බැඳියාවක් දක්වන වෙනත් කාරණාවකට අදාලව ගාස්තු සහ/හෝ කොමිස් මුදල් අත්හැරීමට අදාළව යම් ණය පහසුමක් ලබා දීම හෝ" වඩා වාසිදායක අයුරින් සැලකීම යන්න හඳුනාගැනීමේ ක්‍රියාවලියක් පැවතීම.	පහත කාරණාව සහිතව අනුකූලතා දක්වා ඇත. අධ්‍යක්ෂවරුන් හෝ ඔවුන්ගේ සමීප ඥාතීන්ට ණය පහසුකම් ලබාදීමේ දී අධ්‍යක්ෂවරුන් සංයුතියෙන් තුනෙන් දෙකකට නොඅඩු අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමකදී අනුමත කළ යුතුය. කාර්ය මණ්ඩල ණයවලට අදාළව නිකුත් කර ඇති චක්‍රලේඛ මාර්ගෝපදේශ මත පදනම්ව KMP සඳහා ලබා දෙන ණය පහසුකම් බැංකුවේ අදාළ අධිකාරී මට්ටම් විසින් අනුමත කරනු ලැබේ.

අංශය	මූලධර්මය	2021 වර්ෂය තුළ අනුකූලතා මට්ටම
3(7)(vii)	ඉහත 3(7) (v) සහ 3(7)(vi) නියමයන් යටතේ බැංකුවක් විසින් ලබා දෙන ඕනෑම ණය පහසුකමක් ලබා දීමට සඳහා අධීක්ෂණ මණ්ඩලයෙන් පූර්ව අනුමැතිය ලබා ගැනීමේ සහ මුදල් මණ්ඩලයේ පූර්ව අනුමැතියකින් තොරව ණය පහසුකම් හෝ ඒ සඳහා ගෙවිය යුතු කිසිදු පොලී මුදලක් ප්‍රේෂණය කර නොමැති බව තහවුරු කරන ක්‍රියාවලියක් ඇත. එවැනි අනුමැතියකින් තොරව කරන ලද යම් සහනයක් අවලංගු නොවේ.	එවැනි තත්වයක් උද්ගත වී නොමැති අතර 2022 වසර සඳහා යාවත්කාලීන ප්‍රතිපත්තිය මෙම අවශ්‍යතාවය ආවරණය කරයි.
3(8)	හෙළිදරව් කිරීම්	
3(8)(i)	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනාවරණය කර ඇත:	පහත කාරණාව සහිතව අනුකූලතා දක්වා ඇත.
	(අ) අධීක්ෂණ සහ නියාමන බලධාරීන් විසින් නියම කර ඇති ආකෘති සහ අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සකස් කර ප්‍රකාශයට පත් කරන ලද වාර්ෂික විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සහ එම ප්‍රකාශ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂාවලින් සංක්ෂිප්ත ආකාරයෙන් පුවත්පත්වල පළ කළ යුතුය.	වාර්ෂික විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සකස් කර ප්‍රකාශයට පත් කරනු ලබන්නේ අධීක්ෂණ සහ නියාමන බලධාරීන් විසින් නියම කර ඇති ආකෘතියට සහ අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලවය. එම ප්‍රකාශ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂාවලින් සංක්ෂිප්ත ආකාරයෙන් පුවත්පත්වල පළ වේ.
	(ආ) ත්‍රෛමාසික මූල්‍ය ප්‍රකාශන සකස් කර, සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂාවලින් සංක්ෂිප්ත ආකාරයෙන් පුවත්පත්වල පළ කරනු ලැබිය යුතුය.	
3(8)(ii)	අධ්‍යක්ෂ මණ්ඩල වාර්ෂික වාර්තාවේ පහත සඳහන් අවම හෙළිදරව් කිරීම් සිදු කර ඇත්දැයි පරීක්ෂා කරන්න.	
	අ) නිශ්චිත හෙළිදරව් කිරීම් ඇතුළුව අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන් සහ නියාමන අවශ්‍යතාවලට අනුකූලව වාර්ෂික විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇති බවට ප්‍රකාශය.	පහත කාරණාව සහිතව අනුකූලතා දක්වා ඇත. 1988 අංක 30 දරන බැංකු පනතේ අවශ්‍යතාවයට අනුකූලව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇති බව මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අංක 2.2 සටහනෙන් අනාවරණය වේ.
	ආ) මූල්‍ය වාර්තාකරණයේ විශ්වසනීයත්වය පිළිබඳ සාධාරණ සහතිකයක් ලබා දීම සඳහා මූල්‍ය වාර්තාකරණ පද්ධතිය සැලසුම් කර ඇති බවත්, බාහිර අරමුණු සඳහා මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම ඊට අනුකූලව සිදු කර ඇති බවත් සනාථ කරන බැංකුවේ අභ්‍යන්තර පාලන යාන්ත්‍රණය පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව අදාළ ගිණුම්කරණ මූලධර්ම සහ නියාමන අවශ්‍යතා.	පහත කාරණාව සහිතව අනුකූලතා දක්වා ඇත. මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලන පද්ධතියේ වාර්තාව "අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය" යටතේ ලබා දී ඇත.
	ඇ) ඉහත 3(8) (ii)(ආ) නියමයේ සඳහන් අභ්‍යන්තර පාලන යාන්ත්‍රණයේ සඵලතාවය පිළිබඳ බාහිර විගණන වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලබාගෙන ඇත.	පහත කාරණාව සහිතව අනුකූලතා දක්වා ඇත. බැංකුව විගණකාධිපතිවරයාගෙන් මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලනවල සඵලතාවය පිළිබඳ සහතිකයක් ලබාගෙන ඇත.

ආයතනික පාලනය

අංශය	මූලධර්මය	2021 වර්ෂය තුළ අනුකූලතා මට්ටම
	ඈ) පළපුරුද්ද සහ යෝග්‍යතාවය පිළිබඳ මාර්ගෝපදේශයේ අවශ්‍යතා සපුරාලමින්, අධ්‍යක්ෂවරුන්ගේ නම්, සුදුසුකම්, වයස, බැංකුව සමඟ ගනුදෙනු සහ බැංකුව විසින් ගෙවන ලද මුළු ගාස්තු / වේතන ඇතුළුව මුලු එකතුව.	පහත කාරණාව සහිතව අනුකූලතා දක්වා ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයේ නම්, සුදුසුකම් සහ පළපුරුද්ද ඇතුළුව අධ්‍යක්ෂවරුන්ගේ විස්තර ''අධ්‍යක්ෂ මණ්ඩලය'' යටතේ අනාවරණය කර ඇත. තවද, අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ගෙවන ලද ගාස්තු / වේතන මුල්‍ය ප්‍රකාශනවල අංක 14 සටහන මගින් අනාවරණය කර ඇත.
	ඉ) 3(7) (iii) හි අර්ථ දක්වා ඇති පරිදි එක් එක් සම්බන්ධිත පාර්ශ්වයන් සඳහා ලබා දී ඇති මුළු ශුද්ධ ණය පහසුකම් අදාළ පාර්ශව වල එක් එක් කාණ්ඩයට ලබා දී ඇති ශුද්ධ ණය පහසුකම් බැංකුවේ නියාමන ප්‍රාග්ධනයේ ප්‍රතිශතයක් ලෙස ද හෙළි කළ යුතුය.	මූල්‍ය ප්‍රකාශනවල සටහන අංක 38 යටතේ KMPs සහ පවුලේ සමීපතම සාමාජිකයන් සම්පූර්ණයෙන් නිරාවරණය කර ඇත.
	(ඊ) බැංකුව විසින් එහි ප්‍රධාන කළමනාකාරිත්වයේ නිලධාරීන්ට ගෙවනු ලබන වේතනයේ සමස්ථ අගයන් සහ එහි ප්‍රධාන කළමනාකාරිත්වයේ නිලධාරීන් සමඟ බැංකුවේ ගනුදෙනුවල සමස්ථ වටිනාකම්, ගෙවන ලද වේතන, ලබා දී ඇති ණය පහසුකම්න් සහ තැන්පතු හෝ ආයෝජන වැනි පුළුල් කාණ්ඩ මගින් ආවරණය කෙරෙන සමුච්චිත වටිනාකම්.	පහත කාරණාව සහිතව අනුකූලතා දක්වා ඇත. ප්‍රධාන කළමණාකරන නිලධාරීන්ට ගෙවන ලද වේතනයේ සමස්ථ වටිනාකම සහ ප්‍රධාන කළමණාකරන පුද්ගලයින් (KMP) සමඟ කරන ලද ගණුදෙනු වල සමස්ථ වටිනාකම මුල්‍ය ප්‍රකාශන වල අංක 38.1 සටහන යටතේ අනාවරණය කර ඇත.
	උ) ආයතනික පාලන උපදෙස් වලට අනුකූල වීම පිළිබඳ බාහිර විගණක වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලබාගෙන ඇත.	පහත කාරණාව සහිතව අනුකූලතා දක්වා ඇත. ආයතනික පාලන මාර්ගෝපදේශවලට අනුකූල වීම පිළිබඳ බාහිර විගණන වාර්තාව වාර්ෂික වාර්තාවට ඇතුළත් වේ.
	ඌ) විචක්ෂණ අවශ්‍යතා, රෙගුලාසි, නීති සහ අභ්‍යන්තර පාලනයන්ට අනුකූල වීම සහ කිසියම් අනුකූලතාවයක් නිවැරදි කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳ විස්තර දැක්වෙන වාර්තාවක්.	පහත කාරණාව සහිතව අනුකූලතා දක්වා ඇත. විචක්ෂණ අවශ්‍යතා, රෙගුලාසි සහ නීති සහ අභ්‍යන්තර පාලනයන්ට අනුකූල වීම පිළිබඳ විස්තර අධ්‍යක්ෂ වාර්තාවට ඇතුළත් කර ඇත.
	එ) බැංකුවේ අවදානම් කළමනාකරණයේ අඩුපාඩු හෝ බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ විසින් පෙන්වා දී ඇති මෙම උපදෙස්වලට අනුකූල නොවීම පිළිබඳ නියාමන සහ අධීක්ෂණ අවශ්‍යතා පිළිබඳ ප්‍රකාශයක් එවැනි ගැටළු විසඳීම සඳහා බැංකුව විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග සමඟ මුදල් මණ්ඩලය විසින් මහජනතාවට හෙළිදරව් කරන ලෙස නියෝග කරනු ලැබුවහොත්, එකී විස්තර දැක්වෙන ප්‍රකාශයක් හෙළිදරව් කළ යුතුය.	එසේ මඟ පෙන්වීමක් ලබා දී නැත.

අධ්‍යක්ෂ මණ්ඩල සහ අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටුවල, සහභාගීත්වය

අධ්‍යක්ෂ මණ්ඩල සහභාගීත්වය

අනු අංකය	නම	පැවැති දිනයන් සහ අධ්‍යක්ෂ මණ්ඩල, කමිටු සහභාගීත්වය											
		21.01.2021	18.02.2021	18.03.2021	22.04.2021	20.05.2021	17.06.2021	29.07.2021	26.08.2021	30.09.2021	28.10.2021	29.11.2021	20.12.2021
1	එම්. මහින්ද සාලිය මහතා (සභාපති)	P	P	P	E	P	P	P	P	P	P	P	P
2	ආචාර්ය නිර්මාල් ද සිල්වා මහතා (අධ්‍යක්ෂ)	E	P	P	P	P	P	P	P	P	E	P	P
3	ඩබ්ලිව්. එම්. කරුණාරත්න මහතා (අධ්‍යක්ෂ)	E	P	P	P	P	P	P	P	P	P	P	P
4	මහාචාර්ය එච්.එම්.ඩබ්ලිව්. ආරියරත්න හේරත් මහතා (අධ්‍යක්ෂ)	P	P	P	P	P	P	P	P	P	P	P	P
5	කේ. රවීන්ද්‍රන් මහතා (අධ්‍යක්ෂ)	P	P	P	P	P	P	P	P	P	P	P	P
6	බී.එම්.ප්‍රේමනාත් මහතා (අධ්‍යක්ෂ)	E	P	P	P	P	E	P	P	P	P	E	E
7	එම්.එස්.ඩී. රණසිරි මහතා (අධ්‍යක්ෂ)	P	P	P	P	P	P	P	P	P	P	P	P
8	ලලිත් අබේසිරිවර්ධන මහතා (අධ්‍යක්ෂ)	P	P	P	P	P	P	P	P	P	P	P	P
9	කේ.ඊ.ඩී. සුමනසිරි මහතා (අධ්‍යක්ෂ)	P	E	P	P	P	P	P	N/A	N/A	N/A	N/A	N/A
10	ජී.වී. ජයශාන්ත මහතා (අධ්‍යක්ෂ)	N/A	N/A	N/A	N/A	N/A	N/A	N/A	N/A	P	P	P	P
11	හිරන්ති කරුණාරත්න මිය (අධ්‍යක්ෂ)	N/A	N/A	N/A	N/A	N/A	N/A	N/A	N/A	N/A	N/A	P	P
12	එම්.එස්.එස්.එස්. ප්‍රනාන්දු මහතා (අධ්‍යක්ෂ)	N/A	N/A	N/A	N/A	N/A	N/A	N/A	N/A	N/A	N/A	N/A	P

අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව

සාමාජිකයාගේ නම	රැස්වීම් දිනයන්	
	23.09.2021	08.12.2021
මහින්ද සාලිය මහතා - සභාපති	P	P
ආචාර්ය නිර්මාල් ද සිල්වා මහතා - අධ්‍යක්ෂ	P	P
ලලිත් අබේසිරිවර්ධන මහතා - අධ්‍යක්ෂ	P	P
මහාචාර්ය ආරියරත්න හේරත් මහතා - අධ්‍යක්ෂ	P	P

අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුව

සාමාජිකයාගේ නම	රැස්වීම් දිනයන්	
	23.09.2021	30.09.2021
එම් මහින්ද සාලිය මහතා - සභාපති	P	P
ආචාර්ය නිර්මාල් ද සිල්වා මහතා - අධ්‍යක්ෂ	P	P
ලලිත් අබේසිරිවර්ධන මහතා - අධ්‍යක්ෂ	P	P
මහාචාර්ය එච්.එම්.ඩබ්ලිව්.ඒ. හේරත් - අධ්‍යක්ෂ	P	P

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව

සාමාජිකයාගේ නම	රැස්වීම් දිනයන්	
	15.11.2021	20.12.2021
කේ රවීන්ද්‍රන් මහතා - අධ්‍යක්ෂ	P	P
මහාචාර්ය එච්.එම්.ඩබ්ලිව්.ඒ. හේරත් - අධ්‍යක්ෂ	P	P
ආචාර්ය නිර්මාල් ද සිල්වා - අධ්‍යක්ෂ	P	P
ජී.වී. ජයශාන්ත මහතා - අධ්‍යක්ෂ	P	P

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව

සාමාජිකයාගේ නම	රැස්වීම් දිනයන්	
	15.09.2021	09.12.2021
එම්.එස්.ඩී. රණසිරි මහතා - අධ්‍යක්ෂ	P	P
ඩබ්ලිව්.එම්. කරුණාරත්න මහතා - අධ්‍යක්ෂ	P	P
බී.එම්. ප්‍රේමනාත් මහතා - අධ්‍යක්ෂ	P	E
ලලිත් අබේසිරිවර්ධන මහතා - අධ්‍යක්ෂ	P	P
මහාචාර්ය එච්.එම්.ඩබ්ලිව්.ඒ. හේරත් මහතා - අධ්‍යක්ෂ	P	P
ජී.වී. ජයශාන්ත මහතා - අධ්‍යක්ෂක	NA	E

අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

පොදු කාරණා

ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ 2021 දෙසැම්බර් 31 න් අවසන් වූ දොළොස් වන මූල්‍ය වර්ෂය සඳහා වූ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සහිතව බැංකුවේ ව්‍යාපාරික කටයුතු පිළිබඳ වාර්ෂික ප්‍රකාශනය ඉදිරිපත් කිරීමට ලැබීම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයට මහත් සතුටක් දනවයි. මෙම වාර්ථාව, 2008 අංක 41 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතේ සහ 1988 අංක 30 දරන බැංකු පනතේ අවශ්‍යතාවලට සහ ආයතනික පාලනය පිළිබඳ නියමයන්ට අනුකූලතාව දක්වයි. ග්‍රාමීය බැංකු දාහතක් රජරට, රුහුණු, වයඹ, ඌව, කඳුරට හා සබරගමුව සංවර්ධන බැංකු නමින් ඒකාබද්ධ කරමින් 1997 දී ප්‍රාදේශීය සංවර්ධන බැංකුව ස්ථාපිත කරන ලදි. ඉන් අනතුරුව 2010 වසරේදී එකී පළාත් මට්ටමේ බැංකු හය ජාතික මට්ටමේ සංවර්ධන බැංකුව වශයෙන් තවදුරටත් ඒකාබද්ධ කොට ප්‍රාදේශීය සංවර්ධන බැංකුව ලෙස නම් කරන ලදි. ප්‍රාදේශීය සංවර්ධන බැංකුව ස්ථාපිත කරන ලද්දේ 2008 අංක 41 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත යටතේ විය. ප්‍රාදේශීය සංවර්ධන බැංකුව පූර්ණ වශයෙන් රජයේ හිමිකාරත්වය යටතේ පවතින බැංකුවක් වන අතර, මෙරට ග්‍රාමීය ජනතාව හට පහසුවෙන් ලබා ගත හැකි මූල්‍ය සේවා ලබා දෙමින් ග්‍රාමීය ආර්ථිකය නගා සිටුවීමට උපරිම දායකත්වය සැපයීම අපගේ මුඛ්‍ය පරමාර්ථය වේ.

ප්‍රධාන කාර්යයන්

අප බැංකුවේ ප්‍රධාන කාර්යභාරයන් වන්නේ මූලික වශයෙන්ම ක්ෂුද්‍ර මූල්‍ය ආයතන සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් වෙත මූල්‍ය උපකාර ලබා දීම තුළින් කෘෂිකර්මාන්තය, කර්මාන්ත, වෙළෙඳ අංශය, වාණිජ්‍යය, සත්ත්ව පාලනය, ධීවර කර්මාන්තය ප්‍රවර්ධනය කරමින් හා ශ්‍රී ලාංකිකයන් මූල්‍යමය වශයෙන් සවිබල ගන්වමින් සමස්ථ රටෙහි ආර්ථික සංවර්ධනය වෙත දායකත්වය සැපයීමයි.

දැක්ම හා මෙහෙවර

අපගේ බැංකුවේ දැක්ම හා මෙහෙවර මෙම වාර්ෂික වාර්තාවේ මුල් කවරයේ ඇතුළු පැත්තෙහි සඳහන් කර ඇත. එකී දැක්ම හා මෙහෙවර සාක්ෂාත් කර ගැනීමේදී ඉහළ ආචාර ධර්ම සහිත ව්‍යාපාරික පරිචයන් අනුගමනය කිරීමට අප බැංකුව සෑම විටම කැප වී සිටියි.

ව්‍යාපාරික අඛණ්ඩතාව

පුරෝකථනය කළ හැකි අනාගතය තුළ බැංකුවේ මෙහෙයුම් අඛණ්ඩව පවත්වා ගැනීමට ප්‍රමාණවත් ලෙස සම්පත් පවතින බවට අධ්‍යක්ෂ මණ්ඩලය සෑහීමකට පත් වෙයි. මේ නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී තවදුරටත් ව්‍යාපාරික අඛණ්ඩතා පදනම යොදා ගැනීමට අපි තීරණය කළෙමු.

මූල්‍ය ප්‍රකාශන

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කර ඇති ප්‍රමිති (SLFRSs/ LKASs) සහ 1988 අංක 30 දරන බැංකු පනතේ විධිවිධානවලට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කරන ලදි. 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ අප බැංකුවේ 12 වන මූල්‍ය වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශනවලට නිසි විධිවිධාන ප්‍රකාරව බැංකුවේ ප්‍රධාන මූල්‍ය නිලධාරී, ප්‍රධාන විධායක නිලධාරී සහ අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු විසින් අත්සන තබන ලද අතර එකී අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාවෙහි ඒකාබද්ධ කොටසක් වන එකී මූල්‍ය ප්‍රකාශන මෙහි 121 පිටුවෙහි දක්වා ඇත.

මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම

බැංකුවේ කටයුතු පිළිබඳ සාධාරණ හා සත්‍ය පිළිබිඹුවක් ලබා දෙන අයුරින් මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම දරයි. ඒ අනුව, මෙම මූල්‍ය ප්‍රකාශන 1988 අංක 30 දරන බැංකු පනතේ සහ ඊට සිදු කර ඇති සංශෝධනවල සඳහන් විධිවිධාන වල සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්හි අවශ්‍යතාවලට අනුකූලව පිළියෙළ කොට ඇති බව අධ්‍යක්ෂ මණ්ඩලයේ මතය වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාවෙහි ඒකාබද්ධ කොටසක් වන මූල්‍ය ප්‍රකාශනවලට අදාළව අධ්‍යක්ෂවරුන් වෙත පැවරී ඇති වගකීම් සම්බන්ධ සවිස්තර විග්‍රහයක් මෙම වාර්තාවෙහි 111 පිටුවෙහි දැක්වෙන 'අධ්‍යක්ෂවරුන්ගේ වගකීම පිළිබඳ ප්‍රකාශනයෙහි' දැක්වේ.

විගණකාධිපති වාර්තාව

2021 වසර සඳහා වූ බැංකුවේ විගණන කටයුත්ත විගණකාධිපති විසින් සිදු කරන ලද අතර එකී විගණනය වසර පුරාවටම සිදු කෙරිණ. එම වාර්තාවෙහි හඳුනා ගන්නා ලද ගැටළු සහ අඩුපාඩු කඩිනම් ක්‍රියාමාර්ග ගැනීම සඳහා නිරන්තර පදනමක් මත කළමනාකාරිත්වය වෙත වාර්තා කරන ලදි. මූල්‍ය වාර්තාකරණයේ නිරවද්‍යතාව තහවුරු කර ගැනීමෙන් අනතුරුව අවශ්‍ය දත්ත හා තොරතුරුද සමගින් මූල්‍ය ප්‍රකාශන විගණකාධිපතිගේ අධීක්ෂණය සඳහා යොමු කරන ලදි. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකාධිපතිගේ මතය මෙම වාර්ෂික වාර්තාවේ 114 පිටුවෙහි දැක්වේ. නියාමන අධීක්ෂණ ආයතනයක් වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවද තමන් විසින් නිකුත් කර ඇති නියමයන්ට අනුකූලතාව දක්වන්නේද යන්න නිරීක්ෂණය කරනු පිණිස අප බැංකුවේ වාර්තා සහ මෙහෙයුම් කලින් කලට විමර්ශනය කරන ලදි. පාර්ශ්වකරුවන්ගේ - විශේෂයෙන්ම තැන්පත්කරුවන්ගේ - අභිලාෂ සඳහා නිසි සුරක්ෂාව හිමි වීම සඳහා අවශ්‍ය වන මට්ටම්වලින් මූල්‍ය දර්ශක පවත්වා ගෙන තිබේද යන්නද එමඟින් නිර්ණය කෙරේ.

වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී යොදා ගන්නා ලද වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති 128 සිට 142 දක්වා පිටුවල දැක්වේ.

අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික

වර්ෂය තුළ අධ්‍යක්ෂවරුන් හට ගෙවන ලද පාරිශ්‍රමික පිළිබඳ විස්තර මෙම මූල්‍ය ප්‍රකාශනවලට අදාළ 14 වන සටහනෙහි දැක්වේ.

අනාගත සංවර්ධනයන්

බැංකුවේ අනාගත සංවර්ධනයන් පිළිබඳ කෙටි සමාලෝචනයක් සභාපතිතුමාගේ ප්‍රකාශනයෙහි (පිටු 8-11), සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරීගේ සමාලෝචනයෙහි (පිටු 12-15) සහ කළමනාකරණ සාකච්ඡාව හා විශ්ලේෂණයෙහි (පිටු 34-65) දැක්වේ.

ව්‍යාපාරික කාර්යසාධනය පිළිබඳ සමාලෝචනය

2021 මූල්‍ය වර්ෂය තුළ බැංකුවේ කාර්යසාධනය පිළිබඳ සමාලෝචනයක් සභාපතිතුමාගේ ප්‍රකාශනයෙහි (පිටු 8-11), සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරීගේ සමාලෝචනයෙහි (පිටු 12-15) සහ කළමනාකරණ සාකච්ඡාව හා විශ්ලේෂණයෙහි (පිටු 34-65) දැක්වේ. එකී වාර්තා මෙම වාර්ෂික වාර්තාවෙහි ඒකාබද්ධ කොටසක් වේ.

මූල්‍ය ප්‍රතිඵල

බැංකුවේ මූල්‍ය හා මෙහෙයුම් කාර්යසාධනය පිළිබඳ විග්‍රහයක් සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරීගේ සමාලෝචනයෙහි (පිටු 12-15) සහ 6 සිට 7 දක්වා පිටුවල සඳහන් වැදගත් මූල්‍යමය කරුණුවල දැක්වේ.

ප්‍රකාශිත ප්‍රාග්ධනය

2021 දෙසැම්බර් 31 දිනට බැංකුවේ මුළු කොටස්හිමි අරමුදලේ වටිනාකම රු. බී. 15.4 ක් විය. මෙම මූල්‍ය වර්ෂය අවසානය වන විට කොටස් හිමියන් විසින් දායක කර ඇති ප්‍රකාශිත ප්‍රාග්ධනය රු. බී. 8.05 ක් වූ අතර කොටස් හිමිකාරත්වය ප්‍රතිශතවලින් පහත දැක්වේ.

	රු.	%
01 මහා භාණ්ඩාගාරය	7,553,739,710	94
02 ලංකා බැංකුව	164,484,480	2
03 මහජන බැංකුව	164,484,480	2
04 ජාතික ඉතිරි කිරීමේ බැංකුව	164,521,260	2
එකතුව	8,047,229,930	100

ආදායම

2021 වසර සඳහා වූ බැංකුවේ දළ ආදායම රු. බී. 24.5 ක් වූ අතර ආදායම පිළිබඳ විස්තර 143 පිටුවෙහි දක්වා ඇත.

බදුකරණය

2021 දී බැංකුව බදු හා අයබදු වශයෙන් රු. මී. 1,972 ක් රජය වෙත දායක කර ඇත. රු. මී. 821 ක් වූ ආදායම් බදු සහ රු. මී. 1,151 ක් වූ මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බදු ඊට ඇතුළත් විය. බැංකුවේ මෙහෙයුම්වලට අදාළ වන ආදායම් බදු අනුපාතය 24% ක් වේ. හඳුනා ගැනෙන තාවකාලික වෙනස්කම් සියල්ලටම අදාළව බැරකම් ක්‍රමවේදය යටතේ විලම්බනය වූ බදුකරණයන් සඳහා ප්‍රතිපාදන සැලසීම අප බැංකුවේ ප්‍රතිපත්තියයි.

දේපල, පිරියත සහ උපකරණ

මෙහි සමාලෝචිත වර්ෂය තුළ දේපල, පිරියත සහ උපකරණ හා කල්බදු දේපල සහ අස්පෘශ්‍ය වත්කම් අත්පත්කර ගැනීම වෙනුවෙන් බැංකුවට දරන්නට සිදු වූ මුළු ප්‍රාග්ධන වියදම රු. මී. 326 ක් විය (2020 දී මෙය රු.මී.47ක් විය). ඊට අදාළ විස්තර මෙම වාර්ෂික වාර්තාවේ 156 සිට 160 පිටුවල ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ 24 හා 25 සටහන්වල දක්වා ඇත.

ශේෂ පත්‍ර දිනට පසුව සිදුවීම්

ගැලපුම් සිදු කළ යුතු හෝ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීම අවශ්‍ය වන කිසිදු සැලකිය යුතු තරමේ සිදුවීමක් ශේෂ පත්‍ර දිනට පසුව උද්ගත වී නොමැත.

නිරාකරණය කර ගත යුතුව ඇති නෛතික ක්‍රියාමාර්ග

අධ්‍යක්ෂවරුන්ගේ සහ බැංකුවේ නීතීඥයන්ගේ මතයට අනුව, මූල්‍ය ප්‍රකාශනවලට අදාළ 41 සටහනෙහි දක්වා ඇති නිරාකරණය කර ගත යුතුව ඇති නෛතික ක්‍රියාමාර්ග මගින් බැංකුවේ මූල්‍ය තත්ත්වය හෝ එහි අනාගත මෙහෙයුම් වෙත කිසිදු බලපෑමක් චිල්ල නොවනු ඇත.

ප්‍රාග්ධනය හා මූල්‍ය සංචිත

රඳවාගත් ඉපැයීම්ද ඇතුළත්ව බැංකුවේ ප්‍රාග්ධන හා මූල්‍ය සංචිත පහත අංගවලින් සමන්විත වේ:

	2021 රු.	2020 රු.
ප්‍රකාශිත ප්‍රාග්ධනය	8,047,229,930	8,047,229,930
ව්‍යවස්ථාපිත සංචිත අරමුදල	777,778,133	762,462,998
විශේෂ සංචිත අරමුදල	632,168,461	616,853,326
සාමාන්‍ය සංචිත අරමුදල	3,299,712,282	3,238,451,740
රඳවාගත් ඉපැයීම්	2,636,433,520	2,449,318,947
එකතුව	15,393,322,327	15,114,316,941

ලාභාංශ

2021 වසරේ ආන්තික මෙහෙයුම් ප්‍රතිඵල සලකා බැලීමේදී පෙනී යන්නේ අධ්‍යක්ෂ වරුන් 2021 වසර සඳහා ලාභ වෙතින් ලාභාංශ බෙදා දීමට අනුමැතියක් ලබා දී නොමැති බවයි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

අධ්‍යක්ෂ මණ්ඩලය

සභාපති ඇතුළු සාමාජිකයන් 11 දෙනෙකුගෙන් අධ්‍යක්ෂ මණ්ඩලය සමන්විත වේ. මහා භාණ්ඩාගාරයේ ලේකම් විසින් සභාපති සහ අනෙකුත් අධ්‍යක්ෂවරුන් පත් කරනු ලැබෙන අතර මහා භාණ්ඩාගාරය, ලංකා බැංකුව, මහජන බැංකුව සහ ජාතික ඉතිරි කිරීමේ බැංකුව නියෝජනය කරනු පිණිස අධ්‍යක්ෂවරුන් හතර දෙනෙකු කොටස් හිමියන් විසින් පත් කරනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ නම් පහත දැක්වෙන අතර ඔවුන් පිළිබඳ කෙටි විස්තරයක් මෙම වාර්ෂික වාර්තාවේ 18 සිට 23 දක්වා පිටුවල ඇතුළත් වේ.

එම්. මහින්ද සාලිය මහතා - සභාපති

කේ. රවීන්ද්‍රන් මහතා
ස්වාධීන නොවන/විධායක නොවන අධ්‍යක්ෂ

බී. එම්. ප්‍රේමනාත් මහතා
ස්වාධීන නොවන/විධායක නොවන අධ්‍යක්ෂ

කේ. ඊ. ඩී. සුමනසිරි මහතා
ස්වාධීන නොවන/විධායක නොවන අධ්‍යක්ෂ

එම්. එස්. ඩී. රණසිරි මහතා
ස්වාධීන/විධායක නොවන අධ්‍යක්ෂ

ඩබ්. එම්. කරුණාරත්න මහතා
ස්වාධීන/විධායක නොවන අධ්‍යක්ෂ

මහාචාර්ය එච්. එම්. ඩබ්. ආරියරත්න හේරත්
ස්වාධීන/විධායක නොවන අධ්‍යක්ෂ

ආචාර්ය නිර්මාල් ද සිල්වා මහතා
ස්වාධීන/විධායක නොවන අධ්‍යක්ෂ

ලලිත් අබේසිරිවර්ධන මහතා
ස්වාධීන/විධායක නොවන අධ්‍යක්ෂ

පී ඒ ජයශාන්ත මහතා
ස්වාධීන නොවන/විධායක නොවන අධ්‍යක්ෂ

හිරන්ති කරුණාරත්න මහත්මිය
ස්වාධීන/විධායක නොවන අධ්‍යක්ෂ

එම් එස් එස් එස් ප්‍රනාන්දු
ස්වාධීන නොවන /විධායක නොවන අධ්‍යක්ෂ

ඉවත් වූ අධ්‍යක්ෂවරුන්

කේ. ඊ.ඩී. සුමනසිරි මහතා
ස්වාධීන නොවන/විධායක නොවන අධ්‍යක්ෂ, 2021.08.16 දින ඉල්ලා අස්විය

එම්.එස්.ඩී.රණසිරි මහතා
ස්වාධීන/විධායක නොවන අධ්‍යක්ෂ 2021.12.21 දින ඉල්ලා අස් විය

බී.එම්. ප්‍රේමනාත් මහතා
ස්වාධීන නොවන/විධායක නොවන අධ්‍යක්ෂ, 2022.01.01 දින විශ්‍රාම ගත්තේය.

අභිනවයෙන් පත් කරන ලද අධ්‍යක්ෂවරුන්

අධ්‍යක්ෂවරයාගේ නම	පත් වූ දිනය
පී ඒ ජයශාන්ත මහතා	26.08.2021
හිරන්ති කරුණාරත්න මහත්මිය	21.09.2021
එම්. එස්.එස් එස් ප්‍රනානදු මහතා	01.10.2021

අධ්‍යක්ෂ මණ්ඩල උප කමිටු

බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය සිය සමස්ථ වගකීම හා වගවීම භාර ගන්නා අතරම අප බැංකුව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද ආයතනික පාලන ප්‍රමිතීන් සහ අනෙකුත් ව්‍යවස්ථාපිත අවශ්‍යතාවලට අනුකූලතාව දක්වන බව සහතික කිරීම උදෙසා පහත දැක්වෙන උප කමිටු පිහිටුවන ලදි. එකී අධ්‍යක්ෂ මණ්ඩල උප කමිටුවල සංයුතිය පහත දැක්වේ:

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව

1. එම්. එස්. ඩී. රණසිරි මහතා (කමිටුවේ සභාපති) (2021.12.21 දින ඉල්ලා අස්විය)
2. ඩබ්. එම්. කරුණාරත්න මහතා
3. බී. එම්. ප්‍රේමනාත් මහතා (2022.01.01 දින ඉල්ලා අස්විය)
4. ලලිත් අබේසිරිවර්ධන මහතා (2021.07.29 දින පත්විය)
5. පී ඒ ජයශාන්ත මහතා (2021.10.01 දින පත්විය)
6. ජාතික විගණන කාර්යාලයේ විගණක පරීක්ෂක
7. සී. විල්. සී. මුතුබණ්ඩා මහතා - සහකාර සාමාන්‍යාධිකාරී - අභ්‍යන්තර විගණන

විගණන කමිටුව පිළිබඳ වාර්තාවක් 102 පිටෙහි දැක්වෙන අතර එය අධ්‍යක්ෂවරුන්ගේ වාර්ෂික වාර්තාවේ ඒකාබද්ධ කොටසකි.

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව

1. කේ. රවීන්ද්‍රන් මහතා (කමිටුවේ සභාපති, 2021.01.21 දින පත්විය)
2. මහාචාර්ය එච්.එම්.ඩබ්.ඒ. හේරත් මහතා
3. කේ.ඊ.ඩී. සුමනසිරි මහතා (2020.11.27 දින පත් වන අතර 2021.08.16 දින ඉල්ලා අස්විය)
4. ආචාර්ය නිර්මාල් ද සිල්වා මහතා (2021.07.29 දින පත්විය)
5. පී.ඒ. ජයශාන්ත මහතා (2021.10.01 දින පත්විය)
6. ආර්.එම්.ඩී.කේ. රත්නායක -වැඩ බලන සාමාන්‍යාධිකාරී/ප්‍ර.වි.නි - 2020.11.02 දින සිට
7. එච්.එම්.එන්.එම්. හේරත් මිය - සහකාර සාමාන්‍යාධිකාරී - අවදානම් කළමණාකරන
8. ටී.කේ. විජේරත්න මිය - සහකාර සාමාන්‍යාධිකාරී- අනුකූලතා

ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව පිළිබඳ වාර්තාව 104 පිටෙහි දැක්වෙන අතර එය මෙම වාර්ෂික වාර්තාවේ කොටසකි.

අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව

1. එම්. මහින්ද සාලිය මහතා (කමිටුවේ සභාපති)
2. ආචාර්ය නිර්මාල් ද සිල්වා මහතා
3. ලලිත් අබේසිරිවර්ධන මහතා
4. මහාචාර්ය එච්. එම්. ඩබ්. ඒ. හේරත්
5. කේ. ඊ. ඩී. සුමනසිරි මහතා (2020.07.02 දින පත් වන අතර 2021.08.16 වන දින ඉල්ලා අස්විය)
6. ආර්.එම්.ඩී.කේ.රත්නායක මිය වැඩබලන සාමාන්‍යාධිකාරී/ප්‍ර.වි.නි. - (2020.11.02 දින සිට)
7. ඩී. කේ.එස් සේරසිංහ මහතා - ප්‍රධාන මානව සම්පත් නිලධාරී

අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කමිටුව

1. ආචාර්ය නිර්මාල් ද සිල්වා (කමිටුවේ සභාපති)
2. එම්. එස්. ඩී. රණසිරි මහතා (2020.11.02 දින පත්කරන ලද අතර 2021.12.21 දින විශ්‍රාම ගියේය)
3. කේ. ඊ. ඩී. සුමනසිරි මහතා (2020.11.27 දින පත්කරන ලද අතර 2021.08.16 දින විශ්‍රාම ගියේය)
4. කේ. රවීන්ද්‍රන් මහතා (2020.11.27 දින පත් විය)
5. ආර්. එම්. ඩී. කේ. රත්නායක මිය (2020.11.02 දින සිට වැඩබලන සාමාන්‍යාධිකාරී/ප්‍ර.වි.නි.)
6. වී. ජයසිංහ මහතා - ප්‍රධාන තොරතුරු නිලධාරී

අධ්‍යක්ෂ මණ්ඩල ණය කමිටුව

1. එම්. මහින්ද සාලිය මහතා (කමිටුවේ සභාපති)
2. ඩබ්. එම්. කරුණාරත්න මහතා
3. එම්. එස්. ඩී. රණසිරි මහතා (2020.11.02 දින පත් වී 2021.12.21 දින ඉල්ලා අස් විය)
4. ලලිත් අබේසිරිවර්ධන මහතා
5. බී. එම්. ප්‍රේමනාත් මහතා (2020.11.27 දින පත් වී 2021.12.21 දින ඉල්ලා අස් විය)
6. ආර්. එම්. ඩී. කේ රත්නායක මිය (වැඩබලන සාමාන්‍යාධිකාරී/ප්‍ර.වි.නි. (2020.11.02 දින පත් විය)
7. ඒ. එච්. එම්. එම්. බී. ජයසිංහ මහතා - නි. සාමාන්‍යාධිකාරී - ණය
8. ඒ.එච්.එම්.පී. අබේරත්න - නි. සාමාන්‍යාධිකාරී - ණය අයකිරීම්

අධ්‍යක්ෂ මණ්ඩල නාම යෝජනා කමිටුව

1. එම්. මහින්ද සාලිය මහතා (කමිටුවේ සභාපති)
2. ආචාර්ය නිර්මාල් ද සිල්වා මහතා
3. ලලිත් අබේසිරිවර්ධන මහතා
4. මහාචාර්ය එච්. එම්. ඩබ්. ඒ. හේරත්
5. කේ. ඊ. ඩී. සුමනසිරි මහතා (2020.07.02 දින පත්වන ලද අතර 2021.08.16 දින ඉල්ලා අස්විය)
6. හිරන්ති කරුණාරත්න මහත්මිය (2021. 12. 20 වෙනි දින පත්කරන ලදී)
7. ආර්. එම්. ඩී. කේ. රත්නායක මිය (2020.11.02 සිට වැඩබලන සාමාන්‍යාධිකාරී/ප්‍ර.වි.නි.)
8. ඩී.කේ.එස්. සේරසිංහ මහතා - ප්‍රධාන මානව සම්පත් නිලධාරී

අධ්‍යක්ෂවරුන්ගේ රැස්වීම්

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්, විගණන කමිටු රැස්වීම්, ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු රැස්වීම්, මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු රැස්වීම්, නාම යෝජනා කමිටු රැස්වීම්, ණය කමිටු රැස්වීම්, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කමිටු රැස්වීම් ඇතුළු අධ්‍යක්ෂවරුන් සහභාගී වූ රැස්වීම් සංඛ්‍යාව සහ එකී රැස්වීම්වලට අධ්‍යක්ෂවරුන්ගේ සහභාගීත්වය පිළිබඳ තොරතුරු මෙම වාර්ෂික වාර්තාවේ 93 පිටෙහි දැක්වේ.

කොන්ත්‍රාත්තු සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ පිළිබැඳියාව

මෙහි සමාලෝචනයට ලක් වන වසර තුළදී අධ්‍යක්ෂවරුන් කිසිවෙකු බැංකුව සමග සිදු කෙරෙන කිසිදු කොන්ත්‍රාත්තුවක් හෝ සිදු කිරීමට යෝජිත කොන්ත්‍රාත්තුවක් සම්බන්ධයෙන් සෘජු හෝ වක්‍ර පිළිබැඳියාවක් දක්වා නොමැත.

සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවල (LKAS24) නියමයන්ට අනුව සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු ලෙස වර්ග කළ හැකි ගනුදෙනු කිසිවක් වේ නම් අධ්‍යක්ෂවරුන් විසින් එකී ගනුදෙනු හෙළිදරව් කර ඇති අතර එම ප්‍රමිතීන් මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී යොදා ගෙන ඇත. අධ්‍යක්ෂවරුන් විසින් හෙළිදරව් කරන ලද එකී ගනුදෙනු මෙම මූල්‍ය ප්‍රකාශනවලට අමුණා ඇති 38 සටහනෙහි දක්වා ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී

සාමාන්‍යාධිකාරී තනතුර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරනු ලැබෙන අතර ඔහු/ඇය බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරී තනතුරද දරයි. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා සහභාගී වීමේ හිමිකම සාමාන්‍යාධිකාරී තනතුර සතු වේ.

මානව සම්පත්

ඉහළ ගුණාත්මකභාවයෙන් යුතු සේවාවක් ලබා දීම තුළින් තිරසාර වටිනාකම් නිර්මාණය කිරීමේ ශක්‍යතාවෙන් යුතු ඉහළම අභිප්‍රේරණයකින් හා කැප වීමකින් කටයුතු කරන සේවක පිරිසක් පවත්වා ගැනීමටද බැංකුව කටයුතු කර ඇත.

මෙහෙයුම් විශිෂ්ටතාව

කාර්යක්ෂමතාව ඉහළ නැංවීම හා මෙහෙයුම් වියදම් අඩු කිරීම උදෙසා දැනට පවතින තාක්ෂණික විසඳුම්වලින් උපරිම ඵල නෙළා ගැනීමට සහ ප්‍රතිපත්ති හා ක්‍රියාවලි ප්‍රමිතිගත කිරීමටද බැංකුව පියවර ගනිමින් සිටී.

පරිසරය ආරක්ෂා කිරීම

බැංකුවේ තිරසාර සංවර්ධනය හා වර්ධනය උදෙසා අතිශයින් වැදගත් වන සාධකයක් වන පරිසරය ආරක්ෂා කිරීම වෙනුවෙන්ද අප පියවර ගෙන තිබේ. පරිසරයට හානිකර හෝ උවදුරුදායක කිසිදු ක්‍රියාකාරකමක බැංකුව නිරත වී නොමැත.

ව්‍යවස්ථාපිත ගෙවීම්

රජය වෙත සිදු කළ යුතු ව්‍යවස්ථාපිත ගෙවීම් සහ සේවකයන්ට අදාළ සියලු ගෙවීම් නිසි පරිදි ගෙවා ඇති බවට අධ්‍යක්ෂ මණ්ඩලය සිය දැනුමේ හා විශ්වාසයේ හැටියට සෑහීමකට පත් වේ.

අවදානම් කළමනාකරණය, අභ්‍යන්තර පාලනයන් සහ කළමනාකරණ තොරතුරු පද්ධතිය

අවදානම් කළමනාකරණය කිරීමේ සමස්ථ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී ඇත. එම අරමුණ සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කාර්යක්ෂම හා විස්තීර්ණ අභ්‍යන්තර පාලනයන් සහ කළමනාකරණ තොරතුරු පද්ධතියක් පිහිටුවා ක්‍රියාත්මක කර තිබේ. බැංකුව නිරාවරණය වන අවදානම් අවම කිරීමේ සහ සැලකිය යුතු මට්ටමේ සාවද්‍ය ප්‍රකාශිතයන් හෝ අලාභ සම්බන්ධයෙන් සාධාරණ සහතිකයක් සැපයීමේ අරමුණින් එකී අභ්‍යන්තර පාලන පද්ධති නැවත සැලසුම් කර තිබේ. එමෙන්ම, බැංකුව මුහුණ පාන අවදානම් හඳුනා ගැනීම, තක්සේරු කිරීම සහ කළමනාකරණය කිරීම උදෙසා අඛණ්ඩව ක්‍රියාත්මක වන ක්‍රමවේදයක්ද පවතී. එකී අවදානම් අවම කිරීම සඳහා බැංකුව විසින් අනුගමනය කර ඇති සුවිශේෂී විධිවිධාන සම්බන්ධ විස්තර මෙම වාර්ෂික වාර්තාවේ 58 සිට 65 දක්වා පිටුවල දැක්වේ.

අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශනය

බැංකුවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රමවේදය සකස් කර ඇත්තේ බාහිර අරමුණු වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කොට ඇත්තේ අදාළ ගිණුම්කරණ මූලධර්ම හා නියාමන අවශ්‍යතාවලට අනුකූලතාව දක්වමින් බව ප්‍රකට කරමින් එකී කාර්යයෙහි විශ්වසනීයභාවය සම්බන්ධයෙන් සාධාරණ සහතිකයක් ලබා දිය හැකි පරිදි වේ. අධ්‍යක්ෂවරුන්ගේ වාර්ෂික වාර්තාවේ ඒකාබද්ධ කොටසක් වන එම වාර්තාව 110 පිටුවේ දක්වා තිබේ. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අභ්‍යන්තර පාලනය පිළිබඳ ස්වකීය ප්‍රකාශනය සම්බන්ධයෙන් විගණකාධිපති වෙතින් සහතිකකරණ වාර්තාවක් ලබා ගෙන ඇති අතර එය මෙහි 108 පිටුවෙහි දක්වා ඇත.

ආයතනික පාලනය

බැංකුවේ මෙහෙයුම් කළමනාකරණය කිරීමේදී පිළිගත් හොඳම ආයතනික පාලන පරිචයන් හා ක්‍රමවේදයන්ට අනුකූලතාව දැක්වීම කෙරෙහි අධ්‍යක්ෂ මණ්ඩලය අවධානය යොමු කොට ඇත. ඒ අනුව, අවදානම් කළමනාකරණ විධිවිධාන සහ බැංකුවේ වගවීම හා විනිවිදභාවය ඉහළ නංවනු පිණිස කලින් කලට නව පද්ධති හා ව්‍යුහයන් හඳුන්වා දීම හා පවතින පද්ධති වැඩිදියුණු කිරීම සිදු කර තිබේ. ආයතනික පාලනය පිළිබඳ වෙනම වාර්තාවක් 69 සිට 92 දක්වා පිටුවල දැක්වෙන අතර අධ්‍යක්ෂ මණ්ඩලය ඒ වෙනුවෙන් විගණකාධිපති වෙතින් සිද්ධිවාචක සොයාගැනීම් පිළිබඳ වාර්තාවක් ලබා ගෙන ඇත.

නීති, රෙගුලාසි හා විචක්ෂණභාවය පිළිබඳ අවශ්‍යතා වෙත අනුකූලතාව දැක්වීම

බැංකුව සෑම කල්හිම සිය මෙහෙයුම්වලට අදාළ වන නීති, රෙගුලාසි හා විචක්ෂණභාවය පිළිබඳ අවශ්‍යතා වෙත සහ ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතේ විධිවිධාන වෙත අනුකූලතාව දක්වා ඇති බව සහතික කර තිබේ.

විගණකවරුන්

2021 දෙසැම්බර් 31 න් අවසන් මූල්‍ය වර්ෂය සඳහා බැංකුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණනය විගණකාධිපති විසින් සිදු කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,



අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුවේ වාර්තාව, අධ්‍යක්ෂ මණ්ඩල නාම යෝජනා කමිටුවේ වාර්තාව

හැඳින්වීම

බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා නිකුත් කර ඇති නියමයන්හි 3(6)(iii) සහ (iv) වගන්ති වල දක්වා ඇති 3(6) නියමයෙහි දක්වා ඇති පරිදි ආයතනික පාලන පරිචයන් හට අදාළව ශ්‍රී ලංකා මහ බැංකුවේ නියමවලට අනුකූලව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සෘජුව වාර්තා කරනු ලබන අධ්‍යක්ෂ මණ්ඩල උප කමිටු ප්‍රාදේශීය සංවර්ධන බැංකුව විසින් පිහිටුවීම අවශ්‍ය වේ. ඒ අනුව, අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව සහ අධ්‍යක්ෂ මණ්ඩල නාම යෝජනා කමිටුව නමින් වෙන වෙනම කමිටු දෙකක් අධ්‍යක්ෂවරුන්ගේ සාමාජිකත්වයෙන් යුතුව පිහිටුවන ලදි. ශ්‍රී ලංකා මහ බැංකු නියමයන්හි දක්වා ඇති පරිදි එකී කමිටු වලට අදාළ පරාසයන්ට අනුකූලව වගකීම් පවරන ලදි. 2017 මාර්තු 27 දින සිට බලාත්මක වන පරිදි නිකුත් කර ඇති යොමු කිරීමේ අනුදේශයන්ට අදාළව මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව හා නාම යෝජනා කමිටුව වෙන වෙනම කමිටු දෙකක් වශයෙන් ක්‍රියාත්මක වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුවේ කාර්ය පරාසය

- බැංකුවේ අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ට අදාළ පාරිශ්‍රමික ප්‍රතිපත්තිය තීරණය කිරීම.
- අධ්‍යක්ෂවරුන්, ප්‍ර.වි.නි. සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් වෙනුවෙන් ඉලක්ක හා අරමුණු පිහිටුවීම සහ ඒවාට සාපේක්ෂව ඔවුන්ගේ කාර්යසාධනය කලින් කලට ඇගයීමට ලක් කිරීම.
- බැංකුවේ ව්‍යාපාරික හා කාර්යමය උපායමාර්ග හා බැඳී ඇති මානව සම්පත් උපායමාර්ග කාර්යක්ෂම කිරීම සඳහා මගපෙන්වීම සහ උපදෙස් ලබා දීම.
- මානව සම්පත් ප්‍රතිපත්ති කමිටුව විසින් ඉදිරිපත් කරන ලද කාරණා සහ යෝජනා සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ ඉදිරිපත් කිරීම

අධ්‍යක්ෂ මණ්ඩල නාම යෝජනා කමිටුවේ කාර්ය පරාසය

- ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ තනතුරු සඳහා පුද්ගලයන් පත් කිරීම හෝ උසස් කිරීමට අදාළ සුදුසුකම්, පළපුරුද්ද හා ප්‍රධාන ගති ලක්ෂණ නිර්වචනය කිරීම.
- අධ්‍යක්ෂ මණ්ඩල උප කමිටුවලට නව සාමාජිකයන්, ප්‍ර.වි.නි. හා ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් තෝරා ගැනීම/පත් කිරීම හෝ ඔවුන් එකී තනතුරුවලට නැවත පත් කිරීම සලකා බැලීම සහ බැංකුවේ සමස්ථ අභිමතාර්ථ සාධනය කර ගැනීම වෙනුවෙන් ප්‍ර.වි.නි. හා ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් ලබා දී ඇති දායකත්වය පදනම් කරගෙන ඔවුන්ගේ ධූර කාල දීර්ඝ කිරීම සඳහා ක්‍රමවේදයක් ක්‍රියාවට නැංවීම.
- ව්‍යවස්ථා ප්‍රකාරව 3(3) නියමයෙහි ලබා දී ඇති නිර්ණායකවල දක්වා ඇති පරිදි අධ්‍යක්ෂවරුන් එකී තනතුරු දැරීම සඳහා සුදුසු හා උචිත පුද්ගලයන් වන බව සහතික කිරීම.
- විශ්‍රාම ගන්නා අධ්‍යක්ෂවරුන් සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් වෙනුවෙන් පත් කිරීම්වලදී අමතරව/අභිනවයෙන් අදාළ වන අවශ්‍යතා හා අනුප්‍රාප්තික සැලැස්මක් කලින් කලට සලකා බැලීම හා නිර්දේශ කිරීම.

මෙකී කමිටු දෙක සිය අනුමැතිය සඳහා සිය නිර්දේශ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කරයි.

සංයුතිය හා රැස්වීම්

කමිටු දෙක මෙහෙයවීම පහත පරිදි වේ:

අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු සහ අධ්‍යක්ෂ නාම යෝජනා කමිටුවේ සභාපතිත්වය දරණු ලැබුවේ එම් මහින්ද සාලිය මහතා විසිනි

2021 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර තුළ අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු රැස්වීම් හයක් (05) ක් සහ අධ්‍යක්ෂ මණ්ඩල නාම යෝජනා කමිටු රැස්වීම් හතරක් (04) පවත්වන ලදි.

මානව සම්පත් හා පරිපාලන දෙපාර්තමේන්තුවේ ප්‍රධානී විසින් කමිටු සාමාජිකයන් හට තීරණ ගැනීමේදී ප්‍රයෝජනවත් වනු පිණිස අවශ්‍ය වන පසුබිම් තොරතුරු හා අනෙකුත් අදාළ තොරතුරු සහිතව සාමාන්‍යාධිකාරී/ප්‍ර.වි.නි. හරහා සියලු පත්‍රිකා ඉදිරිපත් කළ යුතු වේ.

මෙම කමිටුවල ලේකම් වශයෙන් කටයුතු කරනු ලබන්නේද අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් වේ.

අවශ්‍ය අවස්ථාවලදී අංශ හෝ ඒකක ප්‍රධානීන් හටද ඔවුන්ට අදාළ කාර්යභාරයන් සම්බන්ධයෙන් අදහස් පළ කිරීම සඳහා රැස්වීම්වලට කැඳවනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුවේ රැස්වීම් සියල්ලටම සාමාන්‍යාධිකාරී/ප්‍ර.වි.නි. සහභාගී විය යුතු වන අතර අධ්‍යක්ෂ මණ්ඩල නාම යෝජනා කමිටු රැස්වීම් සඳහා සාමාන්‍යාධිකාරී/ප්‍ර.වි.නි. ආරාධනාව මත සහභාගී විය යුතු වේ.

එකී ඒ ඒ කමිටුවේ ගණපූරණය ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු වන අතර යටත් පිරිසෙයින් කාර්තුමය පදනම මතවත් එම කමිටු රැස් විය යුතුය. සමාලෝචිත වසර තුළදී කමිටු සාමාජිකයන් වෙනස් වූ අතර ඊට අදාළ විස්තර පහත දැක්වේ:

අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව

නම	සහභාගී වූ/ සුදුසුකම් ලත් රැස්වීම්
එම්. මහින්ද සාලිය මහතා - සභාපති (2020 පෙබරවාරි 26 සිට බලාත්මක වන පරිදි පත් කර ඇත)	05/05
ආචාර්ය නිර්මාල් ද සිල්වා මහතා - අධ්‍යක්ෂ 2020 පෙබරවාරි 26 සිට බලාත්මක වන පරිදි පත් කරන ලදි)	05/05
ලලිත් අබේසිරිවර්ධන මහතා - අධ්‍යක්ෂ (2020 පෙබරවාරි 26 සිට බලාත්මක වන පරිදි පත් කරන ලදි)	05/05

අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුවේ වාර්තාව, අධ්‍යක්ෂ මණ්ඩල නාම යෝජනා කමිටුවේ වාර්තාව

නම	සහභාගී වූ/ සුදුසුකම් ලත් රැස්වීම්
මහාචාර්ය එච්. එම්. ඩබ්. ඒ. හේරත් - අධ්‍යක්ෂ (2020 පෙබරවාරි 26 සිට බලාත්මක වන පරිදි පත් කරන ලදි)	05/05
කේ. ඊ. ඩී. සුමනසිරි මහතා - අධ්‍යක්ෂ (2020 ජූලි 02 සිට බලාත්මක වන පරිදි පත් කරන ලදි)	02/03
දමිතා රත්නායක මිය -වැ.බ. සාමාන්‍යාධිකාරී/ප්‍ර.වි.නි.	
ආර්. එම්. ටී. රාජපක්ෂ මිය - අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්	

අධ්‍යක්ෂ මණ්ඩල නාම යෝජනා කමිටුව

නම	සහභාගී වූ/ සුදුසුකම් ලත් රැස්වීම්
එම්. මහින්ද සාලිය මහතා - සභාපති (2020 පෙබරවාරි 26 සිට බලාත්මක වන පරිදි පත් කර ඇත)	04/04
ආචාර්ය නිර්මාල් ද සිල්වා මහතා - අධ්‍යක්ෂ 2020 පෙබරවාරි 26 සිට බලාත්මක වන පරිදි පත් කරන ලදි)	04/04
ලලිත් අබේසිරිවර්ධන මහතා - අධ්‍යක්ෂ (2020 පෙබරවාරි 26 සිට බලාත්මක වන පරිදි පත් කරන ලදි)	04/04
මහාචාර්ය එච්. එම්. ඩබ්. ඒ. හේරත් - අධ්‍යක්ෂ (2020 පෙබරවාරි 26 සිට බලාත්මක වන පරිදි පත් කරන ලදි)	04/04
කේ. ඊ. ඩී. සුමනසිරි මහතා - අධ්‍යක්ෂ (2020 ජූලි 02 සිට බලාත්මක වන පරිදි පත් කරන ලදි)	02/02
දමිතා රත්නායක මිය - වැ.බ. සාමාන්‍යාධිකාරී/ප්‍ර.වි.නි.	
ආර්. එම්. ටී. රාජපක්ෂ මිය - අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්	

ක්‍රියාකාරකම් පිළිබඳ සාරාංශය

2021 අගෝස්තු මසදී අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු වූ කේ. ඊ. ඩී. සුමනසිරි මහතා ඉල්ලා අස්වීම සැලකිල්ලට ගනිමින් එකී කමිටු අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙක් ලෙස හිරන්ති කරුණාරත්න මහත්මිය පත් කරන ලදි.

අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුවේ සහ අධ්‍යක්ෂ මණ්ඩල නාම යෝජනා කමිටුවේ රැස්වීම් වාර්තාද සහිතව එකී කමිටු දෙකෙහි ලේකම් විසින් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සඳහා නිර්දේශ ඉදිරිපත් කරන ලදි. මෙහි සමාලෝචනයට ලක් වන වසර තුළදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නාම යෝජනා කටමුවව සහ මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශ අනුමත කර ඇත.



එම්. මහින්ද සාලිය මහතා
සභාපති

අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව
අධ්‍යක්ෂ මණ්ඩල නාම යෝජනා කමිටුව
2022.08.15

අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කමිටුව

කාර්ය පරාසය

බැංකුවේ මෙහෙයුම් වලදී තොරතුරු හා සන්නිවේදන තාක්ෂණික විසඳුම් යොදා ගැනීමේ ස්වභාවය සහතික කිරීමේ සහ තොරතුරු තාක්ෂණික වර්ධනය සම්බන්ධයෙන් දැකිය හැකි නැගී එන ඉල්ලුමට සරිලන පරිදි මෙහෙයුම් පවත්වා ගැනීමේදී බැංකුවට සහාය වීමේ අරමුණින් අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කමිටුව පිහිටුවන ලදි.

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණික විසඳුම්වලට අදාළ සමස්ථ උපායමාර්ගය සකස් කිරීමේ සහ පාරිභෝගික සේවාවන් හා අභ්‍යන්තර කාර්යසාධනය වැඩිදියුණු කිරීම උදෙසා බැංකුවේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණික කටයුතු සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත අදාළ නිර්දේශ ලබා දීමේ වගකීම මෙම කමිටුව වෙත පැවරී ඇත.

කමිටුවේ සංයුතිය

ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කමිටුව පහත සමාජිකයන්ගෙන් සමන්විත වේ:

අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කමිටුවේ සාමාජිකයන්

1. ආචාර්ය නිර්මාල් ද සිල්වා (කමිටුවේ සභාපති)
2. එම්. එස්. ඩී. රණසිරි මහතා (2020.11.02 දින පත් කරන ලද අතර 2021.12.21 දින විශ්‍රාම ගන්නා ලදී)
3. කේ. ඊ. ඩී. සුමනසිරි මහතා (2020.11.27 දින පත් කරන ලද අතර 2021.08.16 දින විශ්‍රාම ගන්නා ලදී)
4. කේ. රවීන්ද්‍රන් මහතා (2020.11.27 දින පත් කරන ලදී)

සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - තොරතුරු තාක්ෂණ / ප්‍රධාන තොරතුරු නිලධාරී සහ ප්‍රධාන අවදානම් කළමනාකරණ නිලධාරී යන නිලධාරීන් ආරාධනාව මත මෙම කමිටු රැස්වීම්වලට සහභාගී වන ආයතනික කළමනාකරණ සාමාජිකයෝ වෙති. බැංකුවේ ඕනෑම නිලධාරියෙකුට ආරාධනාවක් මත රැස්වීම්වලට සහභාගි විය හැක

අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කමිටුවේ ගණපූරණය වන්නේ සාමාජිකයන් දෙදෙනෙකි (02). 2021 වසර තුළ පළමුවන හා දෙවන කාර්තුවේ දී තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කමිටුව විසින් රැස්වීම් දෙකක් (02) ක් පවත්වා ඇති අතර ඒ අනුව නෛතික අවශ්‍යතා ඉටු කර ඇත. එම රැස්වීම් 2021.03.10 සහ 2021.06.25 යන දිනවල පැවැත්විණ.

2021.07.29 වෙනි දින පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී ගන්නා ලද තීරණයකට අනුව තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කමිටුව විසුරුවා හරිා ලදී.



ආචාර්ය නිර්මාල් ද සිල්වා
සභාපති
අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කමිටුව
2022.08.15

අධ්‍යක්ෂ මණ්ඩල විගණන උපකමිටුවේ වාර්තාව

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව, ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා වන ආයතනික පාලනය සම්බන්ධයෙන් 2007 අංක 12 දරන බැංකු පනතේ ඇතුළත් විධිවිධාන වලට අනුකූලව පිහිටුවන ලදි. විගණන කමිටුවේ කටයුතු ඉටු කෙරෙනුයේ එකී කටමුවේ කාර්යයන් උදෙසා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇති ප්‍රඥප්තිය පදනම් කර ගෙන වේ.

විගණන කමිටුව වෙත අධිකාරිත්වය, කාර්ය පරාසය හා වගකීම් පැවරීමේ අරමුණ වෙනුවෙන් අධ්‍යක්ෂ මණ්ඩලය කලින් කලට විගණන කමිටු ප්‍රඥප්තිය සමාලෝචනය කොට අදාළ බලතල පවරයි. පවරන ලද බලතල හා අධිකාරත්වය මත පදනම්ව අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් විගණන කමිටු ප්‍රඥප්තියට අනුකූලව බැංකුවේ අභ්‍යන්තර විගණන කාර්යභාරයෙහි පරාසය හා වගකීම් තීරණය කරනු ලැබේ.

කමිටුවේ සංයුතිය

මෙම කමිටුව, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද විගණන කමිටු ප්‍රඥප්තියට අනුකූලව එහි කටයුතු මෙහෙයවීමේ වගකීම දරන පහත සඳහන් විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත වේ:

1. එම්. එස්. එස්.එස් ප්‍රනාන්දු මහතා (කමිටුවේ සභාපති)
2 ඩබ්. එම්. කරුණාරත්න මහතා
3 ලලිත් අබේසිරිවර්ධන මහතා (2021.09.15 දින පත් විය)
4. පී.ඒ. ජයශාන්ත මහතා - (2021.12.09 දින පත්විය)
5. එම්.එස්.ඩී. රණසිරි මහතා - (2021.12.21 දින ඉල්ලා අස්වන ලදී)
6. බී. එම්. ප්‍රේමනාත් මහතා (2021.12.31 දින ඉල්ලා අස්වන ලදී)

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් ආරාධනා කරන ලද අවස්ථාවලදී සාමාන්‍යාධිකාරී/ප්‍ර.වි.නි., විගණන අංශ ප්‍රධානී, සහකාර සාමාන්‍යාධිකාරී (අවදානම් කළමනාකරණ), ප්‍රධාන මූල්‍ය නිලධාරී හා ජ්‍යෙෂ්ඨ සහකාර සාමාන්‍යාධිකාරී (අනුකූලතා) සහ ජාතික විගණන කාර්යාලයේ නියෝජිතයෙකු (බැංකුවේ බාහිර විගණක) මෙම කමිටුවේ රැස්වීම් සඳහා සහභාගී වෙයි. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවට සිය භූමිකාව ඉටු කිරීමේදී අදාළ වන ප්‍රධාන ගැටළු/කාරණා සහ ව්‍යාපාරික සංවර්ධනයන් සම්බන්ධයෙන් මෙම කමිටුවේ දැනුවත්භාවය ඉහළ නංවනු පිණිස ඇතැම් රැස්වීම් සඳහා සහභාගී වන ලෙස අදාළ ව්‍යාපාරික ඒකක හෝ අංශවල නිලධාරීන් හටද ඇරයුම් කෙරේ. අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් මෙම කමිටුවේ ලේකම් වශයෙන්ද කටයුතු කරයි.

කමිටුවේ ප්‍රඥප්තිය

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද, අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු ප්‍රඥප්තිය මගින් එම කමිටුවට අදාළ යොමු කිරීමේ අනුදේශයන් පැහැදිලිව නිර්වචනය කෙරේ. කමිටු ප්‍රඥප්තිය අවසන් වරට 2019 අප්‍රේල් මස අධ්‍යක්ෂ මණ්ඩලය මගින් සමාලෝචනය කර අනුමත කරන ලදී.

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ වගකීම් සහ භූමිකාව

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව පහත කාර්යභාරයන් සඳහා වගකීම දරයි:

- හෙළිදරව් කිරීම සඳහා පිළියෙළ කරන ලද බැංකුවේ මූල්‍ය ප්‍රකාශනවල, වාර්ෂික වාර්තාවෙහි සහ ගිණුම් හා කාර්තුමය වාර්තාවල ඒකාබද්ධභාවය අධීක්ෂණය කරනු පිණිස බැංකුවට අදාළ මූල්‍ය තොරතුරු සමාලෝචනය කිරීම.
- බැංකුවේ ගිණුම්කරණ ප්‍රතිපත්ති හා පරිචයන්හි පිළිගත හැකි බව හා ගුණාත්මකභාවය පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කිරීම.
- ගිණුම්කරණ හා මූල්‍ය වාර්තාකරණය, අවදානම් කළමනාකරණ ක්‍රියාවලීන් සහ නියාමන අනුකූලතා සමාලෝචනය කිරීම.
- මූල්‍ය ප්‍රකාශන, සෑම කල්හිම අදාළ වන ව්‍යාවස්ථාපිත විධිවිධාන,ගිණුම්කරණ ප්‍රමිතීන් සහ ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට දක්වන අනුකූලතාව සහතික කරනු පිණිස එකී ප්‍රකාශන පළ කිරීමට පෙර සමාලෝචනය කිරීම (කාර්තුමය වාර්තාද ඇතුළත්ව).
- අභ්‍යන්තර විගණන වාර්තා සමාලෝචනය කිරීම සහ අදාළ විධිවිධාන උල්ලංඝනය කිරීම්, වංචා හා දූෂණ හා වැරදි වැළැක්වීම උදෙසා අවශ්‍ය පූර්වාරක්ෂණ ක්‍රමවේද අනුගමනය කිරීමේදී ආයතනික කළමනාකාරිත්වය සමඟ සම්බන්ධීකරණය පවත්වා ගැනීම.
- විගණන ප්‍රධානී පත් කිරීමද ඇතුළුව අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය සහ කාර්යභාරය තක්සේරුවට ලක් කිරීම.
- අදාළ වන ගිණුම්කරණ ප්‍රමිති හා නියාමන අවශ්‍යතාවලට අනුකූලව බාහිර අරමුණු සඳහා පිළියෙළ කරනු ලබන මූල්‍ය ප්‍රකාශනවල විශ්වසනීයත්වය සම්බන්ධයෙන් සාධාරණ සහතිකයක් ලබා දෙනු පිණිස මූල්‍ය වාර්තාකරණයට අදාළව බැංකුවේ පවතින අභ්‍යන්තර පාලනයන්හි සඵලදායීතාව සමාලෝචනය කිරීම.
- අවශ්‍ය අවස්ථාවලදී සුවිශේෂිත කාරණා සම්බන්ධයෙන් ස්වාධීන උපදේශකයන් හා කටයුතු කිරීම.

රැස්වීම්

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද සංවිධානමය ආයතනික පාලනය සඳහා වන රෙගුලාසි/මාර්ගෝපදේශවලට අනුකූලව මෙම කමිටුවේ රැස්වීම් කාර්තුමය පදනම මත පැවැත්වේ. ඒ අනුව, 2021 දෙසැම්බර් 31 න් අවසන් මූ මූල්‍ය වර්ෂය තුළ විගණන කමිටු රැස්වීම් හතරක් (4) පවත්වා ඇත.

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු රැස්වීම් සඳහා අවශ්‍ය ගණපූරණය සාමාජිකයන් තිදෙනෙකි (3).

කමිටු සාමාජිකයන් එකී රැස්වීම් සඳහා සහභාගී වීම පිළිබඳ තොරතුරු පහත දැක්වේ:

කමිටු සාමාජිකයාගේ නම	සහභාගීත්වය
එම්. එස්. ඩී. රණසිරි මහතා	04/04
ඩබ්. එම්. කරුණාරත්න මහතා	04/04
බී. එම්. ප්‍රේමනාත් මහතා	02/04
ලලිත් අබේසිරිවර්ධන මහතා	02/02
පී ඒ ජයශාන්ත මහතා	00/01

අභ්‍යන්තර විගණනය හා අධීක්ෂණය

අභ්‍යන්තර විගණන කාර්යය බැංකුවේ ස්වාධීන කාර්යභාරයක් බව මෙම කමිටුව සහතික කර ඇත. අභ්‍යන්තර විගණන කාර්යයෙහි ස්වාධීනතාව, අභ්‍යන්තර විගණන අංශයේ කාර්ය පරාසයෙහි හා එය සතු සම්පත්වල ප්‍රමාණාත්මතාව කමිටුව විසින් සමාලෝචනය කරන ලද අතර, අභ්‍යන්තර විගණන අංශය සතුව සිය කාර්යයන් ඉටු කිරීම සඳහා අවශ්‍ය අධිකාරිත්වය පැවැති බවට කමිටුව සෑහීමකට පත් වේ.

කොවිඩ්-19 වසංගතයේ ව්‍යාප්තිය හේතුවෙන් විගණන සැලැස්මට අනුකූලව විගණනය සිදු කිරීම කෙරෙහි සෘජු බලපෑමක් එල්ල විය. මේ හේතුවෙන්, ශාඛා විගණන කටයුතු බොහොමයක් පද්ධති පාදක විගණනයන් බවට පරිවර්තනය කෙරිණ. මෙහි සමාලෝචනයට ලක් වන වසරට අදාළ අභ්‍යන්තර විගණන සැලැස්මට අනුව, විගණන කමිටුවේ අධීක්ෂණය හා මගපෙන්වීම යටතේ අභ්‍යන්තර විගණන අංශය මගින් ශාඛා විශාල ප්‍රමාණයක් විගණනය කරන ලදි. මේ අතරම, වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සහ අතුරු මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කොට ඇත්තේ අධීක්ෂණ හා නියාමන අධිකාරීන් සහ අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලතාව දක්වමින් බව සහතික කරනු පිණිස අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සහාය වී තිබේ.

ශ්‍රී ලංකා මහ බැංකුවේ ව්‍යවස්ථාපිත විමර්ශන වාර්තාව සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 13(7)(අ) වගන්තිය ප්‍රකාරව 2020 වසර සඳහා ජාතික විගණන කාර්යාලය විසින් නිකුත් කරන ලද වාර්තාව සහ 2020 කළමනාකරණ ලිපිය මගින් ඉස්මතු කර තිබුණු කාරණා සම්බන්ධයෙන් බැංකුවේ කළමනාකාරිත්වය විසින් 2021 වසරේදී ගන්නා ලද නිවැරදිකරණ ක්‍රියාමාර්ග සම්බන්ධයෙන්ද විගණන කමිටුව සොයා බලන ලදි.

එමෙන්ම, අභ්‍යන්තර පාලන පද්ධතිය වැඩිදියුණු කිරීම සහ වංචා, වැරදි හා දූෂණ සහ අනෙකුත් අලාභ ඇති කරන සිදුවීම් අවම කිරීමේ පියවර සම්බන්ධයෙන්ද කටයුතු කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් බැංකුවේ තිරසාරතාව, ලාභදායීතාව සහ අනෙකුත් වී හා සබැඳි කාරණා ඇගයීමට ලක් කෙරේ. විගණන කාර්ය මණ්ඩලයේ දැනුම හා නිපුණතා වර්ධනය කිරීම වෙනුවෙන්ද පියවර ගෙන තිබේ.

වී අනුව, මූල්‍ය වාර්තාකරණයේදී සහ අවදානම් කළමනාකරණයේදී බැංකුව ප්‍රමාණවත් හා උචිත පාලනයන් පවත්වා ගන්නා බව සහ අදාළ ක්‍රමවේද/පද්ධතිවලට අනුකූලතාව දක්වන බව අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව සහතික කරයි.

බාහිර විගණනය

බැංකුවේ බාහිර විගණන කාර්යභාරය සම්බන්ධයෙන් මෙම කමිටුව වෙත පැවරී ඇති භූමිකාව පහත පරිදි වේ:

බැංකුවේ බාහිර විගණන කාර්යය රටෙහි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රකාරව විගණකාධිපති විසින් සිදු කරනු ලැබේ. එකී බාහිර විගණනය ස්වාධීනව හා සඵලදායීව සිදු කර ඇති බවත්, අදාළ විගණන ප්‍රවේශය හා ක්‍රමවේදයට අදාළව විගණකාධිපතිගේ නියෝජිතයා සමග අඛණ්ඩ වාර්තාකරණයක් පවත්වා ගන්නා ලද බවටත් කමිටුව සහතික කරයි.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

බැංකුවට අදාළ වන නව හා සංශෝධිත ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (SLFRS/LKAS) යොදා ගැනීම සම්බන්ධයෙන් මෙම කමිටුව විසින් ඊට අදාළ සංශෝධිත ප්‍රතිපත්තිමය තීරණ සමාලෝචනය කරන ලදි. එමෙන්ම, ඊට අදාළ නිර්දේශ කිරීම් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදි. අදාළ ගිණුම්කරණ ප්‍රමිති වෙත අනුකූලතාව දක්වන්නේද යන්න අධීක්ෂණය කිරීමට කමිටුව අඛණ්ඩව කටයුතු කර අතර නිරන්තර පදනමක් මත අධ්‍යක්ෂ මණ්ඩලය දැනුම්වත් කිරීමට කටයුතු කරනු ඇත.

2021 වසරේදී සිදු කරන ලද කාර්යයන්

මෙහි සමාලෝචනයට ලක් වන වසර තුළදී කමිටුව පහත දැක්වෙන ප්‍රධාන කාර්යයන් ඉටු කර තිබේ:

1. 2022 වසර සඳහා බැංකුවේ විවිධ ක්ෂේත්‍රවලට අදාළ අවදානම් කළඹ පදනම් කර ගනිමින් පිළියෙළ කරන ලද වාර්ෂික විගණන සැලැස්ම අනුමත කරන ලදි.
2. 1971 අංක 38 දරන මුදල් පනතේ 13(7)(අ) වගන්තිය ප්‍රකාරව 2020 වසර සඳහා විගණකාධිපති විසින් නිකුත් කරන ලද වාර්තාව සහ 2020 කළමනාකරණ ලිපිය හා ඊට අදාළ කළමනාකාරිත්වයේ ප්‍රතිචාර සාකච්ඡා කොට සමාලෝචනය කරන ලදි.
3. 2021 වසර සඳහා වූ බැංකුවේ කාර්තුමය මූල්‍ය කාර්යසාධනය සමාලෝචනය කොට වී පිළිබඳ නිර්දේශ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කරන ලදි.
4. අභ්‍යන්තර විගණන වාර්තා සහ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය කලින් කලට සමාලෝචනය කරන ලදි.



එම්. එස්. එස්. එස් ප්‍රනාන්දු
සභාපති
අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව
2022.08.15

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ වාර්තාව

කමිටුවේ සංයුතිය

මෙහි සමාලෝචනයට ලක් වන වසර තුළ අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව පහත සඳහන් විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත වූ අතර ඔවුන්ගේ සුදුසුකම් 18 සිට 23 දක්වා පිටුවල දැක්වේ.

ඒ ඒ අධ්‍යක්ෂවරයාගේ නම යටතේ එකී අධ්‍යක්ෂවරයා ස්වාධීනද ස්වාධීන නොවන්නේද යන්න සඳහන් කර ඇත.

1. කේ. රවීන්ද්‍රන් මහතා (කමිටුවේ සභාපති/ස්වාධීන අධ්‍යක්ෂ)
2. මහාචාර්ය එච්. එම්. ඩබ්. ඒ. හේරත් - ස්වාධීන අධ්‍යක්ෂක
3. කේ. ඊ. ඩී. සුමනසිරි මහතා - ස්වාධීන අධ්‍යක්ෂක
4. ආචාර්ය නිර්මාල් ද සිල්වා මහතා - ස්වාධීන අධ්‍යක්ෂක
5. පී ඒ ජයශාන්ත මහතා - ස්වාධීන අධ්‍යක්ෂක

2021 වසර තුළදී ප්‍රධාන විධායක නිලධාරී, ප්‍රධාන අවදානම් කළමනාකරණ නිලධාරී සහ අනුකූලතා නිලධාරී යන නිලධාරීන් මෙම කමිටුවේ රැස්වීම් සඳහා නිරන්තරව සහභාගී වී ඇත.

කමිටුවේ ලේකම්

අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් මෙම කමිටුවේ ලේකම්ද වේ.

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව කාර්තුමය පදනමක් මත රැස් වී ඇති අතර පැවැති අවශ්‍යතා මත පදනම්ව අතිරේක රැස්වීම් සුදුසු පරිදි පවත්වා ඇත. අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු ප්‍රඥප්තියට අනුව කමිටුවේ ගණපූරණය සැදුම් ලබන්නේ විධායක නොවන අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු, ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන අවදානම් කළමනාකරණ නිලධාරී මගිනි.

වසර තුල දී ප්‍රාදේශීය සංවර්ධන බැංකුව විසින් කාර්තුමය පදනමින් කමිටු රැස්වීම් හතරක් (04) ක් පවත්වන ලද අතර බැංකුවේ අවධානම් පැතිකඩ මත කොවිඩ් 19 වසංගතයේ බලපෑම පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා අතිරේක කමිටුවක් (1) ක් පවත්වන ලදී කමිටු රැස්වීම් කාර්ය සටහන් අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්ථා කරන ලදී.

කමිටුවේ සාමාජිකයන් රැස්වීම්වලට සහභාගී වීම පිළිබඳ විස්තර පහත දැක්වේ:

රැස්වීම්

කමිටු සාමාජිකයාගේ නම	සහභාගීත්වය
කේ. රවීන්ද්‍රන් මහතා - අධ්‍යක්ෂ	05/05
මහාචාර්ය එච්. එම්. ඩබ්. ඒ. හේරත් - අධ්‍යක්ෂ	05/05
කේ. ඊ. ඩී. සුමනසිරි මහතා - අධ්‍යක්ෂ	03/05
ආචාර්ය නිර්මාල් ද සිල්වා - අධ්‍යක්ෂ	03/05
පී ඒ ජයශාන්ත මහතා- අධ්‍යක්ෂ	02/05

කමිටුවට අදාළ යොමු කිරීමේ අනුදේශ

1988 අංක 30 දරන බැංකු පනත මගින් මුදල් මණ්ඩලය වෙත පැවරී ඇති බලතල යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද ''ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා වන ආයතනික පාලනය'' පිළිබඳ 2007 බැංකු පනතේ අංක 11 දරන විධිවිධානයේ 3(6) වගන්තියට අනුකූලව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව පිහිටුවන ලදි.

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව ප්‍රධාන අවදානමට භාජනයවීම් සමාලෝචනය හා එය නිරීක්ෂණය හා පාලනය කිරීමට ගතයුතු පියවර සමගින් බැංකුවේ අවදානම් කළමනාකරණ කාර්යේ වගකීම සාක්ෂාත් කර ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලයට සහය වේ

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙම කමිටුව වෙනුවෙන් පිහිටුවන ලද යොමු කිරීමේ අනුදේශ අතරට පහත කාරණා ඇතුළත් වේ:

1. ඒකාබද්ධ අවදානම් කළමණාකරණ රාමුවට අනුව බැංකුව අබණ්ඩව අවදානම් කළමනාකරණ උපායමාර්ග, රාමුව හා ක්‍රමවේද ක්‍රියාවට නංවා ඇති බව තහවුරු කිරීම.
2. ණය, වෙළඳපල ද්‍රවශීලතාවය, මෙහෙයුම් හා අනුකූලතා අවදානම් වලට අදාල නිවැරදි හා කාර්යක්ෂම අවදානම් හඳුනාගැනීම, මැනීම, අධීක්ෂණය හා අවම කිරීම.
3. බැංකුවේ ප්‍රතිපත්ති සහ නියාමන හා අධීක්ෂණ අවශ්‍යතා මත පදනම්ව කමිටුව විසින් තීරණය කරනු ලබන අවදානම් දරා ගැනීමේ සීමාව ඉක්මවා අවදානම් භාර ගැනීම අවම කිරීම සඳහා ස්ථාපිත කරන ලද අධිකාරත්වයට අනුව අවදානම් කළමනාකරණ තීරණ ගනු ලැබෙන බව සහතික කිරීම.
4. බැංකුවේ අවදානම් කළමනාකරණ පද්ධතියේ කාර්යක්ෂමතාව සහ අවදානම් කළමනාකරණ කාර්යභාරයේ සඵලදායීතාව අධීක්ෂණය කිරීම හා තක්සේරු කිරීම.
5. බැංකුවට අදාල අවදානම් රුචිය (Risk Appetite) අවදානම් දරා සිටීමේ සීමාව සැකසීම.
6. බාසල් III මාර්ග සිතියම ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය හා නියාමන මාර්ගෝපදේශ සමාලෝචනය කිරීම.
7. බැංකුවේ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ ප්‍රත්පත්ති සමාලෝචනය කිරීම සහ වැඩිදියුණු කිරීම
8. අවදානම් කළමනාකරණ අංශයේ (RMD) විෂය පථය නිර්ණය කිරීම සහ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ රාමුව ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා අවදානම් කළමනාකරණ අංශය මෙහෙයවීම.

2021 වසරේ ක්‍රියාකාරකම්

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (BIRMC) වෙත පැවරී ඇති ඉහත රාජකාරී සහ වගකීම් ඉටු කිරීමේදී, කමිටුව විසින් වර්ෂය තුළ උපායමාර්ගික, මෙහෙයුම්, ණය, වෙළඳපල, සයිබර් සහ අනෙකුත් නැගී එන අවදානම් කාණ්ඩ ඇතුළත් සැලකිය යුතු අවදානම් සමාලෝචනය කරන ලදී.කමිටුව විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම් පහත දැක්වේ;

1. බැංකුවේ ණය ආකෘතිය අනුව අවදානම් සම්බන්ධ ප්‍රතිපත්ති සමාලෝචනය කර සංශෝධනය කිරීම හා ප්‍රතිපත්ති/අත්පොත් නිර්දේශ ඉදිරිපත් කිරීම

2021 වර්ෂය තුළ සමාලෝචනය කර සංශෝධනය කරන ලද අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති	
ආතති පරීක්ෂණ ප්‍රතිපත්තිය	බැංකුවේ ආතති පරීක්ෂණ රාමුව විස්තර කරයි
තොරතුරු ආරක්ෂණ ප්‍රතිපත්තිය	බැංකුවේ සහ එහි ජාල තුළ ඇති තොරතුරුවල ආරක්ෂාවට අදාළ නීති සහ මාර්ගෝපදේශ ගෙන හැර දක්වයි.
අනුකූලතා ප්‍රතිපත්තිය	බැංකුවේ අනුකූලතා කළමනාකරණය කිරීම සඳහා රාමුව
බැංකුවේ මුදල් විශුද්ධිකරණ විරෝධී (AML) ප්‍රතිපත්තිය	බැංකුවේ මුදල් විශුද්ධිකරණයට එරෙහිවීම සහතික කිරීම සඳහා වූ මාර්ගෝපදේශ සහ ක්‍රියා පටිපාටි
බාහිර උපදේශකයින් හරහා තක්සේරු කර ඇති 2021 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද අලුතින් වැඩිදියුණු කරන ලද අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති.	
පොලී අනුපාත අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය	පොලී අනුපාත අවදානම හඳුනා ගැනීම, තක්සේරු කිරීම, කළමනාකරණය සහ අවම කිරීම සඳහා රාමුව.
ද්‍රවශීලතා අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය	ද්‍රවශීලතා අවදානම හඳුනා ගැනීම, තක්සේරු කිරීම, කළමනාකරණය සහ අවම කිරීම සඳහා වන රාමුව.
විදේශ විනිමය අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය	විදේශ විනිමය අවදානම හඳුනා ගැනීම, තක්සේරු කිරීම, කළමනාකරණය සහ අවම කිරීම සඳහා රාමුව.
වත්කම් හා වගකීම් කමිටුවේ (ALCO) ප්‍රකාශය	වත්කම් සහ වගකීම් කළමනාකරණය සහතික කිරීම සඳහා වන මාර්ගෝපදේශ සහ ක්‍රියා පටිපාටි.
2021 වර්ෂය තුළ සමාලෝචනය කර සංශෝධනය කරන ලද බැංකුවේ අනෙකුත් කාර්යයන් සම්බන්ධ ප්‍රතිපත්ති,	
සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු ප්‍රතිපත්තිය	සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු පිළිබඳ මාර්ගෝපදේශය සහ ක්‍රියා පටිපාටි
අනුකූලතා ප්‍රතිපත්තිය	නියාමකයා විසින් පනවා ඇති නීති, රීති සහ රෙගුලාසිවලට අනුකූල වීම සඳහා බැංකුව විසින් පිළිපැදිය යුතු අභ්‍යන්තර ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි.
බැංකු අරමුදල් ආයෝජනය කිරීම සඳහා ආයෝජන ප්‍රතිපත්තිය	බැංකුවේ අරමුදල් ආයෝජනය කිරීමේ දී ආයෝජන අරමුණු, අවදානම දරාගැනීමේ කැමැත්ත, ආයෝජන කළඹෙහි ඇති බාධාවන් සහ ආයෝජන වැඩසටහන කළමනාකරණය සහ අධීක්ෂණය කරන්නේ කෙසේද යන්න හඳුනා ගැනීම සඳහා පරාමිති සහ මාර්ගෝපදේශ.
හාණිකරණ (Impairment) ප්‍රතිපත්තිය	සාමූහික පදනමක් මත මනිනු ලබන මූල්‍ය වත්කම් සමූහගත කිරීම සඳහා බැංකුවේ ප්‍රතිපත්තිය පිළිබඳ රාමුව.
අවදානම් තක්සේරු පුරක (Matrix) ප්‍රතිපත්තිය	අවදානම් හඳුනාගැනීම, තක්සේරු කිරීම, කළමනාකරණය සහ අවදානම අවම කිරීම සඳහා වන රාමුව.
හෙළිදරව් කිරීමේ ප්‍රතිපත්තිය	හෙළිදරව් කිරීමේ ප්‍රතිපත්තිය යනු රහස්‍ය ව්‍යාපාරික තොරතුරු හැර අවශ්‍ය තොරතුරු මහජනතාවට, ආයෝජකයින්ට, සේවකයින්ට, ගනුදෙනුකරුවන්ට, ණය හිමියන්ට සහ වෙනත් අදාළ පාර්ශ්වයන්ට කාලෝචිත, නිවැරදි, සම්පූර්ණ, තේරුම්ගත හැකි, පහසු සහ දැරිය හැකි මිලකට හෙළිදරව් කිරීම සහතික කිරීමයි.
බාහිරින් සේවා ලබා ගැනීමේ ප්‍රතිපත්තිය	බාහිරින් ලබා ගැනීමේ ගිවිසුම් හා සම්බන්ධ අවදානම් කළමනාකරණය කිරීම සඳහා බාහිරින් ලබා ගැනීමේ ප්‍රතිපත්ති රාමුව.
වාහන කළමනාකරණ ප්‍රතිපත්තිය	වාහන කළමනාකරණ පිළිබඳ රාමුව.
ණය කපා හැරීම් ප්‍රතිපත්තිය	බැංකුවේ ණය කපා හැරීම පිළිබඳ ප්‍රතිපත්ති
අක්‍රීය ණය ප්‍රතිසාධනය සඳහා වන ප්‍රතිපත්තිය	පරාටේ (Parate) ක්‍රියාත්මක කිරීම හරහා චංචල / නිශ්චල දේපල හඳුනා ගැනීමෙන් පසු අක්‍රීය ණය ආපසු අයකර ගැනීම පිළිබඳ මාර්ගෝපදේශය, පරාටේ (Parate) ක්‍රියාත්මක කිරීම සහ වෙන්දේසියේදී විකුණා නැති දේපල අත්පත් කර ගැනීම සහ ඒවා ටෙන්ඩර් හරහා විකිණීම පිළිබඳ ප්‍රතිපත්තිය.
නව නිෂ්පාදන ප්‍රතිපත්ති	බැංකුව විසින් අනුවර්තනය කරන ලද නව නිෂ්පාදන මිලකරණ උපාය මාර්ග පිළිබඳ මාර්ගෝපදේශය සහ රාමුව
විසිල් බ්ලෝවර් ප්‍රතිපත්තිය	සංවිධානයේ සම්මත කරගත් ප්‍රතිපත්ති උල්ලංඝණය කිරීම සහ නීති විරෝධී භාවිතයන් සම්බන්ධයෙන් වාර්තා කිරීමේ මූලධර්ම රාමුව

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ වාර්තාව

2. නිශ්චිත අවදානම් මට්ටම නිරීක්ෂණය කිරීම සඳහා වැඩිදියුණු කරන ලද ප්‍රධාන අවදානම් දර්ශක (KRIs) නියමිත අවදානම් කළමනාකරණ අරමුණු සහ අවදානම් නිරාවරණ පාලනය සඳහා ක්‍රියාශීලී ක්‍රියාමාර්ගවලට සේවය කිරීම සඳහා එවැනි දර්ශකවල ප්‍රමාණවත් බව තීරණය කිරීමේ අරමුණින් නිතිපතා සමාලෝචනය කරන ලදී. තත්‍ය මාසික ප්‍රතිඵල මිණුම් සලකුණු වලට එරෙහිව සමාලෝචනය කරන ලද අතර නිශ්චිත අවදානම් වල බලපෑම් අවම කිරීම සඳහා කඩිනම් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග නිර්දේශ කරන ලදී.
3. COVID-19 ගෝලීය වසංගත තත්ත්වය හේතුවෙන් රට මුහුණ දී සිටින ආර්ථික අභියෝග මධ්‍යයේ 2021 වර්ෂය සඳහා ප්‍රධාන අවධානය යොමු වූයේ බැංකු කර්මාන්තයේ ණය ගුණාත්මක භාවය පිරිහීම පිළිබඳ තත්වයයි. ණය ගුණාත්මක භාවය පිරිහීම වැලැක්වීමේ අරමුණින් අවදානම් අවම කිරීම සඳහා බැංකුවේ පාලනය යටතේ පවතින සාධක සහ බලපෑමට ලක් වූ අංශ පිළිබඳ සාකච්ඡා නිසි ලෙස සලකා බලන ලදී.
4. අවදානම් රුචිය පිළිබඳ රාමුව සහ අවදානම් ඉවසීමේ සීමාව පිළිබඳ සමාලෝචනය කරන ලද වාර්තා, බැංකුවේ සමස්ත අවදානම් කළමනාකරණ අංශය පිළිබඳ කාර්තුමය වාර්තා සමාලෝචනය කරන ලදී.
5. බැංකුවේ අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා තක්සේරු කිරීමේ ක්‍රියාවලි (ICAAP) ලේඛනය සමාලෝචනය කරන ලදී.
6. කළමනාකරණ කමිටුවල ප්‍රමාණවත් බව සහ සඵලතාවය සමාලෝචනය කරන ලදී.
7. අනුමත සීමාවන් ඉක්මවා ගිය බැංකුවේ ණය කළඹෙහි ආංශික සීමාවන් අධීක්ෂණය කර සමාලෝචනය කර ගැලපීම් සඳහා නිර්දේශ ඉදිරිපත් කරන ලදී.
8. නියාමන අවශ්‍යතාවලට අනුකූල වීමේ ප්‍රමාණය තක්සේරු කිරීම සඳහා අනුකූලතා නිලධාරියා විසින් ඉදිරිපත් කරන ලද සම්පූර්ණ අනුකූලතා වාර්තා සමාලෝචනය කරන ලදී.
9. කළමනාකරණ මට්ටමේ කමිටුවල සියලුම රැස්වීම් වාර්තා සමාලෝචනය කරන ලදී (මෙහෙයුම් අවදානම් කළමනාකරණ අනුකමිටුව, කළමනාකරණ කමිටුව, වත්කම් සහ වගකීම් කළමනාකරණ කමිටුව, මෙහෙයුම් පරිශ්‍ර කමිටුව)
10. ව්‍යවස්ථාපිත පරීක්ෂණ වාර්තාව අධීක්ෂණය කර සමාලෝචනය කරන ලද අතර ගැටළු නිරාකරණය කිරීමට හැකි සියලු නිර්දේශ ඉදිරිපත් කරන ලදී.
11. සයිබර් අවදානම් වාර්තා, පොලී අනුපාත අවදානම, විදේශ විනිමය අවදානම, මෙහෙයුම් අවදානම, අනුකූලතා අවදානම.. යනාදී සියලු වර්ගවල අවදානම් දර්ශක අධීක්ෂණය සහ සමාලෝචනය කරන ලද අතර අවදානම් අවම කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කරන ලදී.
12. බැංකුවේ ආපදා ප්‍රතිසාධන ඩ්‍රිලය අධීක්ෂණය කරන ලද අතර එහි සාර්ථකත්වය සඳහා හැකි සියලු නිර්දේශ ඉදිරිපත් කරන ලදී.
13. දෙපාර්තමේන්තුවේ දැනුම වැඩි දියුණු කිරීම සඳහා බැංකුවේ අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව සමඟ සමීපව කටයුතු කිරීම.
14. ද්‍රවශීලතා අවදානම, ණය අවදානම යනාදිය පිළිබඳ සමහර දර්ශක සඳහා අවදානම් සීමාවන් ක්‍රියාත්මක කිරීම.

වාර්තා කිරීම

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු (BIRMC) රැස්වීම් වල වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරනු ලැබේ. බැංකුවේ අවදානම් පැතිකඩ පිළිබඳ වාර්තාව සහ අනෙකුත් විශේෂිත කරුණු අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවෙහි නිර්දේශය මත අනුමැතිය සඳහා වෙන වෙනම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබේ. සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලදී.


2021 වර්ෂය තුළ දී, ඵලදායී අවදානම් කළමනාකරණ රාමුවක් මගින් ශක්තිමත් කරනු ලබන අවදානම් පරාමිතීන් තුළ බැංකුවේ සමස්ත ව්‍යාපාර උපාය මාර්ගය ක්‍රියාත්මක කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව සහාය ලබා දුන් අතර ක්‍රියාකාරකම් නිතිපතා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරන ලදී.

නිගමනය

2021 දී අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ සාමාජිකයින් සාමූහිකව කටයුතු කිරීමෙන් කාර්යසාධනය සහ කාර්යක්ෂමතාව සඳහා එහි ක්‍රියාකාරිත්වය ඇගයීමට ලක් කර ඇත. බැංකුව මුහුණ දෙන විවිධ අවදානම් ක්ෂේත්‍රය පිළිබඳව කමිටුව නිරන්තරව සමාලෝචනය කරන අතර පහත සඳහන් කටයුතුවල නිරත වීමෙන් ශක්තිමත් අවදානම් පාලන රාමුවක් ප්‍රවර්ධනය කිරීමට හැකි විය.

1. අවදානම් රුචිය නිර්ණය කිරීම ආවරණය වන පරිදි හොඳින් වර්ධනය වූ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තියක්.
2. පීඩන පරීක්ෂණ හෝ දර්ශන විශ්ලේෂණයන්, සම බැංකු විශ්ලේෂණය සහ දත්ත විශ්ලේෂණයේ ප්‍රතිඵල ඵලදායී ලෙස සන්නිවේදනය කිරීම. අවදානම් වාර්තාකරණය අධ්‍යක්ෂ මණ්ඩලට නිවැරදිව සන්නිවේදනය කරන බව සහතික කිරීම.
3. අවදානම් කළමනාකරණය කිරීමේ අවශ්‍යතාවය පිළිබඳ කාර්ය මණ්ඩලය අතර දැනුවත්භාවය වැඩි කිරීම, අනුකූලතාව සහතික කිරීම සහ කාර්ය මණ්ඩලය පුහුණු කිරීම අවදානම් සංස්කෘතිය නිර්මාණය කිරීමේ දී වැදගත් සංරචක වේ.
4. බැංකුවේ පාර්ශවකරුවන්ගේ අභිලාෂයන් සුරක්ෂිත කරමින් අවදානම් කළමනාකරණය සහ අනුකූලතාව යන අභියෝග වලට මුහුණ දීම සඳහා බැංකුව නිවැරදි මාවතක ගමන් කරන බව කමිටුවේ අදහසයි.

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන්



සභාපති,
ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව

2022 අගෝස්තු 15
කොළඹ දී ය.

ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන මූල්‍ය නිලධාරීගේ වගකීම පිළිබඳ ප්‍රකාශනය

ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන පහත සඳහන් නියාමන අවශ්‍යතාවලට අනුකූලව පිළියෙළ කොට ඉදිරිපත් කරනු ලැබේ:

1. ශ්‍රී ලංකා ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් (SLFRS/ LKAS)
2. 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති සමීක්ෂණ පනත
3. 1988 අංක 30 දරන බැංකු පනත සහ ඊට සිදු කරන ලද සංශෝධන
4. ආයතනික පාලනය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද 2007 බැංකු පනතේ අංක 12 දරන නියමයද ඇතුළත්ව නමුත් ඊට සීමා නොවන අනෙකුත් විධිවිධාන ප්‍රකාරව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී විශේෂිත බැංකු වෙත නිකුත් කරන ලද නියමයන්, චක්‍රලේඛ සහ මාර්ගෝපදේශ, සහ
5. 2008 අංක 41 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතේ විධිවිධාන.

මෙම මූල්‍ය ප්‍රකාශන සහ අනෙකුත් හෙළිදරව් කිරීම් පිළියෙළ කොට ඉදිරිපත් කිරීමේදී යොදා ගන්නා ලද ආකෘතීන්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද බලපත්‍රලාභී විශේෂිත බැංකුවල වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී අනුගමනය කළ යුතු විශේෂිත ආකෘතිවලට අනුකූලතාව දක්වයි.

බැංකුවේ ගිණුම්කරණ ප්‍රතිපත්ති, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය විසින් කලින් කලට නිකුත් කරනු ලැබෙන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල වේ. එකී ගිණුම්කරණ ප්‍රතිපත්ති බැංකුව විසින් නිරතුරුවම අනුගමනය කරනු ලැබේ. වත්මන් වසරට අදාළ ඉදිරිපත් කිරීමේදී අනුකූලතාව දැක්විය යුතු සෑම අවස්ථාවකදීම විස්තීර්ණ තොරතුරු ප්‍රති-ප්‍රකාශිත කොට ඇත. වැදගත් අයිතම සියල්ලම මූල්‍ය ප්‍රකාශනවලට යෙදූ සටහන් මගින් හෙළිදරව් කොට විස්තර කොට තිබේ. මේ සමග ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන මගින් සමාලෝචිත වසරට අදාළ බැංකුවේ මූල්‍ය තත්ත්වය, ආදායම් ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ සම්බන්ධයෙන් සත්‍ය හා සාධාරණ පිළිබිඹුවක් ලබා දෙන බව අපගේ දැනුමේ හා විශ්වාසයේ හැටියට අපි සනාථ කරන්නෙමු. පුරෝකථනය කළ හැකි අනාගතය තුළ සිය මෙහෙයුම් අඛණ්ඩව පවත්වා ගැනීමටත් ඒ අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී ව්‍යාපාරික අඛණ්ඩතා පදනම යොදා ගැනීමටත් අවශ්‍ය සම්පත් ප්‍රමාණවත් ලෙස බැංකුව සතුව පවතින බව අපගේ විශ්වාසයයි.

මූල්‍ය ප්‍රකාශනවල ඒකාබද්ධතාව හා වාස්තවිකභාවය පිළිබඳ වගකීම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය සහ කළමනාකාරිත්වය භාර ගනියි. මූල්‍ය ප්‍රකාශනවලට අදාළ ඇස්තමේන්තුගත කිරීම් සහ තීන්දු ගැනීම් සාධාරණ හා විචක්ෂණ පදනමක් මත සිදු කර තිබේ. ඒ අනුව, මූල්‍ය ප්‍රකාශන මගින් සත්‍ය හා සාධාරණ පිළිබිඹුවක් සිදු කෙරෙන පරිදි ගනුදෙනුවල ස්වභාවය හා අන්තර්ගතය මෙන්ම බැංකුවේ කටයුතුවල තත්ත්වය සාධාරණ ලෙස ඉදිරිපත් කෙරේ.

එය තහවුරු කිරීම උදෙසා බැංකුවේ වත්කම් ආරක්ෂා කිරීම සහ වංචා හා අනෙකුත් අක්‍රමිකතා හඳුනා ගැනීම හා වළක්වා ගැනීම වෙනුවෙන් ප්‍රමුඛ බැංකුකරණ පද්ධතිය භාවිතයෙන් අභ්‍යන්තර පාලන පද්ධති ක්‍රියාත්මක කිරීමේදී බැංකුව විසින් මනා සහ ප්‍රමාණවත් සුපරීක්ෂාවකින් කටයුතු කර තිබෙන අතර එකී කාරණා අඛණ්ඩ පදනමක් මත සමාලෝචනය හා තක්සේරු කොට යාවත්කාලීන කෙරේ.

බැංකුවේ ස්ථාපිත ප්‍රතිපත්ති හා ක්‍රමවේද නිරතුරුවම අනුගමනය කරනු ලැබෙන බවට සාධාරණ සහතිකයක් ලබා දෙනු පිණිස බැංකුවේ අභ්‍යන්තර විගණක විසින් කලින් කලට විගණනයන් සිදු කොට තිබේ. කෙසේ වෙතත්, ඕනෑම අභ්‍යන්තර පාලන විධිවිධානයක් සහ ගිණුම්කරණ පරිචයක් මගින් සැපයෙන සහතිකය මිනුම්ගත කිරීමේදී පිළිගත යුතු අත්‍යන්ත සීමාකම්ද පවතී.


බැංකුවේ මූල්‍ය ප්‍රකාශන ජාතික විගණන කාර්යාලය විසින් විගණනය කරන ලදි. විගණකාධිපති විසින් නිකුත් කරන ලද වාර්තාව මෙම වාර්ෂික වාර්තාවෙහි 114 සිට 118 දක්වා පිටුවල දක්වා ඇත.

සියලු ගනුදෙනු නිවැරදිව සහ අංග සම්පූර්ණව ගිණුම් පොත්වල වාර්තා කර ඇති බවට සහ SLFRS/ LKAS ඇතුළු ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් හා මූල්‍ය වාර්තාකරණයට හා අදාළ හෙළිදරව් කිරීම්වලට අදාළ වන අනෙකුත් නියාමන විධිවිධාන සහතික කෙරෙන ක්‍රියාවලීන් සම්බන්ධයෙන් සාධාරණ සහතිකයක් ලබා දෙනු පිණිස මූල්‍ය වාර්තාකරණයට අදාළ අභ්‍යන්තර පාලනයන්හි සඵලදායීතාවද ඇතුළත්ව අභ්‍යන්තර පාලන පද්ධතියේ කාර්යක්ෂමතාව සහ ප්‍රමාණාත්මතාව අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් සමාලෝචනය කරනු ලැබේ. පූර්ණ ස්වාධීනතාවක් පවතින බව සහ සැලකිය යුතු මට්ටමේ වැදගත්කමක් දරන ඕනෑම කාරණාවක් සාකච්ඡාවට ලක් කරනු පිණිස බාහිර විගණකවරුන්ට සහ අභ්‍යන්තර විගණකවරුන් හට විගණන කමිටු රැස්වීම්වලදී අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු සාමාජිකයන් වෙත සම්පූර්ණ හා නිදහස් ප්‍රවේශය ඇති බව සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ වාර්තාව මෙහි 102 සහ 103 පිටුවල දක්වා ඇත.

අපගේ දැනුමේ හැටියට පහත කරනු සනාථ කරන්නෙමු:

බැංකුව විසින් ඊට අදාළ සියලුම නීති, රීති, රෙගුලාසි හා මාර්ගෝපදේශ අනුගමනය කර ඇති බව, සැලකිය යුතු තරමේ අනුකූලතා නොවන කිසිවක් නොමැති බව, වාර්ෂික වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන කොටසේ අංක 38.2 දරන සටහනේ දක්වා ඇති කාරණා හැරුණු විට බැංකුවට එදිරිව කිසිදු සැලකිය යුතු මට්ටමේ නෛතික ක්‍රියාමාර්ග කිසිවක් නොමැති බව, බැංකුව විසින් සිදු කළ යුතු බදු, තීරබදු, අයබදු හා සියලුම ව්‍යවස්ථාපිත ගෙවීම් සහ බැංකුවේ සේවකයන් වෙනුවෙන් හා ඔවුන්ට අදාළව සිදු කළ යුතු සියලුම දායකත්වයන්, අයබදු හා ගාස්තු වාර්තාකරණ දිනය වන විට හෝ අදාළ දින වන විට ගෙවා ඇති බව.





ඒ. එච්.එම්.එම්.බී. ජයසිංහ
සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී

පී. එස්. එදිරිසූරිය
ප්‍රධාන මූල්‍ය නිලධාරී

2022 අගෝස්තු .15

අභ්‍යන්තර පාලනය පිළිබඳ විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. BAN/E/RDB/IC/2021
මෙහි අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 07 September 2022

සභාපති,
ප්‍රාදේශීය සංවර්ධන බැංකුව

ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව පිළිබඳව විගණකාධිපති විසින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කරනු ලබන සහතිකකරණ වාර්තාව

හැඳින්වීම

මෙම වාර්තාවෙහි පරමාර්ථය වන්නේ 2021 දෙසැම්බර් 31 න් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා වූ ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ වාර්ෂික වාර්තාවෙහි ඇතුළත් කර ඇති මූල්‍ය වාර්තාකරණය සම්බන්ධ අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශනය සම්බන්ධයෙන් සහතිකකරණයක් ලබා දීමයි.

කළමනාකාරිත්වයේ වගකීම

2007 අංක 12 දරන බැංකු පනත් නියමයෙහි 3(8)(ii)(b) වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කර ඇති 'අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශනය සම්බන්ධයෙන් බැංකු අධ්‍යක්ෂ මණ්ඩල' සඳහා වන මාර්ගෝපදේශය අනුකූලව එකී ප්‍රකාශනය පිළියෙළ කොට ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් කළමනාකාරිත්වය වගකීම දරයි.

මාගේ වගකීම සහ SLSAE 3050 (සංශෝධිත) ප්‍රමිතියට අනුකූලතාව දැක්වීම

අධ්‍යක්ෂවරුන් විසින් හෝ ඔවුන් වෙනුවෙන් පිළියෙළ කරන ලද ලේඛන මෙම ප්‍රකාශනය සඳහා උපකාරී වී ඇතිද යන්න සහ මෙමගින් ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ අභ්‍යන්තර පාලන යාන්ත්‍රණයේ සැකැස්ම හා කාර්යක්ෂමතාව සමාලෝචනය කිරීමේදී අධ්‍යක්ෂවරුන් විසින් යොදා ගන්නා ලද ක්‍රියාවලිය ප්‍රමාණවත් ලෙස පිළිබිඹු වන්නේද යන්න තක්සේරු කිරීම මාගේ වගකීම වේ.

ශ්‍රී ලංකා ප්‍රමිති සහතික විකඟතා 3050 (සංශෝධිත) අනුකූලව මාගේ සහතික වාර්තාව, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයෙන් නිකුත් කළ, අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය පිළිබඳ සහතික වාර්තාව අනුකූලව ඉදිරිපත් කරමි. සැලකිය යුතු මට්ටමින් වැදගත් සෑම කෙෂ්ත්‍රයක්ම සලකා බලමින් කළමනාකාරිත්වය විසින් අභ්‍යන්තර පාලනය පිළිබඳ ප්‍රකාශනය පිළියෙළ කර තිබේද යන්න පිළිබඳ සීමිත සහතිකයක් ලබා ගැනීම සඳහා මා විසින් ක්‍රමවේද සැලසුම් කොට විගණනය කිරීම එකී ප්‍රමිතීන්ට අනුව අවශ්‍ය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.auditorgeneral.gov.lk

මෙම විගණන කාර්යයෙහි අරමුණ වෙනුවෙන් කවර හෝ වාර්තාවක් යාවත්කාලීන කිරීම හෝ නැවත නිකුත් කිරීම සම්බන්ධයෙන් මා වගකීම නොදරන අතර, විගණන කාර්යය අතරතුරදී මූල්‍ය තොරතුරු සම්බන්ධ විගණනයක් හෝ සමාලෝචනයක්ද මා විසින් සිදු කර නොමැත.

ඉටු කරන ලද කාර්යභාරය පිළිබඳ සාරාංශයක්

අධ්‍යක්ෂවරුන් විසින් හෝ ඔවුන් වෙනුවෙන් පිළියෙළ කරන ලද ලේඛන මෙම ප්‍රකාශනය සඳහා උපකාරී වී ඇතිද යන්න සහ මෙමගින් බැංකුවේ අභ්‍යන්තර පාලන යාන්ත්‍රණය සමාලෝචනය කිරීමේදී අධ්‍යක්ෂවරුන් විසින් යොදා ගන්නා ලද ක්‍රියාවලිය ප්‍රමාණවත් ලෙස පිළිබිඹු වන්නේද යන්න තක්සේරු කරනු පිණිස මා විසින් මෙම කර්තව්‍යය ඉටු කර ඇත.

මෙහිදී යොදා ගන්නා ලද ක්‍රමවේද මූලික වශයෙන්ම බැංකු කාර්ය මණ්ඩලයෙහි විමසීම් සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යොදා ගන්නා ලද ක්‍රියාවලිය වෙත සහාය වූ සහ නියැදි පදනමක් මත සිදු කරන ලද ලේඛනගත කිරීම්වල පැවැත්ම වෙත සීමා විය.

SLSAE 3050 (සංශෝධිත) ප්‍රමිතියට අනුව, එම ප්‍රකාශනය මගින් අවදානම් හා පාලන විධිවිධාන සියල්ලම ආවරණය වන්නේද යන්න සලකා බැලීම හෝ බැංකුවේ අවදානම් හා පාලන යාන්ත්‍රණයෙහි කාර්යක්ෂමතාව පිළිබඳ මතයක් ගෙනහැර පෑම මා විසින් ඉටු කළ යුතු අවශ්‍යතාවක් නොවේ. SLSAE 3050 (සංශෝධිත) ප්‍රමිතියට අනුව, වාර්ෂික වාර්තාවෙහි හෙළිදරවු කර ඇති සැලකිය යුතු මට්ටමේ ගැටළු කිසිවකට අදාළ අභ්‍යන්තර පාලන විධිවිධානවල වැදගත් පැතිකඩ සම්බන්ධයෙන් කටයුතු කිරීම උදෙසා විස්තර කර ඇති ක්‍රියාවලීන් මගින් එම ගැටළුවලට පිළියම් යෙදෙන්නේද යන්න සලකා බැලීමද මා විසින් කළ යුතු බවට අවශ්‍යතාවක් නොමැත.

ප්‍රකාශනය පිළියෙළ කිරීමට අදාළව බැංකුවේ ස්වභාවය, සිදුවීම් හෝ ගනුදෙනු සම්බන්ධයෙන් වන මාගේ අවබෝධයට අදාළව මෙහිදී තෝරා ගන්නා ලද ක්‍රමවේද මාගේ තීන්දුව මත පදනම් වේ.

මා විසින් ලබා ගන්නා ලද සාක්ෂි මාගේ සාරාංශය ඉදිරිපත් කිරීම සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා යෝග්‍ය බව මාගේ විශ්වාසය වේ.

සාරාංශය

මෙම කාර්යයේදී යොදා ගන්නා ලද ක්‍රමවේද මත පදනම්ව බැලූ කල වාර්ෂික වාර්තාවෙහි ඇතුළත් කර ඇති අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශනය, බැංකුවේ මූල්‍ය වාර්තාකරණයට අදාළ අභ්‍යන්තර පාලන පද්ධතියේ සැකැස්ම හා කාර්යක්ෂමතාව සමාලෝචනය කිරීමේදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යොදා ගෙන ඇති ක්‍රියාවලිය පිළිබඳ මාගේ වැටහීම සමග අසංගත වන බව විශ්වාස කිරීමට සිදු වන කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

ඩබ්ලිව්. පී. සී. වික්‍රමරත්න
විගණකාධිපති

මූල්‍ය වාර්තාකරණය සම්බන්ධ අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශනය

අවශ්‍යතාව

මෙම වාර්තාව ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ මත පදනම්ව පිළියෙළ කොට ඇති අතර 2007 බැංකු පනතේ අංක 12 දරන නියමයෙහි 3(8)(II)(ආ) වගන්තියට අනුකූලව නිකුත් කර ඇත.

වගකීම

ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ අභ්‍යන්තර පාලනය සහ එහි කාර්යක්ෂමතාව හා ප්‍රමාණාත්මකභාවය සමාලෝචනය කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම දරයි. කෙසේ වෙතත්, එකී පද්ධතියක් සකස් කරනු ලබන්නේ බැංකුවේ ප්‍රතිපත්ති හා ව්‍යාපාරික අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා අවදානම් හෝ දුවර්ලතා මගහැරවීමට නොව හාර ගත හැකි අවදානම් කළඹ ඇතුළත බැංකුවේ ප්‍රධාන අවදානම් කෙෂ්ත්‍ර කළමනාකරණය කර ගැනීමේ අරමුණෙනි. ඒ අනුව, අභ්‍යන්තර පාලන පද්ධතිය මගින් ලබා දිය හැක්කේ කළමනාකාරිත්වයේ සැලකිය යුතු මට්ටමේ සාවද්‍ය ප්‍රකාශනයන් වලට සහ මූල්‍යමය අලාභ හෝ වංචා වළක්වා ගනු පිණිස මූල්‍ය තොරතුරු හා වාර්තා කිරීම්වලට අදාළව සාධාරණ සහතිකයක් වේ.

අධ්‍යක්ෂ මණ්ඩල සමාලෝචන ක්‍රියාවලිය

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කර ඇති 'අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශනය සම්බන්ධයෙන් බැංකු අධ්‍යක්ෂ මණ්ඩල' සඳහා වන මාර්ගෝපදේශයට අනුකූලව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බැංකුවේ අභ්‍යන්තර පාලන ක්‍රියාවලිය කලින් කලට සමාලෝචනය කරනු ලැබේ. එකී මාර්ගෝපදේශයෙහි දක්වා ඇති පරිදි අභ්‍යන්තර පාලන පද්ධතිය තක්සේරුවට ලක් කිරීමට අදාළ මූලධර්ම සලකා බලමින් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අභ්‍යන්තර පාලන පද්ධතිය තක්සේරු කොට ඇත. මූල්‍ය වාර්තාකරණයේ විශ්වසනීයත්වය සම්බන්ධයෙන් සාධාරණ වගකීමක් ලබා දිය හැකි පරිදි මූල්‍ය වාර්තාකරණ පද්ධතිය සකස් කර ඇති බවට සහ බාහිර පරමාර්ථ උදෙසා මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කොට ඇත්තේ අදාළ ගිණුම්කරණ මූලධර්ම හා නියාමන අවශ්‍යතාවලට අනුකූලව බවට සහතික කිරීම උදෙසා බැංකුව නිසි පියවර ගෙන ඇති බව අධ්‍යක්ෂ මණ්ඩලයේ මතය වේ.

එකී අවදානම් පාලනය කිරීම හා අවම කිරීම උදෙසා බැංකුව මුහුණ පාන අවදානම් හඳුනා ගෙන තක්සේරු කිරීම සහ සුදුසු අභ්‍යන්තර පාලනයන් සකස් කිරීම, ක්‍රියාවට නැංවීම හා අධීක්ෂණය කිරීම තුළින් අවදානම් හා පාලනයන්ට අදාළ බැංකුවේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේදී කළමනාකාරිත්වය අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සහාය වේ.

ක්‍රියාවලියේ ප්‍රධාන ලක්ෂණ

මූල්‍ය වාර්තාකරණයට අදාළව අභ්‍යන්තර පාලන පද්ධතියෙහි ප්‍රමාණාත්මතාව හා වීකාබද්ධතාව සමාලෝචනය කිරීම සඳහා පිහිටුවා ඇති ප්‍රධාන ක්‍රියාවලීන් පහත දැක්වේ:

- බැංකුවේ දෛනික මෙහෙයුම්වල කාර්යක්ෂමතාව සහතික කිරීම සහ බැංකුවේ මෙහෙයුම් සියල්ලම ආයතනික අරමුණු, උපාය මාර්ග හා වාර්ෂික අයවැය මෙන්ම අනුමත කර ඇති ව්‍යාපාරික නියමයන් හා ප්‍රතිපත්තිවලට අනුකූලව සිදු කෙරෙන බව සහතික කිරීම උදෙසා විගණන, ණය හා වීකාබද්ධ අවදානම් කළමනාකරණ යන අධ්‍යක්ෂ මණ්ඩල උප කමිටු අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සහාය වේ.
- බැංකුවේ සියලුම ගනුදෙනුවලට අදාළව මූල්‍ය හා අනෙකුත් පාලනයන් සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහෙයුම් මාර්ගෝපදේශයක් අනුමත කර තිබේ. එකී මාර්ගෝපදේශයෙහි විස්තර කර ඇති ක්‍රමවේද කාර්ය මණ්ඩල සාමාජිකයන් සියලුම දෙනා වෙත සන්නිවේදනය කර ඇත.
- නියැදි හා වටමාරු ක්‍රමවේද යොදා ගනිමින් බැංකුවේ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් අදාළ ප්‍රතිපත්ති හා ක්‍රමවේදවලට දක්වන අනුකූලතාව අඛණ්ඩ පදනමක් මත පරීක්ෂා කරනු ලබන අතර, කවර හෝ අනනුකූලතාවක් වේ නම් ඊට අදාළ වැදගත් සොයා ගැනීම් අවධාරණය කරයි. වීකක හා ශාඛා සියල්ලම ආවරණය කරමින් විගණනයන් සිදු කෙරෙන අතර ස්වාධීන හා වාස්තවික වාර්තාවක් ලබා දීම උදෙසා එකී කාර්ය සිදු කෙරෙන විරාමයන් තක්සේරු කරන ලද අවදානම් මට්ටම් මත පදනම්ව තීරණය කෙරේ.වාර්ෂික විගණන සැලැස්ම විගණන කමිටුව විසින් සමාලෝචනය කොට අනුමත කර තිබේ. අභ්‍යන්තර විගණනයෙහි සොයා ගැනීම් සමාලෝචනය උදෙසා කලින් කලට පැවැත්වෙන රැස්වීම්වලදී විගණන කමිටුව වෙත ඉදිරිපත් කෙරේ.
- බැංකුවේ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව හඳුනා ගන්නා අභ්‍යන්තර පාලන පද්ධතියේ ගැටලු විගණන කමිටුව විසින් සමාලෝචනය කරනු ලැබෙන අතර, එමගින් බැංකුවේ අවදානම් කළමනාකරණ ක්‍රියාවලියේ හා අභ්‍යන්තර පාලන පද්ධතියෙහි ප්‍රමාණාත්මතාව හා කාර්යක්ෂමතාව ඇගයීමට ලක් කෙරේ. විගණන කාර්යයන්හි පරාසය හා අභ්‍යන්තර විගණනයන්හි ගුණාත්මකතාව වෙත සුවිශේෂී අවධානයක් ලබා දෙමින් අභ්‍යන්තර විගණන කාර්යයන් සමාලෝචනය කිරීමද එම කමිටුව විසින් සිදු කෙරේ. විගණන කමිටු රැස්වීම් වාර්තා කාලීන පදනමක් මත බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කෙරේ.
- බැංකුව විසින් 2018 වසරේදී SLFRS - 09, මූල්‍ය උපකරණ යන ප්‍රමිතියද 2019 වසරේදී SLFRS - 16, කල්බදු යන ප්‍රමිතියද ක්‍රියාත්මක කරන ලදි. බාහිර විගණකවරුන්, නියමන අධිකාරීන් සහ අධ්‍යක්ෂ මණ්ඩල විගණන උප කමිටුව විසින් ලබා දෙන ප්‍රතිපෝෂණ මත පදනම්ව ඉහත කී ප්‍රමිතීන් ක්‍රියාත්මක කිරීමේදී ආරම්භයේදී යොදා ගන්නා ලද ක්‍රියාවලීන් හා ක්‍රමවේද තවදුරටත් සවිමත් කිරීමට නියමිතය. ණය හා අත්තිකාරම් හානිකරණය කිරීම, මූල්‍ය ප්‍රකාශනවලට අදාළ හෙළිදරව් කිරීම හා අවදානම් කළමනාකරණයට අදාළ ක්‍රියාවලීන් තවදුරටත් සවිමත් කිරීමට බැංකුව ඉදිරියටත් කටයුතු කරනු ඇත.

තහවුරු කිරීම

ඉහත ක්‍රියාවලීන් මත පදනම්ව, මූල්‍ය වාර්තාකරණයේ විශ්වසනීයත්වය සම්බන්ධයෙන් සාධාරණ වගකීමක් ලබා දිය හැකි පරිදි මූල්‍ය වාර්තාකරණ පද්ධතිය සකස් කර ඇති බවට සහ බාහිර පරමාර්ථ උදෙසා මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කොට ඇත්තේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති හා ශ්‍රී ලංකා මහ බැංකුවේ නියාමන අවශ්‍යතාවලට අනුකූලව බව අධ්‍යක්ෂ මණ්ඩලය තහවුරු කරයි.

බාහිර විගණකවරුන් විසින් අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රකාශනය සමාලෝචනය කිරීම

2021 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා වන අභ්‍යන්තර පාලනය පිළිබඳ ඉහත කී අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශනය බාහිර විගණකවරුන් විසින් සමාලෝචනය කරන ලදි. බැංකුවේ අභ්‍යන්තර පාලන පද්ධතියේ සැකැස්ම හා කාර්යක්ෂමතාව සමාලෝචනය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යොදා ගෙන ඇති ක්‍රියාවලීන් පිළිබඳ ස්වකීය වැටහීම මත එකී ප්‍රකාශනය පරස්පර වන බවට විශ්වාස කිරීමට තුඩු දෙන කරුණු කිසිවක් සිය අවධානයට ලක් වූයේද යන්න අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කිරීම ඔවුන්ගේ වගකීම වේ.

සභාපති - විගණන කමිටුව:

අධ්‍යක්ෂ

2022.09.01

අධ්‍යක්ෂ

මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම

මෙම අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රකාශනය මගින් බැංකුවේ මූල්‍ය වාර්තාකරණ රාමුවට අදාළව අධ්‍යක්ෂවරුන් වෙත පැවරී ඇත වගකීම විස්තර කෙරේ. මූල්‍ය ප්‍රකාශනවලට අදාළව විගණකවරුන් වෙත පැවරී ඇති වගකීම් මෙම වාර්ෂික වාර්තාවේ 114 පිටුවේ දැක්වෙන විගණකවරුන්ගේ වාර්තාවෙහි සඳහන් වේ.

මූල්‍ය ප්‍රකාශන

සියලුම ගනුදෙනුවලට අදාළ ගිණුම් පොත් නිසි පරිදි පවත්වා ගනු ලැබෙන බව සහතික කරමින් සෑම මූල්‍ය වර්ෂයකම අවසානයේදී අදාළ ව්‍යවස්ථාපිත/නියාමන අවශ්‍යතාවලට අනුකූලව සහ බැංකුවේ කටයුතු සම්බන්ධ සත්‍ය හා සාධාරණ පිළිඹිඹුවක් ලබා දෙන පරිදි ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLFRS/ LKAS) අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී ඇත. ආදායම් ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, මූල්‍ය තත්ව ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනය, මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ඒවාට අදාළ සටහන් යනාදියෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සමන්විත වේ.

මෙම වාර්ෂික වාර්තාවෙහි ඉදිරිපත් කර ඇති 2021 දෙසැම්බර් 31 න් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී ඉතාම යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති නිරතුරුවම යොදා ගෙන ප්‍රමාණවත් ලෙස හෙළිදරව් කර ඇති බව අධ්‍යක්ෂ මණ්ඩලය පිළිගනී. මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී ගනුදෙනුවල ස්වභාවය හා අන්තර්ගතය නිසි පරිදි පිළිබිඹු වී ඇති බව සහතික කරනු පිණිස අවශ්‍ය අවස්ථාවලදී සාධාරණ හා විචක්ෂණශීලී තීන්දු ගන්නා ලදි.

2021 දෙසැම්බර් 31 න් අවසන් වූ වසරට අදාළ මූල්‍ය ප්‍රකාශන 2008 අංක 41 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතේ විධිවිධාන, 1988 අංක 30 දරන බැංකු පනතේ විධිවිධාන හා ඊට සිදු කර ඇති සංශෝධන, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති සහ අනෙකුත් ව්‍යවස්ථාපිත/නියාමන අවශ්‍යතාවලට අනුකූලව පිළියෙළ කොට තිබේ. මෙකී මූල්‍ය ප්‍රකාශන මගින් 2021 දෙසැම්බර් 31 දිනට බැංකුවේ කටයුතු පිළිබඳ සත්‍ය හා සාධාරණ දැක්මක් ලබා දේ.

ව්‍යාපාරික අඛණ්ඩතාව

පුරෝකථනය කළ හැකි අනාගතය තුළ මෙහෙයුම් අඛණ්ඩව පවත්වා ගැනීමටත් ඒ අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී ව්‍යාපාරික අඛණ්ඩතා පදනම යොදා ගැනීමටත් අවශ්‍ය සම්පත් ප්‍රමාණවත් ලෙස බැංකුව සතුව පවතින බව අපගේ විශ්වාසයයි.

අභ්‍යන්තර පාලනය, අවදානම් කළමනාකරණය සහ අනුකූලතාව

බැංකුවේ වත්කම් ආරක්ෂා කිරීම හා වංචා සහ අනවශ්‍ය කළමනාකරණ පරිචයන් වැළැක්වීම උදෙසා සවිමත් අභ්‍යන්තර පාලන පද්ධතියක් හා අවදානම් කළමනාකරණයක් පවතවා ගැනීම හා සවිමත් පාලන පරිසරයක් පවත්වා ගැනීම කෙරෙහි සැලකීම යොමු කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම දරයි.

බැංකුවේ මෙහෙයුම්වලට අභ්‍යන්තරයෙන් බැඳී ඇති අවදානම් සපුරාම වළක්වා ගැනීමට නොහැකි බව අවධාරණය කරමින් වුවද විවිධ පද්ධති හා අනෙකුත් පාලන විධිවිධානවල ක්‍රියාකාරිත්වය සහතික කිරීම තුළින් එකී අවදානම් අවම කිරීම සඳහා ගත හැකි සියලු පියවර බැංකුව විසින් ගෙන තිබේ. මූල්‍ය වාර්තාකරණයේ විශ්වාසනීයත්වය සම්බන්ධයෙන් සාධාරණ සහතිකයක් ලබා දිය හැකි පරිදි මූල්‍ය වාර්තාකරණ පද්ධතිය සකස් කර ඇති බව සහතික කෙරෙන, බැංකුවේ අභ්‍යන්තර පාලන යාන්ත්‍රණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව මෙම වාර්ෂික වාර්තාවේ 110 පිටුවේ දක්වා ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලය සහ කළමනාකාරිත්වය විසින් අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තීන් හා මාර්ගෝපදේශ ක්‍රියාත්මක කර තිබේ. සැලකිය යුතු තරමේ අවදානම් අධීක්ෂණය කොට කළමනාකරණය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල උප කමිටු පිහිටුවා ඇති අතර අවශ්‍ය සාකච්ඡා වෙනුවෙන් කාලීන පදනමක් මත අවදානම් පිළිබඳ වාර්තා ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව වෙත ඉදිරිපත් කිරීම සඳහාද විධිවිධාන සලසා තිබේ.

බැංකුවට අදාළ නීති රෙගුලාසි, රීති, නියමයන් හා මාර්ගෝපදේශ වෙත අනුකූලතාව දැක්වීම අනුකූලතා දෙපාර්ත්තමේන්තුව විසින් අධීක්ෂණය කරනු ලැබෙන අතර එහි ප්‍රතිඵල අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව සහ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත කලින් කලට වාර්තා කෙරේ.

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව සහ අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව අඛණ්ඩ පදනමක් මත බැංකුවේ අභ්‍යන්තර පාලන යාන්ත්‍රණය සහ අවදානම් කළමනාකරණ ක්‍රමවේද වල සඵලදායිතාව සවිගැන්වීමෙහිලා සැලකිල්ල දක්වන භූමිකාවක නිරත වෙයි. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ සහ අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ වාර්තා පිළිවෙළින් මෙම වාර්ෂික වාර්තාවේ 102 සහ 104 පිටුවල ඇතුලත් කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පිළියෙළ කරන ලද මූල්‍ය ප්‍රකාශනද ඇතුළත් බැංකුවේ සියලුම වාර්තා විගණකාධිපති වෙත ලබා දී ඇති අතර සිදු කළ යුතු බවට ඔවුන් විසින් සලකා බලන ලද විමර්ශනයන් සිදු කිරීම සඳහා අවශ්‍ය වූ සෑම අවස්ථාවකදීම ඔවුන් වෙත අවස්ථාව සැලසීමට කටයුතු කරන ලදි.

අනුකූලතාව

මූල්‍ය වර්ෂය අවසානය වන විට බැංකුව විසින් බදු මුදල් හා රජය වෙත ගෙවිය යුතු අනෙකුත් ව්‍යවස්ථාපිත ගෙවීම් සහ අදාළ නියාමන හා ව්‍යවස්ථාපිත ආයතන වෙත ගෙවිය යුතු ගෙවීම් සියල්ලම ගෙවා ඇති බවට බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය සිය දැනුමේ හා විශ්වාසයේ හැටියට සෑහීමට පත්වේ.

මෙම ප්‍රකාශනයෙහි දක්වා ඇති ස්වකීය වගකීම් තමන් විසින් ඉටුකර ඇති බව අධ්‍යක්ෂ මණ්ඩලයේ මතය වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,



අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්
2022 අගෝස්තු 15 දින.

මූල්‍ය වාර්තා



114 විගණකාධිපති වාර්තාව

119 ආදායම් ප්‍රකාශනය

120 විස්තීරණ ආදායම් ප්‍රකාශනය

121 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

122 මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය

124 ස්කන්ධය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනය

125 මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්



විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. BAN/E/RDB/1/2021/07

ඔබේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 29 August 2022

සභාපති
ප්‍රාදේශීය සංවර්ධන බැංකුව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව 2021 දෙසැම්බර් 31න් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ මූල්‍ය ප්‍රකාශන සහ අනෙකුත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ විගණකාධිපති වාර්තාව

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

2021 දෙසැම්බර් 31 දින වන විට ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ ('බැංකුවේ') මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය හා ආදායම් ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස් වීම පිළිබඳ ප්‍රකාශනය හා අවසන් වූ වසර සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට සටහන් යනාදියෙන් සමන්විත මූල්‍ය ප්‍රකාශන සම්බන්ධ විගණනය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමග එක්ව අර්ථකථනය කළ යුතු ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) වගන්තියේ විධිවිධානවලට අනුකූලව මාගේ නියමය හා අධීක්ෂණය යටතේ සිදු කරන ලදි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) වගන්තියේ විධිවිධානවලට අනුකූලව මාගේ වාර්තාව නිසි කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කෙරෙනු ඇත.

මෙහි දැක්වෙන මූල්‍ය ප්‍රකාශන මගින් 2021 දෙසැම්බර් 31 දින වන විට බැංකුවේ මූල්‍ය තත්ත්වය හා එහි මූල්‍ය කාර්යසාධනය සහ මුදල් ප්‍රවාහ පිළිබඳ සත්‍ය හා සාධාරණ පිළිබිඹුවක් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව ඉදිරිපත් කෙරෙන බව මාගේ මතය වේ.

1.2 මතය සඳහා පදනම

මාගේ විගණන කාර්යය ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට (SLAuSs) අනුකූලව සිදු කරන ලදි. එකී ප්‍රමිතීන් යටතේ මා වෙත පැවරෙන වගකීම් මාගේ වාර්තාවෙහි ඇතුළත් 'මූල්‍ය ප්‍රකාශන විගණනය කිරීමට අදාළ විගණකගේ වගකීම්' යන කොටසෙහි වැඩිදුරටත් විස්තර කර තිබේ. මා විසින් ලබා ගන්නා ලද විගණන සාක්ෂි මාගේ මතය ඉදිරිපත් කිරීම සඳහා ප්‍රමාණවත් හා යෝග්‍ය පදනමක් සපයන බව මාගේ විශ්වාසය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.3 2021 වසර සඳහා බැංකුවේ වාර්ෂික වාර්තාවෙහි ඇතුළත් අනෙකුත් තොරතුරු

අනෙකුත් තොරතුරු අතරට 2021 වසර සඳහා බැංකුවේ වාර්ෂික වාර්තාවට ඇතුළත් කර ඇති තොරතුරු ඇතුළත් වන නමුදු ඊට බැංකුවේ මූල්‍ය ප්‍රකාශන සහ මෙම විගණන වාර්තාවෙහි දිනයට පසුව පළ කිරීමට අපේක්ෂිත මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවේ. කළමනාකාරිත්වය අනෙකුත් තොරතුරු සම්බන්ධයෙන් වගකීම දරයි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ මතය මගින් එකී අනෙකුත් තොරතුරු ආවරණය නොකෙරෙන අතර ඒ පිළිබඳ කිසිදු සහතික කිරීමේ නිගමනයක් මා විසින් ඉදිරිපත් නොකෙරේ.

මූල්‍ය ප්‍රකාශන විගණනයට අදාළව මා වෙත පැවරෙන වගකීම වන්නේ ඉහත හඳුනා ගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි විට ඒවා කියවා විමසා බැලීම සහ එසේ කරන අතරතුරදී එකී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශනවලට හෝ විගණනයේදී මා විසින් ලබා ගන්නා දැනුමට සැලකිය යුතු තරමින් පරස්පරතා මතු කරන්නේද යන්න හෝ වෙනත් අයුරකින් සැලකිය යුතු ලෙස අවප්‍රකාශිත වී ඇතිද යන්න සලකා බැලීමයි.

2021 වසර සඳහා බැංකුවේ වාර්ෂික වාර්තාව විමසා බැලීමේදී සැලකිය යුතු තරමේ අවප්‍රකාශිත වීම් එහි පවතින බව මාගේ නිගමනය වේ නම් එකී කාරණා අදාළ නිරවද්‍යකරණ පියවර ගැනීම උදෙසා නියාමන බලතල පැවරී ඇති පාර්ශ්ව වෙත මා විසින් සන්නිවේදනය කරනු ලැබීම අවශ්‍ය වේ. නිවැරදි නොකරන ලද සැලකිය යුතු තරමේ අවප්‍රකාශිතයන් වැඩිදුරටත් පවතී නම් එකී කාරණා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) වගන්තියේ විධිවිධානවලට අනුකූලව නිසි කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කෙරෙන මාගේ වාර්තාවෙහි ඇතුළත් කෙරෙනු ඇත.

1.4 කළමනාකාරිත්වයේ සහ මූල්‍ය ප්‍රකාශන නියාමනය සම්බන්ධයෙන් බලතල පැවරී ඇති පාර්ශ්වයන්හි වගකීම්

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ පිළිබඹුවක් ලබා දෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම සහ වංචා හෝ දූෂණ හේතුවෙන් සැලකිය යුතු තරමේ අවප්‍රකාශිත වීම් වලින් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට ඉඩකඩ සැලසීම සඳහා අවශ්‍ය බවට කළමනාකාරිත්වය තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනයන් සම්බන්ධයෙන් වගකීම කළමනාකාරිත්වය වෙත පැවරේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී අදාළ පරිදි ව්‍යාපාරික අඛණ්ඩතාව පවත්වා ගැනීම සම්බන්ධ කාරණා හෙළිදරව් කරමින් සහ බැංකුව ඈවර කිරීමට හෝ මෙහෙයුම් අවසන් කිරීමට කළමනාකාරිත්වය අදහස් කරන්නේ නම් හෝ එසේ කිරීම හැර වෙනත් යථාර්ථවාදී විකල්පයක් නොමැති වන්නේ නම් මිස ගිණුම්කරණ අඛණ්ඩතා පදනම යොදා ගැනීම තුළින් අඛණ්ඩ පදනමක් මත මෙහෙයුම් පවත්වා ගැනීමට බැංකුවට ඇති හැකියාව තක්සේරු කිරීම සම්බන්ධයෙන්ද කළමනාකාරිත්වය වගකීම දරයි.

බැංකුවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීමේ වගකීම නියාමන බලතල පැවරී ඇති පාර්ශ්ව වෙත පැවරේ.

විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තියට අනුකූලව බැංකුවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට ඉඩකඩ සලසනු පිණිස බැංකුව විසින් සිය ආදායම්, වියදම්, වත්කම් හා වගකීම්/බැරකම් සියල්ලටම අදාළ වාර්තා පොත් නිසි පරිදි පවත්වා ගැනීම අවශ්‍ය වේ.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය කිරීමට අදාළ විගණකගේ වගකීම්

වංචා හෝ දූෂණ හේතුවෙන් සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන මගින් කිසිදු අයුරක සැලකිය යුතු තරමේ අවප්‍රකාශිත වීමක් සිදු නොවන්නේද යන්න සම්බන්ධයෙන් සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාවක් නිකුත් කිරීම සඳහා සාධාරණ සහතිකයක් ලබා ගැනීම මාගේ පරමාර්ථය වේ. සාධාරණ සහතිකයක් ලබා ගැනීම ඉහළ මට්ටමේ සහතිකයක් වුවද ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූලව සිදු කරනු ලබන විගණන කාර්යයක් මගින් සැලකිය යුතු තරමේ අවප්‍රකාශිත වීම් පවතින විට ඒවා සෑම විටම හඳුනා ගනු ලැබෙන බවට සහතිකයක් එමගින් නොසැපයේ. අවප්‍රකාශිත වීම් වංචා හෝ දූෂණ හේතුවෙන් සිදු විය හැකි අතර, මෙකී මූල්‍ය ප්‍රකාශන පදනම්ව බැලූ කල පරිශීලකයන්ගේ ආර්ථික තීරණ වෙත සැලකිය යුතු තරමේ බලපෑමක් ඒ මගින් කේවල හෝ සාමූහික වශයෙන් එල්ල වේ නම් ඒවා සැලකිය යුතු අවප්‍රකාශිතයන් ලෙස සැලකේ.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සිදු කෙරෙන විගණන කටයුත්තකදී විගණනය පුරාවටම මා විසින් වෘත්තීය තීන්දු සහ වෘත්තීය විචක්ෂණශීලීභාවය පවත්වා ගනු ලැබේ. එසේම, මා විසින් සලකා බලනු ලැබෙන කාරණා පහත දැක්වේ:

- වංචා හෝ දූෂණ හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන සැලකිය යුතු ලෙස අවප්‍රකාශිත වීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම, එකී අවදානම්වලට ප්‍රතිචාරාත්මක ලෙස විගණන ක්‍රමවේද සැලසුම් කොට ක්‍රියාත්මක කිරීම සහ මාගේ මතය සඳහා පදනමක් ලබා දීමට ප්‍රමාණවත් හා යෝග්‍ය වන විගණන සාක්ෂි ලබා ගැනීම සිදු කරනු ලැබේ. වංචා හේතුවෙන් මතු වන සැලකිය යුතු අවප්‍රකාශිතයන් හඳුනා නොගැනීමේ අවදානම, වංචා යන්නට කුමන්ත්‍රණකාරී ක්‍රියා, ව්‍යාජ ලේඛන සැකසීම, චේතාන්විත නොසලකා හැරීම්, සාවද්‍ය ඉදිරිපත් කිරීම් හෝ අභ්‍යන්තර පාලනයන් අභිබවා යාම් යනාදිය ඇතුළත් වන හෙයින් එකී අවදානම් දෝෂ හේතුවෙන් මතු වන අවදානම්වලට වඩා ඉහළ බරපතලකමක් දරයි.
- බැංකුවේ අභ්‍යන්තර පාලන යාන්ත්‍රණයේ කාර්යක්ෂමතාව පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ පරමාර්ථයෙන් නොව, විගණන ක්‍රමවේද ආවස්ථිකව සුදුසු පරිදි සැලසුම් කිරීම උදෙසා විගණන කාර්යයට අදාළව බැංකුවේ අභ්‍යන්තර පාලන පද්ධතිය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම.
- යොදා ගෙන ඇති ගිණුම්කරණ ප්‍රතිපත්තිවල යෝග්‍යතාව සහ කළමනාකාරිත්වය විසින් සිදු කර ඇති ගිණුම්කරණ තක්සේරුකරණයන්හි හා ඊට අදාළ සාධාරණභාවය ඇගයීමට ලක් කිරීම.
- කළමනාකාරිත්වය විසින් යොදා ගනු ලැබ ඇති ගිණුම්කරණයට අදාළ අඛණ්ඩතා පදනමේ යෝග්‍යතාව පිළිබඳව නිගමනයකට එළැඹීම සහ ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම්ව බැලූ කල අඛණ්ඩ පදනමක් මත මෙහෙයුම් පවත්වා ගැනීමට බැංකුවට ඇති හැකියාව සම්බන්ධයෙන් සැලකිය යුතු සැකයක් මතු කිරීමට ඉඩ ඇති සිදුවීම් හෝ තත්ත්ව සම්බන්ධයෙන් සැලකිය යුතු තරමේ අවිනිශ්චිතතාවක් පවතින්නේද යන්න ඇගයීම. කිසියම් සැලකිය යුතු තරමේ අවිනිශ්චිතතාවක් පවතින බවට මා නිගමනය කරන්නේ නම්, මාගේ විගණනයේදී මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර ඇති අදාළ කාරණා වෙත මා අවධානය යොමු කළ යුතු අතර, එකී හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මා විසින් මාගේ මතය සංශෝධනය කිරීම අවශ්‍ය වේ. මාගේ නිගමනයන්, මාගේ විගණන වාර්තාව ඉදිරිපත් කරන දින වන විට ලබා ගෙන ඇති විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වෙතත්, අනාගතයේ සිදු විය හැකි සිදුවීම් හෝ උද්ගත විය හැකි තත්ත්ව හේතුවෙන් අඛණ්ඩ පදනමක් මත මෙහෙයුම් පවත්වා ගැනීමට අවසන් කිරීමට බැංකුවට සිදු විය හැක.

- අදාළ හෙළිදරව් කිරීම් ද ඇතුළුව මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම, ව්‍යුහය හා අන්තර්ගතය සහ සාධාරණ ඉදිරිපත් කිරීමක් සිදු වන පරිදි මූල්‍ය ප්‍රකාශන මගින් අදාළ ගනුදෙනු නියෝජනය වන්නේද යන්න ඇගයීමට ලක් කිරීම.

මාගේ විගණනයේදී මා විසින් හඳුනා ගනු ලබන අභ්‍යන්තර පාලනයන් ආශ්‍රිත සැලකිය යුතු දුර්වලතාද ඇතුළත් සැලකිය යුතු විගණන සොයා ගැනීම් අදාළ නියාමන අධිකාරීන් වෙත මා විසින් සන්නිවේදනය කරනු ලැබේ.

2. නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතට පහත අවශ්‍යතාවලට අදාළ විශේෂ විධිවිධාන ඇතුළත් වේ:

2.1.1 මා විසින් විගණනය සඳහා අවශ්‍ය සියලුම තොරතුරු හා පැහැදිලි කිරීම් ලබා ගෙන ඇති අතර, මාගේ විමර්ශනයෙන් පෙනී යන පරිදි බැංකුව විසින් 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ අවශ්‍යතාවට අනුව ගිණුම්කරණ වාර්තා නිසි පරිදි පවත්වා ගනු ලැබ ඇත.

2.1.2 මෙහි ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (අෑ) (iii) වගන්තියේ අවශ්‍යතාව ප්‍රකාරව ගත වූ වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමග සැසඳේ.

2.1.3 මෙහි ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශනවලට, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (අෑ) (iv) වගන්තියේ අවශ්‍යතාව ප්‍රකාරව ගත වූ වර්ෂයේ සිදු කරන ලද නිර්දේශ සියල්ලම ඇතුළත් වේ.

2.2 ඉටු කරන ලද ක්‍රමවේද සහ ලබා ගන්නා ලද සාක්ෂි මත පදනම්ව පහත ප්‍රකාශ සිදු කිරීමට තුඩු දෙන කිසිවක් මාගේ අවධානයට ලක් වී නොමැත:

2.2.1 බැංකුවේ පාලන යාන්ත්‍රණයෙහි කවර හෝ සාමාජිකයෙකු බැංකුව විළැඹී ඇති ගිවිසුමක් සම්බන්ධයෙන් කිසිදු ආකාරයක සෘජු හෝ වක්‍ර පිළිබැඳියාවක් 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අෑ) වගන්තියේ අවශ්‍යතාවට අනුව බැංකුවේ සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවලින් පරිබාහිර වන පරිදි පවත්වා තිබේද යන්න ප්‍රකාශ කිරීම.

විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ අවශ්‍යතාවට අනුව බැංකුවේ නියාමන අධිකාරිය විසින් නිකුත් කර ඇති අදාළ වන කවර හෝ ලිඛිත නීතියක් හෝ පොදු හෝ විශේෂ නියමයක් වෙත බැංකුව අනුකූලතාව දක්වා නොමැත්තේද යන්න ප්‍රකාශ කිරීම.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ අවශ්‍යතාවට අනුව බැංකුව තමන්ට අදාළ වන බලතල, කාර්යභාරයන් හා රාජකාරි නිසි පරිදි ඉටු කර නොමැත්තේද යන්න ප්‍රකාශ කිරීම.

2.2.4 බැංකුවේ සම්පත් සකසුරුවම්දායී, කාර්යක්ෂම හා සඵලදායී අයුරින් නිසි කාල සීමා ඇතුළත හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ අවශ්‍යතාවට අනුව අදාළ වන නීතිවලට අනුකූලතාව දක්වමින් ප්‍රසම්පාදනය කොට භාවිතයට ගෙන නොමැත්තේද යන්න ප්‍රකාශ කිරීම.

ඩබ්ලිව්. පී. සී. වික්‍රමරත්න
විගණකාධිපති

ආදායම් ප්‍රකාශනය

2021 දෙසැම්බර් 31න් අවසන් වූ වසර සඳහා	සටහන	2021	2020
		රු.	රු.
දළ ආදායම	7	**24,492,768,957**	24,354,246,869
පොලී ආදායම		**23,545,299,165**	23,182,459,141
පොලී වියදම්		**(9,893,373,234)**	(12,294,380,832)
ශුද්ධ පොලී ආදායම	8	**13,651,925,931**	10,888,078,309
ගාස්තු හා කොමිස් ආදායම		**935,136,855**	1,143,097,671
ගාස්තු හා කොමිස් වියදම්		**(312,112,052)**	(271,935,223)
ශුද්ධ ගාස්තු හා කොමිස් ආදායම	9	**623,024,803**	871,162,448
ශුද්ධ වෙළෙඳ ලාභ/(අලාභ)	10	**(24,214,945)**	23,135,814
වෙනත් මෙහෙයුම් ආදායම් (ශුද්ධ)	11	**36,547,883**	5,554,243
මුළු මෙහෙයුම් ආදායම		**14,287,283,672**	11,787,930,814
හානිකරණ ගාස්තු	12	**(3,256,775,862)**	(2,010,929,062)
ශුද්ධ මෙහෙයුම් ආදායම		**11,030,507,810**	9,777,001,752
අඩු කළා - මෙහෙයුම් වියදම්			
පුද්ගල වියදම්	13	**(7,292,269,883)**	(5,983,362,037)
ක්ෂය කිරීම් හා ක්‍රමක්ෂය වියදම්		**(520,988,009)**	(616,792,758)
වෙනත් වියදම්	14	**(1,290,468,186)**	(1,115,987,925)
බද්දට පෙර මෙහෙයුම් ලාභය		**1,926,781,733**	2,060,859,032
අඩු කළා - මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බදු		**(1,151,277,133)**	(1,047,410,630)
ආදායම් බදු වියදමට පෙර ලාභය		**775,504,600**	1,013,448,401
ආදායම් බදු වියදම්	15	**(469,201,889)**	(609,412,349)
වසර සඳහා ලාභය		**306,302,711**	404,036,052
කොටසකට ඉපැයීම්			
කොටසකට ඉපැයීම් මූලික	16.1	**0.56**	0.74
කොටසකට තනුක ඉපැයීම්	16.2	**0.56**	0.74

වරහන් තුළ ඇති සංඛ්‍යා මගින් අඩු කිරීම් දැක්වේ.

මෙම මූල්‍ය ප්‍රකාශන, මෙහි 125 සිට 206 පිටුවල දැක්වෙන මූල්‍ය ප්‍රකාශනවල කොටසක් වන ඊට අදාළ සටහන් සමග කියවිය යුතු වේ.

විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

දෙසැම්බර් 31න් අවසන් වූ වසර සඳහා	සටහන	2021	2020
		රු.	රු.
වසර සඳහා ලාභය		**306,302,711**	404,036,052
වෙනත් විස්තීර්ණ ආදායම්/(වියදම්)			
වෙනත් විස්තීර්ණ ආදායම් ලාභ හෝ අලාභ තුළට නැවත වර්ගීකරණය නොකළ යුතුය			
විශ්‍රාමික ප්‍රතිලාභ බැඳීම් මත ආයුගණන අලාභ	34.3	**(35,917,534)**	(335,579,854)
විලම්බිත බදු බලපෑම		**8,620,208**	80,539,165
වසර සඳහා මුළු වෙනත් විස්තීර්ණ ආදායම		**(27,297,325)**	(255,040,689)
වසර සඳහා මුළු වෙනත් විස්තීර්ණ ආදායම		**279,005,386**	148,995,363

වරහන් තුළ ඇති සංඛ්‍යා මගින් අඩු කිරීම් දැක්වේ.

මෙම මූල්‍ය ප්‍රකාශන, මෙහි 125 සිට 206 පිටුවල දැක්වෙන මූල්‍ය ප්‍රකාශනවල කොටසක් වන ඊට අදාළ සටහන් සමඟ කියවිය යුතු වේ.

මූල්‍ය තත්ව ප්‍රකාශනය

දෙසැම්බර් 31 දිනට	සටහන	2021	2020
		රු.	රු.
වත්කම්			
මුදල් හා මුදල් සමානයන්	18	**1,486,878,989**	3,758,858,141
බැංකුවල රඳවා තැබීම්	19	**6,596,072,932**	8,436,353,244
ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට ස්කන්ධ උපකරණ	20	**188,140**	145,160
ක්‍රමක්ෂිත පිරිවැය ණයවලට සාපේක්ෂ මූල්‍ය වත්කම් සහ අනෙකුත් ගනුදෙනුකරුවන්ගෙන් ලැබිය යුතු දෑ	21	**175,229,666,656**	156,694,052,473
ක්‍රමක්ෂිත පිරිවැය ණය හා අනෙකුත් උපකරණ මත මූල්‍ය ආයෝජන	22	**54,856,210,318**	46,962,354,137
වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ අගයට හඳුනා ගැනෙන ස්කන්ධ උපකරණ	23	**2,289,919**	2,289,919
දේපල, පිරියත හා උපකරණ	24	**928,568,438**	970,538,655
අස්පෘශ්‍ය වත්කම්	25	**113,688,780**	21,272,699
භාවිත හිමිකම් වත්කම්	26.1	**505,092,023**	598,978,557
විලම්බිත බදු වත්කම්	27	**1,263,795,071**	903,720,969
වෙනත් වත්කම්	28	**4,907,060,297**	2,760,586,570
මුළු වත්කම්		**245,889,511,562**	221,109,150,524
වගකීම්/බැරකම්			
බැංකුවලට ගෙවිය යුතු මුදල්	29	**29,500,936,543**	21,796,679,350
වෙනත් ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු මුදල්	30	**187,752,465,256**	172,882,632,278
ලබා දුන් ණය හා වෙනත් ණයට ගත් අරමුදල්	31	**2,000,000,000**	2,000,000,000
වත්මන් බදු වගකීම්	32	**503,021,886**	378,203,555
වෙනත් වගකීම්	33	**7,693,300,812**	6,154,443,776
විශ්‍රාමික ප්‍රතිලාභ බැඳීම්	34	**3,046,464,739**	2,782,874,624
මුළු වගකීම්		**230,496,189,235**	205,994,833,583
ස්කන්ධය			
ප්‍රකාශිත ප්‍රාග්ධනය	35	**8,047,229,930**	8,047,229,930
ව්‍යවස්ථාපිත සංචිත අරමුදල	36	**777,778,133**	762,462,998
රඳවාගත් ඉපැයීම්		**2,636,433,521**	2,449,318,947
වෙනත් සංචිත	37	**3,931,880,743**	3,855,305,066
මුළු කොටස් හිමි ස්කන්ධය		**15,393,322,327**	15,114,316,940
මුළු ස්කන්ධය හා වගකීම්		**245,889,511,562**	221,109,150,523
අසම්භව්‍ය වගකීම් සහ බැඳීම්	40	**225,888,152**	202,334,713

මෙම මූල්‍ය ප්‍රකාශන, මෙහි 125 සිට 206 පිටුවල දැක්වෙන මූල්‍ය ප්‍රකාශනවල කොටසක් වන ඊට අදාළ සටහන් සමග කියවිය යුතු වේ.

බැංකුවේ මූල්‍ය ප්‍රකාශන 1988 අංක 30 දරන බැංකු පනතේ සහ 2008 අංක 41 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතේ අවශ්‍යතාවලට අනුකූලව පිළියෙළ කර ඇති බවට සහතික කරමි.

පී. එස්. වීදිරුසූරිය
ප්‍රධාන මූල්‍ය නිලධාරී

ඒ.එච්.එම්.එම්.බී. ජයසිංහ
සාමාන්‍යාධිකාරී/ප්‍ර.වි.නි.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලදුව පහත නිලධාරී වෙනුවෙන් අත්සන් තබන ලද මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම දරයි:

සභාපති/අධ්‍යක්ෂ

අධ්‍යක්ෂ

2022 අගෝස්තු 18
කොළඹ

මුල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය

දෙසැම්බර් 31න් අවසන් වූ වසර සඳහා	සටහන	2021	2020
		රු.	රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම් වෙතින් ලද මුදල් ප්‍රවාහ			
බදුවලට පෙර ලාභය		**775,504,601**	2,060,859,032
ගැලපුම්:			
බදුවලට පෙර ලාභයට ඇතුළත් මුදල් නොවන අයිතම			
දේපල, පිරියත හා උපකරණ ක්ෂය වීම/භාවිතයේ හිමිකම් ඇති වත්කම් ක්‍රමක්ෂය කිරීම	24	**490,215,777**	591,176,191
අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂ කිරීම	25	**30,772,231**	25,616,567
කල්බදු මත පොළී වියදම	26.2	**229,798,098**	-
ණයකර මත පොළී වියදම		**311,500,000**	-
ලාභාංශ ආදායම	10	**(10,209,840)**	-
මාණ්ඩලික ණය ගැලපීම		**-**	326,777,343
හානිකරන ගාස්තු	12	**3,256,775,862**	2,010,929,062
ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමකින් යුත් කොටස් උපකරණවල වෙනස්වීම්	10	**(42,980)**	(22,160)
විනිමය ලාභය/අලාභය	10	**34,467,765**	(23,102,434)
විශ්‍රාම ප්‍රතිලාභ වගකීම මත අය කිරීම	34.1	**379,779,626**	389,587,045
වෙනත් අරමුදල් සංචලනය		**-**	26,719,629
දේපල, පිරියත හා උපකරණ විකුණුම් මත ලාභය/අලාභය	11	**(18,134,116)**	349,129
අක්‍රමික ණය අයකරගැනීම් (කපාහැරීම)	11	**(441,823)**	(184,320)
මෙහෙයුම් වත්කම් මත වෙනස			
වෙනත් ගනුදෙනුකරුවන්ගෙන් ලැබිය යුතු දේ සහ ණය මත ශුද්ධ වෙනස		**(21,794,891,917)**	(22,405,498,881)
වෙනත් වත්කම්වල ශුද්ධ වෙනස		**(2,167,393,709)**	(28,162,728)
ක්‍රමක්ෂය කරන ලද පිරිවැය ණය සහ අනිකුත් මූල්‍ය ආයෝජනවල ශුද්ධ වෙනස		**(1,033,112,853)**	(783,385,821)
මෙහෙයුම් වගකීම්වල වෙනස			
බැංකුවලට ගෙවිය යුතු ශුද්ධ වෙනස		**3,081,261,163**	377,454,313
වෙනත් ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු ශුද්ධ වෙනස		**14,869,832,978**	23,257,229,441
වෙනත් වගකීම්වල ශුද්ධ වෙනස		**1,456,574,150**	183,523,330
පාරිතෝෂික ගෙවීම්	34.1	**(134,929,431)**	(142,040,058)
මූල්‍ය සේවා මත බදු			(1,276,059,797)
ගෙවන ලද බදු	32	**(695,837,450)**	(806,955,563)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වෙතින් උත්පාදිත/(තුළ භාවිත වූ) ශුද්ධ මුදල		**(938,511,867)**	3,784,809,318
ආයෝජන ක්‍රියාකාරකම් වෙතින් මුදල් ප්‍රවාහ			
දේපල, පිරියත හා උපකරණ මිලදී ගැනීම	24	**(202,693,190)**	(45,854,295)
අස්පෘශ්‍ය වත්කම් ශුද්ධ මිල දී ගැනීම්	25	**(123,380,926)**	(1,532,923)
ණයකරවල ආයෝජන	22.1	**392,280,000**	(500,000,000)
ස්ථාවර තැන්පතුවල ආයෝජන (මාස 3ට වැඩි)	22.2	**(3,220,344,943)**	9,300,148,156

දෙසැම්බර් 31න් අවසන් වූ වසර සඳහා	සටහන	2021	2020
		රු.	රු.
දේපල, පිරියත හා උපකරණවලින් ඉදිරියට ගෙන ආ මුදල්		**17,453,993**	888,491
ලැබුණු ලාභාංශ ආදායම	10	**10,209,840**	11,220
- ආයෝජන ක්‍රියාකාරකම් (වලදී භාවිත කරන ලද)/වෙතින් ලද ශුද්ධ මුදල්		**(3,126,475,226)**	8,753,660,649
මූල්‍ය ක්‍රියාකාරකම් වෙතින් ලද මුදල් ප්‍රවාහ			
මෙහෙයුම් කල්බදු මුල් මුදල ගෙවීම්	26.2	**(326,522,434)**	(318,229,934)
කාලීන ණය වලින් ඉදිරියට ගෙන ආ ශුද්ධ මුදල	29	**4,807,413,840**	(630,783,966)
ණයකර නිදහස් කිරීම්	31.1	**-**	(2,500,000,000)
- ණයකර මත ගෙවූ පොලී	31.1	**(311,500,000)**	(207,852,534)
මූල්‍ය ක්‍රියාකාරකම් වෙතින් ලද ශුද්ධ මුදල්		**4,169,391,406**	(3,656,866,435)
මුදල් හා මුදල් සමානයන්හි ශුද්ධ ඉහළ/(පහළ) යාම්		**104,404,312**	8,881,603,532
වසර ආරම්භයේදී මුදල් හා මුදල් සමානයන්		**43,466,344,201**	34,584,740,669
වසර අවසානයේදී මුදල් හා මුදල් සමානයන්		**43,570,748,513**	43,466,344,201
මුදල් හා මුදල් සමානයන් සැසඳීම			
මුදල් හා මුදල් සමානයන්	18	**1,486,878,989**	3,758,858,141
බැංකුවල ඇති වාසිදායක ශේෂයන්			
බැංකුවල රඳවා තැබීම්	19	**6,596,072,932**	8,436,353,244
මාස 3ට අඩු ස්ථාවර තැන්පතු	21.2	**35,579,154,747**	31,546,908,781
බැංකුවල ඇති අවාසිදායක ශේෂයන්		**(91,358,155)**	(275,775,965)
		43,570,748,513	43,466,344,201

වරහන් තුළ ඇති සංඛ්‍යා මගින් අඩු කිරීම් දැක්වේ.

මෙම මූල්‍ය ප්‍රකාශන, මෙහි 125 සිට 206 පිටුවල දැක්වෙන මූල්‍ය ප්‍රකාශනවල කොටසක් වන ඊට අදාළ සටහන් සමග කියවිය යුතු වේ.

ස්කන්ධය වෙනස් වීම පිළිබඳ ප්‍රකාශනය

2021 දෙසැම්බර් 31න් අවසන් වූ වසර සඳහා	ප්‍රකාශිත ප්‍රාග්ධන - සටහන 35 රු.	ව්‍යවස්ථාපිත සංචිත අරමුදල - සටහන 36 රු.	විශේෂ සංචිත අරමුදල - සටහන 37 රු.	සාමාන්‍ය සංචිත අරමුදල - සටහන 37 රු.	රඳවාගත් ඉපැයීම් රු.	එකතුව රු.
2020 ජනවාරි 01 දිනට ශේෂය	8,047,229,930	742,261,195	596,651,523	3,157,644,530	2,421,534,400	14,965,321,578
වසර සඳහා මුළු විස්තීර්ණ ආදායම						
වසර සඳහා ලාභය	-	-	-	-	404,036,052	404,036,052
වෙනත් විස්තීර්ණ ආදායම	-	-	-	-	(255,040,689)	(255,040,689)
වසර සඳහා මුළු විස්තීර්ණ ආදායම	-	-	-	-	148,995,363	148,995,363
ස්කන්ධ හිමියන් සමග ගනුදෙනු, ස්කන්ධය තුළ සෘජුව හඳුනා ගත්						
ව්‍යවස්ථාපිත සංචිත අරමුදල වෙත මාරු කිරීම්	-	20,201,803	-	-	(20,201,803)	-
විශේෂ සංචිත අරමුදල වෙත මාරු කිරීම්	-	-	20,201,803	-	(20,201,803)	-
සාමාන්‍ය සංචිත අරමුදල වෙත මාරු කිරීම්	-	-	-	80,807,210	(80,807,210)	-
ස්කන්ධ හිමියන් සමග ගනුදෙනු, ස්කන්ධය තුළ සෘජුව හඳුනා ගත්	-	20,201,803	20,201,803	80,807,210	(121,210,816)	-
2020 දෙසැම්බර් 31 දිනට ශේෂය	8,047,229,930	762,462,998	616,853,326	3,238,451,740	2,449,318,947	15,114,316,941
2021 ජනවාරි 01 දිනට ශේෂය	8,047,229,930	762,462,998	616,853,326	3,238,451,740	2,449,318,948	15,114,316,941
වසර සඳහා මුළු විස්තීර්ණ ආදායම						
වසර සඳහා ලාභය	-	-	-	-	306,302,711	306,302,711
වෙනත් විස්තීර්ණ ආදායම	-	-	-	-	(27,297,325)	(27,297,325)
වසර සඳහා මුළු විස්තීර්ණ ආදායම	-	-	-	-	279,005,386	279,005,386
ස්කන්ධ හිමියන් සමග ගනුදෙනු, ස්කන්ධය තුළ සෘජුව හඳුනා ගත් -						
ව්‍යවස්ථාපිත සංචිත අරමුදල වෙත මාරු කිරීම්	-	15,315,136	-	-	(15,315,136)	-
විශේෂ සංචිත අරමුදල වෙත මාරු කිරීම්	-	-	15,315,135	-	(15,315,135)	-
සාමාන්‍ය සංචිත අරමුදල වෙත මාරු කිරීම්	-	-	-	61,260,542	(61,260,542)	-
ස්කන්ධ හිමියන් සමග ගනුදෙනු, ස්කන්ධය තුළ සෘජුව හඳුනා ගත්	-	15,315,136	15,315,135	61,260,542	(91,890,813)	-
2021 දෙසැම්බර් 31 දිනට ශේෂය	8,047,229,930	777,778,133	632,168,461	3,299,712,282	2,636,433,521	15,393,322,327

මෙම මූල්‍ය ප්‍රකාශන, මෙහි 125 සිට 206 පිටුවල දැක්වෙන මූල්‍ය ප්‍රකාශනවල කොටසක් වන ඊට අදාළ සටහන් සමග කියවිය යුතු වේ.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

1. සාමාන්‍ය තොරතුරු

1.1 ආයතනික තොරතුරු

ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ මූලාරම්භය, මෙරට ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු යන කාණ්ඩය යටතේ දිස්ත්‍රික් මට්ටමේ බැංකු ස්ථාපිත වූ 1985 වසර දක්වා ඈතට දිවෙයි. 1997 වසරේදී එවැනි ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු දාහතක් ඒකාබද්ධ කොට රජරට, රුහුණ, වයඹ, ඌව, කඳුරට, සහ සබරගමුව සංවර්ධන බැංකු නමින් පළාත් මට්ටමේ බැංකු හයක් පිහිටුවන ලදි. 2010 මැයි මාසයේදී ජාතික මට්ටමේ තනි බැංකුවක් පිහිටුවනු පිණිස එකී බැංකු හය ඒකාබද්ධ කරන ලදුව ප්‍රාදේශීය සංවර්ධන බැංකුව ලෙස නම් කරන ලදි. 2008 අංක 41 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතේ විධිවිධාන යටතේ අප බැංකුව ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙස ස්ථාපිත කරන ලදි. බැංකුවේ ලියාපදිංචි කාර්යාලය අංක 933, නුවර පාර, වෙදමුල්ල, කැළණිය යන ස්ථානයේ පිහිටා ඇත.

2019 වසර තුළදී, මෙම මූල්‍ය ප්‍රකාශනවලට අදාළ 23 සටහනෙහි නිසි ලෙස විස්තර කර ඇති පරිදි 2019 අප්‍රේල් 1 දින සිට ක්‍රියාත්මක වන පරිදි ලංකාපුත්‍ර සංවර්ධන බැංකුවේ වත්කම් හා බැරකම් ප්‍රාදේශීය සංවර්ධන බැංකුව වෙත ඒකාබද්ධ කරන ලදි.

2021 දෙසැම්බර් 31 දින වන විට බැංකුවේ ස්ථිර, පුහුණු (අභ්‍යාසලාභී) සහ කොන්ත්‍රාත් පදනම මත සේවයේ නියුතු කාර්ය මණ්ඩලය 3226 ක් විය (2020 දෙසැම්බර් 31 දිනට එය 3312ක් විය).

1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් හා මෙහෙයුම්වල ස්වභාවය

රජයේ හිමිකාරත්වය යටතේ පවතින ජාතික මට්ටමේ බැංකුවක් වශයෙන් ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ මූලික අරමුණු වන්නේ ක්ෂුද්‍ර මූල්‍ය ආයතන සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් වෙත මූල්‍ය සහාය ලබා දීම තුළින් කෘෂිකර්මාන්තය, කර්මාන්ත, වෙළෙඳ කටයුතු, වාණිජ්‍යය, සත්ත්ව පාලනය, ධීවර කර්මාන්තය වැනි සංවර්ධන ක්‍රියාදාමයන් ප්‍රවර්ධනය කිරීම හා කාන්තාවන් සවිබල ගැන්වීම ඔස්සේ රටේ සමස්ථ ආර්ථික සංවර්ධනයට සහාය දැක්වීමයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ වගකීම්

2008 අංක 41 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතේ හා ඊට සිදු කරන ලද සංශෝධන, 1988 අංක 30 දරන බැංකු පනතේ හා ඊට සිදු කරන ලද සංශෝධනවල විධිවිධාන සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව බැංකුවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම දරයි.

1.4 මූල්‍ය ප්‍රකාශන සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය

2021 දෙසැම්බර් 31න් අවසන් වූ වසර සඳහා වන බැංකුවේ මූල්‍ය ප්‍රකාශන සඳහා 2022 අගෝස්තු 18 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමැතිය ලබා දෙන ලදි.

2. පිළියෙළ කිරීමේ පදනම

2.1 මිනුම්ගත කිරීමේ පදනම

පහත දැක්වෙන සැලකිය යුතු මට්ටමේ කාරණා සම්බන්ධයෙන් හැර මෙම මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පදනම මත පිළියෙළ කරන ලදි.

- නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් සම්බන්ධයෙන් වූ වගකීම ආයුගණන පදනම මත ප්‍රමාණගත කරන ලද අතර එය නිශ්චිත ප්‍රතිලාභ බැඳීමෙහි වත්මන් වටිනාකම ලෙස හඳුනා ගන්නා ලදි.
- සාධාරණ වටිනාකමින් මනිනු ලැබූ ලාභ හෝ අලාභ (FVTPL) සහ වෙනත් විස්තීර්ණ ආදායම් (FVOCI) හරහා සාධාරණ වටිනාකම මත ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ සහ ව්‍යුත්පන්න නොවන මූල්‍ය උපකරණ සාධාරණ වටිනාකමක් දරයි.

2.2 අනුකූලතා ප්‍රකාශනය

2021 දෙසැම්බර් 31 දිනට සහ එදිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ මූල්‍ය ප්‍රකාශන 1988 අංක 30 දරන බැංකු පනත සහ ඊට සිදු කරන ලද සංශෝධනවල අවශ්‍යතා, 2008 අංක 41 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතේ සහ ඊට සිදු කරන ලද සංශෝධනවල අවශ්‍යතා සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් නිකුත් කර ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (SLFRSs/LKASs) අනුකූලව පිළියෙළ කොට ඇත. බැංකුවේ මූල්‍ය ප්‍රකාශන 2008 අංක 41 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතේ අවශ්‍යතාවලට අනුකූලව පිළියෙළ කර ඇත.

2.3 ක්‍රියාකාරී හා ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය

ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කර ඇත්තේ බැංකුවේ මෙහෙයුම් ක්‍රියාත්මක වන ප්‍රාථමික ආර්ථික පරිසරයෙහි මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් වලිනි. ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති මෙම මූල්‍ය තොරතුරු වෙනත් ලෙසකින් නිශ්චිතව දක්වා ඇත්නම් මිස ආසන්නතම රුපියලට පෙන්වා ඇත.

2.4 සැලකිය යුතුභාවය හා සමූහනය

LKAS 01 - ''මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම'' යන ප්‍රමිතියට අනුකූලතාව දක්වමින් එක සමාන අයිතම ඇතුළත් සැලකිය යුතු කාණ්ඩ සියල්ලම මූල්‍ය ප්‍රකාශනවල වෙන වෙනම ඉදිරිපත් කර තිබේ. අසමාන ස්වභාවයක් හෝ කාර්යභාරයක් උසුලන අයිතමද සැලකිය යුතුභාවයකින් යුතු නම් වෙන වෙනම ඉදිරිපත් කෙරේ.

2.5 හඳුනාගනු ලැබෙන වටිනාකම්

හිලවු කිරීමට නෛතිකව ක්‍රියාත්මක කළ හැකි අයිතියක් ඇති විට හා ශුද්ධ පදනමක් මත පියවීමට අභිලාෂයක් ඇති විට හෝ වත්කමක් ආදායමක් බවට හරවා ඒ මොහොතේම බැරකම පියවීමට අභිලාෂයක් ඇති විට පමණක් මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම්/බැරකම් හිලවු කොට ශුද්ධ වටිනාකම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි වාර්තා කෙරේ. කවර හෝ ගිණුම්කරණ ප්‍රමිතියක් හෝ අර්ථ නිරූපණයක් මගින් අවශ්‍ය කෙරෙන්නේ නම් හෝ අවසර ලැබෙන්නේ නම් මිස සහ ගිණුම්කරණ ප්‍රතිපත්තිවල

විශේෂයෙන් හෙළිදරව් කර ඇති පරිදි ආදායම් හා වියදම් ආදායම් ප්‍රකාශනයෙහි හිලවු නොකෙරේ.

2.6 සංසන්දනාත්මක තොරතුරු

සංසන්දනාත්මක තොරතුරු මෙම වසරේ ඉදිරිපත් කිරීමට අනුකූල වන පරිදි සහ වඩා හොඳ ඉදිරිපත් කිරීමක් ලබා දීම සඳහා බලපත්‍රලාභී බැංකු විසින් වාර්ෂික හා කාර්තුමය මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් හෙළිදරව් කිරීම් ප්‍රකාශයට පත් කිරීම පිළිබඳ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද 2019 අංක 2 දරන චක්‍රලේඛයට අනුකූල වන පරිදි සංසන්දනාත්මක තොරතුරු අවශ්‍ය සෑම අවස්ථාවකදීම නැවත වර්ගීකරණය කරනු ලැබේ.

2.7 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි ඉදිරිපත් කර ඇති බැංකුවේ මූල්‍ය අයිතම ස්වභාවයෙන්ම සමූහගත කර ඇති අතර ඒවායෙහි සාපේක්ෂ ද්‍රවශීලතාව හා කල් පිරීමේ රටාව පිළිබිඹු වන පරිදි දක්වා තිබේ. මූල්‍ය ප්‍රකාශන වෙත බලපෑම් ඇති කරන උද්ධමනීය සාධක වෙනුවෙන් ගැලපුම් කිසිවක් සිදු කර නොමැත. වාර්තාකරණ දිනයට මාස 12 කට පසු (ප්‍රවර්තන) කාලසීමාව සහ වාර්තාකරණ දිනයට මාස 12 කට වඩා වැඩි කාල සීමාව (ප්‍රවර්තන නොවන) සඳහා අයකර ගැනීමට හෝ පියවීම් පිළිබඳ විශ්ලේෂණයක් 44 සටහනෙහි දක්වා තිබේ.

විකල්ප පිළියම් ප්‍රකාශය (SOAT)

තවද, 2022 අංක 14 දරණ අධිභාර බදු පනතින් පැන නගින බදු වගකීම, ආදායම් බදු පිළිබඳ සටහන 15 යටතේ හෙළිදරව් කර ඇති පරිදි ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද විකල්ප පිළියම් ප්‍රකාශය (SOAT) මගින් නිර්දේශ කර ඇති පරිදි ගණනය කර ඇත.

3. වැදගත් ගිණුම්කරණ තීන්දු, තක්සේරු කිරීම් හා උපකල්පන

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව බැංකුවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී කළමනාකාරිත්වය විසින් වාර්තා කර ඇති ආදායම් වටිනාකම්, වියදම්, වත්කම් හා වගකීම්/බැරකම් හා ඊට අදාළ හෙළිදරව් කිරීම් මෙන්ම අසම්භාව්‍ය වගකීම් හෙළිදරව් කිරීමට බලපාන තීන්දු, තක්සේරු කිරීම් හා උපකල්පන සිදු කිරීම අවශ්‍ය වේ. එකී උපකල්පන හා තක්සේරු කිරීම් සම්බන්ධ අවිනිශ්චිතතාවල ප්‍රතිඵලයක් ලෙස අනාගත කාල සීමාවලදී බලපෑමට ඉඩ ඇති වත්කම් හෝ වගකීම්වල ඉදිරියට ගෙන යන ශේෂ වටිනාකම් සම්බන්ධ සැලකිය යුතු ගැලපුම් සිදු කිරීමට අවශ්‍යතා මතු කෙරෙන තත්ත්ව ඉස්මතු විය හැක.

බැංකුවේ ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදා ගැනීමේ ක්‍රියාවලියේදී ඉදිරි මූල්‍ය වර්ෂය තුළදී වත්කම් හා වගකීම්වල ඉදිරියට ගෙන යන වටිනාකම් වෙත සැලකිය යුතු වෙනස්වීම් සිදු වීමේ සැලකිය යුතු මට්ටමේ අවදානමක් සහිත, අනාගතය සලකා බලමින් සහ වාර්තාකරණ දිනය වන විට අවිනිශ්චිතතා මතු කෙරෙන අනෙකුත් මූලාශ්‍ර සම්බන්ධයෙන් පහත දැක්වෙන තීන්දු හා උපකල්පන වෙත කළමනාකාරිත්වය එළැඹ තිබේ. අනාගත සංවර්ධනයන් සම්බන්ධයෙන් දැනටමත් පවතින තත්ත්ව හා උපකල්පන බැංකුවේ පාලනයෙන් බැහැර සාධක හේතුවෙන් වෙනස් වීමට ඉඩ ඇති අතර ඒවා ඉස්මතු වන අවස්ථාවල උපකල්පන මත පිළිබිඹු කෙරේ.

සැලකිය යුතු කළමනාකරණ විනිශ්චය සහ / හෝ ඇස්තමේන්තු සහිත මූල්‍ය ප්‍රකාශනවල පිළිගත් ප්‍රමාණයන් කෙරෙහි වඩාත් සැලකිය යුතු බලපෑමක් ඇති අයිතම සම්බන්ධ විනිශ්චයන් / ඇස්තමේන්තු සම්බන්ධයෙන් පහත එකතු කර ඇත.

කොවිඩ් 19 වසංගතය

කොවිඩ්-19 වසංගතය සහ ගෝලීය ආර්ථිකයට එහි බලපෑම ගනුදෙනුකරුවන්, මෙහෙයුම් සහ බැංකුවේ කාර්ය සාධනය කෙරෙහි බලපා ඇත. වසංගතය හේතුවෙන් ජනගහනයේ සෞඛ්‍ය, දේශීය ආර්ථිකය සහ ජීවනෝපාය ආරක්ෂා කිරීම සඳහා පෙර නොවූ විරූ මට්ටමින් ප්‍රතිචාර දැක්වීමට රජයට අවශ්‍යය විය. මේ අනුව, මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී ඇස්තමේන්තු අවිනිශ්චිතතාවය සැලකිය යුතු ලෙස වැඩි කර ඇති අතර, මෙය ව්‍යාපාරවලට බාධා කිරීමේ ප්‍රමාණය සහ කාලසීමාව, අපේක්ෂිත ආර්ථික පසුබෑම සහ පසුව යථා තත්ත්වයට පත් වීම යනාදිය ඇතුලත් කර ඇත.

මෙම අනාවැකි සහ ඒ හා සම්බන්ධ අවිනිශ්චිතතාවයන් මගින් බලපෑමට ලක් වූ සැලකිය යුතු ගිණුම්කරණ ඇස්තමේන්තු ප්‍රධාන වශයෙන් අපේක්ෂිත ණය අලාභ, සාධාරණ වටිනාකම් මිනුම් සහ මූල්‍ය නොවන වත්කම් වල අයකර ගත හැකි ප්‍රමාණය තක්සේරු කිරීම හා සම්බන්ධ වේ. මෙම සෑම ඇස්තමේන්තුවකටම කොවිඩ්-19 වසංගතයේ බලපෑම මෙම මූල්‍ය ප්‍රකාශනවල අදාළ සටහන් වල තවදුරටත් සාකච්ඡා කෙරේ. සැබෑ ප්‍රතිඵල මෙම ඇස්තමේන්තු වලට වඩා වෙනස් විය හැකිය. ඇස්තමේන්තු සහ පහතින් පවතින උපකල්පන අඛණ්ඩ පදනමක් මත සමාලෝචනය කරනු ලැබේ. ඇස්තමේන්තු වල සංශෝධන යතා කාලයේ දී හඳුනාගනු ලැබේ.

(i) ගිණුම්කරණ තීන්දු

අ) මූල්‍ය වත්කම් වර්ගීකරණය

වත්කම් රඳවා ඇති ව්‍යාපාර ආකෘතිය තක්සේරු කිරීමේදී සහ මූල්‍ය වත්කම්වල කොන්ත්‍රාත් කොන්දේසි හිඟ මුදලේ ප්‍රධාන මුදල මත මූලික හා පොලී (SPPI) ගෙවීම් පමණක් දැයි තක්සේරු කිරීමේදී බැංකුව විනිශ්චයන් භාවිතා කළේය.

(ආ) ණය අවදානම තක්සේරු කිරීම

හානිකරණ අලාභ මැනීම සඳහා සියලුම මූල්‍ය වත්කම් කාණ්ඩ පුරාවට SLFRS 9 යටතේ විනිශ්චය අවශ්‍ය වේ, විශේෂයෙන්, හානිකරණ අලාභ තීරණය කිරීමේදී අනාගත මුදල් ප්‍රවාහවල ප්‍රමාණය සහ වේලාව තක්සේරු කිරීම සහ ණය අවදානමේ සැලකිය යුතු වැඩිවීමක් තක්සේරු කිරීම. මෙම තක්සේරුගත කිරීම්වලට සාධක රැසක් බලපාන අතර ඒවායෙහි වෙනස්වීම් නිසා විවිධ ප්‍රතිපාදන මට්ටම් ලැබිය හැක.

බැංකුවේ අපේක්ෂිත ණය අලාභය (ECL) ගණනය කිරීම් යනු විචල්‍ය යෙදවුම් තෝරා ගැනීම සහ ඒවායේ අන්තර් රඳා පැවතීම සම්බන්ධයෙන් පවතින උපකල්පන ගණනාවක් සහිත සංකීර්ණ ආකෘතිවල නිමැවුම් වේ. ගිණුම්කරණ විනිශ්චයන් සහ

ඇස්තමේන්තු ලෙස සලකනු ලබන ECL ආකෘතිවල අංගවලට ඇතුළත් වන්නේ:

- ණය අවදානමේ සැලකිය යුතු වර්ධනයක් සිදුවී ඇත්දැයි යන්න සහ එසේ නම් මූල්‍ය වත්කම් සඳහා ප්‍රතිපාදන සහ ගුණාත්මක තක්සේරුව LTECL පදනම මත ඇගයීමට බැංකුව සතු නිර්නායක
- සාමූහික පදනම මත ඔවුන්ගේ ECL තක්සේරු කරන විට මූල්‍ය වත්කම් කණ්ඩනය කිරීම
- විවිධ සූත්‍ර සහ යෙදවුම් තෝරා ගැනීම ඇතුළුව ECL ආකෘති සංවර්ධනය කිරීම සාර්ව ආර්ථික තත්වයන් සහ, විරැකියා මට්ටම් සහ සම්පාර්ශවීය අගයන් වැනි ආර්ථික යෙදවුම් අතර සංයෝගයන් නිර්ණය කිරීම සහ PDs, EADs සහ LGDs වලට ඇති බලපෑම.
- අපේක්ෂිත ණය අලාභ ආකෘති වෙතට ආර්ථික අවදන යොමු කිරීම් සඳහා ඉදිරිගාමී සාර්ව-ආර්ථික තත්වයන් හා ඒවායේ නව්‍යතා බර තැබීම් තෝරා ගැනීම.

(ඇ) පොදු පාලනය යටතේ ව්‍යාපාර සංයෝජන

පොදු පාලනය යටතේ පවතින ආයතන අතර ව්‍යාපාර සංයෝජන Pooling of Interest ක්‍රමය භාවිතා කර ගිණුම්ගත කරනු ලැබේ. ඒ අනුව, ඒකාබද්ධ ආයතනවල වත්කම් හා බැරකම් ඒවායේ රැගෙන යන වටිනාකමෙන් පිළිබිඹු වේ. සංයෝජනයේ ප්‍රතිඵලයක් ලෙස නව කීර්තිනාමයක් හඳුනාගෙන නොමැත. ගෙවන ලද / මාරු කරන ලද වටිනාකම් සහ අත්පත් කරගත් ස්කන්ධය අතර ඕනෑම වෙනසක් ස්කන්ධය තුළ පිළිබිඹු වේ.

තාවකාලික / ඇස්තමේන්තුගත සංඛ්‍යා භාවිතා කරමින් සහ සාධාරණ කාල පරිච්ඡේදයක් තුළ ව්‍යාපාර සංයෝජනය සිදු කරන ලදී. 2019 අප්‍රේල් 1 වන දින ට ඒකාබද්ධ කරන ලද වත්කම් හා බැරකම් නැවත තක්සේරු කිරීම සහ ඒ අනුව ඒකාබද්ධ සංචිතය සකස් කිරීම ප්‍රාදේශීය සංවර්ධන බැංකුවට අවශ්‍ය වේ.

(II) උපකල්පන සහ ඇස්තමේන්තු අවිනිශ්චිතතාව

ව්‍යාපාරික අඛණ්ඩතාව

අඛණ්ඩ පදනමක් මත මෙහෙයුම් පවත්වා ගැනීමට බැංකුවට ඇති හැකියාව පිළිබඳව බැංකුවේ කළමනාකාරිත්වය විසින් තක්සේරුවක් සිදු කරන ලද අතර, පුරෝකථනය කළ හැකි අනාගතය තුළ ව්‍යාපාරික අඛණ්ඩතාව පවත්වා ගැනීමට ප්‍රමාණවත් සම්පත් බැංකුව සතුව පවතින බවට කළමනාකාරිත්වය සෑහීමකට පත් වේ. එමෙන්ම, අඛණ්ඩ පදනමක් මත මෙහෙයුම් පවත්වා ගැනීමට බැංකුවට ඇති හැකියාව සම්බන්ධයෙන් සැලකිය යුතු මට්ටමේ සැකයක් ඉස්මතු කිරීමට ඉඩ ඇති සැලකිය යුතු මට්ටමේ කිසිදු අවිනිශ්චිතතාවක් කළමනාකාරිත්වයේ අවධානයට ලක්ව නොමැත. මේ නිසා, මූල්‍ය ප්‍රකාශන ව්‍යාපාරික අඛණ්ඩතා පදනම මත පිළියෙළ කරනු ලැබේ.

මූල්‍ය උපකරණවල සාධාරණ අගය

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි වාර්තා කර ඇති මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම්/බැරකම්වල සාධාරණ අගය සක්‍රිය වෙළෙඳපොල වෙතින් ව්‍යුත්පන්න කළ නොහැකි අතර ඒවා ගණිතමය ආකෘති භාවිතයද ඇතුළත් විවිධ ප්‍රමාණකරණ ක්‍රමවේද යොදා ගෙන නිර්ණය කෙරේ. එකී ආකෘතිවල ආදානයන් හැකි අවස්ථාවලදී නිරීක්ෂණය කළ හැකි වෙළෙඳපොල වෙතින් ලබා ගනු ලැබේ. කෙසේ වෙතත්, එකී දත්ත ලබා ගත නොහැකි අවස්ථාවලදී හඳුනාගත නොහැකි ආදාන යොදා ගැනීමේ බලපෑම අවම කිරීමට තීන්දු යොදු ගැනේ.

බදුකරණය

බැංකුව අදායම් බදුවලට යටත් වන අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කරන ලද කාලය වන විට බදු නීතිවල අදාළතාව අර්ථකථනය කිරීමට අදාළව පැවැති අවිනිශ්චිතතා හේතුවෙන් ප්‍රවර්තන, විලම්බිත හා අනෙකුත් බදු වෙනුවෙන් වෙන් කළ යුතු මුළු ප්‍රතිපාදන තීරණය කිරීම උදෙසා තීන්දු ගැනීම අවශ්‍ය වේ.

ව්‍යාපාරික සබඳතා පුළුල් පරාසයක විහිදීම හා පවතින ගිවිසුම්ගත ව්‍යවහාරවල දිගු කාලීන ස්වභාවය හා සංකීර්ණතා හේතුවෙන් තථ්‍ය ප්‍රතිඵල හා සිදු කරන ලද උපකල්පන අතර වෙනස්කම් ඉස් මතු වන අතර, එහි ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල ආරම්භයේදී 15, 27 හා 32 සටහන්වල වාර්තා කරන ලද බදු ආදායම හා වියදම් සහ විලම්බිත බදු වටිනාකම් වෙනුවෙන් ගැලපුම් සිදු කිරීමට සිදු වේ.

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්වල පිරිවැය හා ඒවායෙහි බැඳීම්වල වත්මන් අගය ආයුගණන ප්‍රමාණකරණ/ඇස්තමේන්තු ඇසුරින් තීරණය කෙරේ. වට්ටම් අනුපාත, වත්කම්වල ප්‍රතිලාභවලට අදාළ අපේක්ෂිත අනුපාත, අනාගත වැටුප් ඉහළ දැමීම්, මර්ත්‍යතා අනුපාත හා අනාගත විශ්‍රාම වැටුප් ඉහළ දැමීම් සම්බන්ධයෙන් උපකල්පන වෙත විළැඹීම එකී ආයුගණන ප්‍රමාණකරණයට ඇතුළත් වේ. එකී සැලසුම්වල දිගු කාලීන ස්වභාවය හේතුවෙන් එම තක්සේරු කිරීම් සැලකිය යුතු මට්ටමේ අවිනිශ්චිතතාවන්ට ලක් වීමට ඉඩ තිබේ. උපකල්පන සියල්ලම සෑම වාර්තාකරණ දිනයකදීම සමාලෝචනය කෙරේ.

සුදුසු වට්ටම් අනුපාතය තීරණය කිරීමේදී, නිශ්චිත ප්‍රතිලාභ බැඳීමේ අපේක්ෂිත කාල සීමාවට අදාළ තක්සේරුගත කල් පිරීම් සහ ශ්‍රී ලංකා රජයේ බැඳුම්කරවලට අදාළ පොලී අනුපාත කළමනාකාරිත්වය විසින් සැලකිල්ලට ගනු ලබයි.

මර්ත්‍යතා අනුපාතය පදනම් වන්නේ දැනට ලබා ගත හැකි මර්ත්‍යතා වගු මතයි. අපේක්ෂිත අනාගත උද්ධමන අනුපාත සහ බැංකුවේ අපේක්ෂිත අනාගත වැටුප් ඉහළ දැමීම් මත පදනම්ව අනාගත වැටුප් ඉහළ දැමීම් හා විශ්‍රාම වැටුප් ඉහළ දැමීම් තීරණය කෙරේ.

දේපල, පිරියත හා උපකරණවල ප්‍රයෝජනයට ගත හැකි ආයු කාලය

බැංකුව සෑම වාර්තාකරණ දිනයක්ම වන විට සිය වත්කම්වල ශේෂ වටිනාකම්, ප්‍රයෝජනයට ගත හැකි ආයු කාල හා ක්‍රමක්ෂය ක්‍රමවේද සමාලෝචනය කරයි. එකී වටිනාකම්, අනුපාත හා ක්‍රමවේද තක්සේරු කිරීමේදී කළමනාකාරිත්වයේ තීන්දුව ක්‍රියාත්මක කෙරෙන අතර එබැවින් එය අවිනිශ්චිතතාවන්ට ලක් වීමට ඉඩ තිබේ.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

බැඳීම් හා අසම්භව්‍යතා

හඳුනා ගත් වගකීම්/බැරකම් සියල්ලෙහිම වටිනාකම නිර්ණය කර ගැනීමේදී වටහා ගත හැකි අවදානම් සියල්ලම සැලකිල්ලට ගනු ලැබේ.

අසම්භාව්‍ය වගකීම් යනු, ආර්ථික ප්‍රතිලාභ මාරු කිරීම සිදු කළ නොහැකි හෝ විශ්වසනීය ලෙස මිනුම්ගත කළ නොහැකි විට අවිනිශ්චිත අනාගත සිදුවීම් හෝ වත්මන් බැඳීම් ඇසුරින් පමණක් පැවැත්ම තහවුරු කරගත හැකි බැඳීම් වේ. අසම්භාව්‍ය වගකීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි හඳුනා නොගැනෙන නමුදු ඒවා දුරස්ථ වන්නේ නම් මිස හෙළිදරව් කරනු ලැබේ.

4.ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්කම්

ප්‍රධාන පොලී අනුපාතික මිනුම් දණ්ඩෙහි මූලික ප්‍රතිසංස්කරණයක් ගෝලීය වශයෙන් සිදු කරනු ලබන අතර, ඇතැම් අන්තර් බැංකු පිරිනමනු ලබන අනුපාත (''IBORs) වෙනුවට විකල්ප අවදානම් රහිත අනුපාත (''IBOR ප්‍රතිසංස්කරණ" ලෙස හැඳින්වේ) මෙම වෙළඳපොළ ව්‍යාප්ත මූලපිරිමිවල කොටසක් ලෙස ප්‍රතිසංස්කරණය කරනු ලබන එහි මූල්‍ය උපකරණවල ඇතැම් IBORs වෙත නිරාවරණය වී ඇත.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (CA ශ්‍රී ලංකා) විසින් පොලී අනුපාතික මිනුම් දණ්ඩ ප්‍රතිසංස්කරණ අදියර 1 සහ අදියර 2 හේතුවෙන් SLFRS 9, LKAS 39 සහ SLFRS 7 සඳහා සංශෝධන නිකුත් කරන ලදී. IBOR ප්‍රතිසංස්කරණ අදියර 1 සහ අදියර 2 සංශෝධන දෙකෙහිම ඵලදායී දිනය 2021 ජනවාරි 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන වාර්ෂික වාර්තාකරණ කාල පරිච්ඡේදයන් සඳහා වන අතර අදියර 2 සංශෝධන යටතේ වන අවශ්‍යතා පූර්ව ගාමීව යෙදිය යුතුය.
IBOR ප්‍රතිසංස්කරණයේ ප්‍රතිඵලයක් ලෙස බැංකුව නිරාවරණය වී ඇති ප්‍රධාන අවදානම් ක්‍රියාත්මක වේ. නිදසුනක් වශයෙන්, ගනුදෙනුකරුවන් සමඟ ද්විපාර්ශ්වික සාකච්ඡා මගින් ණය ගිවිසුම් නැවත සාකච්ඡා කිරීම, කොන්ත්‍රාත් කොන්දේසි යාවත්කාලීන කිරීම සහ ප්‍රතිසංස්කරණ හා නියාමන අවදානමට අදාළ මෙහෙයුම් පාලනයන් සංශෝධනය කිරීම.

මූල්‍ය අවදානම ප්‍රධාන වශයෙන් පොලී අනුපාත අවදානමට පමණක් සීමා වේ. මෙම ප්‍රතිසංස්කරණයෙන් සිය මූල්‍ය උපකරණ වලට සිදුවන බලපෑම ඇගයීමේ ක්‍රියාවලියක් බැංකුව විසින් ආරම්භ කර ඇත. මෙම ක්‍රියාවලියට ණය ප්‍රමාණය ඉහළ යාම, ණය කැපවීම්, වගකීම් සහ ව්‍යුත්පන්නයන් යොමු IBOR මුදල් ප්‍රවාහයන් ඇගයීම, IBOR ප්‍රතිසංස්කරණයේ ප්‍රතිඵලයක් ලෙස එවැනි ගිවිසුම් සංශෝධනය කළ යුතුද, ප්‍රතිපාර්ශවයන් සමඟ IBOR ප්‍රතිසංස්කරණ පිළිබඳ සන්නිවේදනය කළමනාකරණය කරන්නේ කෙසේද සහ පවත්නා ණය ප්‍රතිපත්ති සඳහා අවශ්‍ය වෙනස්කම් ඇගයීමට ලක් කරනු ඇත.

2021 දෙසැම්බර් 31 වන විට, බැංකුවට නිරාවරණය වී ඇති ඇතැම් ප්‍රධාන මුදල් සඳහා වන IBORs ප්‍රතිසංස්කරණය කිරීමේ ක්‍රියාවලියක පවතී

5. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශය

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී බැංකුව විසින් යොදා ගන්නා ලද වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත දැක්වේ. සටහන් 4හි වෙනත් ලෙසකින් දක්වා ඇත්තේ නම් හැර බැංකුවේ මූල්‍ය ප්‍රකාශනවල නිරූපනය වන සෑම කාලසීමාවක්ම සඳහා පහත දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්ති නිරතුරුව යොදා ගෙන තිබේ.

5.1 මූල්‍ය වත්කම් හා වගකීම්

5.1.1 හඳුනාගැනීම සහ ආරම්භක මිනුම්

ගනුදෙනුකරුවන් වෙත ලබා දුන් ණය හා අත්තිකාරම් සහ ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු ශේෂ හැරුණුකොට මූල්‍ය වත්කම් හා වගකීම් වෙළෙඳ දිනය, එනම්, බැංකුව අදාළ උපකරණයේ ගිවිසුම්ගත විධිවිධානවල පාර්ශ්වකරුවෙකු බවට පත් වූ දිනය, සැලකිල්ලට ගෙන ආරම්භක හඳුනා ගැනීම සිදු කෙරේ. මිල දී ගැනීම් හෝ වෙළෙඳපොලෙහි ඇති නියාමන අවශ්‍යතා හෝ සම්මුතීන් මගින් සාමාන්‍යයෙන් ස්ථාපිත කෙරෙන කාල සීමාව ඇතුළත වත්කම් ලබා දීම අවශ්‍ය වන මූල්‍ය වත්කම් මීට ඇතුළත් වේ. ගනුදෙනුකරුවන්ගේ ගිණුම් වෙත මුදල් බැර කෙරෙන අවස්ථාවේදී ගනුදෙනුකරුවන් වෙත ලබා දුන් ණය හා අත්තිකාරම් හඳුනා ගැනේ. බැංකුව වෙත මුදල් ලැබෙන අවස්ථාවේදී ගනුදෙනුකරුවන් වෙත ගෙවිය යුතු ශේෂ හඳුනා ගැනේ.

5.1.2. මූල්‍ය උපකරණවලට අදාළ ආරම්භක මිනුම්ගත කිරීම

ආරම්භක හඳුනා ගැනීමේදී මූල්‍ය උපකරණ වර්ගීකරණය කිරීම ඒවායෙහි ගිවිසුම්ගත නියමයන් හෝ උපකරණ කළමනාකරණය කිරීම සඳහා වන ව්‍යාපාරික ආකෘතිය මත තීරණය වන්නකි. මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය මත පදනම්ව වාර්තා කර ඇති අවස්ථාවල හැර අන් අවස්ථාවලදී මූල්‍ය උපකරණ ඒවායෙහි සාධාරණ අගයට මිනුම්ගත කෙරෙන අතර, එම ගනුදෙනු පිරිවැය ඊට එකතු කොට හෝ ඉන් අඩු කර දක්වා ඇත. ලැබිය යුතු වෙළෙඳාම් ගනුදෙනු මිල පාදකව මිනුම්ගත කර තිබේ. මූල්‍ය උපකරණවල සාධාරණ අගය ආරම්භක හඳුනා ගැනීමේදී ගනුදෙනු මිලෙන් වෙනස් වන්නේ නම් පහත දක්වා ඇති පරිදි බැංකුව ලාභ හෝ අලාභ 1 වන දිනය මත පදනම්ව ගිණුම්ගත කරයි.

දින 1 ලාභ හෝ අලාභ

ආරම්භක හඳුනා ගැනීමේදී මූල්‍ය උපකරණයේ ගනුදෙනු මිල සාධාරණ අගයෙන් වෙනස් වන්නේ නම් හා සාධාරණ අගය වෙළෙඳපොල ගනුදෙනු ආශ්‍රිතව නිරීක්ෂණය කළ හැකි යෙදවුම් පමණක් යොදා ගැනෙන ප්‍රමාණකරණ ක්‍රමවේදයක් මත පදනම් වන්නේ නම්, බැංකුව එකී ගනුදෙනු මිල හා සාධාරණ අගය අතර වෙනස ශුද්ධ වෙළෙඳ ආදායම තුළ හඳුනා ගනියි. ඇතැම් යෙදවුම් නිරීක්ෂණය කළ නොහැකි යම් ආකෘති මත සාධාරණ අගය පදනම් වන එවැනි අවස්ථාවලදී, ගනුදෙනු මිල හා සාධාරණ අගය අතර වෙනස් විලම්බනය කෙරෙන අතර, යෙදවුම් වෙළෙඳපොල තුළ නිරීක්ෂණය කළ හැකි වූ විට හෝ උපකරණය හඳුනා ගැනීමෙන් ඉවත් කළ විට පමණක් ඒවා ආදායම් ප්‍රකාශනය තුළ හඳුනා ගැනේ.

5.1.2.1 මූල්‍ය වත්කම්

පහත සාධක පදනම් කර ගෙන මිනුම්ගත කෙරෙන, වත්කම් හා වත්කම්වල ගිවිසුම්ගත නියමයන් සඳහා අදාළ වන ව්‍යාපාරික ආකෘතිය පාදක කර ගෙන බැංකුව සිය මූල්‍ය වත්කම් සියල්ලම වර්ගීකරණය කරයි:

- 5.1.2.1.1 සටහනෙහි විස්තර කර ඇති පරිදි ක්‍රමක්ෂිත පිරිවැය
- 5.1.2.1.2 සටහනෙහි දැක්වෙන පරිදි ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට මනිනු ලැබෙන මූල්‍ය වත්කම්
- 5.1.2.1.3 සටහනෙහි දැක්වෙන පරිදි වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ අගයට හඳුනා ගැනෙන මූල්‍ය වත්කම්

එම වර්ගීකරණය, මූල්‍ය වත්කම් සහ මූල්‍ය වත්කම්වල මුදල් ප්‍රවාහ පිළිබඳ ගිවිසුම්ගත නියමයන් කළමනාකරණය කිරීම සඳහා බැංකුව සතුව පවතින ව්‍යාපාරික ආකෘතිය මත පදනම් වේ. ලාභ ඔස්සේ නිශ්චය කර ඇති වගකීම්/බැරකම් පවතින්නේ නම් හැර අනෙක් අවස්ථාවලදී බැංකුව සිය මූල්‍ය වත්කම් ක්‍රමක්ෂිත පිරිවැය පාදකව වර්ගීකරණය කරයි.

5.1.2.1.1 ගනුදෙනුකරුවන් සඳහා ණය හා අත්තිකාරම්, ක්‍රමක්ෂිත පිරිවැයට මූල්‍ය වත්කම්

පහත දැක්වෙන කොන්දේසි දෙකම සන්තෘප්ත වන්නේ නම් බැංකුව විසින් වෙනත් බැංකු වලින් ලැබිය යුතු වත්කම්, ගනුදෙනුකරුවන්ට ලබා දුන් ණය හා අත්තිකාරම් සහ අනෙකුත් මූල්‍ය උපකරණ ක්‍රමක්ෂිත පිරිවැයට මිනුම්ගත කරනු ලැබේ:

- ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ රැස් කර ගැනීම උදෙසා මූල්‍ය වත්කම් රඳවා තැබීමේ අරමුණ සහිත ව්‍යාපාරික ආකෘතියක් තුළ මූල්‍ය වත්කම රඳවා ඇති නම්
- මූල්‍ය වත්කමට අදාළ ගිවිසුම්ගත නියමයන් මගින්, හුදෙක්ම මුල් මුදල ගෙවීම් සහ මුල් මුදල මත ගෙවිය යුතු හිඟ වටිනාකම ලෙස පවතින මුදල් ප්‍රවාහ නිශ්චිත දිනවලදී ගම්‍ය කරයි නම්

එකී කොන්දේසිවල විස්තර පහත පැහැදිලි කර ඇත.

ව්‍යාපාරික ආකෘතිය තක්සේරු කිරීම

බැංකුව සිය ව්‍යාපාරික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා තමන් විසින් සිය මූල්‍ය වත්කම් කළමනාකරණය කරනු ලැබෙන ආකාරය වඩාත් හොඳින් පිළිබිඹු කෙරෙන පරිදි සිය ව්‍යාපාරික ආකෘති තීරණය කරයි.

බැංකුවේ ව්‍යාපාරික ආකෘතිය තක්සේරු කරනු ලබන්නේ උපකරණයෙන් උපකරණයට පදනම මත නොවන අතර සමුච්චිත කළඹ ආශ්‍රිත ඉහළ මට්ටම් පාදකව වන අතර, එකී කාර්යය පහත දැක්වෙන ආකාරයේ නිරීක්ෂණය කළ හැකි සාධක මත පදනම් වේ:

- ව්‍යාපාරික ආකෘතියේ කාර්යසාධනය සහ එකී ආකෘතිය තුළ රඳවා ඇති මූල්‍ය වත්කම් ඇගයීමට ලක් කොට ආයතනයේ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් වෙත වාර්තා කරනු ලබන්නේ කෙසේද යන්න
- ව්‍යාපාරික ආකෘතියේ කාර්යසාධනය (සහ එකී ආකෘතිය තුළ රඳවා ඇති මූල්‍ය වත්කම්) වෙත බලපාන අවදානම් සහ එකී අවදානම් කළමනාකරණය කරනු ලබන්නේ කෙසේද යන්න
- ව්‍යාපාර කළමනාකරණය කරන්නන් සඳහා ගෙවනු ලබන්නේ කෙසේද යන්න (නිදසුනක් ලෙස, එකී ගෙවීම එලෙස කළමනාකරණය කරනු ලැබෙන වත්කම්වල සාධාරණ අගය මත පදනම් වන්නක්ද, නැතහොත් රැස් කරනු ලබන ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ මත පදනම් වන්නක්ද යන්න)
- විකුණුම් සිදු කෙරෙන වාර ගණන, ඒවායෙහි වටිනාකම හා කාලය ද බැංකුවේ තක්සේරුවෙහි වැදගත් පැතිකඩ වේ

ව්‍යාපාරික ආකෘතිය තක්සේරු කිරීම, 'වඩාත් අවාසිදායකම අවස්ථා' හෝ 'ආතතිකර අවස්ථා' සැලකිල්ලට ගැනීමෙන් තොරව සාධාරණ ලෙස අපේක්ෂා කළ හැකි අවස්ථා හෝ සිදුවීම් මත පදනම් වේ. ආරම්භක හඳුනා ගැනීමෙන් පසුව මුදල් ප්‍රවාහ ලබා ගනුයේ බැංකුවේ මුල් අපේක්ෂාවලට වඩා වෙනස් ආකාරයකට නම්, බැංකුව එකී ව්‍යාපාරික ආකෘතිය තුළ රඳවා ඉතිරිව ඇති මූල්‍ය වත්කම් වර්ගීකරණයට වෙනස්කම් සිදු නොකරන අතර, අලුතින් උත්පාදනය වූ හෝ මිල දී ගත් මූල්‍ය වත්කම් අඛණ්ඩ පදනම මත තක්සේරු කිරීමේදී එකී තොරතුරු අන්තර්ගත කරයි.

හුදෙක්ම මුල් මුදල හා පොළී ගෙවීම් (SPPI Test)

ස්වකීය වර්ගීකරණ ක්‍රමවේදයේ දෙවන පියවරක් වශයෙන් බැංකුව සිය මූල්‍ය වත්කම්වලට අදාළ ගිවිසුම්ගත නියමයන් හුදෙක්ම මුල් මුදල මත පොළී ගෙවීම් පරීක්ෂාව (SPPI Test) වෙත අනුගත වේද යන්න හඳුනා ගනු පිණිස තක්සේරු කරයි.

මෙම අරමුණ සඳහා 'මුල් මුදල' යන්න නිර්වචනය කෙරෙනුයේ ආරම්භක හඳුනා ගැනීමේදී මූල්‍ය වත්කමෙහි සාධාරණ අගය වන අතර, එය එකී මූල්‍ය වත්කමේ ආයු කාලය තුළ වෙනස් වීමට ඉඩ ඇත (නිදසුනක් ලෙස, මුල් මුදල ආපසු ගෙවීම් හෝ මූලික මුදල/වට්ටම් ක්‍රමක්ෂය කිරීම් සිදු වේ නම්).

ණය ලබා දීමේ ගිවිසුමක් තුළ පොළිවල අදාළ වන ඉතාම වැදගත් සංඝටක වන්නේ සාමාන්‍යයෙන් මුදලෙහි කාලික වටිනාකම සලකා බැලීම සහ ණය අවදානම යනාදියයි. SPPI තක්සේරුවක් සිදු කිරීම සඳහා බැංකුව ස්වකීය තීන්දු අදාළ කර ගන්නා අතර, මූල්‍ය වත්කම දක්වා ඇති මුදල් ඒකකය සහ පොළී අනුපාත අදාළ කෙරෙන කාල සීමාව වැනි අදාළ සාධක සැලකිල්ලට ගනියි.

ඊට හාත්පසින්ම වෙනස්ව, මූලික ණය ලබා දීමේ විධිවිධානයකට සම්බන්ධ නොවන ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන්හි අවදානම් හෝ අස්ථාවරත්වය අවම කිරීමකට වඩා වැඩි යමක් හඳුන්වා දෙන ගිවිසුම් කොන්දේසි පවතින අවස්ථාවක දී, මූලික වශයෙන් ගෙවිය යුතු මුදල හා පොළිය පමණක් ගෙවිය යුතු ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන්ට අදාළ ව ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ නිර්මාණය නොවේ. එවැනි අවස්ථාවන්හිදී, මූල්‍ය වත්කම් FVPL ඔස්සේ මැනීම අවශ්‍ය වේ.

5.1.2.1.2 ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට මනිනු ලැබෙන මූල්‍ය වත්කම්

ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට මනිනු ලැබෙන මූල්‍ය වත්කම් සමන්විත වන්නේ:

- මූල්‍ය උපකරණ - විකිණීමට තබා ඇති, සහ
- හුදෙක් මුල් මුදල හා ලාභය ගෙවීමක් නියෝජනය නොකරන ගිවිසුම්ගත නියමයන් සහිත උපකරණ මගිනි.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

ලාභ හෝ අලාභ ඔස්සේ රඳවා ඇති මූල්‍ය උපකරණ ආරම්භකව හඳුනා ගැනෙන්නේ සාධාරණ අගයට අනුව වන අතර, ගනුදෙනු පිරිවැය මතුවන විට ලාභ හෝ අලාභ ප්‍රකාශනයෙහි හඳුනා ගැනේ.ඉන් අනතුරුව, ඒවා සාධාරණ අගයට මිනුම්ගත කෙරෙන අතර කවර හෝ ලාභයක් හෝ අලාභයක් වේ නම් ඒවා ඉස්මතු වන විට ලාභ හෝ අලාභ ප්‍රකාශනයෙහි හඳුනා ගැනේ.

යම් මූල්‍ය වත්කමක් සාධාරණ අගයට මිනුම්ගත කෙරෙන විට, ණය අවදානම ආශ්‍රිත වෙනස් වීම් හේතුවෙන් සාධාරණ අගයෙහි සිදු විය හැකි වෙනස් වීම් නියෝජනය වන පරිදි ප්‍රතිපාර්ශවයේ ණය යෝග්‍යතාව පිළිබිඹු කරනු පිණිස ණය ප්‍රමාණකරණ ගැලපීමක් ඇතුළත් කරනු ලැබේ.

මූල්‍ය උපකරණ - විකිණීමට තබා ඇති

කිසියම් මූල්‍ය ආයෝජනයක් මූලික වශයෙන්ම නුදුරු කාලයේදී විකිණීමේ හෝ නැවත මිල දී ගැනීමේ අරමුණින් අත්පත් කර ගෙන හෝ උද්ගත කර ගෙන තිබේ නම් හෝ වික්‍රව කළමනාකරණය කෙරෙන සහ කෙටි කාලීන ලාභ ලැබීමේ සාක්ෂි සහිත මූල්‍ය උපකරණ කළඹක කොටසක් වේ නම් හෝ ඉදිරි රැකුම් සබඳතාවක් වෙතින් ව්‍යුත්පන්න වූවක් නොවේ නම් එය ලාභ හෝ අලාභ ඔස්සේ හඳුනා ගැනෙන මූල්‍ය වත්කම් ලෙස වර්ගීකරණය කෙරේ.

ස්කන්ධ සුරැකුම්වල ආයෝජන ද ලාභ හෝ අලාභ ඔස්සේ හඳුනා ගැනෙන මූල්‍ය වත්කම් ලෙස වර්ගීකරණය කෙරෙන අතර සාධාරණ අගය මත හඳුනා ගැනේ. එම තොරතුරු 20 සටහන මගින් දක්වා ඇත.

ලාභ හෝ අලාභ ඔස්සේ මිනුම්ගත කෙරෙන ලෙස හඳුනා ගැනෙන මූල්‍ය උපකරණ

ආරම්භක හඳුනා ගැනීමෙන් පසුව, මූල්‍ය උපකරණ ලාභ හෝ අලාභ ඔස්සේ මිනුම්ගත කෙරෙන ලෙස හඳුනා ගැනේ. කිසියම් මූල්‍ය වත්කමක් ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට නියම කිරීම මගින්, වෙනත් ලෙසකින් මූල්‍ය වත්කම් හෝ වත්කම් වෙනස් පදනමක් මත මිනුම්ගත කිරීම නිසා උද්ගත විය හැකි, මිනුම්ගත කිරීමේ හෝ හඳුනා ගැනීමේ අසංගතතා මතු වීම වළක්වාලීමක් හෝ සැලකිය යුතු ලෙස අඩු කිරීමක් සිදු වේ නම් පමණක් එය ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට මිනුම්ගත කෙරේ. බැංකුව මෙම කාණ්ඩය යටතේ කිසිදු මූල්‍ය උපකරණයක් හඳුනා නොගනී.

5.1.2.1.3. වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ අගයට මිනුම්ගත කෙරෙන මූල්‍ය වත්කම්

ලාභ හෝ අලාභ ඔස්සේ හඳුනා ගත් මූල්‍ය වත්කම් විකිණීමක් හෝ SLFRS 3 - ''ව්‍යාපාර සංයුක්ත කිරීම'' ප්‍රමිතිය අදාළ වන ව්‍යාපාර සංයුක්ත කිරීමක දී බැංකුව විසින් හඳුනා ගත් අසම්භාව්‍ය සැලකීමක් හෝ නොවන ස්කන්ධ උපකරණවල ආයෝජන, වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ අගයට මිනුම්ගත කෙරෙන අතර එහිදී ආයෝජනයේ දිගු කාලීන ස්වභාවය හේතුවෙන් කළමනාකාරිත්වය විසින් අහෝසිකර වරණයක් සිදු කරනු ලැබේ. වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ අගයට මිනුම්ගත කිරීම සම්බන්ධයෙන් කළමනාකාරිත්වය අහෝසිකර වරණයක් යොදා ගැනීම සලකා නොබලන කළඹ සඳහා සම්මතයක් වශයෙන් එකී ආයෝජන ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට මිනුම්ගත කෙරේ.

වෙනත් විස්තීර්ණ ආදායම් තුළ ඉදිරිපත් කර ඇති වටිනාකම් ඉන් අනතුරුව ලාභ හෝ අලාභ තුළ හඳුනා නොගනේ. එවැනි ආයෝජනවලින් ලැබෙන ලාභාංශ ලාභ හෝ අලාභ තුළ හඳුනා ගැනේ. එවැනි ස්කන්ධ ආයෝජන මත ලාභ හෝ අලාභ කිසිදු විටක ලාභ වෙත යොමු නොකෙරේ. බැංකුව විසින් කිසියම් උපකරණයක පිරිවැයෙහි අයකර ගැනීමේ කොටස ලෙස ලාභාංශවල ප්‍රතිලාභ ඉදිරියට ගෙන එන අවස්ථාවලදී හැර ගෙවීම් හිමිකමක් ස්ථාපිතව ඇති විට ලාභාංශ ආදායම් ප්‍රකාශනය තුළ ශුද්ධ වෙළෙඳ ලාභ/(අලාභ) ලෙස හඳුනා ගැනෙන අතර, ඉදිරියට ගෙන එන අවස්ථාවලදී එවැනි ලාභ වෙනත් විස්තීර්ණ ආදායම් හි වාර්තා කෙරේ. වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ අගයට මිනුම්ගත කෙරෙන ස්කන්ධ ආයෝජන හානිකරණ තක්සේරුවකට ලක් නොකෙරේ.

5.1.2.2 මූල්‍ය වගකීම්

මූල්‍ය වගකීම් සම්බන්ධ ආරම්භක හා ඉන් පසුව සිදු කෙරෙන මිනුම්ගත කිරීම පහත දැක්වෙන පරිදි අනෙකුත් වර්ගීකරණයක් මත පදනම් වේ.

ආරම්භයේදී බැංකුව සිය මූල්‍ය වගකීම් වර්ගීකරණය කිරීම සලකා බලයි. ඒ අනුව, මූල්‍ය වගකීම් පහත පරිදි වර්ගීකරණය කෙරේ:

- ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට මිනුම්ගත කෙරෙන මූල්‍ය වගකීම් (5.1.2.2.1 සටහන)
  - විකිණීම සඳහා රඳවා ඇති මූල්‍ය වගකීම්
  - ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට මිනුම්ගත කෙරෙන මූල්‍ය වගකීම්
- ක්‍රමක්ෂිත පිරිවැය මත මූල්‍ය වගකීම් (5.1.2.2.2 සටහන)

මූල්‍ය වගකීම් සම්බන්ධ ආරම්භක හා ඉන් පසුව සිදු කෙරෙන මිනුම්ගත කිරීම ඒවාට අදාළ වර්ගීකරණය මත පදනම් වේ.

5.1.2.2.1 ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට මිනුම්ගත කෙරෙන මූල්‍ය වගකීම්

ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට ආරම්භක හඳුනා ගැනීම සිදු කොට මිනුම්ගත කරන ලද මූල්‍ය වගකීම් සහ විකිණීම සඳහා රඳවා ඇති මූල්‍ය වගකීම් ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට මිනුම්ගත කළ මූල්‍ය වගකීම්වලට අයත් වේ. ආරම්භක හඳුනා ගැනීමෙන් අනතුරුව මූල්‍ය වගකීම් ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට මිනුම්ගත කෙරෙන අතර ඉන් පසුව සිදු වන වෙනස් වීම් ලාභ හෝ අලාභ තුළ හඳුනා ගැනේ.

මූල්‍ය වගකීම් මූලික වශයෙන්ම නුදුරු කාලයේදී විකිණීමේ හෝ නැවත මිල දී ගැනීමේ අරමුණින් අත්පත් කර ගෙන ඇති නම් හෝ කෙටි කාලීන ලාභ වෙනුවෙන් කළමනාකරණය කරන කළඹක කොටසක් ලෙස රඳවා ඇති නම් එකී මූල්‍ය වගකීම් විකිණීම සඳහා තබා ඇති ලෙස වර්ගීකරණය කෙරේ. ''මූල්‍ය උපකරණ: හඳුනා ගැනීම හා මිනුම්ගත කිරීම'' පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති - LKAS 39 මගින් නිශ්චය කර ඇති පරිදි ඉදිරි රැකුම් සම්බන්ධතාවකදී ඉදිරි රැකුම් උපකරණ ලෙස හඳුනා නොගැනෙන, බැංකුව සම්බන්ධ වූ ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ මෙම කාණ්ඩයට අයත් වේ. වෙන් කරන ලද අන්තර්ගත ව්‍යුත්පන්නයන්ද සවිලදායී ඉදිරි රැකුම් උපකරණ ලෙස හඳුනා ගෙන නොමැති නම් ඒවාද

විකිණීම සඳහා රඳවා ඇති ලෙස වර්ග කෙරේ. විකිණීම සඳහා රඳවා ඇති වගකීම් මත ලාභ හෝ අලාභ ආදායම් ප්‍රකාශනයෙහි හඳුනා ගැනේ.

මෙම කාණ්ඩය යටතේ බැංකුවට මූල්‍ය වගකීම් කිසිවක් නොමැත.

5.1.2.2.2 ක්‍රමක්ෂීත පිරිවැය මත මූල්‍ය වගකීම්

ගිවිසුම්ගත විධිවිධාන හේතුවෙන් රැඳවුම් හිමියා වෙත මුදල් ගෙවීමට හෝ වෙනත් මූල්‍ය වත්කමක් ලබා දීමට හෝ EIR ක්‍රමවේදය භාවිතයෙන් තමන්ගේම ස්කන්ධ කොටස් ස්ථාවර සංඛ්‍යාවක් ක්‍රමක්ෂීත පිරිවැය මත පදනම්ව ස්ථාවර වට්නාකමක් මුදලින් හෝ වෙනත් මූල්‍ය වත්කම් ඇසුරින් හුවමාරු කිරීම ස්වරූපයෙන් බැඳීමක් ඉටු කිරීමට බැංකුව බැඳියාවකට යටත් කෙරෙන විට ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට මිනුම්ගත කර නොමැති බැංකුව විසින් නිකුත් කර ඇති මූල්‍ය උපකරණ ''ගනුදෙනුකරුවන් වෙත ගෙවිය යුතු හා වෙනත් ණය ගැනීම්'' යටතේ ක්‍රමක්ෂීත පිරිවැයට හඳුනා ගැනෙන වගකීම් ලෙස වර්ග කෙරේ.

ආරම්භක හඳුනා ගැනීමෙන් පසුව, එවැනි මූල්‍ය වගකීම් සඵලදායී පොලී ක්‍රමවේදය යොදා ගනිමින් ක්‍රමක්ෂීත පිරිවැයට අනුව ඉන් අනතුරුව මිනුම්ගත කෙරේ. ක්‍රමක්ෂීත පිරිවැය ගණනය කරනු ලබන්නේ නිකුතුවට අදාළ ඕනෑම වට්ටමක් හෝ මූලික ගෙවීමක් සැලකිල්ලට ගෙන වන අතර පිරිවැය EIR හි සංගෘහිත අංකයකි. සඵලදායී පොලී ක්‍රමයට ක්‍රමක්ෂයකරණය ආදායම් ප්‍රකාශනයෙහි ''පොලී වියදම්'' යටතේ ඇතුළත් කර ඇත. වගකීම් හඳුනා ගැනීමෙන් ඉවත් කෙරෙන විට මෙන්ම සඵලදායී පොලී ක්‍රමයට ක්‍රමක්ෂය කිරීමේ ක්‍රියාවලිය ඔස්සේ ලාභ හා අලාභ ආදායම් ප්‍රකාශනයෙහි හඳුනා ගැනේ.

බැංකුව වෙත ලැබිය යුතු වට්නාකම්, වෙනත් ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු බැඳීම්, නිකුත් කළ ණය සහ වෙනත් ණයට ගැනීම් අරමුදල මෙම කාණ්ඩයට අයත් වේ.

5.1.2.3. මූල්‍ය වත්කම් සහ වගකීම් නැවත වර්ගීකරණය

බැංකුව විසින් කිසියම් ව්‍යාපාරික මාර්ගයක් අත්පත් කර ගැනෙන, බැහැර කෙරෙන හෝ නවතා දැමීම සිදු වන ව්‍යතිරේක අවස්ථාවලදී හැර, ආරම්භක හඳුනා ගැනීමෙන් පසුව බැංකුව සිය මූල්‍ය වත්කම් නැවත වර්ගීකරණය නොකරයි. මූල්‍ය වගකීම් කිසිදු විටෙක නැවත වර්ගීකරණය නොකෙරේ. 2021 වසරේදී බැංකුව සිය මූල්‍ය වත්කම් හෝ වගකීම් කිසිවක් නැවත වර්ගීකරණය කර නැත.

5.1.2.4 මූල්‍ය වත්කම් සහ වගකීම් හඳුනා ගැනීමෙන් ඉවත් කිරීම

නියම හා කොන්දේසි පසුව සංශෝධනය කිරීම හේතුවෙන් හඳුනා ගැනීමෙන් ඉවත් කිරීම.

ගනුදෙනුකරුවෙකුට ලබා දුන් ණය මුදලක් වැනි කිසියම් මූල්‍ය වත්කමක් සැලකිය යුතු පරිද්දෙන් නව ණයක් බවට පත් වන තරමටම ඊට අදාළ නියම හා කොන්දේසි සංශෝධනය වී ඇති විට, හඳුනා ගන්නා ලද වෙනස හානිකරන අලාභයක් වී වන විටත් වාර්තා නොවනතාක් කල් ලාභ හෝ අලාභ හඳුනා ගැනීමෙන් ඉවත් කිරීමක් ලෙස හඳුනා ගනිමින් එකී හඳුනා ගැනීමෙන් ඉවත් කරනු ලැබේ. එකී ණය මුදල මිල දී ගත් හෝ උත්පාදිත ණය හානිකරණයක් ලෙස පෙනී යන්නේ නම් හැර එලෙස අලුතින් හඳුනා ගත් ණය අපේක්ෂිත ණය අලාභ මිනුම්ගත කිරීමේ අරමුණ වෙනුවෙන් 1 අවධිය ලෙස වර්ග කෙරේ.

ගනුදෙනුකරුවෙකු වෙත ලබා දුන් ණය මුදලක් හඳුනා ගැනීමෙන් ඉවත් කරන්නේද නැද්ද යන්න තක්සේරු කිරීමේදී බැංකුව තවත් කාරණා සහිතව පහත සාධක සලකා බලයි:

- ණය මුදල් ඒකකයෙහි වෙනස් වීම්
- ස්කන්ධ ලක්ෂණයක් හඳුන්වා දීම
- ප්‍රතිපාර්ශ්වයෙහි වෙනස් වීම්
- අදාළ උපකරණය තවදුරටත් SPPI නිර්ණායකය සන්තෘප්ත නොකරන තරමට වෙනස් වීම සිදු වී ඇතිද යන්න

වෙනස් වීම හේතුවෙන් සැලකිය යුතු තරමින් වෙනස් මුදල් ප්‍රවාහ ජනනය වන්නේද යන්න, එහිදී වෙනස් වීම නිසා හඳුනා ගැනීමෙන් ඉවත් කිරීම සිදු නොවේ. මුල් සඵලදායී පොලී අනුපාතයට අනුව වට්ටම් කරන ලද මුදල් ප්‍රවාහ ආශ්‍රිත වෙනස් වීම් මත පදනම්ව බැංකුව, හානිකරණ අලාභයක් වාර්තා නොවන තාක් එකී වෙනස් වීම් ලාභයක් හෝ අලාභයක් ලෙස වාර්තා කරයි.

සැලකිය යුතු තරමේ වෙනස් වීමක් හැර වෙනත් හේතුවක් මත හඳුනා ගැනීමෙන් ඉවත් කිරීම

මූල්‍ය වත්කම්

කිසියම් මූල්‍ය වත්කමකින් මුදල් ප්‍රවාහ ලැබීමට ඇති හිමිකම ඉකුත් වී ඇති විට එකී මූල්‍ය වත්කම (හෝ අදාළ වන විට, කිසියම් වත්කමක කොටසක් හෝ සමාන මූල්‍ය වත්කම් සමූහයක කොටසක්) හඳුනා ගැනීමෙන් ඉවත් කෙරේ. බැංකුව විසින් කිසියම් මූල්‍ය වත්කමක් පවරා ඇත්නම් සහ එකී පැවරීම හඳුනා ගැනීමෙන් ඉවත් කිරීමට සුදුසුකම් සපුරන්නේ නම් එකී වත්කම හඳුනා ගැනීමෙන් ඉවත් කෙරේ.

පහත අවස්ථාවන්හිදී පමණක් බැංකුව මූල්‍ය වත්කම් පවරා ඇත:

- මූල්‍ය වත්කමෙන් මුදල් ප්‍රවාහ ලැබීමට ඇති අයිතිය බැංකුව විසින් පැවරීම

හෝ

- මුදල් ප්‍රවාහ රඳවා ගැනීම සඳහා හිමිකම චිමගින් ඉතිරි වන නමුදු, ලිහිල් ප්‍රතිපත්ති ක්‍රමවේදයක් යටතේ කිසිදු සැලකිය යුතු තරමේ ප්‍රමාදයකින් තොරව, ලැබුණු මුදල් ප්‍රවාහ මුළු මුදල වශයෙන්ම තෙවැනි පාර්ශ්වයක් වෙත ගෙවීමට බැඳීමක් ගම්‍ය වී ඇත.

ලිහිල් ප්‍රතිපත්ති ක්‍රමවේද යනු, පහත දැක්වෙන කොන්දේසි තුනම සන්තෘප්ත වන අවස්ථාවන්හිදී කිසියම් මූල්‍ය වත්කමක මුදල් ප්‍රවාහ ලැබීමට ගිවිසුම්ගත හිමිකම් බැංකුවට ඉතිරි වන නමුදු, පාර්ශ්ව එකක් හෝ වැඩි ගණනක් වෙත එකී මුදල් ප්‍රවාහ ගෙවීමට ගිවිසුම්ගත බැඳීමක් පවතින ගනුදෙනු වේ.

- ණය පිණිස ලබා දුන් මුදල සහ වෙළෙඳපොල අනුපාත පාදක උපචිත පොලිය සම්පූර්ණයෙන්ම අයකර ගැනීමට හිමිකම සහිතව ලබා දුන් කෙටි කාලීන අත්තිකාරම් හැර, මුල් වත්කමෙන් අදාළ වට්නාකම් රැස්කර ගෙන නොමැති නම් ඉන් අනතුරුව එම මුදල් ලබන්නන් හට මුදල් ගෙවීමට බැඳීමක්

බැංකුවට නැත.

- වත්කමකින් මුදල් ලබා ගන්නා පාර්ශව වෙත සුරැකුමක් ලෙස ගෙවීම හැර වෙනත් ලෙසකින් මුල් වත්කම විකිණීමට හෝ ඉදිරි රැකුමකට ලක් කිරීමට බැංකුවට නොහැක.
- කිසිදු සැලකිය යුතු ප්‍රමාදයකින් තොරව, බැංකුව වත්කමෙන් මුදල් ප්‍රවාහ ලබා ගන්නා පාර්ශ්ව වෙනුවෙන් රැස් කර ගන්නා මුදල් ප්‍රවාහ ඔවුන් වෙත ප්‍රේෂණය කළ යුතු වේ.

ඊට අමතරව, රැස් කර ගන්නා දිනය සහ ප්‍රතිලාභය ලැබෙන පාර්ශ්වය වෙත මුදල් ප්‍රේෂණය කෙරෙන දින අතර කාල සීමාව තුළ, උපයා ගන්නා පොලිය ද ඇතුළත්ව මුදල් හෝ මුදල් සමානයන් ස්වරූපයෙන් හැර වෙනත් ලෙසකින් එවැනි මුදල් ප්‍රවාහ නැවත ආයෝජනය කිරීමට බැංකුව හිමිකම් නොකියයි.

පහත සාධක පවතින්නේ නම් පමණක් යම් පැවරීමක් හඳුනා ගැනීමෙන් ඉවත් කිරීමට සුදුසුකම් ලබයි:

- බැංකුව වත්කමට අදාළ අවදානම් සහ ප්‍රතිලාභ සියල්ලම සැලකිය යුතු ලෙස පවරා ඇති විට

හෝ

- බැංකුව වත්කමට අදාළ අවදානම් සහ ප්‍රතිලාභ සියල්ලම සැලකිය යුතු ලෙස පවරා හෝ රඳවා ගෙන නොමැති, එහෙත් වත්කමෙහි පාලනය පවරා ඇති විට

එකී වත්කම අසම්බන්ධිත තෙවැනි පාර්ශ්වයක් වෙත විකිණීමට ප්‍රායෝගික හැකියාවක් පැවරීම ලබා පාර්ශ්වය සතුව පවතින්නේ නම්, සහ පැවරීම මත අතිරේක සීමාකම් යෙදවීමෙන් තොරව ඒකපාර්ශවීයව එම හැකියාව ක්‍රියාවේ යෙදවීමට හැකියාවක් තිබේනම් පමණක් බැංකුව එම වත්කමෙහි පාලනය පැවරිය හැකි වකක් ලෙස සලකයි.

බැංකුව වත්කමට අදාළ අවදානම් සහ ප්‍රතිලාභ සියල්ලම සැලකිය යුතු ලෙස පවරා හෝ රඳවා ගෙන නොමැති විට, බැංකුව සතුව තවදුරටත් ඊට ඇති සම්බන්ධය පවතින තාක් එම වත්කම හඳුනා ගැනීමට ලක් කළ යුතු අතර එවැනි අවස්ථාවලදී බැංකුවද ඊට සම්බන්ධිත වගකීමක් හඳුනා ගනී. පවරන ලද වත්කම හා ඒ හා සබැඳි වගකීම, බැංකුව විසින් රඳවා ගන්නා ලද හිමිකම් හා බැඳීම් පිළිබිඹු කෙරෙන පදනමක් මත මිනුම්ගත කෙරේ.

පවරන ලද වත්කම අරබයා වන සුරැකුමක ස්වරූපය ගන්නා අඛණ්ඩව පවත්නා සම්බන්ධතාවක් මිනුම්ගත කෙරෙනුයේ වත්කමෙහි ඉදිරියට ගෙන යන මුල් වටිනාකම සහ බැංකුව විසින් ගෙවිය යුතු සලකා බැලීමේ උපරිම වටිනාකමට අඩුවෙනි.

එකී අඛණ්ඩව පවත්නා සම්බන්ධතාවය ලිඛිත හෝ මිල දී ගන්නා ලද විකල්පයක ස්වරූපය ගන්නේ නම් (හෝ ඒ දෙආකාරයේම), එය මිනුම්ගත කරනුයේ ප්‍රතිමිලදී ගැනීමකදී බැංකුව විසින් ගෙවිය යුතු වටිනාකම පදනම් කරගෙන වේ. කිසියම් වත්කමක් සාධාරණ අගයට මනිනු ලැබෙන විට ලිඛිත විකල්පයක් යොදා ගන්නේ නම් ආයතනයේ අඛණ්ඩව පවත්නා සම්බන්ධතාවෙහි තරම පවරන ලද වත්කමෙහි සාධාරණ අගය සහ විකල්පය ක්‍රියාත්මක කිරීමේ මිලට පහළින් පවතී.

මූල්‍ය වගකීම්

කිසියම් මූල්‍ය වගකීමක් යටතේ ඇති බැඳීම බැහැර කොට, අවලංගු කොට හෝ ඉකුත් වී ඇති විට එය හඳුනා ගැනීමෙන් ඉවත් කෙරේ. පවතින කිසියම් මූල්‍ය වගකීමක් වකම ණය හිමියා විසින් ලබා ගන්නා ලද වෙනත් වගකීමකින් සැලකිය යුතු තරමේ කොන්දේසි මත විතැන් කෙරේ නම් හෝ පවතින වගකීමේ නියමයන් සැලකිය යුතු ලෙස වෙනස් වී ඇති නම්, එවැනි හුවමාරුවක් හෝ සංශෝධනය කිරීමක් මුල් වත්කම හඳුනා ගැනීමෙන් ඉවත් කිරීමක් ලෙස හා නව වගකීමක් හඳුනා ගැනීමට ලක් කිරීමක් ලෙස සැලකේ. මුල් වගකීමෙහි ඉදිරියට ගෙන යන වටිනාකම සහ ගෙවන ලද සලකා බැලූ වටිනාකම අතර වෙනස ආදායම් ප්‍රකාශනයෙහි හඳුනා ගැනේ.

5.1.2.5 හානිකරණ

අපේක්ෂිත ණය අවදානම් සමාලෝචනය

සියලුම ණය හා ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට රඳවන ලාභ අනෙකුත් ණය මූල්‍ය වත්කම් සම්බන්ධයෙන් බැංකුව අපේක්ෂිත ණය අලාභ වෙනුවෙන් ප්‍රතිපාදන වාර්තා කරමින් සිටින අතර, ණය බැඳීම් හා මූල්‍ය සුරැකුම් කොන්ත්‍රාත්තුද ඊට ඇතුළත් වේ. මෙම කොටසේදී මේ සියල්ලම 'මූල්‍ය උපකරණ' ලෙස සැලකේ. SLFRS 9 යටතේ ස්කන්ධ උපකරණ හානිකරණයට ලක් නොවේ.

මාස 12 අපේක්ෂිත ණය අලාභ යනු, වාර්තාකරණ දිනයෙන් මාස 12ක කාල සීමාවක් ඇතුළත මූල්‍ය උපකරණයකට අදාළව සිදු විය හැකි ගෙවීම් හිඟ වීම් හේතුවෙන් ඉස්මතු වන අපේක්ෂිත ණය අලාභ නියෝජනය කරන LTECL කොටස වේ.

LTECL සහ අපේක්ෂිත මාස 12 ණය අලාභ යන දෙවර්ගයම ගණනය කරනු ලබන්නේ හෝ කේවල පදනම හෝ සාමූහික පදනම මත වන අතර, මූල්‍ය උපකරණවලට අදාළ කළඹෙහි ස්වභාවය මත එය පදනම් වේ. සාමූහික පදනමක් මත මිනුම්ගත කෙරෙන මූල්‍ය වත්කම් සමූහනය කිරීම සඳහා බැංකුව විසින් භාවිත කරනු ලබන ප්‍රතිපත්තිය පහත විස්තර කර ඇත. යම් මූල්‍ය උපකරණයක ඉතිරි වී ඇති ආයු කාලය තුළ ගෙවීම් නොලැබීමේ අවදානම වෙනසකට ලක් විය හැකිද යන්න සලකා බලමින් එහි ආරම්භක හඳුනා ගැනීමේ සිට ඊට අදාළ ණය අවදානම සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇතිද යන්න පිළිබඳ තක්සේරුවක් ඒ ඒ වාර්තාකරණ කාල සීමාව අවසානයේදී සිදු කිරීම වෙනුවෙන් බැංකුව සතුව ස්ථාපිත ප්‍රතිපත්තියක් තිබේ.

ඉහත ක්‍රියාවලිය මත පදනම්ව, බැංකුව පහත දක්වා ඇති පරිදි සිය ණය 1 අදියර, 2 අදියර, 3 අදියර සහ මිල දී ගත් හෝ උත්පාදිත ණය හානිකරණ වෙත සමූහනය කරයි:

1 අදියර : ණය පළමු වරට හඳුනා ගැනීමෙන් පසුව බැංකුව මාස 12 අපේක්ෂිත ණය අලාභ පදනම් කර ගෙන ඒ සඳහා කිසියම් ප්‍රතිපාදනයක් හඳුනා ගනී. ණය අවදානම ඉහළ ගොස් ඇති සහ 2 අදියරේ සිට නැවත වර්ගීකරණය කර ඇති ණය පහසුකම්ද 1 අදියරේ ණයවලට ඇතුළත් වේ.

2 අදියර : කිසියම් ණය පහසුකමක් උත්පාදනයේ සිට ණය අවදානම සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇති විට බැංකුව LTECL වෙනුවෙන් ප්‍රතිපාදනයක් වෙන්

කරයි. ණය අවදානම ඉහළ ගොස් ඇති සහ 3 අදියරේ සිට නැවත වර්ගීකරණය කර ඇති ණය පහසුකම්ද 2 අදියරේ ණයවලට ඇතුළත් වේ.

3 අදියර : ණය-හානිකරණ ලෙස සලකනු ලැබෙන ණය. බැංකුව LTECL වෙනුවෙන් ප්‍රතිපාදනයක් වෙන් කරයි.

POCI : මිල දී ගත් හෝ උත්පාදිත ණය හානිකරණ වත්කම් යනු ආරම්භක හඳුනා ගැනීම මත ණය හානිකරණයට ලක් වූ මූල්‍ය වත්කම් වේ. මිල දී ගත් හෝ උත්පාදිත ණය හානිකරණ ආරම්භක හඳුනා ගැනීමේදී සාධාරණ අගයට වාර්තා කෙරෙන අතර ඉන් අනතුරුව ඒවායෙහි පොලී ආදායම, ණය ගැලපූ සඵලදායී වාර්ෂික පොලී අනුපාතයක් මත පදනම්ව හඳුනා ගැනේ. අපේක්ෂිත ණය අලාභ හඳුනා ගනු ලැබෙන්නේ අපේක්ෂිත අලාභයෙහි සැලකිය යුතු වෙනසක් සිදු වන තාක් පමණි. වාර්තාකරණ දිනය වන විට බැංකුව සතුව මිල දී ගත් හෝ උත්පාදිත ණය-හානිකරණ කිසිවක් නොතිබිණ.

සම්පූර්ණ හිඟ වටිනාකම හෝ ඉන් කොටසක් අයකර ගැනීමේ සාධාරණ අපේක්ෂාවක් බැංකුව සතු නොවන මූල්‍ය වත්කම් සම්බන්ධයෙන් එකී වත්කමෙහි දළ ඉදිරියට ගෙන යන වටිනාකම අඩු කෙරේ. මෙය, එකී මූල්‍ය වත්කම (හෝ ඉන් කොටසක්) හඳුනා ගැනීමෙන් ඉවත් කිරීමක් ලෙස සැලකේ.

අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීම

සඵලදායී වාර්ෂික පොලී අනුපාතයට සාපේක්ෂව වට්ටම් කරන ලද අපේක්ෂිත මුදල් හිඟ වීම් මිනුම්ගත කිරීම සඳහා බැංකුව සම්භාවිතාව අනුව බර තැබීම පදනම් වන සිද්ධි හතරක් පාදකව අපේක්ෂිත ණය අලාභ ගණනය කරයි. මුදල් හිඟ වීමක් යනු ගිවිසුමකට අදාළව කිසියම් පාර්ශ්වයක් වෙත ගෙවිය යුතු මුදල් සහ එකී පාර්ශ්වය ලැබීමට අපේක්ෂා කරන මුදල් ප්‍රවාහ අතර වෙනස වේ.

අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීමේ ක්‍රමවේදය සහ ඊට අදාළ ප්‍රධාන සංරචක පහත දැක්වේ:

සම්භාවිතා හිඟය : සම්භාවිතා හිඟය යනු දෙන ලද යම් කාල සීමාවක් තුළ හිඟයක් ඇති වීමට ඇති හැකියාවයි. අදාළ පහසුකම ඊට පෙර හඳුනා ගෙන නොමැති නම් සහ ඒ වන විටත් කළඹට ඇතුළත්ව තිබේ නම් යම් නිශ්චිත කාලයක් තුළ පමණක් මෙවැනි හිඟතාවයක් ඇති වීමට ඉඩ ඇත.

හිඟ නිරාවරණය : මුල් මුදල හා පොලිය ආපසු ගෙවීම, නියම වී ඇත්තේ ගිවිසුමක් ප්‍රකාරවද නැතහොත් වෙනත් ආකාරයකින්ද යන්න, බැඳීමක් ඇති පහසුකම්වලින් අපේක්ෂිත පහත බැඳීම් සහ සිදු නොකොට ඇති ගෙවීම් වෙතින් ලැබෙන උපචිත පොලිය වැනි සාධක ආශ්‍රිතව වාර්තාකරණ දිනයෙන් පසුව සිදු වෙතැයි අපේක්ෂිත වෙනස් වීම් සැලකිල්ලට ගෙන කිසියම් අනාගත හිඟයක් ඇති විය හැකි දිනයක් වන විට සිදු විය හැකි නිරාවරණය පිළිබඳ තක්සේරුවක් හිඟ නිරාවරණය යන්නෙන් අදහස් වේ.

දෙන ලද කාලයකදී : දෙන ලද කාලයකදී අලාභ යනු කිසියම් දෙන ලද කාලයකදී හිඟයක් ඉස්මතු විය හැකි සිදුවීමකදී

අලාභ උද්ගත වන අලාභය තක්සේරු කිරීමකි. ඕනෑම ණය සුරැකුමක් රඳවා ගැනීමද ඇතුළත්ව ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ සහ ණය හිමියා ලබා ගැනීමට අපේක්ෂා කරන මුදල් ප්‍රවාහ අතර වෙනස මත මෙය පදනම් වේ. සාමාන්‍යයෙන් එය හිඟ නිරාවරණයෙහි ප්‍රතිශතයක් ලෙස ප්‍රකාශ කෙරේ.

අපේක්ෂිත ණය අලාභ තක්සේරු කිරීමේදී බැංකුව පාදක සිද්ධිය, හොඳම සිද්ධිය හා අවාසිදායකම සිද්ධිය යන සිද්ධි තුනක් සැලකිල්ලට ගනියි. මේ සෑම සිද්ධියක්ම එකිනෙකට වෙනස් සම්භාවිතා හිඟ, හිඟ නිරාවරණ සහ දෙන ලද කාලයකදී අලාභ හා බැඳී තිබේ. අදාළ අවස්ථාවලදී, ණය ආශ්‍රිත හිඟයන් සමනය වීමට ඇති සම්භාවිතාව සහ සුරැකුම් වටිනාකම හෝ වත්කම විකිණීමෙන් ලැබීමට ඉඩ ඇති වටිනාකම ඇතුළත්ව ගෙවීම් හිඟ සහිත ණය ආපසු අයකර ගැනීමට අපේක්ෂා කරන්නේ කෙසේද යන්න විමසීමද ඉහත සිද්ධි තක්සේරුවට ඇතුළත් වේ.

හානිකරණ අලාභ හා නිකුතු, මූල්‍ය වත්කමේ දළ ඉදිරියට ගෙන යන වටිනාකමෙහි ගැලපුමක් ලෙස ගිණුම්ගත කෙරෙන අලාභ හෝ ලාභවල වෙනස්වීම්වලින් වෙනස්ව ගිණුම්ගත කොට හෙළිදරව් කෙරේ.

අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීමේ ක්‍රමවේදය පහත සාරාංශ ගත කොට ඇත:

1 අදියර : මාස 12 අපේක්ෂිත ණය අලාභ, වාර්තාකරණ දිනයෙන් මාස 12 ක කාල සීමාවකට පසුව මූල්‍ය උපකරණයකට අදාළව සිදු විය හැකි ගෙවීම් හිඟ වීම් හේතුවෙන් ඉස්මතු වන අපේක්ෂිත ණය අලාභ නියෝජනය කරන LTECL කොටස ලෙස ගණනය කරනු ලැබේ. වාර්තාකරණ දිනයට මාස 12කට පසුව ගෙවීම් හිඟ වීමක් පිළිබඳ අපේක්ෂාව පදනම් කරගෙන බැංකුව මාස 12 අපේක්ෂිත ණය අලාභ ගණනය කරයි. එකී මාස 12 හිඟ සම්භාවිතා පුරෝකථනිත හිඟ නිරාවරණ සඳහා අදාළ කෙරෙන අතර ඉන් පසුව අපේක්ෂිත දෙන ලද කාලයක අලාභවලින් එය ගුණ කොට මුල් සඵලදායී පොලී අනුපාතයට සාපේක්ෂ වටිනාකමක් වට්ටම් කෙරේ. ඉහත විස්තර කරන ලද සිද්ධි තුන සඳහාම මෙම ගණනය කිරීම සිදු කරයි.

2 අදියර : කිසියම් ණය පහසුකමක් උත්පාදනයේ සිට ණය අවදානම සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇති විට බැංකුව LTECL වෙනුවෙන් ප්‍රතිපාදනයක් වෙන් කරයි. එම ක්‍රමවේදය ඉහත විස්තර කර ඇති ක්‍රමවේදයට සමාන වන අතර බහුවිධ සිද්ධි භාවිත කිරීමද ඊට ඇතුළත් වේ. නමුත්, සම්භාවිතා හිඟය සහ දෙන ලද කාලයක අලාභ තක්සේරු කරනුයේ අදාළ උපකරණයේ ආයුකාලය පුරාවට වේ. අපේක්ෂිත මුදල් ප්‍රවාහ හිඟ වීම් මුල් සඵලදායී පොලී අනුපාතයට සාපේක්ෂ වටිනාකමකින් වට්ටම් කෙරේ.

3 අදියර : ණය හානිකරණ ලෙස සලකනු ලැබෙන ණයවලට අදාළව බැංකුව ආයු කාලය තුළ අපේක්ෂිත ණය අලාභ හඳුනා ගනී. එම ක්‍රමවේදය ඉහත විස්තර කර ඇති ක්‍රමවේදයට සමාන වන අතර සම්භාවිතා හිඟය 100% ක් ලෙස සැලකේ.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

POCI : මිල දී ගත් හෝ උත්පාදිත ණය-හානිකරණ වත්කම් යනු ආරම්භක හඳුනා ගැනීම මත ණය හානිකරණයට ලක් කරන ලද මූල්‍ය වත්කම් වේ. බැංකුව ආරම්භක හඳුනා ගැනීමේ සිට ආයු කාලයෙහි සමුච්චිත වෙනස්කම් පමණක් හඳුනා ගන්නා අතර, එම ක්‍රියාවලිය, ණයවලට ගැලපූ සුදුසු සළුලදායී වාර්ෂික පොලී අනුපාතයෙන් වට්ටම් කරන ලද ඉහත සිද්ධි හතර පිළිබඳ සම්භාවිතාව මත බර තැබීමක් මත පදනම්ව සිදු කරයි. වාර්තාකරණ දිනය වන විට බැංකුව සතුව මිල දී ගත් හෝ උත්පාදිත ණය-හානිකරණ කිසිවක් නොතිබිණ.

මූල්‍ය ඇප ගිවිසුම් : ණය කාඩ්පත් සහ ණය පහසුකමක් සහ ලබා නොගත් ණය ගිවිසුම් බැඳීමක් යන දෙකම ඇතුළත් පිළිවැටුම් ණය පහසුකම්වලට අදාළව අපේක්ෂිත ණය අලාභ අදාළ ණය පහසුකමද සමගින් ගණනය කොට ඉදිරිපත් කෙරේ. ණය බැඳීම්වලට අදාළව අපේක්ෂිත ණය අලාභ අදාළ ප්‍රතිපාදන ඇතුළත හඳුනා ගැනේ.

කේවල වශයෙන් වැදගත් වන ණය පහසුකම් වෙනුවෙන් අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීම

බැංකුව පළමුවෙන්ම බැංකුවට කේවල වශයෙන් වැදගත් වන මූල්‍ය වත්කම්වලට අදාළ අපේක්ෂිත ණය අලාභ තනි තනිව තක්සේරු කරයි. එවැනි වත්කම් හානිකරණය වී නොමැති බවට බැංකුව විසින් තීරණය කරනු ලැබෙන අවස්ථාවලදී (3 අදියරේදී නොවේ) සමාන ණය අවදානම් ලක්ෂණ දරන මූල්‍ය වත්කම් සමූහයක් තුළට එම වත්කම අයත් වන අතර එකී වත්කම් හානිකරණය සඳහා සාමූහිකව තක්සේරු කෙරේ. කෙසේ වෙතත්, හානිකරණය වෙනුවෙන් කේවල වශයෙන් තක්සේරු කෙරෙන සහ හානිකරණ අලාභයක් හඳුනා ගෙන ඇති හෝ හඳුනා ගැනෙමින් පවතින වත්කම් සාමූහික හානිකරණ තක්සේරුවකට ඇතුළත් නොකෙරේ.

අදාළ වත්කම හානිකරණය වී ඇත්නම්, මුල් වරට පැවැති සළුලදායී පොලී අනුපාතයට අනුව එකී වත්කමින් අපේක්ෂිත අනාගත මුදල් ප්‍රවාහ වට්ටම් කිරීම සහ මූල්‍ය වත්කමේ වත්මන් ඉදිරියට ගෙන යන වටිනාකම සමගින් එහි වත්මන් වටිනාකම සංසන්දනය කිරීම තුළින් එහි අලාභ වටිනාකම මිනුම්ගත කරනු ලැබේ. කේවල වශයෙන් වැදගත් ගිණුම් හානිකරණය කිරීම් සුදුසු අවස්ථාවලදී වඩාත් නිරන්තර පදනමක් මත සමාලෝචනය කෙරේ. සාමාන්‍යයෙන්, රඳවා ගන්නා ලද ඕනෑම ණය සුරුකුමක බලාත්මක කළ හැකි බව සහ එහි සත්‍ය හා අපේක්ෂිත ගෙවීම් ලැබීම්වලට අදාළ කාලය හා වටිනාකම නැවත තක්සේරු කිරීමද ඊට ඇතුළත් වේ. සිදු කරන ලද අලාභ ඇස්තමේන්තුවෙහි අඩු වීමක් සිදු විය හැකි බවට සාධාරණ හා වාස්තවික සාක්ෂියක් පවතින විට පමණක් කේවල වශයෙන් සිදු කරන ලද හානිකරණයන් නිකුත් කරනු ලැබේ. හානිකරණය කරන ලද වත්කම් මත පොලිය වට්ටම නිදහස් කිරීම ඔස්සේ හඳුනා ගැනේ.

කේවල වශයෙන් වැදගත් මූල්‍ය වත්කම්වලට අදාළ අපේක්ෂිත ණය අලාභ තීරණය කළ පසුව පහත සාධක සලකා බැලේ:

- ලබා නොගතත් නිරාවරණයන්ද ඇතුළුව ගනුදෙනුකරු වෙතට සිදු වන සමුච්චිත නිරාවරණය
- ගනුදෙනුකරුගේ ව්‍යාපාරික ආකෘතිය සතු ජීව්‍යතාව සහ මූල්‍යමය දුෂ්කරතා මධ්‍යයේ වුවද සාර්ථක ලෙස වෙළෙඳාමේ යෙදීමට හා ණය බැඳීම් ඉටු කිරීම උදෙසා ප්‍රමාණවත් මුදල් ප්‍රවාහ ජනනය කිරීමට ඇති හැකියාව.
- ගෙවීම් හා අයකර ගැනීම් ලැබීමට අපේක්ෂිත කාලය හා වටිනාකම්
- අනෙකුත් ණයකරුවන්ගේ බැඳීම් බැංකුවේ බැඳීම් අභිබවමින් හෝ ඊට සමානව ශ්‍රේණිගත වන තරම සහ ඔවුන් බැංකුවට සහාය දැක්වීම දිගටම සිදු කිරීමට ඇති හැකියාව
- සමුච්චිත වටිනාකම තීරණය කිරීමේ සංකීර්ණතාව හා ණයකරුවන්ගේ සියලුම හිමිකම් පෑම් ශ්‍රේණිගත කිරීම සහ නෛතික හා රක්ෂණ අවිනිශ්චිතතා පවතින තරම
- සුරැකුමෙහි උපයා ගත හැකි වටිනාකම (හෝ වෙනත් ණය අවම කිරීමේ විධිවිධාන) සහ සාර්ථක ලෙස ණය පියවා ගැනීමට ඇති හැකියාව
- හිඟ මුදල් අයකර ගැනීමේදී දරන්නට සිදු වන කවර හෝ පිරිවැයක් වේ නම් එය අඩු කර ගැනීමට ඇති හැකියාව
- අදාළ ණය පහසුකම දේශීය මුදල් ඒකකයෙන් දක්වා නොමැති නම් එම ණය ලබා ගන්නා පාර්ශ්වයට ණය මුදල් ඒකකයෙන් ගෙවීම් ලබා ගැනීමට සහ සිදු කිරීමට ඇති හැකියාව
- ඈවර කිරීමකදී හෝ බංකොලොත් වීමකදී ලාභාංශ ලබා ගත හැකි වීම

වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ අගයට මිනුම්ගත කෙරෙන ණය උපකරණ

වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ අගයට මිනුම්ගත කෙරෙන ණය උපකරණවලට අදාළ අපේක්ෂිත ණය අලාභ ඇස්තමේන්තු මගින් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි එකී මූල්‍ය වත්කම්වල ඉදිරියට ගෙන යනු ලබන ශේෂය (සාධාරණ අගයට පවතින) අඩු නොකෙරේ. ඒ වෙනුවට, වත්කම් ක්‍රමක්ෂිත පිරිවැය මත හඳුනා ගතහොත් ලැබිය හැකි ප්‍රතිපාදන වටිනාකමට සමාන වටිනාකමක්, සමුච්චිත හානිකරණ වටිනාකමක් ලෙස වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයෙහි හඳුනා ගැනෙන අතර ඊට අදාළ ගාස්තු/වියදම්ද ආදායම් ප්‍රකාශනයෙහි හඳුනා ගැනේ. වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයෙහි හඳුනා ගැනෙන සමුච්චිත අලාභය වත්කම් හඳුනා ගැනීමෙන් ඉවත් කිරීමෙන් පසුව ලාභ හා අලාභ වෙත විතැන් කෙරේ.

මිල දී ගත් හෝ උත්පාදිත ණය-හානිකරණ වත්කම්

මිල දී ගත් හෝ උත්පාදිත ණය-හානිකරණ වත්කම්වලට අදාළව බැංකුව අලාභ ප්‍රතිපාදනවල ආරම්භක හඳුනා ගැනීමේ සිට LTECL සිදුව ඇති සමුච්චිත වෙනස්කම් පමණක් හඳුනා ගනී.

ඉදිරි දැක්මක් සපයන තොරතුරු

බැංකුව සිය අපේක්ෂිත ණය අලාභ ආකෘති සම්බන්ධයෙන් ආර්ථික යෙදවුම් ලෙස සලකමින් පුළුල් පරාසයක විහිදෙන ඉදිරි දැක්මක් සපයන තොරතුරු මාලාවක් මත රඳා පවතී. ඒ අතරට පහත තොරතුරු ඇතුළත් වේ:

- දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය
- උද්ධමන අනුපාතය
- පොලී අනුපාත

- ඇ.ඩො.:රු විනිමය අනුපාත
- රැකියා වියුක්ති අනුපාතය

අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීම සඳහා භාවිත කෙරෙන යෙදවුම් හා ආකෘති මගින් මූල්‍ය ප්‍රකාශන දිනය වන විට පවතින වෙළෙඳපොල ලක්ෂණ සියල්ලම ග්‍රහණය නොවීමට ඉඩ ඇත. එබැවින්, එවැනි වෙනස් වීම් සැලකිය යුතු තරමින් වැදගත් වන අවස්ථාවලදී තාවකාලික ගැලපුම් වශයෙන් කලාතුරකින් ගුණාත්මක ගැලපුම් හෝ අවදානම් ආවරණයන් සිදු කරනු ලැබේ. මේ නිසා, බැංකුව පහත දැක්වෙන ගුණාත්මක සාධක වෙතද අවධානය යොමු කරයි.

- වටිනාකමට ණය අනුපාතයේ සාමාන්‍යය
- රජයේ ප්‍රතිපත්ති
- කර්මාන්තයේ ව්‍යාපාරවල ස්වභාවය
- නියාමන බලපෑම්

5.1.3- ඇපකර ප්‍රමාණනය

බැංකුව සිය මූල්‍ය වත්කම් මත ඇති විය හැකි ණය අලාභ අවම කර ගනු පිණිස හැකි අවස්ථාවලදී ඇපකර භාවිත කිරීමට අපේක්ෂා කරයි. මෙම ඇපකර විවිධ ස්වරූප ගන්නා අතර ඒ අතරට මුදල්, සුරැකුම්, ණයවර/ඇප ලිපි, දේපල, ලැබීම්, ඉන්වෙන්ටරි, තුලනය කිරීමේ විධිවිධාන වැනි අනෙකුත් මූල්‍ය නොවන වත්කම් හා ණය වැඩිදියුණු කිරීම ආදිය ඇතුළත් වේ. SLFRS 9 යටතේ බැංකුවේ ණය ලබා දීමේ ක්‍රියාවලීන් ඔස්සේ පැවරෙන ඇපකරවලට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්තිය LKAS 39 යටතේ වන ප්‍රතිපත්තියම වේ.

5.1.3.1 නැවත ලබා ගත් ඇපකර

නැවත අත්කර ගත් වත්කමක් බැංකුවේ අභ්‍යන්තර මෙහෙයුම් සඳහා යොදා ගත යුතුද, නැතහොත් විකුණා දැමිය යුතුද යන්න තීරණය කිරීමද බැංකුවේ ප්‍රතිපත්තිය වේ. අභ්‍යන්තර මෙහෙයුම් සඳහා යොදා ගැනීමට ප්‍රයෝජනවත් බවට තීරණය කරනු ලැබෙන වත්කම් ඒවා නැවත අත්කර ගත් වටිනාකමට වඩා අඩු වටිනාකමකින් හෝ සුරැකුම් කරන ලද මුල් වටිනාකම්න් අදාළ වත්කම් කාණ්ඩය වෙත පැවරේ. විකුණා දැමීම වඩා හොඳ විකල්පය බවට තීරණය කෙරෙන වත්කම් බැංකුවේ ප්‍රතිපත්තියට අනුකූල වන පරිදි ඒවායෙහි සාධාරණ අගයට (මූල්‍ය වත්කම් නම්) සහ මූල්‍ය නොවන වත්කම් නම් ඒවා නැවත අත්කර ගත් දිනට පවතින විකිණුම් වටිනාකම සාධාරණ අගයෙන් අඩු කළ විට ලැබෙන වටිනාකමට විකිණීම පිණිස රඳවා ඇති වත්කම් කාණ්ඩයට පවරනු ලැබේ.

බැංකුව සිය සාමාන්‍ය ව්‍යාපාරික මෙහෙයුම් අතරතුර දී දේපල හෝ සිය සුළු කළඹෙහි ඇතුළත් වෙනත් වත්කම් භෞතික වශයෙන් නැවත අත්කර ගැනීමක් සිදු නොකරන අතර එහි හිඟ ණය පියවීම උදෙසා සාමාන්‍යයෙන් වෙන්දේසියකදී අදාළ අරමුදල් ආපසු අයකර ගැනීම සඳහා බාහිර නියෝජිතයන්ගේ සේවය ලබා ගනී. කවර හෝ අතිරික්ත අරමුදලක් තිබේ නම් එය ගනුදෙනුකරුවන්/බන්ධන්දායියන් (obligor) වෙත ආපසු ගෙවනු ලැබේ. මෙම ක්‍රමවේද හේතුවෙන් නෛතික ආපසු අයකර ගැනීමේ ක්‍රියාවලීන් යටතේ පදිංචි දේපල කිසිවක් ශේෂ පත්‍රයෙහි වාර්තා නොකෙරේ.

5.1.4 ලියා හැරීම්

බැංකුව කිසියම් අයකර ගැනීමේ ක්‍රියාවලියක් නවතා දමා ඇත්නම් පමණක් මූල්‍ය වත්කම් කොටස් වශයෙන් හෝ සම්පූර්ණයෙන් ලියා හරිනු ලැබේ. ලියා හැරීමට නියමිත වටිනාකම සමුච්චිත අලාභ ප්‍රතිපාදනයට වඩා විශාල වන්නේ නම්, පළමුව වී අතර ඇති වෙනස ප්‍රතිපාදනයට අමතරව එක් කිරීමක් ලෙස සලකනු ලබන අතර ඉන් අනතුරුව දළ ඉදිරියට ගෙන යන වටිනාකමට සාපේක්ෂව එය යොදනු ලැබේ. ඉන් පසුව සිදු කෙරෙන අයකර ගැනීම් කිසිවක් වේ නම් ණය අලාභ වියදම් වලට බැර කරනු ලැබේ.

5.1.5 වළක්වාලන ලද හෝ සංශෝධිත ණය

ණය ගැනුම්කරුගේ මූල්‍ය දුෂ්කරතාවලට ප්‍රතිචාර වශයෙන් ඇපකරවල අයිතිය අත්පත් කර ගැනීම හෝ ඇපකර රැස්කර ගැනීම බලාත්මක කිරීම වෙනුවට බැංකුව ඇතැම් අවස්ථාවලදී ණය පහසුකමට අදාළ මුල් නියමයන් සම්බන්ධයෙන් සංශෝධනය කිරීම් හෝ සහන සැලසීම් සිදු කරයි. ගැනුම්කරුගේ වත්මන් හෝ අනාගතයේ අපේක්ෂිත මූල්‍ය දුෂ්කරතාවල ප්‍රතිඵලයක් ලෙස එවැනි ණය සහන හෝ සංශෝධන ලබා දී ඇති විට බැංකුව එවැනි ණයක් වළක්වාලන ලද ණයක් ලෙස සලකන අතර, ගැනුම්කරු මූල්‍යමය වශයෙන් සවිමත්ව සිටී නම් බැංකුව ඒවාට එකඟ නොවනු ඇත. මෙම මූල්‍ය දුෂ්කරතා ප්‍රකට කරණ සාධක අතරට ගිවිසුම් හෝ ණය අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් අවධානයට ලක් කරන ලද වෙනත් සැලකිය යුතු තරමේ ගැටළු ආදිය ඇතුළත් වේ. සහන යටතේ ගෙවීමේ වැඩපිළිවෙළට දීර්ඝ කිරීම් හා නව ණය කොන්දේසි වෙත එකඟ වීමද ඇතුළත් විය හැක. අදාළ කොන්දේසි වෙත එකඟ වීමෙන් අනතුරුව, කවර හෝ හානිකරණයක් වේ නම් එය කොන්දේසි සංශෝධනය කිරීමට පෙර පැවැති මුල් සඵලදායී වාර්ෂික පොලී අනුපාතය ඇසුරින් ගණනය කෙරේ. අනාගතයේදී ණය ආපසු ගෙවීම් අඛණ්ඩව සිදු වනු ඇති බව සහතික කරනු පිණිස සහන යටතේ ගෙවීමේ පහසුකම් සැලසූ ණය අධීක්ෂණයට ලක් කිරීම බැංකුවේ ප්‍රතිපත්තිය වේ. හඳුනාගැනීමෙන් ඉවත් කිරීමේ තීරණ හා 2 හා 3 අදියර යටතේ වර්ගීකරණය කිරීම් සිද්ධියෙන් සිද්ධිය සලකා බැලීමේ පදනම මත සිදු කෙරේ. එම ක්‍රමවේද මගින් කිසියම් ණයකට අදාළ අලාභයක් ඇති බව හඳුනා ගැනෙන්නේ නම් එය හෙළිදරව් කොට එය අයකර ගන්නා හෝ ලියාහරින තෙක් 3 අදියරේ හානිකරණයට ලක් කරන ලද සහන යටතේ ගෙවීමේ පිළිවෙළ සැලසූ ණයක් ලෙස කළමනාකරණය කරනු ලැබේ.

කිසියම් ණයකට අදාළ කොන්දේසි වෙනස් කර ඇති හෝ සංශෝධනය කර ඇති නමුත් හඳුනා ගැනීමෙන් ඉවත් කොට නොමැති විට, මෙහි 21.3 සටහනෙහි දක්වා ඇති පරිදි ණය අවදානම ආශ්‍රිත සැලකිය යුතු ඉහළ යාමක් වේද යන්න හඳුනා ගනු පිණිස එය නැවත තක්සේරු කිරීමටද බැංකුව පියවර ගනියි. එමෙන්ම, එකී වත්කම් 3 අදියර යටතේ වර්ගීකරණය කළ යුතුද යන්නද බැංකුව සලකා බලයි.

5.1.6 පූර්වාවරණය කරන වත්කම්

පූර්වාවරණය කරන ලද වත්කම්, ණය සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් බේරුම් කිරීමෙන් අත්කර ගත් දේපළ නියෝජනය කරන අතර, පූර්වාවරණය කරන ලද වත්කම් වල වර්තමාන වෙළඳපොල අගයට සහ අදාළ ණය මුදලේ හිඟහිටි මුදල එකී දේපළ අත්කරගත් වර්ෂය තුළ ආදායම් ප්‍රකාශයේ ණය තෘප්තිමත්

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

කිරීමේදී ඇති වන ණය අලාභ සඳහා වන ප්‍රතිපාදනයක් සේ හඳුනාගනු ලබයි.

5.1.7 හිලව් කරනු ලැබූ මූල්‍ය මෙවලම්

මූල්‍ය වත්කම් හා මූල්‍ය බැරකම් හිලව් කරනු ලබන අතර හඳුනාගනු ලැබූ ප්‍රමාණ හිලව් කිරීම සඳහා ගත් අවස්ථාවේ බලාත්මක යම් නෛතික අයිතියක් ඇත්නම් සහ ශුද්ධ පදනම මත පියවීමට හෝ වත්කම් උපලබ්ධි කොට බැරකම පියවීමට එකවර ක්‍රියාකිරීමට යම් අපේක්ෂාවක් ඇතිනම් පමණක් අදාළ ශුද්ධ අගය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි වාර්තා කරනු ලැබේ. ගෙවීම් පැහැර හැරීමකදී සියළුම බැරකම් එකවර පියවීම පිළිබඳ ගිවිසුම් සම්බන්ධයෙන් මෙය පොදුවේ අදාළ නොවන බැවින් ආශ්‍රිත වත්කම් හා බැරකම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි දළ වශයෙන් දක්වනු ලැබ ඇත.

5.2 දේපල, පිරියත හා උපකරණ

වත්කම් හා බැඳුනු අනාගත ආර්ථික ප්‍රතිලාභ බැංකුව වෙත ගලා ඒම්ම සහ වත්කමෙහි පිරිවැය විශ්වසනීය ලෙස මැනිය හැකි නම් දේපළ, පිරියත සහ උපකරණ හඳුනා ගැනේ.

දේපළ, පිරියත සහ උපකරණ වල පිරිවැයෙන් ඒවායේ දෛනික සේවා කිරීමේ පිරිවැය අත්හැර උපචිත ක්ෂය කිරීම් හා වටිනාකමේ උපචිත හානිකරණ අඩු කොට දක්වනු ලබයි. අපේක්ෂිත ප්‍රයෝජනවත් ජීවකාලයේ යෝග්‍ය පරිදි ක්ෂය කිරීම් කාල පරිච්ඡේදය හෝ ක්‍රමවේදය වෙනස් කිරීම මගින් ගණන්දීම සිදුකරනු ලබන අතර ගිණුම්කරණ ඇස්තමේන්තුවලදී වෙනස්කම් සේ සලකනු ලබයි. වත්කම් භාවිතය සඳහා පවත්නා අවස්ථාවේ සිට ආරම්භ කර ඒවායේ ප්‍රයෝජනවත් ජීවකාලයේ ක්ෂයවීම සරල මාර්ග පදනමින් ආදායම් ප්‍රකාශනයෙහි දක්වනු ලබයි. කෙසේ වෙතත්, ඉඩම් ක්ෂය කිරීමට ලක් නොකෙරේ.

තක්සේරු කරන ලද වත්කම් ආයුකාල පහත පරිදි වේ:

ගොඩනැගිලි වාර්ෂිකව	5%
පරිගණක උපකරණ වාර්ෂිකව	20%
කාර්යාල උපකරණ වාර්ෂිකව	20%
මෝටර් රථවාහන වාර්ෂිකව	20%
ගෘහ භාණ්ඩ වාර්ෂිකව	15%
යකඩ සේප්පු වාර්ෂිකව	10%
බෙදුම් හා සවි කිරීම් වාර්ෂිකව	20%

පසු වියදම්වල අනාගත ආර්ථික ප්‍රතිලාභ බැංකුව වෙත ගලා ඒම සසම්භාවී වන විට එම වියදම් ප්‍රාග්ධනීකරණය කෙරෙනු ඇත.

දේපල, පිරියත හා උපකරණය යටතට ගැනෙන කිසියම් අයිතමයක ඉදිරියට ගෙන යනු ලබන වටිනාකම එය බැහැර කිරීමේදී හෝ එය භාවිත කිරීමෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ කිසිවක් අපේක්ෂා කළ නොහැකි විට හඳුනා ගැනීමෙන් ඉවත් කෙරේ. කිසියම් වත්කමක් හඳුනා ගැනීමෙන් ඉවත් කිරීමකදී ඇති වන (බැහැර කිරීමේ ශුද්ධ ආදායම සහ වත්කමෙහි ධාරණ අගය අතර වෙනස වශයෙන් ගණනය කරනු ලබන) ලාභය හෝ අලාභය අදාළ වත්කම පිළිගැනීම අහෝසි කරනු ලැබූ වර්ෂයේ ආදායම් ප්‍රකාශනයෙහි වෙනත් මෙහෙයුම් - ආදායම්/වියදම් යටතේ දක්වනු ලබයි.

සිදු කෙරෙමින් පවතින ප්‍රාග්ධන කාර්යයන් ඒවායේ පිරිවැය මත දක්වනු ලැබේ. ඒවා, ගොඩනැගිලි ඉදිකිරීමට අදාළව සෘජුව දරන ලදුව ප්‍රාග්ධනීකරණයට නියමිත ප්‍රාග්ධන ස්වභාවයේ වියදම් වේ.

5.3 කල්බදු

මෙම ප්‍රතිපත්තිය 1 ජනවාරි 2019 දින හෝ ඊට පසු ඇතුළත් කරන ලද (හෝ වෙනස් කරන ලද) කොන්ත්‍රාත්තු සඳහා අදාළ වේ.

කොන්ත්‍රාත්තුවක් ආරම්භයේ දී, කොන්ත්‍රාත්තුවක් බදු දීමක් ද, හෝ ඇතුලත් වන්නක් ද යන්න බැංකුව තක්සේරු කරයි. කොන්ත්‍රාත්තුවක් යනු, හෝ ඇතුලත් වන්නක් යනු කොන්ත්‍රාත්තුව සලකා බැලීම වෙනුවට යම් කාලයක් සඳහා හඳුනාගත් වත්කමක් භාවිතා කිරීම පාලනය කිරීමේ අයිතිය ප්‍රකාශ කරන්නේ නම්. කොන්ත්‍රාත්තුවක් මගින් හඳුනාගත් වත්කමක් භාවිතා කිරීම පාලනය කිරීමේ අයිතිය ප්‍රකාශ කරන්නේද යන්න තක්සේරු කිරීම සඳහා, බැංකුව SLFRS 16 කල්බදු අර්ථ දැක්වීම භාවිතා කරයි

5.3.1 බැංකුව බදු ගෙවන්නෙකු ලෙස ක්‍රියා කරයි

කල්බදු සංරචකයක් අඩංගු කොන්ත්‍රාත්තුවක් ආරම්භයේදී හෝ වෙනස් කිරීමේදී බැංකුව විසින් එක් එක් කල්බදු සංරචකයට කොන්ත්‍රාත්තුවේ සලකා බැලීම එහි සාපේක්ෂ ස්ථාවර තනි මිල මත වෙන් කරනු ලැබේ. කෙසේ වෙතත්, ශාඛා සහ කාර්යාල පරිශ්‍ර බදු දීම සඳහා කල්බදු නොවන සංරචක සහ කල්බදු නොවන සංරචක සඳහා ගිණුම් තනි බදු සංරචකයක් ලෙස වෙන් නොකිරීමට බැංකුව තීරණය කර ඇත.

කල්බදු ආරම්භ කරන දිනයේදී භාවිතා කිරීමේ අයිතිය සහිත වත්කමක් සහ කල්බදු වගකීමක් ලෙස බැංකුව විසින් හඳුනාගනු ලැබේ. භාවිතා කිරීමේ අයිතිය සහිත වත්කම් මුලින් මනිනු ලබන්නේ පිරිවැය මත වන අතර එය ආරම්භක දිනයට හෝ ඊට පෙර සිදු කරන ලද ඕනෑම කල්බදු ගෙවීම් සඳහා සකස් කරන ලද කල්බදු වගකීමේ ආරම්භක මුදල හා සිදු කරන ලද ඕනෑම ආරම්භක සෘජු පිරිවැය සහ ශාඛා හෝ කාර්යාල පරිශ්‍රයට සිදු කරන ලද ඕනෑම වැඩිදියුණු කිරීමක් විසුරුවා හැරීමට සහ ඉවත් කිරීමට පිරිවැය ඇස්තමේන්තුවකින් සමන්විත වේ.

භාවිතයේ අයිතිය සහිත වත්කම පසුව ආරම්භක දිනයේ සිට කල්බදු කාලය අවසන් වන තෙක් සරල රේඛා ක්‍රමය භාවිතා කරමින් ක්ෂය කෙරේ. මීට අමතරව, භාවිතයේ අයිතිය සහිත වත්කම වරින් වර හානිකරණ අලාභ මගින් අඩු කරනු ලැබේ, එවැන්නක් ඇත්නම් කල්බදු වගකීමේ ඇතැම් ප්‍රතිමිනුම් සඳහා ගලපනු ලැබේ.

කල්බදු වගකීම මුලින් මනිනු ලබන්නේ ආරම්භක දිනයේ දී නොගෙවනු ලබන කල්බදු ගෙවීම්වල වර්තමාන වටිනාකම මත වන අතර, බදු දී ඇති පොලී අනුපාතය භාවිතා කරමින් වට්ටම් කරනු ලැබේ හෝ, එම අනුපාතය පහසුවෙන් තීරණය කළ නොහැකි නම්, බැංකුවේ වර්ධක ණය අනුපාතය භාවිත කරයි. සාමාන්‍යයෙන්, බැංකුව වට්ටම් අනුපාතය ලෙස එහි වර්ධක ණය අනුපාතය භාවිතා කරයි.

බැංකුව විවිධ බාහිර මූලාශ්‍ර වලින් ලබාගත් ණය ගැනීම් විශ්ලේෂණය කිරීමෙන් එහි වර්ධක ණය අනුපාතය තීරණය කරන අතර බදු දීමේ කොන්දේසි සහ බදු දී ඇති වත්කම් වර්ගය පිළිබිඹු කිරීම සඳහා යම් යම් ගැලපීම් සිදු කරයි.

කල්බදු වගකීම් මැනීම සඳහා ඇතුළත් කර ඇති බදු ගෙවීම් පහත සඳහන් දෑ වලින් සමන්විත වේ:

- ද්‍රව්‍යස්ථාවර ගෙවීම් ඇතුළුව ස්ථාවර ගෙවීම්. -
- දර්ශකයක් හෝ අනුපාතයක් මත රඳා පවතින විචල්‍ය කල්බදු ගෙවීම්, ආරම්භක දිනය වන විට දර්ශකය හෝ අනුපාතය භාවිතා කරමින් මුලින් මනිනු ලැබේ. -
- අවශේෂ වටිනාකම් සහතිකයක් යටතේ ගෙවිය යුතු යැයි අපේක්ෂා කරන මුදල; සහ -
- බැංකුව විසින් ක්‍රියාත්මක කිරීමට සාධාරණ ලෙස නිශ්චිත වන මිලදී ගැනීමේ විකල්පයක් යටතේ ක්‍රියාත්මක කරන මිල, බැංකුව විසින් දීර්ඝ කිරීමේ විකල්පයක් ක්‍රියාත්මක කිරීමට සාධාරණ ලෙස නිශ්චිත නම් විකල්ප අළුත් කිරීමේ කාල පරිච්ඡේදයක් තුළ කල්බදු ගෙවීම් සහ කල්බදු ඉක්මනින් අවසන් නොකිරීම සඳහා වන දඩ මුදල් බැංකුව විසින් කලින් අවසන් නොකිරීමට සාධාරණ ලෙස සහතික නොවන්නේ නම්

කල්බදු වගකීම මනිනු ලබන්නේ සථලදායී පොලී ක්‍රමය භාවිතා කරමින් ක්‍රමක්ෂය පිරිවැයෙනි. අවශේෂ වටිනාකම් ඇපකරයක් යටතේ ගෙවිය යුතු අපේක්ෂිත මුදල පිළිබඳ බැංකුවේ ඇස්තමේන්තුවේ වෙනසක් සිදු වුවහොත්, මිලදී ගැනීමක්, දීර්ඝ කිරීමක් හෝ අවසන් කිරීමේ විකල්පයක් භාවිතා කරන්නේද යන්න පිළිබඳ තක්සේරුව බැංකුව විසින් වෙනස් කරන්නේ නම් හෝ ද්‍රව්‍ය ස්ථාවර කල්බදු ගෙවීමේ සංශෝධිතයක් තිබේ නම්, දර්ශකයක් හෝ අනුපාතයක වෙනසක් හේතුවෙන් අනාගත කල්බදු ගෙවීම්වල වෙනසක් සිදු වූ විට එය නැවත මනිනු ලැබේ.

කල්බදු වගකීම මේ ආකාරයෙන් නැවත මනිනු ලබන විට, භාවිතයේ අයිතිය සහිත වත්කම් වල රැගෙන යාමේ මුදලට අනුරූප ගැලපීමක් සිදු කරනු ලබන අතර භාවිතයේ අයිතිය සහිත වත්කම් වල රැගෙන යාමේ වටිනාකම ශූන්‍ය දක්වා අඩු කර ඇත්නම් ලාභ හෝ අලාභ ගිණුමේ වාර්තා කරයි.

බැංකුව විසින් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ භාවිතා කිරීමේ අයිතිය සහිත වත්කම් වෙන වෙනම සහ වෙනත් වගකීම් යටතේ කල්බදු වගකීම් ඉදිරිපත් කරයි.

5.3.1.1 අඩු වටිනාකම් සහිත වත්කම් වල කල්බදු සහ කෙටි කාලීන කල්බදු

අඩු වටිනාකමකින් යුත් වත්කම් සහ කෙටි කාලීන කල්බදු සඳහා භාවිතා කිරීමේ අයිතිය ඇති වත්කම් සහ කල්බදු වගකීම් හඳුනා නොගැනීමට බැංකුව තීරණය කර ඇත. මෙම කල්බදු හා සම්බන්ධ කල්බදු ගෙවීම් කල්බදු කාල සීමාව තුළ සරල රේඛා පදනමක් මත කරන ලද වියදමක් ලෙස බැංකුව විසින් පිළිගනු ලැබේ.

5.3.2 බැංකුව බදු ගෙවන්නෙකු ලෙස ක්‍රියා කරයි

කල්බදු සංරචකයක් අඩංගු කොන්ත්රාත්තුවක් ආරම්භයේ දී හෝ වෙනස් කිරීමේදී, බැංකුව විසින් කොන්ත්රාත්තුවේ වටිනාකම ඔවුන්ගේ සාපේක්ෂ ස්ථාවර විකුණුම් මිල ගණන් මත පදනම්ව එක් එක් කල්බදු සංරචකයට වෙන් කරනු ලැබේ.

බැංකුව බදු කරුවෙකු ලෙස ක්‍රියාකරන විට, බදු දීම මූල්‍ය කල්බදු හෝ මෙහෙයුම් කල්බදු ද යන්න කල්බදු ආරම්භයේ දී තීරණය කරයි.

එක් එක් කල්බදු වර්ගීකරණය කිරීම සඳහා, කල්බදු මගින් යටින් පවතින වත්කම් වල හිමිකාරිත්වයට ආනුෂංගික අවදානම් සහ ප්‍රතිලාභ සියල්ලම සැලකිය යුතු ලෙස මාරු කරන්නේද යන්න පිළිබඳ සමස්ත තක්සේරුවක් බැංකුව විසින් සිදු කරනු ලැබේ. මෙය එසේ නම්, බදු දීම මූල්‍ය කල්බදු වේ; එසේ නොවේ නම්, එය මෙහෙයුම් බදු දීමකි. මෙම ඇගයීමේ කොටසක් ලෙස, බදු, වත්කම්වල ආර්ථික ජීවිතයේ ප්‍රධාන කොටසක් ද යන්න වැනි ඇතැම් දර්ශක බැංකුව විසින් සලකා බලයි.

කල්බදු වල ශුද්ධ ආයෝජනය සඳහා SLFRS 09 හි හඳුනා නොගැනීම හා හානිකරණ අවශ්‍යතා බැංකුව විසින් යොදා ගනී. කල්බදු වල දළ ආයෝජනය ගණනය කිරීමේදී කරන ඇස්තමේන්තු ගත සහතික නොකළ අවශේෂ අගයන් බැංකුව තවදුරටත් නිතිපතා සමාලෝචනය කරයි

5.4 අස්පෘශ්‍ය වත්කම්

බැංකුවෙන් වෙනත් අස්පෘශ්‍ය වත්කම් අතරට පරිගණක මෘදුකාංගවල වටිනාකම ඇතුළත් වේ.

අස්පෘශ්‍ය වත්කමක් හඳුනාගනු ලබන්නේ එහි වියදම විශ්වසනීය ලෙස මැනිය හැකි වීමත් එයට ආරෝපණය කළ හැකි අපේක්ෂිත අනාගත ආර්ථික ප්‍රතිලාභ බැංකුවට ගලා ඒමේ හැකියාවත් මත වේ.

වෙන වෙනම අත්පත් කර ගනු ලැබෙන අස්පෘශ්‍ය වත්කම් පිරිවැය මත ආරම්භක හඳුනා ගැනීමේදී මිනුම්ගත කෙරේ. මූලික හඳුනා ගැනීම අනුව යමින් අස්පෘශ්‍ය වත්කම් වියදම් රහිතව ඕනෑම සමුච්චිත ක්‍රමක්ෂයක් සහ ඕනෑම සමුච්චිත හානිකරණ අලාභයක් මත ගෙන යනු ලැබේ.

අස්පෘශ්‍ය වත්කම්වල ප්‍රයෝජනයට ගත හැකි ආයු කාල පරිමිත හෝ අපරිමිත වශයෙන් තක්සේරු කෙරේ. පරිමිත ආයු කාල සහිත අස්පෘශ්‍ය වත්කම් ඒවායෙහි ආර්ථිකමය වශයෙන් ප්‍රයෝජනයට ගත හැකි ආයු කාලයට සාපේක්ෂව ක්‍රමක්ෂය කරනු ලැබේ. පරිමිත ප්‍රයෝජනවත් කාලයක් සහිත අස්පෘශ්‍ය වත්කම් සඳහා ක්‍රමක්ෂ කාලය සහ ක්‍රමක්ෂය ගණනය කරනු ලබන ක්‍රමය සමාලෝචනය කිරීම අවම වශයෙන් සෑම මූල්‍ය වර්ෂයකම අවසානයේදී සිදුකරනු ලැබේ. වත්කම්වල අන්තර්ගතව ඇති අපේක්ෂිත ප්‍රයෝජනවත් කාලසීමාවන්හි හෝ අනාගත ආර්ථික ප්‍රතිලාභයන්හි අපේක්ෂිත පරිභෝජන රටාවෙහි වෙනස්කම් යෝග්‍ය පරිදි ක්‍රමක්ෂ කාලය හෝ ක්‍රමය වෙනස් කිරීම මගින් හෝ වාර්තා කරනු ලබන අතර ගිණුම්කරණ ඇස්තමේන්තු වල වෙනස්කම් ලෙස සලකනු ලබයි. පරිමිත කාල සීමාවක් සහිත අස්පෘශ්‍ය වත්කම් මත ක්‍රමක්ෂ වියදම ආදායම් ප්‍රකාශයෙහි වෙනම රේඛීය අයිතමයක් ලෙස දක්වා ඇත.

අස්පෘශ්‍ය වත්කම් වල ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් කාලසීමාව තුළ ඒවායේ වියදම ඒවායේ අවශේෂ වටිනාකමට ලියා තැබීම සඳහා සරල මාර්ග පදනම යොදාගෙන ක්‍රමක්ෂය ගණනය කරනු ලැබේ:

⦿ පරිගණක මෘදුකාංග වසර 3

5.5 මූල්‍ය නොවන වත්කම් වල දුර්වලතා

එක් එක් වාර්තාකරන දිනයකදී වත්කමක් හානිකරණය විය හැකි බවට ඉඟියක් තිබේද යන්න බැංකුව විසින් තක්සේරු කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

කිසියම් ඇඟවීමක් තිබේ නම්, හෝ වත්කමක් සඳහා වාර්ෂික හානිකරණ පරීක්ෂා කිරීම අවශ්‍ය වූ විට, බැංකුව වත්කමේ අයකර ගත හැකි මුදල ඇස්තමේන්තු කරයි.

වත්කමක් අයකර ගත හැකි මුදල හෝ මුදල් උත්පාදන ඒකකය (CGU) භාවිතා කරන වටිනාකම සහ විකිණීම සඳහා එහි සාධාරණ වටිනාකමෙන් අඩු පිරිවැයෙන් වැඩි අගය වේ. වටිනාකම තක්සේරු කිරීමේදී, ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන් එහි වර්තමාන අගයට වට්ටම් කිරීමේදී මුදලේ කාල වටිනාකමේ වර්තමාන වෙළඳපල ඇගයීම හා CGU බැඳුනු අවදානම පිළිබිඹු කරන පූර්ව බදු වට්ටම් අනුපාතය භාවිතා කරයි.

හානිකරණ පරීක්ෂා කිරීමේ අරමුණින්, තනි තනිව පරීක්ෂා කළ නොහැකි වත්කම් මෙහෙයුම් සිවිලිම් පරීක්ෂණයකට යටත්ව, වෙනත් වත්කම් හෝ CGU හි මුදල් ගලා ඒමෙන් බොහෝ දුරට ස්වාධීන වන අඛණ්ඩ භාවිතයෙන් මුදල් ගලා ඒම ජනනය කරන කුඩාම වත්කම් සමූහයට එකට කාණ්ඩ කර ඇත.

හානිකරණ අලාභය හඳුනාගනු ලබන්නේ වත්කමක් රැගෙන යා හැකි මුදල එහි අයකර ගත හැකි මුදල ඉක්මවා ගියහොත් ය. ලාභ හෝ අලාභ ප්‍රකාශයේ හානිකරණ අලාභ හඳුනාගෙන ඇත.

5.6 මූල්‍ය ඇපකර

"මූල්‍ය ඇපකර" යනු ණය ලේඛනයේ නියමයන්ට අනුකූලව නියමිත වේලාවට ගෙවීමට නියමිත ණයගැතියෙකු අපොහොසත් වීම නිසා සිදු වන අලාභය දරන්නාට ප්‍රතිපූරණය කිරීම සඳහා බැංකුව විසින් නිශ්චිත ගෙවීම් කළ යුතු ගිවිසුම් වේ. "ණය බැඳීම්" යනු පූර්ව නිශ්චිත නියමයන් සහ කොන්දේසි යටතේ ණය සැපයීම සඳහා වන ආයතනික බැඳීම් වේ.

මූල්‍ය ඇපකර හෝ ණයක් ලබාදීමට ඇති බැඳීම්වලින් පැන නගින වගකීම් මුලින් මනිනු ලබන්නේ සාධාරණ වටිනාකමකින් වන අතර ඇපකරයේ හෝ කැපවීමේ කාලය පුරාවට මූලික සාධාරණ වටිනාකම ක්‍රමක්ෂය කරනු ලැබේ. පසුව කොන්ත්‍රාත්තුව යටතේ ගෙවීමක් සිදුවිය හැකි වූ විට වගකීම පියවීම සඳහා මෙම ක්‍රමක්ෂ කළ මුදලින් සහ ඕනෑම අපේක්ෂිත ගෙවීමක වර්තමාන වටිනාකමෙන් වැඩි අගය ඉදිරියට ගෙන යනු ලැබේ. පසුව වගකීම දරනු ලැබේ. වෙළෙඳපොළට වඩා අඩු පොලී අනුපාතයකට ණයක් ලබා දීම සඳහා මූල්‍ය ඇපකර සහ කැපවීම් වෙනත් වගකීම්වලට ඇතුළත් වේ.

5.7 විශ්‍රාමික ප්‍රතිලාභ

5.7.1 නිශ්චිත විශ්‍රාමික ප්‍රතිලාභ සැලැස්ම - පාරිතෝෂික

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 19 (LKAS 19) - ''සේවා නියුක්ති ප්‍රතිලාභ'' හි නිශ්චය කොට ඇති ආකාරයට නිශ්චිත ප්‍රතිලාභ සැලසුමක් යනු නිශ්චිත දායකත්ව සැලසුමකට වඩා පශ්චාත් සේවා නියුක්ති ප්‍රතිලාභ සැලසුමකි.

5.7.2 පාරිතෝෂික

1983 අංක 12 දරණ පාරිතෝෂික පනතට අනුව ගිණුම්වල ප්‍රතිපාදන සලසනු ලැබ ඇත.

මෙම අරමුදල යටතේ වන පූර්ණ වගකීම තක්සේරු කරනු පිණිස සෑම වසරක්ම අවසානයේදී ආයුගණන ප්‍රමාණකරණයක් සිදු කෙරේ. 2021 දෙසැම්බර් 31 දිනට මෙම තක්සේරුව සුදුසුකම්ලත් ආයුගණනයින් වන Actuarial & Management Consultants (Pvt) Ltd. ආයතනය විසින් සිදුකරන ලදී.

ආයුගණන අලාභ හා ලාභ හඳුනා ගැනීම: සැලසුමට අනුව බැංකුවේ වගකීම් ගණනය කිරීමේදී පැන නගින මුළු ආයුගණන ලාභ සහ අලාභ බැංකුව විසින් හඳුනා ගනු ලබන්නේ ඒවා ඇති වන කාලසීමාව තුළ පැන නගින වෙනත් විස්තීර්ණ ආදායම් තුළය.

අරමුදල්කරණ සැලසුම්: පාරිතෝෂික බැඳීම වෙනුවෙන් බාහිරින් අරමුදල් සම්පාදනය නොකෙරේ.

5.7.3 නිශ්චිත දායකත්ව විශ්‍රාම සැලසුම

"නිශ්චිත දායකත්ව සැලසුමක් යනු යම් කිසි ආයතනයක් වෙනත් ආයතනයකට (අරමුදලක්) නිශ්චිත දායකත්වයක් දක්වන සහ එම අරමුදලට ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 19" (LKAS 19) "සේවා නියුක්ති ප්‍රතිලාභ" හි සඳහන් ආකාරයට සේවකයන්ට වර්තමානයේ සහ පූර්ව කාලය තුළ අදාළවන ප්‍රතිලාභ හෝ සියලුම සේවකයන්ට ගෙවීම් කිරීම සඳහා ප්‍රමාණවත් වත්කම් නොමැති නම් වැඩිදුර දායකත්වයක් දැක්වීම සඳහා නීතිමය හෝ සම්ප්‍රයුක්ත බැඳීමක් නැත. පශ්චාත් සේවා නියුක්ති සැලසුමක නිශ්චිත දායකත්ව සැලසුමකට ගෙවිය යුතු දායකත්වය සේවකයින් විසින් බැංකුවට ලබා දී ඇති සේවයට සමානුපාතික වන අතර ඒවා ගෙවීමට තිබෙන සෑම අවස්ථාවකදීම "පුද්ගලික වියදම්" යටතේ සටහන් කරනු ලැබෙයි. නොගෙවූ දායකත්වයන් වගකීම් ලෙස සටහන් වෙයි. නොගෙවන ලද දායකත්ව බැඳීම්ද වගකීමක් ලෙස වාර්තා කෙරේ.

1. සේවක අර්ථසාධක අරමුදල

බැංකුව සහ සේවකයන් පිළිවෙළින් 15% ක් සහ 10%ක සේවක අර්ථසාධක අරමුදල වෙත දායක කරයි.

2. සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල

බැංකුව සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල වෙත 3% ක දායකත්වයක් ලබා දේ.

5.8 ප්‍රතිපාදන

යම් පසුගිය සිද්ධියක් නිසා බැංකුවට යම් වර්තමාන වගකීමක් (නෛතික හෝ සම්ප්‍රයුක්ත) ඇති විට සහ ආර්ථික ප්‍රතිලාභ අන්තර්ගත කෙරෙන සම්පත් පිටතට ගලා යාමක් තිබෙන වගකීම් නිරවුල් කිරීම සඳහා අවශ්‍ය විය හැකි විටෙක සහ විශ්වසනීය ඇස්තමේන්තුවක් වගකීමේ ප්‍රමාණයට සකස් කළ හැකි විටෙක ප්‍රතිපාදන හඳුනා ගනු ලැබේ. කවර හෝ ප්‍රතිපාදනයකට අදාළ වන වියදම්, ලබා දෙන ලද ඕනෑම ප්‍රතිපූර්ණයක් වේ නම් එය අඩු කොට ආදායම් ප්‍රකාශනයෙහි දක්වා තිබේ.

5.9 ආදායම් හා වියදම් හඳුනා ගැනීම

5.9.1 පොලී ආදායම සහ වියදම්

පොලී ආදායම සහ වියදම් සඵල පොලී ක්‍රමය භාවිතා කරමින් ලාභ හෝ අලාභ ලෙස හඳුනාගෙන ඇත. සඵල පොලී අනුපාතය

යනු මූල්‍ය වත්කම් හෝ වගකීම් වල අපේක්ෂිත ආයු කාලය (හෝ යම් සුදුසු කෙටි කාලයක්) හරහා ඇස්තමේන්තුගත අනාගත මුදල් ගෙවීම් සහ ලැබීම් වක් වක් මූල්‍ය වත්කම් හෝ වගකීම් හි ඉදිරියට ගෙන යනු ලබන ශුද්ධ වට්නාකමින් සත්‍ය වශයෙන්ම වට්ටම් කරන අනුපාතයයි. ඵලදායී පොලී අනුපාතය ගණනය කිරීමේදී, බැංකුව මූල්‍ය උපකරණයේ සියලුම ගිවිසුම්ගත කොන්දේසි සැලකිල්ලට ගනිමින් අනාගත මුදල් ප්‍රවාහයන් ඇස්තමේන්තු කරයි, (අනාගත ණය පාඩු හැර).

ඵලදායී පොලී අනුපාතය ගණනය කිරීමෙහි ඵලදායී පොලී අනුපාතයේ අනිවාර්ය අංගයක් වන සියලුම ගනුදෙනු පිරිවැය සහ ගාස්තු ඇතුළත් වේ. ගනුදෙනු පිරිවැයෙහි මූල්‍ය වත්කමක් හෝ වගකීමක් අත්පත් කර ගැනීම හෝ නිකුත් කිරීම සඳහා සෘජුවම ආරෝපණය වන වර්ධක පිරිවැය ඇතුළත් වේ.

ආදායම් ප්‍රකාශයේ ඉදිරිපත් කර ඇති පොලී ආදායම සහ වියදම් මත මනිනු ලබන මූල්‍ය වත්කම් සඵලදායී පොලී පදනම මත ගණනය කරන ලද ක්‍රමක්ෂය පිරිවැය සහ මූල්‍ය වගකීම් සඳහා වන පොලී ඇතුළත් වේ.

අවදානම් කළමනාකරණ කාර්ය සඳහා තබාගත් අනෙකුත් व्युත්පන්නයන්හි සාධාරණ අගයෙහි වෙනස්කම් සහ ලාභ හෝ අලාභ හරහා සාධාරණ අගයෙන් රැගෙන යන අනෙකුත් සියලුම මූල්‍ය වත්කම් හා වගකීම්, ආදායම් ප්‍රකාශනයේ ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට ඇති වෙනත් මූල්‍ය උපකරණවලින් ලද ශුද්ධ ආදායම් මගින් ඉදිරිපත් කෙරේ.

FVOCI හි ඵලදායී පොලී පදනම මත ගණනය කරන ලද ආයෝජන සුරැකුම්පත් වල පොලී ආදායම ද පොලී ආදායම්වලට ඇතුළත් වේ.

5.9.2 ගාස්තු හා කොමිස් ආදායම

ගනුදෙනුකරුවෙන් වෙත ලබා දෙන පුළුල් පරාසයක සේවාවන් කෙරෙන් බැංකුව ගාස්තු හා කොමිස් ආදායම උපයයි. ගාස්තු ආදායම පහත කාණ්ඩවලට බෙදිය හැක:

යම් නිශ්චිත කාල සීමාවක් තුළ සපයන සේවාවන් වෙතින් උපයා ගන්නා ගාස්තු ආදායම එම කාල සීමාවට අදාළව උපචිත කෙරේ. මෙම ගාස්තු ආදායමට කොමිස් ආදායම, ණය සේවා ගාස්තු, පරීක්ෂා කිරීමේ ගාස්තු හා ගනුදෙනුකරුවන් වෙතින් අයකර ගනු ලබන ලිපිලේඛන ගාස්තු ආදිය ඇතුළත් වේ.

ලබා ගැනීමට හැකියාව ඇති ණය සඳහා ණය බැඳීම් ගාස්තු සහ වෙනත් ණයට සම්බන්ධ ගාස්තු විලම්බනය කර (යම්කිසි වර්ධනීය පිරිවැයක් ඇත්නම් එය සමග) ණය මත පවතින සඵලදායී පොලී අනුපාතය සඳහා කරන ගැලපීමක් ලෙස හඳුනා ගැනේ. යම්කිසි ණයක් ලබා ගැනීමට ඇති හැකියාව අඩු නම් ණය බැඳීම් ගාස්තු සරල රේඛීය පදනම යටතේ බැඳියාව ඇති කාල සීමාව තුළ හඳුනා ගනු ලැබේ.

5.9.3 ශුද්ධ ලාභ / (පාඩු) වෙළඳාමෙන්

මෙම ආදායම වෙළඳාම / FVTPL වත්කම් හා සම්බන්ධ ලාභ සහ පාඩු වලින් සමන්විත වන අතර සියලු හඳුනාගත් සහ හඳුනාගත නොහැකි සාධාරණ අගයෙහි වෙනස්කම් ඇතුළත් වේ.

5.9.4 දේපල, පිරියත සහ උපකරණ විකිණීමෙන් ලාභ / අලාභ

දේපල, පිරියත සහ උපකරණ විකිණීමෙන් ලැබෙන ඕනෑම ලාභයක් හෝ අලාභයක් විකිණීම සිදුවන කාල පරිච්ඡේදය තුළ හඳුනාගෙන ඇති අතර එය ශුද්ධ වෙනත් මෙහෙයුම් ආදායමක් ලෙස වර්ගීකරණය කර ඇත.

5.10 බදුකරණය

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 12 (LKAS 12) - ''ආදායම් බදු'' අනුව බදු වියදම යනු වර්තමානයේ හා විලම්බනය කරන ලද කාලසීමාව සහ ලාභ හා අලාභ තීරණය කිරීමේදී ඇතුළත් වන මුළු ප්‍රමාණයයි. ආදායම් බදු වියදම ආදායම් ප්‍රකාශයේ සෘජුව ''ස්කන්ධ ප්‍රාග්ධනය'' සහ ''වෙනත් විස්තීර්ණ ආදායම්'' යන අයිතමයන්ට අදාළ වන ප්‍රමාණයට ව්‍යතිරේකව ස්කන්ධ ප්‍රාග්ධනය හෝ වෙනත් විස්තීර්ණ අදායම ලෙස හඳුනාගැනේ.

5.10.1 ප්‍රවර්තන බදු

පවතින වර්ෂයට සහ පසුගිය වර්ෂයට අදාළ ප්‍රවර්තන බදු වත්කම් සහ වගකීම් මනිනු ලබන්නේ බදු අධිකාරය වෙත ගෙවීමට තිබෙන හෝ ආපසු අයකර ගැනීමට තිබෙන ප්‍රමාණය මතය. ප්‍රමාණය ගණනය කිරීමට භාවිත කරන බදු අනුපාත සහ නීති වාර්තාකරණ දිනට ක්‍රියාත්මක හෝ ක්‍රියාත්මකයැයි අපේක්ෂිත වේවා වේ.

ඒ අනුව, බදුකරණය සඳහා ප්‍රතිපාදන පදනම් වන්නේ 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ විධිවිධානවලට අනුකූලව බදු අරමුණු සඳහා සකස් කරන ලද වර්ෂය සඳහා වන ලාභය සහ මූල්‍ය ප්‍රකාශනවල 15 වැනි සටහනේ දක්වා ඇති අනුපාතවලට අදාළ සංශෝධන මත ය.

5.10.2 විලම්බිත බදු වත්කම්

මූල්‍ය වාර්තාකරණ අරමුණ සඳහා වන වත්කම් සහ වගකීම් වල බදු පදනම සහ වේවායේ ධාරණ අගයන් අතර වාර්තා කරන දිනයේදී ඇති තාවකාලික වෙනස මත විලම්බිත බදු හඳුනාගැනේ. පහත සඳහන් කාරණා වලදී හැර සියළුම බදු අය කෙරෙන තාවකාලික වෙනස්කම් සඳහා විලම්බිත බදු හඳුනා ගැනේ. පහත කාරණාවලදී හැර බදු අදාළ වන තාවකාලික වෙනස්කම් සියල්ලමට අදාළව විලම්බිත බදු වගකීම් හඳුනා ගැනේ:

- විලම්බිත බදු වගකීම ඉස්මතු වන්නේ මූලික අවස්ථාවේදීම කීර්තිනාමය හඳුනාගැනීමෙන් හෝ ව්‍යාපාරික සංකලනයක් නොවන වත්කමක් හෝ වගකීමක් කෙරෙන් සිදුවන ගනුදෙනුවක් මගින් ගිණුම්කරණ ලාභයටවත් බදු ගෙවිය යුතු ලාභයටවත් බලපෑමක් නොවන විට,
- පරිපාලිත සමාගම් වල කරන ලද ආයෝජන වලට අදාළ බදු අයකල හැකි තාවකාලික වෙනස්කම් වලට අදාළව එම තාවකාලික වෙනස්කම් වල ප්‍රවර්තනයෙහි කාල නිර්ණය කිරීම පාලනය කළ හැකි අවස්ථාවල සහ තාවකාලික වෙනස පුරෝකථනය කළ හැකි අනාගතය තුළ ප්‍රතිවර්තනය වීමට ඇති හැකියාවක් නොමැති අවස්ථාවලදී.

සියළුම අඩු කළ හැකි තාවකාලික වෙනස්කම් සඳහා භාවිත නොකළ බදු ණය සහ භාවිත නොකළ බදු අලාභ වල ඉදිරියට ගෙන යාම සඳහා සහ පහත සඳහන් අවස්ථාවල හැර අඩු කල

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

හැකි තාවකාලික වෙනස සහ භාවිත නොකළ බදු ණය සහ භාවිත නොකළ බදු අලාභ වල ඉදිරියට ගෙන යාමට එදිරිව බදු අය කල හැකි ලාභය තිබේ යැයි සිතන ප්‍රමාණයට විලම්බිත බදු හඳුනාගනු ලැබේ:

- අඩු කළ හැකි තාවකාලික වෙනසට අදාළ විලම්බිත බදු වත්කම් යම්කිසි ගනුදෙනුවකදී ව්‍යාපාර සම්බන්ධයෙන් නොමැති වත්කමක් හෝ වගකීමක් ලෙස මූලිකව හඳුනාගෙන ඇති අවස්ථාවක දී සහ ගනුදෙනු සිදුකරන අවස්ථාවේ ගිණුම්කරණ ලාභයට හෝ බදු අයකල හැකි ලාභයට හෝ අලාභයට බලනොපාන අවස්ථාවකදී
- පරිපාලිත සමාගම්වල සිදුකරන ලද ආයෝජනවලට සම්බන්ධ අඩු කළ හැකි තාවකාලික වෙනස්කම්වලට අදාළව විලම්බිත බදු වත්කම් හඳුනාගන්නේ තාවකාලික වෙනස පෙනෙන අනාගතය තුළ ප්‍රතිවර්තනය වීමට ඇති හැකියාවේ ප්‍රමාණය මත සහ තාවකාලික වෙනස උපයෝජනය කළ හැකි තත්ත්වයට එදිරිව බදු අය කළ හැකි ආදායම පවතින තත්ත්වයක් මත පමණක් වේ.

විලම්බිත බදු වත්කම්වල ධාරණ අගය සෑම වාර්තාකරණ දිනකම සමාලෝචනය කරනු ලබන අතර එය විලම්බිත බදු වත්කම්වල සියල්ල හෝ කොටසක් උපයෝජනය කිරීමට ඉඩ දෙන පරිදි ප්‍රමාණවත් බදු අය කළ හැකි ලාභයක් ඇති වීමට ඇති හැකියාව නොමැති වන තත්ත්වයට අඩු කරනු ලබයි. හඳුනානොගත් විලම්බිත බදු වත්කම් සෑම වාර්තාකරණ දිනකම නැවත තක්සේරු කරනු ලබන අතර අනාගත බදු අය කල හැකි ලාභය විසින් විලම්බිත බදු වත්කම් නැවත අය කර ගැනීමට ඉඩදීමට ඇති හැකියාවේ ප්‍රමාණයට හඳුනාගනු ලබයි.

වාර්තා කරන දිනට ක්‍රියාත්මක වන හෝ ක්‍රියාත්මක මට්ටමේ පවතින බවට අපේක්ෂිත බදු අනුපාත (සහ බදු නීති) පදනම්ව වත්කම උපලබ්ධි වන විට හෝ වගකීම නිරවුල් කරන විට වසර තුළ අදාළ කරගැනීමට අපේක්ෂිත බදු අනුපාතය මත විලම්බිත බදු වත්කම් සහ වගකීම් ගණනය කරනු ලැබේ.

සම කොටස් වල සෘජුවම හඳුනාගත් අදාළ පවතින බදු සහ විලම්බිත බදු සම කොටස් වල යළි හඳුනාගන්නා අතර ආදායම් ප්‍රකාශය තුළ හඳුනා නොගනියි.

බදු අය කළ හැකි ආයතනයට සහ චීම බදුකරණ අධිකාරියට අදාළ පවතින බදු වගකීම්වලට සහ විලම්බිත බදුවලට එදිරිව පවතින බදු වත්කම් හිලව් කිරීම සඳහා නෛතිකව බලාත්මක වන අයිතියක් තිබේ නම් විලම්බිත බදු වත්කම් සහ විලම්බිත බදු වගකීම් හිලව් කරනු ලැබේ.

5.10.3 මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බද්ද

බැංකුව සඳහා මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බද්ද (FSVAT) සඳහා වන අගය පදනම වන්නේ බදු වලට පෙර සකස් කරන ලද ගිණුම්කරණ ලාභය, සේවකයින්ගේ වැටුප් සහ ස්ථාවර වත්කම් සඳහා ගණනය කරන ලද ආර්ථික ක්ෂය වීමයි. සමස්ත බැංකුව සඳහා පැමිණි මුළු අගය එකතු කිරීම අදාළ පිරිවැටුම අනුව වෙන් කළ යුතුය; සාමාන්‍ය වැට් බද්ද සහ මූල්‍ය සේවා මත වැට් බද්ද සඳහා අදාළ පිරිවැටුමට අනුකූලව පිරිවැටුම ප්‍රමාණාත්මක විය යුතුය. මූල්‍ය සේවාවන් සඳහා ආරෝපණය කළ යුතු අගය එකතු කිරීම" මූල්‍ය සේවා මත සාමාන්‍ය වැට් බද්ද සහ වැට් බද්ද වෙන්කර හඳුනාගත හැකි පිරිවැටුම් අනුපාතය යෙදීමෙන් ලබා ගත යුතුය. යම් කාල සීමාවක් සඳහා මුළු වැට් බදු වගකීම ලබා ගැනීම සඳහා මූල්‍ය සේවාවන් සඳහා ආරෝපණය කළ යුතු අගය එකතු කිරීම මත 15/115 බදු කොටස (2022 ජනවාරි මාසයේ සිට ක්‍රියාත්මක වන පරිදි මූල්‍ය සේවා මත වැට් බද්ද මත අනුපාතය 15/115 සිට 18/118 දක්වා වෙනස් කිරීමට යෝජනා කර ඇත)

5.10.4 ලාභාංශ මත රඳවා ගැනීමේ බද්ද (WHT)

බදු වලින් පසු ලාභයෙන් බෙදා හරින ලාභාංශ සඳහා ලාභාංශ ලබන්නාගෙන් 14% ක බදු කප්පාදුවක් සිදු කරනු ලබයි (පුද්ගලයන්ට උපයන විට බදු අනුපාත, 6%, 12% සහ ඉතිරියට 18%) මත බදු වේ. 2020 ජනවාරි මාසයට පෙර කාලය මෙන් නොව, ලාභාංශ මත රඳවා ගැනීමේ බද්ද මූලාශ්‍රයේ බද්දක් නොවන අතර ලාභාංශ බෙදා හරින අවස්ථාවේදී එය අඩු නොකළ යුතුය; කොටස් හිමියන්ට දළ වශයෙන් ලාභාංශ ලැබෙනු ඇත.

2021 අංක 10 දරණ දේශීය ආදායම් සංශෝධන පනත ට අනුව ලාභාංශ මත රඳවා ගැනීමේ බද්ද 2020 ජනවාරි 01 දින සිට අහෝසි කර ඇත. එබැවින්, ලාභාංශ ආදායම 2020 ජනවාරි 1 වන දින සිට බලපැවැත්වෙන පරිදි තවදුරටත් රඳවා ගැනීමේ බද්දට යටත් නොවනු ඇත.

2021 අංක 10 දරණ දේශීය ආදායම් සංශෝධන පනත හඳුන්වා දීමත් සමඟ ලැබෙන ලාභාංශවලින් ගෙවනු ලබන ඕනෑම ලාභාංශයක් අරමුදල් පිරිවැයේ ශුද්ධ ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබේ. මීට අමතරව, නේවාසික සමාගමක් නේවාසික පුද්ගලයෙකුට ලාභාංශ ගෙවන්නේ නම් (සමාගමක් ඇතුළුව) එවැනි ගෙවීම් ආදායම් බද්දෙන් සම්පූර්ණයෙන්ම නිදහස් වනු ඇත.

5.10.5 ආර්ථික සේවා ගාස්තුව

2006 අංක 13 දරණ ආර්ථික සේවා ගාස්තු පනත සහ ඉන් අනතුරුව එය වෙත සිදුකරන ලද සංශෝධනවලට අනුව, වගකීමෙන් බැඳෙන පිරිවැටුම මත ආර්ථික සේවා ගාස්තුව ගණනය කෙරේ. වර්තමානයේදී, ආර්ථික සේවා ගාස්තුව 0.5% ක් වශයෙන් ගෙවිය යුතු වන අතර එය ගෙවිය යුතු ආදායම් බදු වලින් අඩු කරගත හැකි වේ. හිමිකම් නොකියන ලද ආර්ථික සේවා ගාස්තු, ඇත්නම්, ඒවා ඉදිරියට ගෙන ගොස් එළඹෙන වසර දෙකකදී ගෙවිය යුතු ආදායම් බදු වලට එදිරිව හිලව් කල හැකි වේ. 2020 ජනවාරි 1 දින සිට බලාත්මක වන පරිදි රජය විසින් මෙම බද්ද අහෝසි කරන ලදි.

5.10.6 ණය ආපසු ගෙවීමේ බදු

2018 ඔක්තෝබර් 1 වැනි දින සිට, 2018 අංක 35 දරණ මුදල් පනත අනුව මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බදු අරමුණු සඳහා මුළු අගය එකතු කිරීම මත පදනම්ව මූල්‍ය සේවා මත ණය ආපසු ගෙවීමේ බදු ගණනය කෙරේ. 2020 දී යොදා ගැනුනු ණය ආපසු ගෙවීමේ ගාස්තු අනුපාතය 7% (2018 - 7%) කි. 2020 ජනවාරි 1 දින සිට බලාත්මක වන පරිදි රජය විසින් මෙම බද්ද අහෝසි කරන ලදි.

5.10.7 භෝග රක්ෂණ බද්ද

2013 අංක 12 දරණ මුදල් පනතෙහි 14 වැනි වගන්තියේ විධිවිධාන වලට අනුව, 2013 අප්‍රේල් 1 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි භෝග රක්ෂණ බද්ද හඳුන්වා දෙන ලද අතර එය ජාතික රක්ෂණ භාර අරමුදල වෙත ගෙවිය යුතු වේ. වර්තමානයේදී, භෝග රක්ෂණ බද්ද, බදුවලට පසු ලාභයෙන් 1% ක් වශයෙන් ගෙවිය යුතු වේ.

2013 අංක 12 දරණ මුදල් පනතේ 14 වන වගන්තිය යටතේ විෂය පථය යටතේ ඇති ආයතන සඳහා බෝග රක්ෂණ බද්දක් පනවා ඇත;

- 1988 අංක 30 දරණ බැංකු පනත
- 1988 අංක 78 දරණ මුදල් සමාගම් පනත
- 2000 අංක 43 දරණ රක්ෂණ කර්මාන්ත නියාමන පනත

ඒ අනුව, 2013 අප්‍රේල් 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි තක්සේරු වර්ෂයක් සඳහා බදු පසු ලාභයෙන් 1% ක් ජාතික රක්ෂණ භාර අරමුදලට ගෙවිය යුතුය.

5.10.8 IFRIC 23 - ආදායම් බදු පිළියම් පිළිබඳ අවිනිශ්චිතතාවය

LKAS 12 "ආදායම් බදු" යෙදීම කෙරෙහි බලපාන අවිනිශ්චිතතාවයට බදු පිළියම් ඇතුළත් වන විට අර්ථ නිරූපණය ආදායම් බදු සඳහා ගිණුම්කරණය ආමන්ත්‍රණය කරයි. LKAS 12 හි විෂය පථයෙන් පිටත බදු හෝ අය කිරීම් සඳහා එය අදාළ නොවේ, සමහර බදු පිළියම් තුළ සම්බන්ධ පොලී හා දඩ මුදල් සම්බන්ධ අවශ්‍යතා විශේෂයෙන් ඇතුළත් නොවේ. අර්ථ නිරූපණය විශේෂයෙන් පහත සඳහන් දේ ආමන්ත්‍රණය කරයි:

- ආයතනයක් අවිනිශ්චිත බදු පිළියම් වෙන වෙනම සලකා බලනවාද යන්න
- බදු කරණ බලධාරීන් විසින් බදු පිළියම් පරීක්ෂා කිරීම පිළිබඳව ආයතනයක් කරනු ලබන උපකල්පන
- ආයතනයක් බදු අය කළ හැකි ලාභය (බදු අලාභය), බදු පදනම්, භාවිතා නොකළ බදු අලාභ, භාවිතා නොකළ බදු බැර සහ බදු අනුපාත තීරණය කරන ආකාරය
- ආයතනයක් කරුණු හා තත්වයන්හි වෙනස්කම් සලකා බලන ආකාරය

එක් එක් අවිනිශ්චිත බදු පිළියම් වෙන වෙනම හෝ වෙනත් අවිනිශ්චිත බදු පිළියම් එකක් හෝ වැඩි ගණනක් සමඟ සලකා බැලිය යුතුද යන්න බැංකුව තීරණය කරන අතර අවිනිශ්චිතතාවයේ විසඳුම වඩා හොඳින් පුරෝකථනය කරන ප්‍රවේශය භාවිතා කරයි.

ආදායම් බදු පිළියම් පිළිබඳ අවිනිශ්චිතතාවයන් හඳුනා ගැනීමේදී බැංකුව සැලකිය යුතු විනිශ්චයක් යොදයි. බැංකුව සංකීර්ණ පරිසරයක් තුළ ක්‍රියාත්මක වන බැවින්, අර්ථ නිරූපණය එහි මූල්‍ය ප්‍රකාශන කෙරෙහි බලපෑමක් ඇති කළ බව බැංකුව තක්සේරු කළේය.

අර්ථ කථනය අනුගත කර ගැනීමෙන් පසු, බැංකුව විසින් නිශ්චිත බදු තනතුරු තිබේද යන්න සලකා බැලීය, විශේෂයෙන් හුවමාරු මිල ගණන් වලට අදාළ වීවා. විවිධ අධිකරණ බල ප්‍රදේශවල බැංකුවේ බදු ගොනු කිරීම් වලට හුවමාරු මිල ගණන් වලට අදාළ අඩු කිරීම් ඇතුළත් වන අතර බදු කරණ බලධාරීන්ට එම බදු ප්‍රතිකාර අභියෝගයට ලක් කළ හැකිය. බැංකුව එහි බදු අනුකූලතාව සහ හුවමාරු මිල ගණන් අධ්‍යයනය මත පදනම්ව තීරණය කළේ, එහි බදු ප්‍රතිකාර බදු බලධාරීන් විසින් පිළිගත් ප්‍රකාශයන් විය හැකි බවයි. මෙම අර්ථ කථනය බැංකුවේ මූල්‍ය ප්‍රකාශන කෙරෙහි බලපෑමක් ඇති කළේ නැත.

5.11 සාමාන්‍ය කොටස් මත ලාභාංශ

සාමාන්‍ය කොටස් මත ලාභාංශ වගකීමක් ලෙස හඳුනාගනු ලබන අතර ස්කන්ධ ප්‍රාග්ධනය බැංකුවේ කොටස් හිමියන් විසින් අනුමත කරනු ලබන අවස්ථාවේදී ස්කන්ධ ප්‍රාග්ධනයෙන් අඩු කරනු ලැබේ. අතුරු ලාභාංශ ස්කන්ධ ප්‍රාග්ධනයෙන් අඩු කරනු ලබන්නේ වීවා ප්‍රකාශයට පත් කිරීම සහ තවදුරටත් බැංකුවේ අභිමතයට යටත් නොවීම යන කරුණු සපුරාලන අවස්ථාවේදීය.

5.12 කොටසකට ඉපැයීම්

බැංකුව කොටසක් මත මූලික ඉපයීම් දත්ත එහි සාමාන්‍ය කොටස් සඳහා ඉදිරිපත් කරයි. කාලසීමාව තුළ ගෙවීමට ඇති සාමාන්‍ය කොටස් වල හරිත සාමාන්‍ය කොටස් ප්‍රමාණය මඟින් බැංකුවේ සාමාන්‍ය කොටස් හිමිකරුවන්ට අදාළ වන ලාභය හෝ අලාභය බෙදීමෙන් මූලික කොටස් මත ඉපයීම් ගණනය කෙරේ. සේවකයන්ට ලබාදෙන ලද කොටස් විකල්පවල අඩංගු වන තනුකිත භව්‍ය සාමාන්‍ය කොටස් වල බර තැබූ සාමාන්‍ය අගය සහ සාමාන්‍ය කොටස්කරුවන්ට අදාළ වන ලාභය හෝ අලාභය ගැළපීමෙන් තනුකිත කොටස් මත ඉපයීම් තීරණය කරනු ලැබේ.

5.13 SLFRS 15 - ගනුදෙනුකරුවන් සමඟ ගිවිසුම් ඔස්සේ ලැබෙන ආදායම

SLFRS 15 2018 ජනවාරි 1 දින හෝ එයට පසු ආරම්භ වන මූල්‍ය කාලසීමා සඳහා බලාත්මක බවට පත් විය. මෙහි ප්‍රධාන මූලධර්මය වනුයේ ආයතනයක් ගනුදෙනුකරුවන් වෙත පොරොන්දු වූ භාණ්ඩ හෝ සේවා මාරු කිරීම විස්තර කරන ආදායම හඳුනාගත යුතු වීමයි. මෙම ප්‍රධාන මූලධර්මය සාකච්ඡා කරන ලද පරිදි පියවර පහත ආදර්ශ රාමුවක් තුළ ලබාදෙනු ලැබේ.

- ගනුදෙනුකරුවන් සමඟ ගිවිසුම (ගිවිසුම්) හඳුනාගැනීම
- ගිවිසුම තුළ කාර්යසාධන බැඳීම් හඳුනාගැනීම
- ගනුදෙනු මිල තීරණය කිරීම
- ගිවිසුම තුළ කාර්යසාධන බැඳීම්වලට ගනුදෙනු මිල වෙන් කිරීම
- ආයතනය කාර්යසාධන බැඳීමක් තෘප්තිමත් කරන අවස්ථාවේදී (හෝ පරිදි) ආදායම හඳුනාගැනීම

මෙම මාර්ගෝපදේශය යොදා ගැනීම ගනුදෙනුකරුවකු සමඟ ගිවිසුමක් තුළ ඉදිරිපත් කෙරෙන සාධක සහ වාතාවරණය මත රඳා පවතින අතර විනිශ්චය ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වේ.

5.14 මුදල් ප්‍රවාහය පිළිබඳ ප්‍රකාශය

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය - LKAS 7 - "මුදල් ප්‍රවාහ ප්‍රකාශය" අනුව වක්‍ර ක්‍රමය භාවිතා කරමින් මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කර ඇත. මුදල් සහ මුදල් සමානයන් අතේ ඇති මුදල් සහ කෙටි

කාලීන, ඉතා ද්‍රවශීල ආයෝජන වලින් සමන්විත වන අතර ඒවා දන්නා මුදල් ප්‍රමාණයන්ට පහසුවෙන් පරිවර්තනය කළ හැකි අතර වටිනාකමේ වෙනස්කම් වල නොවැදගත් අවදානමකට යටත් වේ.

මුදල්, වෙනත් බැංකු ශේෂයන්, බැංකු වල ස්ථානගත කිරීම, ස්ථාවර තැන්පතු වල ආයෝජන (මාස 3 ට අඩු) සහ මුදල් හා මුදල් සමාන දෑ වලට අඩංගු වේ.

5.15 සංචිත

5.15.1 ව්‍යවස්ථාපිත සංචිත අරමුදල

1988 අංක 30 දරණ බැංකු පනතේ 20 (1) සහ (2) වගන්ති ප්‍රකාරව අවශ්‍ය පරිදි ව්‍යවස්ථාපිත සංචිත අරමුදල පවත්වාගෙන යනු ලැබේ. ඒ අනුව, ව්‍යවස්ථාපිත සංචිත අරමුදල ගෙවුම් ප්‍රාග්ධනයෙන් 50% කට සමාන වන තෙක්, බදු කරණයෙන් පසු ශුද්ධ ලාභයෙන් 5% කට නොඅඩු නමුත් කිසියම් ලාභාංශයක් ව්‍යවස්ථාපිත සංචිත අරමුදලට ප්‍රකාශයට පත් කිරීමට පෙර බැංකුව විසින් මාරු කළ යුතුය.

5.15.2 සාමාන්‍ය සංචිත අරමුදල

සාමාන්‍ය සංචිතය යනු බැංකුව විසින් රඳවා ගත් ඉපැයීම් ගිණුම්වලින් යම් ලාභයක් සාමාන්‍ය සංචිත ගිණුමට මාරු කිරීමේ ප්‍රතිඵලයකි. පොදු සංචිතය පිහිටුවීමේ පරමාර්ථය වන්නේ අනාගත නොදන්නා වගකීම් සපුරාලීමයි.

5.15.3 විශේෂ සංචිත අරමුදල

විශේෂ සංචිත අරමුදල යනු රඳවා ගත් ඉපැයීම් ගිණුම්වලින් යම් ලාභයක් බැංකුව විසින් විශේෂ සංචිත ගිණුමට මාරු කිරීමේ ප්‍රතිඵලයකි. අනාගත නොදන්නා වගකීම් සපුරාලීමේ අරමුණින් පිහිටවන ලදී.

6. නිකුත් කර ඇති මුත් තවමත් බලාත්මක නොවූ ගිණුම්කරණ ප්‍රමිතීන්

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් පහත සඳහන් නව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (SLFRSs/LKASs) නිකුත් කර ඇති අතර, එය 2021 ජනවාරි 01 දිනෙන් පසු ආරම්භ වන මූල්‍ය කාල පරිච්ඡේදයන් සඳහා අදාළ වේ. ඒ අනුව මෙම මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී පහත සඳහන් නව ප්‍රමිතීන් බැංකුව විසින් ක්‍රියාත්මක කර නොමැත.

තනි ගනුදෙනුවකින් පැන නගින වත්කම් හා බැරකම් වලට අදාළ විලම්භිත බදු (LKAS 12 හි සංශෝධන)

මෙම සංශෝධන මගින් සමාන හා තාවකාලික වෙනස්කම් ඇති කරන ගනුදෙනු බැහැර කිරීම සඳහා මූලික හඳුනාගැනීම නිදහස් කිරීමේ විෂය පථය පටු කරයි - උදා: කල්බදු. කල්බදු සඳහා, අදාළ විලම්භිත බදු වත්කම් සහ වගකීම් ඉදිරිපත් කරන ලද මුල්ම සංසන්දනාත්මක කාල පරිච්ඡේදයේ ආරම්භයේ සිටම හඳුනා ගත යුතු අතර, එම දිනයේ රඳවා ගත් ඉපැයීම් හෝ කොටස් වල වෙනත් සංරචක වලට ගැලපීමක් ලෙස පිළිගත් ඕනෑම සමුච්චිත බලපෑමක් ලෙස හඳුනා ගැනේ. අනෙකුත් සියලුම ගනුදෙනු සඳහා, ඉදිරිපත් කරන ලද මුල්ම කාල පරිච්ඡේදය ආරම්භ වීමෙන් පසු සිදුවන ගනුදෙනු සඳහා සංශෝධන අදාළ වේ.

විලම්භිත බදු බලපෑම් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ශුද්ධ ලෙස ඉදිරිපත් කර ඇති බව හැර, සංශෝධන වලට සමාන ප්‍රතිඵලයක් ලබා දෙන අතර, 'ඒකාබද්ධව සම්බන්ධ' ප්‍රවේශය යෙදීම සඳහා කල්බදු මත විලම්භිත බදු සඳහා බැංකුව ගිණුම් ගත කරයි. සංශෝධන යටතේ බැංකුව විසින් වෙනම විලම්භිත බදු වත්කමක් සහ විලම්භිත බදු වගකීමක් පිළිගනු ඇත. 2021 දෙසැම්බර් 31 වන විට භාවිත අයිතිය සහිත වත්කම් සම්බන්ධයෙන් අඩු කළ හැකි තාවකාලික වෙනස රුපියල් 456,594,851 ක් වන අතර බදු වගකීම සම්බන්ධයෙන් බදු අය කළ හැකි තාවකාලික වෙනස රුපියල් 149,871,407 කි. 2021 දෙසැම්බර් 31 න් අවසන් ගිණුම් කාලය සඳහා විලම්භිත බදු ව්‍යාපාරයේ සමස්ත බලපෑම හේතුවෙන් රුපියල් 201,048,274 ක ශුද්ධ විලම්භිත බදු වගකීමක් ඇති වී තිබේ.

රුපියල් 201,048,274 ක වෙනම විලම්භිත බදු වගකීමක් සහ රුපියල් 1,464,843,345 ක විලම්භිත බදු වත්කමක් බැංකුව විසින් ඉදිරිපත් කරනු ලබන අතර එහි ශුද්ධ බලපෑම රුපියල් 1,263,795,071 ක් වේ (සටහන 27). සංශෝධන සම්මත කර ගැනීමේදී රඳවා ගත් ඉපැයීම් කෙරෙහි කිසිදු බලපෑමක් සිදු නොවනු ඇත.

වෙනත් ප්‍රමිතීන්

පහත දැක්වෙන නව හා සංශෝධිත ප්‍රමිතීන් බැංකුවේ මූල්‍ය ප්‍රකාශන කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කරනු ඇතැයි අපේක්ෂා නොකෙරේ.

- දැඩි කොන්ත්‍රාත්තු - කොන්ත්‍රාත්තුවක් ඉටු කිරීමේ පිරිවැය (LKAS 37 හි සංශෝධන).
- 2021 ජූනි 30 න් ඔබ්බට COVID-19 සම්බන්ධ කුලී සහන (SLFRS 16 සංශෝධනය)
- SLFRS ප්‍රමිති සඳහා වාර්ෂික වැඩිදියුණු කිරීම් 2018 - 2020.
- දේපල, පිරියත සහ උපකරණ: අපේක්ෂිත භාවිතයට පෙර ආදායම (LKAS 16 හි සංශෝධන).
- සංකල්පීය රාමුව වෙත යොමු කිරීම (SLFRS සංශෝධන 3) - බැරකම් වත්මන් හෝ වත්මන් නොවන ලෙස වර්ගීකරණය කිරීම (LKAS 1 හි සංශෝධන)
- ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කිරීම (LKAS 1 සහ SLFRS ප්‍රායෝගික ප්‍රකාශය 2 හි සංශෝධන).
- ගිණුම්කරණ ඇස්තමේන්තු අර්ථ දැක්වීම (LKAS 8 හි සංශෝධන).

7. දළ ආදායම

දෙසැම්බර් 31න් අවසන් වූ වර්ෂය සඳහා	2021	2020
	(රු.)	(රු.)
පොලී ආදායම (8.1 සටහන)	**23,545,299,165**	23,182,459,141
ගාස්තු හා කොමිස් ආදායම (9 සටහන)	**935,136,855**	1,143,097,671
ශුද්ධ වෙළෙඳ ලාභ/(අලාභ) (10 සටහන)	**(24,214,945)**	23,135,814
වෙනත් මෙහෙයුම් ආදායම් (11 සටහන)	**36,547,883**	5,554,243
දළ ආදායමේ එකතුව	**24,492,768,957**	24,354,246,869

8. ශුද්ධ පොලී ආදායම

8.1 පොලී ආදායම

දෙසැම්බර් 31න් අවසන් වූ වර්ෂය සඳහා	2021	2020
	(රු.)	(රු.)
බැංකුවල රඳවා තැබීම්	**364,966,827**	532,551,255
ක්‍රමක්ෂීන පිරිවැය මත මූල්‍ය වත්කම්		
වෙනත් ගනුදෙනුකරුවන්ගෙන් අය විය යුතු ණය හා ලැබිය යුතු දෑ	**19,937,925,746**	19,130,733,803
ණය හා වෙනත් උපකරණ	**3,242,406,591**	3,519,174,083
මුළු පොලී ආදායම	**23,545,299,165**	23,182,459,141

8.2 පොලී වියදම්

දෙසැම්බර් 31න් අවසන් වූ වර්ෂය සඳහා	2021	2020
	(රු.)	(රු.)
බැංකු වෙත ගෙවිය යුතු	**(1,180,999,383)**	(1,226,169,605)
වෙනත් ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු	**(8,483,808,364)**	(10,949,016,609)
කල්බදු වගකීම් මත පොලී වියදම්	**(228,565,487)**	(119,194,618)
මුළු පොලී වියදම්	**(9,893,373,234)**	(12,294,380,832)
ශුද්ධ පොලී ආදායම	**13,651,925,931**	10,888,078,309

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

9. ශුද්ධ ගාස්තු හා කොමිස් ආදායම

දෙසැම්බර් 31න් අවසන් වූ වර්ෂය සඳහා	2021	2020
	(රු.)	(රු.)
ගාස්තු හා කොමිස් ආදායම	**935,136,855**	1,143,097,671
ගාස්තු හා කොමිස් වියදම්	**(312,112,052)**	(271,935,223)
ශුද්ධ ගාස්තු හා කොමිස් ආදායම	**623,024,803**	871,162,448
සැදුම් ලබන්නේ:		
ණය	**834,390,141**	850,809,944
වෙළඳ හා ප්‍රේෂණ	**7,927,757**	6,844,618
තැන්පතු	**(274,099,141)**	(251,912,550)
වෙනත්	**54,806,046**	265,420,436
ශුද්ධ ගාස්තු හා කොමිස් ආදායම	**623,024,803**	871,162,448

10. ශුද්ධ වෙළඳ ලාභ/(අලාභ)

දෙසැම්බර් 31න් අවසන් වූ වර්ෂය සඳහා	2021	2020
	(රු.)	(රු.)
ලාභ හෝ අලාභ හරහා හඳුනාගත් මූල්‍ය වත්කම් -සාධාරණ අගය වෙනස් වීම	**42,980**	22,160
විනිමය (අලාභය)/ ලාභය	**(34,467,765)**	23,102,434
ලාභාංශ ආදායම	**10,209,840**	11,220
සමස්ත සේවකයින් හෝ විශේෂිත සේවක කාණ්ඩයන් සඳහා ඒකමතිකව අදාල වන අනුමත යෝජනා ක්‍රම යටතේ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් හට පිරිනමන ලද අනුග්‍රහය හැරුනුවිට, සම්බන්ධතාවයක් නොමැති සන්සන්දනීය පාර්ශ්ව සමඟ ගනුදෙනු වල නියමයන්ට සමාන වන නියමයන් හා කොන්දේසි සහිතව බැංකුව සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවලදී සම්බන්ධිත පාර්ශ්වයන් සමඟ ගනුදෙනුවලට එළැඹෙයි.

39. ඇප වශයෙන් ඔඩපනය කරන ලද වත්කම්

2020 සහ 2021 දෙසැම්බර් 31 දිනට බැරකම් වෙනුවෙන් ඇප වශයෙන් ඔඩපනය කරන ලද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි හඳුනාගත් සමස්ත මූල්‍ය වත්කම් පහත වගුවල දැක්වේ:

2021	පහසුකම් වර්ගය	පහසුකමේ වටිනාකම	ඇපයෙහි ස්වභාවය	ඇපයෙහි වටිනාකම	2021 දෙසැම්බර් 31 දිනට ශේෂය
		රු. මිලියන		රු. මිලියන	රු. මිලියන
1.	බැංකු අයිරාව - ලංකා බැංකුව	**1,326**	FD 80912939	**685.299**	**-**
			FD 74353124	**280.891**	
			FD 82300125	**242.000**	
			FD 74817306	**343.255**	
			FD 74588793	**320.040**	
			FD 74619066	**317.286**	
2.	බැංකු අයිරාව - මහජන බැංකුව	**200**	FD- 014-60-01-00015762-6	**501.926**	**-**

2020	පහසුකම් වර්ගය	පහසුකමේ වටිනාකම	ඇපයෙහි ස්වභාවය	ඇපයෙහි වටිනාකම	2020 දෙසැම්බර් 31 දිනට ශේෂය
		රු. මිලියන		රු. මිලියන	රු. මිලියන
1.	බැංකු අයිරාව - ලංකා බැංකුව	1,326	FD 80912939	631.341	-
			FD 74353124	257.523	
			FD 82300125	242.000	
			FD 74817306	316.229	
			FD 74588793	294.968	
			FD 74619066	292.304	
2.	බැංකු අයිරාව - මහජන බැංකුව	200	FD- 014-60-01-00014391-8	458.271	-

40. අසම්භාව්‍ය වගකීම් සහ බැඳීම්

සාමාන්‍ය ව්‍යාපාර ක්‍රියාවලියේදී ගනුදෙනුකරුවන්ගේ මූල්‍ය හා ආයෝජන අවශ්‍යතා සපුරාලීම, වෙළඳ කටයුතු සිදු කිරීම සහ අවදානමට නිරාවරණය වීම කළමනාකරණය කිරීම සඳහා බැංකුව සිය ගනුදෙනුකරුවන්ට නෛතික උපයෝජන සහිතව බැඳීම් භාරගනිමින් අසම්භාව්‍ය වගකීම් දරනු ලැබේ. මෙම මූල්‍ය උපකරණ පොලී හෝ ගාස්තු උත්පාදනය කරන අතර මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ වත්කම් හා වගකීම් ලෙස හඳුනාගත් ප්‍රමාණයන්ට අතිරේකව ණය අවදානමේ සංරචක දරනු ලැබේ. කෙසේ වෙතත්, මෙම ගනුදෙනුවල ප්‍රතිඵලයක් ලෙස කිසිදු ද්‍රව්‍යමය අලාභයක් අපේක්ෂා නොකෙරේ. මෙම අසම්භාව්‍ය වගකීම් සහ බැඳීම් පහත දැක්වේ:

මෙම හදිසි අවස්ථා සහ කැපවීම් පහත දැක්වේ:

දෙසැම්බර් මස 31 වන දින	2021	එකතුව
	රු.	රු.
ඇපකර සහ කාර්ය සාධන බැඳුම්කර	**177,766,966**	138,447,168
අනෙකුත් හදිසි අවස්ථා ඇයිතම	**51,429,192**	65,929,841
අඩු : අපේක්ෂිත ණය අලාභ සඳහා හානිකරණ - ඇපකර	**(3,308,006)**	(2,042,296)
එකතුව	**225,888,152**	202,334,713

40.1 බැඳීම් හා අසම්භාව්‍යතාවයන් ණය අවදානම වෙත නිරාවරණය වීම පිළිබඳ විශ්ලේෂණය

2021 දෙසැම්බර් 31 වන විට	අදියර 1	එකතුව
	රු.	රු.
ඇපකර සහ කාර්ය සාධන බැඳුම්කර	**177,766,966**	**177,766,966**
අනෙකුත් හදිසි අවස්ථා භාණ්ඩ	**51,429,192**	**51,429,192**
අපේක්ෂිත ණය අලාභ දීමනාව (සටහන 40.1.1)	**(3,308,006)**	**(3,308,006)**
	225,888,152	**225,888,152**

2020 දෙසැම්බර් 31 වන විට	අදියර 1	එකතුව
	රු.	රු.
ඇපකර සහ කාර්ය සාධන බැඳුම්කර	138,447,168	138,447,168
අනෙකුත් හදිසි අවස්ථා භාණ්ඩ	65,929,841	65,929,841
අපේක්ෂිත ණය අලාභ දීමනාව (සටහන 40.1.1)	(2,042,296)	(2,042,296)
	202,334,713	202,334,713

40.1.1 අපේක්ෂිත ණය අලාභ දීමනාව

2021 දෙසැම්බර් 31වන විට	2021	2020
	රු.	රු.
ජනවාරි 01 දිනට ශේෂය	**2,042,296**	2,189,819
වර්ෂය සඳහා අපේක්ෂිත ණය අලාභ දීමනාව	**1,265,710**	(147,522)
දෙසැම්බර් 31 දිනට ශේෂය	**3,308,006**	2,042,296

41. බැංකුවට එරෙහිව නෛතික ක්‍රියාමාර්ග

බැංකුවට එරෙහිව නඩු පැවරීම බැංකුව විසින් සිදු කරන ව්‍යාපාරයේ ස්වභාවය හේතුවෙන් සහ බැංකු කර්මාන්තයේ දක්නට ලැබෙන සුලභ සිදුවීමකි. නෛතික හිමිකම් කළමනාකරණය කිරීම සඳහා බැංකුවට විධිමත් පාලනයන් සහ ප්‍රතිපත්ති ඇත. වෘත්තීය උපදෙස් ලබා ගත් පසු සහ සිදුවිය හැකි පාඩු ප්‍රමාණය සාධාරණ ලෙස ඇස්තමේන්තු කළ පසු, බැංකුවේ මූල්‍ය ස්ථාවරය සඳහා බලපෑම් ඇති කරන අහිතකර බලපෑම් සඳහා ගිණුම් වලට ගැලපීම් සිදු කරනු ලැබේ. 2021/12/31 වන විට බැංකුවට එරෙහිව නෛතික ක්‍රියාමාර්ග 44 ක් ඇති අතර සියලුම හිමිකම් ප්‍රමාණවත් ලෙස සපයා ඇත. බැංකුවට එරෙහිව දැනට විභාග වෙමින් පවතින නඩු කටයුතු වාර්තා වූ මූල්‍ය ප්‍රතිඵල හෝ බැංකුවේ ඉදිරි මෙහෙයුම් කටයුතු කෙරෙහි ප්‍රමාණාත්මක බලපෑමක් ඇති නොකරන බව බැංකුවේ නීති දෙපාර්තමේන්තුවේ අදහසයි.

42. වාර්තා කරන දිනයට පසු සිදුවීම්

15.5 සටහන යටතේ හෙළිදරව් කරන ලද කාරණය හැර මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් හෝ හෙළිදරව් කිරීම් අවශ්‍ය වන කිසිදු සිදුවීමක් වාර්තා කිරීමේ දිනයේ සිට පැන නැඟී නොමැත.

43. කොරෝනා වයිරසය (COVID 19) පැතිරීම

2019 දෙසැම්බර් මස චීනයේ වූහාන් ප්‍රාන්තයෙන් ඇරඹී කෝවිඩ් 19 වසංගතය මේ වන විට සමස්ත ලෝක ආර්ථිකය අඩාල කරමින් බොහොමයක් කර්මාන්තයන් හා ක්ෂේත්‍රයන් කෙරෙහි අහිතකර බලපෑම් සිදු කොට ඇත. මෙහිදී අදාළ රජයන් විසින් විවිධ පූර්වාරක්ෂණ පියවර ගන්නා ලද අතර, ජීවායේ බලපෑම ලොව පුරා ක්ෂේත්‍රයන් රැසක් වෙත ප්‍රබල අයුරින් දැනෙන්නට විය.

ශ්‍රී ලංකා රජය විසින් ගනු ලැබූ අවශ්‍ය කොවිඩ් මර්දන පියවරයන් ද ස්වභාවයෙන්ම ක්ෂේත්‍රයන් කිහිපයක ව්‍යාපාරික මෙහෙයුම් සඳහා බාධා වේල්ල කරමින් සමස්ත ආර්ථික ක්‍රියාවලිය යම් මට්ටමකින් අඩාල වීම කෙරෙහි හේතු වූ අතර එමඟින් සමස්තයක් වශයෙන් ප්‍රාදේශීය සංවර්ධන බැංකුව ඇතුළු සමස්ත බැංකුකරණ ක්ෂේත්‍රය වෙතද අහිතකර බලපෑම් වේල්ල විය. මෙහි සෘණාත්මක මූල්‍යමය බලපෑම 2021 දී ප්‍රාදේශීය සංවර්ධන බැංකුව ඇතුළු සමස්ත බැංකුකරණ ක්ෂේත්‍රය වෙත වේල්ල විය.

මෙම විලම්බන කාලය තුළදී, පිරිනමන ලද විවිධ වූ සහන හේතුවෙන් පශ්චාත් විලම්බන කාලසීමාවේදී සිදුවිය හැකි අක්‍රිය ණය වල ඉහළ යාම හේතු කොට ගෙන බැංකුවේ ඉපැයුම් හා ද්‍රවශීලතා තත්ත්වය කෙරෙහි අහිතකර බලපෑම් ඇති විය හැක. ඉපැයුම් කෙරෙහි වූ සෘණාත්මක බලපෑම බැංකුවේ නියාමනමය ප්‍රාග්ධන අනුපාතයන් මත අනිසි ආතතියක් ඇති නොකරනු ඇති බව කළමනාකාරිත්වයේ අදහස වේ.

මෙම සන්දර්භය තුළ, 2021 දෙසැම්බර් 31 දිනට අපේක්ෂිත ණය අලාභය එදිනට පැවැති පුරෝකථනිත ආර්ථික තත්ත්ව මාලාවක්ම පදනම් කර ගෙන තක්සේරු කරන ලදී. එහිදී, දළ දේශීය නිෂ්පාදිතය වෙත වේල්ල වූ බලපෑම සහ 2021 මූල්‍ය වර්ෂය තුළ අපේක්ෂිත ණය අලාභ තක්සේරු කරනු පිණිස යොදා ගන්නා ලද අනෙකුත් ප්‍රධාන දර්ශක ආශ්‍රිත ආර්ථික පසුබෑම හා එහි බරපතලකම නිර්ණය කිරීමේදී එකී සාධක සැලකිල්ලට ගන්නා ලදි. බැංකුව 2021.12.31. දින වන විට ලබා ගත හැකිව තිබුණු තොරතුරු මත පදනම්ව අපේක්ෂිත ණය අලාභ ගණනය කරන ලදී

බැංකුව මඟින් අබණ්ඩවම කවර හෝ සිදුවිය හැකි බලපෑමක් අවම කිරීම සඳහා අවශ්‍ය පූර්ව ආරක්ෂණ පියවර සිය සාධාරණ පාලනය ඇතුළත පූර්ණ වශයෙන් ගනු ලබන අතර, අදාළ අවිනිශ්චිතතා හා අවදානම් කළමනාකරණ පියවර සමීප සමාලෝචනාත්මක ස්වභාවයක් යටතේ පවත්වා ගනු ඇත. පවතින තත්ත්වය දිගින් දිගටම වර්ධනය වෙමින් ආර්ථික ක්‍රියාකාරකම් සාමාන්‍යකරණය වීමේ කාල රාමු තවමත් නිශ්චිතව පැවසිය නොහැකි පසුබිමක් තුළ, වර්තමාන අවදියේදී අනවශ්‍ය පිරිවැයක් හෝ ප්‍රයත්නයක් දැරීමෙන් තොරව පවතින සාධාරණ තොරතුරු මත පදනම්ව, අපගේ ප්‍රධාන වෙළඳපොල හා බැංකුවේ මූල්‍යමය ප්‍රතිඵල පිළිබඳ සාධාරණව ඇස්තමේන්තුගත කිරීම හෝ විශ්වසනීය අයුරින් මැනීම හෝ සිදු කළ නොහැකි වේ.

44. ප්‍රවර්තන හා ප්‍රවර්තන නොවන විශ්ලේෂණය

2021 දෙසැම්බර් 31 දිනට

වත්කම්	මාස 12 ඇතුළත	මාස 12 කට පසු	එකතුව
	රු.	රු.	රු.
මුදල් හා මුදල් සමානයන්	1,486,878,989	-	1,486,878,989
බැංකුවල ස්ථානගත කිරීම්	6,596,072,932	-	6,596,072,932
ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට මනින ලද ස්කන්ධ උපකරණ	188,140	-	188,140
ක්‍රමක්ෂිත පිරිවැය අනුව මූල්‍ය වත්කම් - වෙනත් ගනුදෙනුකරුවන්ගෙන් ණය හා ලැබිය යුතු දෑ	62,634,410,988	112,595,255,668	175,229,666,656
ක්‍රමක්ෂිත පිරිවැය අනුව මූල්‍ය වත්කම් - ණය හා වෙනත් උපකරණ	54,856,210,318	-	54,856,210,318
වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ අගයට මනින ලද ස්කන්ධ උපකරණ	-	2,289,919	2,289,919
දේපල, පිරියත හා උපකරණ	-	928,568,438	928,568,438
අස්පෘශ්‍ය වත්කම්	-	113,688,780	113,688,780
භාවිත හිමිකම් වත්කම්	-	505,092,023	505,092,023
විලම්භිත බදු වත්කම්	-	1,263,795,071	1,263,795,071
වෙනත් වත්කම්	3,827,515,561	1,079,544,736	4,907,060,297
මුළු වත්කම්	129,401,276,928	116,488,234,634	245,889,511,562
වගකීම්			
බැංකු වෙත ගෙවිය යුතු	4,143,128,486	25,357,808,057	29,500,936,543
වෙනත් ගනුදෙනුකරුවන් වෙත ගෙවිය යුතු	127,934,846,256	59,817,618,999	187,752,465,256
නිකුත් කළ ණය හා ණයට ගත් වෙනත් අරමුදල්	2,000,000,000	-	2,000,000,000
ප්‍රවර්තන බදු වගකීම්	503,021,886	-	503,021,886
වෙනත් වගකීම්	3,562,698,921	4,130,601,890	7,693,300,812
විශ්‍රාමික ප්‍රතිලාභ බැඳීම	193,769,265	2,852,695,474	3,046,464,739
මුළු වගකීම්	138,337,464,814	92,158,724,420	230,496,189,235
කල්පිරීමේ පරතරය	(8,936,187,887)	24,329,510,214	15,393,322,327
සමුච්චිත පරතරය	(8,936,187,887)	15,393,322,328	-

2020 දෙසැම්බර් 31 දිනට

වත්කම්	මාස 12 ඇතුළත	මාස 12 කට පසු	එකතුව
	රු.	රු.	රු.
මුදල් හා මුදල් සමානයන්	3,758,858,141	-	3,758,858,141
බැංකුවල ස්ථානගත කිරීම්	8,436,353,244	-	8,436,353,244
ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට මනින ලද ස්කන්ධ උපකරණ	145,160	-	145,160
ක්‍රමක්ෂීත පිරිවැය අනුව මූල්‍ය වත්කම් - වෙනත් ගනුදෙනුකරුවන්ගෙන් ණය හා ලැබිය යුතු දෑ	55,041,777,148	101,652,275,325	156,694,052,473
ක්‍රමක්ෂීත පිරිවැය අනුව මූල්‍ය වත්කම් - ණය හා වෙනත් උපකරණ	46,962,354,137	-	46,962,354,137
වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ අගයට මනින ලද ස්කන්ධ උපකරණ	-	2,289,919	2,289,919
දේපල, පිරියත හා උපකරණ	-	970,538,655	970,538,655
අස්පෘශ්‍ය වත්කම්		21,272,699	21,272,699
භාවිත හිමිකම් වත්කම්	-	598,978,557	598,978,557
විලම්භිත බදු වත්කම්	-	903,720,969	903,720,969
වෙනත් වත්කම්	1,768,425,361	992,161,209	2,760,586,569
මුළු වත්කම්	115,967,913,191	105,141,237,333	221,109,150,524
වගකීම්			
බැංකු වෙත ගෙවිය යුතු	3,416,991,461	18,379,687,889	21,796,679,350
වෙනත් ගනුදෙනුකරුවන් වෙත ගෙවිය යුතු	114,598,563,913	58,284,068,365	172,882,632,278
නිකුත් කළ ණය හා ණයට ගත් වෙනත් අරමුදල්	-	2,000,000,000	2,000,000,000
ප්‍රවර්තන බදු වගකීම්	378,203,555	-	378,203,555
වෙනත් වගකීම්	2,630,439,194	3,524,004,582	6,154,443,776
විශ්‍රාමික ප්‍රතිලාභ බැඳීම	164,537,301	2,618,337,323	2,782,874,624
මුළු වගකීම්	107,815,937,269	84,806,098,159	205,994,833,583
කල්පිරීමේ පරතරය	8,151,975,922	20,335,139,174	15,114,316,940
සමුච්චිත පරතරය	8,151,975,922	28,487,115,096	-

45. මූල්‍ය අවදානම් කළමනාකරණය

45.1 හැඳින්වීම

මූල්‍ය උපකරණ හරහා බැංකුව ප්‍රධාන වශයෙන් පහත දැක්වෙන අවදානම්වලට නිරාවරනය වෙයි:

- ණය අවදානම
- ද්‍රවශීලතා අවදානම
- වෙළඳපොල අවදානම
- මෙහෙයුම් අවදානම

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

45.1.1 අවදානම් කළමනාකරණ රාමුව

බැංකුවේ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය ස්ථාපනය කිරීම සහ අධීක්ෂණය කිරීමේ සමස්ත වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිය අධිකාරීත්වය බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව හා අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව වෙත පවරනු ලැබ ඇත. මෙම කමිටුව බැංකුවේ විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ සාමාජිකයින්ගෙන් සමන්විත වේ. අවදානම් කළමනාකරණ කමිටු රැස්වීම් නිරන්තරයෙන් පැවැත්වෙන අතර, එහි ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය නිසි පරිදි යාවත්කාලීන කෙරේ විධායක කළමනාකරණ කමිටුව, වත්කම් සහ වගකීම් කමිටුව (ALCO), විධායක ණය කළමනාකරණ කමිටුව සහ තොරතුරු තාක්ෂණ මෙහෙයුම් කමිටුව වැනි විධායක කළමනාකරණ අනු කමිටු කිහිපයක් ඇත, ඒවා ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවට සහාය වන විශේෂිත අවදානම් ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කරයි.

බැංකුවේ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තීන් සකසනු ලැබ ඇත්තේ, බැංකුව මුහුණදෙන අවදානම් හඳුනාගැනීම, යෝග්‍ය වූ අවදානම් සීමාවන් හා පාලනයන් සැකසීම සහ ස්ථාපිත සීමාවන් කෙරෙහි අනුකූලතාවය නිරීක්ෂණය කිරීමේ අරමුණෙනි. වෙළඳපොල තත්ත්වයන්, ඉදිරිපත් කෙරෙන සැලසුම් හා සේවාවන්හි වෙනස්වීම් පිළිබිඹුවන පරිදි අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තීන් නිරන්තරයෙන් සමාලෝචනයට ලක් කෙරේ. බැංකුව, එහි පුහුණු සහ කළමනාකරණ ප්‍රමිතීන් සහ ක්‍රියා පටිපාටි හරහා, සියළුම සේවකයින් ඔවුන්ගේ කාර්යභාරයන් සහ වගකීම් අවබෝධ කර ගන්නා විනයගරුක සහ නිර්මාණාත්මක පාලන පරිසරයක් සංවර්ධනය කිරීම අරමුණු කරයි.

බැංකුවේ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටිවලට අනුකූල වීම අධීක්ෂණය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව වගකීම දරයි. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවට අභ්‍යන්තර විගණනය මගින් මෙම කාර්යයන් සඳහා සහාය වේ. අභ්‍යන්තර විගණනය විසින් අවදානම් කළමනාකරණ පාලනයන් සහ ක්‍රියා පටිපාටි පිළිබඳ නිත්‍ය සහ තත්වකාලීන සමාලෝචන සිදු කරන අතර, එහි ප්‍රතිඵල අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව වෙත වාර්තා කෙරේ.

45.1.2 වත්කම් හා වගකීම් කමිටුව

සාමාන්‍යාධිකාරීවරයා විසින් මෙම කමිටුවෙහි සභාපතිත්වය දරනු ලබන අතර මෙය මූල්‍ය, ණය හා අවදානම් කළමනාකරණ දෙපාර්තුමේන්තු නියෝජිතයින් ගෙන් සමන්විත වේ. කමිටුව නිරන්තරයෙන් රැස්වෙමින් නියාමන අවශ්‍යතා සපුරාලමින්, බැංකුවේ වත්කම් හා වගකීම් නිරීක්ෂණය හා කළමනාකරණ සිදුකරන අතර බැංකුවේ ද්‍රවශීලතා මට්ටම් යහපත් ආකාරයෙන් පවත්වා ගැනීම උදෙසා සමස්ත ද්‍රවශීලතා තත්ත්වය කෙරෙහිද එහි අවධානය යොමු කෙරේ.

45.1.3 අවදානම් මිනුම්ගත කිරීම හා වාර්තා කිරීම

අවදානම් වර්ගය, සහ ක්ෂේත්‍රයේ යහ ක්‍රියාකාරකම් මත පදනම්ව නිසි තාක්ෂණික ශිල්ප ක්‍රම යොදාගනිමින් බැංකුවේ අවදානම් මනිනු ලැබේ. ප්‍රමුඛ වර්ගවල අවදානම් ආශ්‍රිත ආන්තික/දරුණු ගනයේ තත්ත්වයන්හි බලපෑම හඳුනාගැනීම සඳහා බැංකුව විසින් ආතති පරීක්ෂාවන්ද සිදු කරනු ලැබේ. ඒවායේ ප්‍රතිඵල ආවර්තිත පදනමක් මත අවදානම් කළමනාකරණ කමිටුව වෙත වාර්තා කෙරේ. අවදානම් නිරීක්ෂණ හා පාලනය මූලික වශයෙන් බැංකුවේ ප්‍රතිපත්ති, සීමාවන් සහ කඩඉම් පාදක කරගනිමින් සිදු කෙරේ. මෙම සීමාවන් මගින් බැංකුවේ ව්‍යාපාරික ක්‍රමෝපාය හා වෙළඳපොල වටපිටාව පිළිබිඹු වන අතර බැංකුවෙහි අවදානම් දරාගැනීමේ සූදානමද මෙමගින් පිළිබිඹු කෙරේ.

45.1.4 අවදානම් අවම කිරීම

සිය සමස්ත අවදානම් කළමනාකරණයෙහි කොටසක් වශයෙන්, බැංකුව මගින් අවදානම ලිහිල් කිරීම සඳහා විවිධ වර්ගයේ ඇප ලබා ගැනේ. පිළිගත හැකි ඇපවල ස්වභාවය, අවශ්‍ය සුරක්ෂිතතා තීරුව වැනි විස්තර බැංකුවේ ණය ප්‍රතිපත්තියෙහි පැහැදිලිව අර්ථ දක්වා ඇති අතර ඉන් කවර හෝ අපගමනයක් සඳහා විශේෂිත අනුමැතියක් අවශ්‍ය වේ. කෙසේ වෙතත්, අදාළ අනුමත අධිකාරී බලය තුළ ආපසු ගෙවීමේ ද්විතියික මූලාශ්‍රය ලෙස පමණක් ආරක්ෂාව ලබා ගැනීමේ හැකියාව සැලකිල්ලට ගනී.

45.2 ණය අවදානම

ණය අවදානම යනු ණය සුරැකුම්පත්වලින් ගනුදෙනුකරුවන්ට/වෙනත් බැංකු සහ ආයෝජන වලට ලබාදෙන බැංකුවේ ණය සහ අත්තිකාරම් වලින් මූලික වශයෙන් පැන නැගෙන, ණය කරුවෙකු හෝ මූල්‍ය උපකරණයකට ප්‍රතිපාර්ශ්වයක් විසින් තම ගිවිසුම්ගත බැඳීම්වලට අනුව ක්‍රියාකිරීමට අපොහොසත් වීම මත බැංකුවට සිදුවන මූල්‍යමය අලාභය වේ.

සෘජු අරමුදල් සම්පාදන නිරාවරනයන්ගෙන් ඇති වන ණය අවදානමට අමතරව, බැංකුව ණය අවදානම දරන්නා වූ ඇප වැනි වක්‍ර බැරකම් වෙතද නිරාවරණය වේ. බැංකුව මගින් දැඩි ණය අවදානම් කළමනාකරණයක් තහවුරු කිරීම උදෙසා ණය අවදානම් නිරාවරණයෙහි සියලුම සංරචකයන් (තනි බන්ධනදායිය ණය පැහැරහැරීමේ අවදානම, දේශීය සහ ආංශික සංකේන්ද්‍රණ අවදානම් වැනි) සලකා බලමින් ඒකාබද්ධකරණයට ලක් කෙරේ.

ණය අවදානම කළමනාකරණය

ණය අවදානම අධීක්ෂණය කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිය අධ්‍යක්ෂ මණ්ඩල ණය කමිටුව වෙත පවරා ඇත (2021 ජූනි මාසයේ සිට ක්‍රියාත්මක වන පරිදි අත්හිටුවන ලදී). බැංකු ණය පරිපාලන ඒකකය ප්‍රධාන අවදානම් නිලධාරියා හරහා විධායක ණය කළමනාකරණ කමිටුව වෙත වාර්තා කිරීම බැංකුවේ ණය අවදානම කළමනාකරණය කිරීම සඳහා වගකිව යුතුය:

- ව්‍යාපාර ඒකක සමඟ සාකච්ඡා කර ණය ප්‍රතිපත්ති සැකසීම, ඇප අවශ්‍යතා, ණය ඇගයීම, අවදානම් ශ්‍රේණිගත කිරීම සහ වාර්තාකිරීම, වාර්තාමය හා නෛතික ක්‍රියාපටිපාටි සහ නියාමන හා ව්‍යස්ථාපිත අවශ්‍යතා වලට අනුකූල වීම.
- ණය පහසුකම් අනුමත කිරීම සහ අළුත් කිරීම සඳහා කර්තෘ ව්‍යුහය ස්ථාපිත කිරීම. ව්‍යාපාර ඒකක ණය නිලධාරීන් සඳහා බලය පැවරීමේ සීමාවන් වෙන් කර ඇත. විශාල පහසුකම් සඳහා ණය ප්‍රධානීන්, අධ්‍යක්ෂ මණ්ඩල ණය කමිටුව (2021 ජූනි මාසයේ සිට ක්‍රියාත්මක වන පරිදි අත්හිටුවන ලද) හෝ සුදුසු පරිදි අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය අවශ්‍ය වේ.
- ණය අවදානම සමාලෝචනය කිරීම සහ තක්සේරු කිරීම. අදාළ ව්‍යාපාර ඒකකය විසින් ගනුදෙනුකරුවන්ට කැපවන පහසුකම් වලට පෙර, ණය ප්‍රධානීන් විසින් නම් කරන ලද සීමාවන් ඉක්මවා සියලු ණය නිරාවරණ තක්සේරු කරනු ලැබේ. පහසුකම් අලුත් කිරීම සහ සමාලෝචන චක්‍රය සමාලෝචන ක්‍රියාවලියකට යටත් වේ.
- ප්‍රතිපාර්ශවයන්, භූගෝලීය හා කර්මාන්ත (ණය සහ අත්තිකාරම් සඳහා) සහ නිකුත් කරන්නා විසින් නිරාවරණය වීමේ සාන්ද්‍රණය සීමා කිරීම.
- තෝරාගත් කර්මාන්ත, රටේ අවදානම සහ නිෂ්පාදන වර්ග ඇතුළුව චක්‍රඟ වූ නිරාවරණ සීමාවන් සහිත ව්‍යාපාර ඒකකවල අනුකූලතාව සමාලෝචනය කිරීම. දේශීය කළඹවල ණය ගුණාත්මකභාවය පිළිබඳ නිතිපතා වාර්තා ණය ප්‍රධානීන්ට සපයනු ලබන අතර ඒවාට සුදුසු නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය විය හැකිය.
- ණය අවදානම් කළමනාකරණයේදී බැංකුව පුරා හොඳම පරිචය ප්‍රවර්ධනය කිරීම සඳහා ව්‍යාපාර ඒකක සඳහා උපදෙස්, මාර්ගෝපදේශන සහ විශේෂඥ නිපුණතා ලබා දීම.
- ව්‍යාපාර ඒකක සහ බැංකු ණය ක්‍රියාවලීන් පිළිබඳ නිතිපතා විගණනය අභ්‍යන්තර විගණනය මගින් සිදු කරනු ලැබේ.

ණය අවදානමට නිරාවරණය වීම

පහත වගුවේ මූල්‍ය වත්කම්වල ණය ගුණාත්මකභාවය සහ එම වත්කම් වලට සාපේක්ෂව බැංකුව සතු හානිකරණ / අපේක්ෂිත ණය අලාභ සඳහා දීමනාව පිළිබඳ තොරතුරු දක්වා ඇත.

ණය තත්ව විශ්ලේෂණය

බැංකුවේ ගෙවීම් පැහැර හැරීමේ තත්ත්වය

පැහැර හැරීමේ තත්ත්වය	විස්තර
1 අදියර	
සාමාන්‍ය	සක්‍රීය
දින 1-30	සක්‍රීය
2 අදියර	
දින 31-60	අවක්‍රීය
දින 61-90	අවක්‍රීය
3 අදියර	
දින 90ට වැඩි	අක්‍රීය

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

දෙසැම්බර් 31 වන දින වන විට	2021			
	අදියර 1	අදියර 2	අදියර 3	මුළු
	රු.	රු.	රු.	රු.
මූල්‍ය වත්කම්- අනෙකුත් ගනුදෙනුකරුවන්ගෙන් ණය සහ ලැබිය යුතු ණය				
0-2 ශ්‍රේණියේ කාර්ය සාධන ණය	157,928,510,574	14,241,187,466	306,097,259	172,475,795,299
3 ශ්‍රේණියේ: NPA විශේෂ සඳහන	-	-	1,228,173,841	1,228,173,841
4 ශ්‍රේණියේ: NPA ප්‍රමිතියෙන් තොර	-	-	3,367,055,156	3,367,055,156
5 ශ්‍රේණියේ: NPA සැක සහිත	-	-	2,223,011,575	2,223,011,575
6 ශ්‍රේණියේ: NPA අලාභය	-	-	9,745,630,548	9,745,630,548
අනෙකුත් ගනුදෙනුකරුවන්ගෙන් ලබාගත් මුළු ණය සහ ලැබිය යුතු මුදල්	157,928,510,574	14,241,187,466	16,869,968,380	189,039,666,420
අපේක්ෂිත ණය අලාභ දීමනාව	(2,530,819,723)	(3,038,214,893)	(7,370,100,371)	(12,939,134,987)
අනෙකුත් ගනුදෙනුකරුවන්ගෙන් ලබාගත් ශුද්ධ ණය සහ ලැබිය යුතු මුදල්	155,397,690,851	11,202,972,573	9,499,868,009	176,100,531,433
ක්‍රමක්ෂය පිරිවැය යටතේ මූල්‍ය ආයෝජන - ණය සහ වෙනත් උපකරණ				
ප්‍රකාශිත ණයකර	623,946,610	-	-	623,946,610
රජයේ ණය සුරැකුම්පත් - භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර	4,813,547,891	-	-	4,813,547,891
ස්ථාවර තැන්පතු සඳහා ආයෝජනය	49,420,476,709	-	-	49,420,476,709
මුළු ණය සහ වෙනත් උපකරණ	54,857,971,211	-	-	54,857,971,211
අපේක්ෂිත ණය අලාභ දීමනාව	(1,760,892)	-	-	(1,760,892)
ශුද්ධ ණය සහ වෙනත් උපකරණ	54,856,210,319	-	-	54,856,210,319
බැංකු සමඟ ස්ථානගත කිරීම්				
මුදල් වෙළඳපොළ ස්ථානගත කිරීම්	6,596,072,932	-	-	6,596,072,932
බැංකු සමඟ මුළු ස්ථානගත කිරීම්	6,596,072,932	-	-	6,596,072,932
අපේක්ෂිත ණය අලාභ දීමනාව	-	-	-	-
බැංකු සමඟ ශුද්ධ ස්ථානගත කිරීම්	6,596,072,932	-	-	6,596,072,932
බැඳීම් හා අසම්භාව්‍යතා				
බැංකු ඇපකරය	177,766,966	-	-	177,766,966
චෙක් රැස් කිරීම සඳහා යවන ලද බිල්පත්	51,429,192	-	-	51,429,192
සම්පූර්ණ බැඳීම් හා අසම්භාව්‍යතා	229,196,158	-	-	229,196,158
අපේක්ෂිත ණය අලාභ දීමනාව	(3,308,006)	-	-	(3,308,006)
ශුද්ධ බැඳීම් හා අසම්භාව්‍යතා	225,888,152	-	-	225,888,152

දෙසැම්බර් 31 වන දින වන විට	2020			
	අදියර 1	අදියර 2	අදියර 3	මුළු
	රු.	රු.	රු.	රු.
ක්‍රමක්ෂිත පිරිවැයට මූල්‍ය වත්කම් - අනෙකුත් ගනුදෙනුකරුවන්ගෙන් ණය සහ ලැබිය යුතු ණය				
0-2 ශ්‍රේණියේ කාර්ය සාධන ණය	119,285,034,714	20,078,064,947	11,141,167,650	154,094,224,085
3 ශ්‍රේණියේ: NPA විශේෂ සඳහන	-	-	4,463,579,680	873,622,905
4 ශ්‍රේණියේ: NPA ප්‍රමිතියෙන් තොර	-	-	2,299,858,885	2,299,858,885
5 ශ්‍රේණියේ: NPA අඩමාන	-	-	1,905,298,067	1,905,298,067
6 ශ්‍රේණියේ: NPA අලාභ	-	-	7,926,045,779	7,926,045,779
අනෙකුත් ගනුදෙනුකරුවන්ගෙන් ලබාගත් මුළු ණය සහ ලැබිය යුතු මුදල්	119,285,034,714	20,078,064,947	27,735,950,061	167,099,049,722
අපේක්ෂිත ණය අලාභ දීමනාව	(1,680,593,572)	(1,263,209,626)	(6,734,872,826)	(9,678,676,023)
අනෙකුත් ගනුදෙනුකරුවන්ගේ ශුද්ධ ණය සහ ලැබිය යුතු මුදල්	117,604,441,142	18,814,855,321	21,001,077,235	157,420,373,698
ක්‍රමක්ෂය පිරිවැය යටතේ මූල්‍ය ආයෝජන - ණය සහ වෙනත් උපකරණ				
ප්‍රකාශිත ණයකර	1,025,565,069	-	-	1,025,565,069
රජයේ ණය සුරැකුම්පත් - භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර	3,771,096,580	-	-	3,771,096,580
ස්ථාවර තැන්පතු සඳහා ආයෝජනය	42,167,885,800	-	-	42,167,885,800
මුළු ණය සහ වෙනත් උපකරණ	46,964,547,449	-	-	46,964,547,449
අපේක්ෂිත ණය අලාභ දීමනාව	(2,193,312)	-	-	(2,193,312)
ශුද්ධ ණය සහ වෙනත් උපකරණ	46,962,354,137	-	-	46,962,354,137
බැංකු සමඟ ස්ථානගත කිරීම්				
මුදල් වෙළඳපොළ ස්ථානගත කිරීම්	8,436,353,244	-	-	8,436,353,244
බැංකු සමඟ මුළු ස්ථානගත කිරීම්	8,436,353,244	-	-	8,436,353,244
අපේක්ෂිත ණය අලාභ දීමනාව	-	-	-	-
බැංකු සමඟ ශුද්ධ ස්ථානගත කිරීම්	8,436,353,244	-	-	8,436,353,244
බැඳීම් හා අසම්භාව්‍යතා				
බැංකු ඇපකරය	138,447,168	-	-	138,447,168
චික් රැස් කිරීම සඳහා යවන ලද බිල්පත්	65,929,841	-	-	65,929,841
සම්පූර්ණ බැඳීම් හා අසම්භාව්‍යතා	204,377,009	-	-	204,377,009
අපේක්ෂිත ණය අලාභ දීමනාව	(2,042,296)	-	-	(2,042,296)
ශුද්ධ බැඳීම් හා අසම්භාව්‍යතා	202,334,713	-	-	202,334,713

ගනුදෙනුකරුවන්ගේ මූල්‍ය අවශ්‍යතා සපුරාලීම සඳහා බැංකුව විවිධ බැඳීම් හා අසම්භාව්‍ය වගකීම් වලට එළඹේ. මෙම බැඳීම් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය තුළ හඳුනා නොගන්නේ වුවද එහි ණය අවදානම අඩංගු වන නිසා බැංකුවේ සමස්ථ අවදානමේ කොටසක් වේ.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

45.2.1 අපේක්ෂිත ණය පාඩු මැනීම (ECL)

SLFRS 9 යටතේ හානිකරණ තක්සේරු කිරීම සඳහා භාවිතා කරන යෙදවුම්, උපකල්පන සහ ශිල්පීය ක්‍රම ගිණුම්කරණ ප්‍රතිපත්ති සටහන 5.1.2.5 යටතේ අනාවරණය කර ඇත.

ණය අවදානමෙහි සැලකිය යුතු ඉහළ යාම

බැංකුව මගින් අඛණ්ඩව අපේක්ෂිත ණය අලාභවලට ලක් වන වත්කම් නිරීක්ෂණය කරනු ලැබේ. කිසියම් උපකරණයක් හෝ උපකරණ කළඹක් මාස 12 අපේක්ෂිත ණය අලාභ වලට හෝ ජීව කාල අපේක්ෂිත ණය අලාභ වලට ලක්වන්නේ දැයි යන්න නිර්ණය කිරීම සඳහා බැංකුව විසින්, මූලික හඳුනාගැනීමේ සිට ණය අවදානමෙහි සැළකිය යුතු ඉහළ යාමක් පවතීද යන්න තක්සේරු කෙරේ. ගනුදෙනුකරුවන් විසින් ගෙවීමට නියමිත දිනය දින 30 ක් කල්පසු කළ විට බැංකුව විසින් සැළකිය යුතු අන්දමින් ඉහළගිය ණය අවදානම හඳුනාගැනේ.

බැංකුව මගින්, ගනුදෙනුකරුවකු පහසුකමක් රැකුම් ලැයිස්තුවට ඇතුළත් කිරීම, හෝ ගිණුම වළකන ලද තත්ත්වයට පත්වීම වැනි, වත්කමක ණය අවදානමෙහි සැලකිය යුතු ඉහළයාම හඳුනාගැනීම සඳහා ද්විතීයික ගුණාත්මක ක්‍රමවේදයක්ද යොදාගැනේ.

ඉදිරි දැක්මක් සහිත තොරතුරු සංස්ථාගත කිරීම

ආරම්භක හඳුනාගැනීමෙන් පසු උපකරණයක ණය අවදානම සැලකිය යුතු ලෙස ඉහළ ගොස් තිබේද යන්න තක්සේරු කිරීම සහ ECL මිනුම යන දෙකටම බැංකුව ඉදිරිගාමී තොරතුරු ඇතුළත් කරයි. බැංකුව විසින් මූල්‍ය උපකරණවල එක් එක් කළඹ සඳහා ණය අවදානම් සහ ණය අලාභවල ප්‍රධාන ධාවකයන් හඳුනාගෙන ලේඛනගත කර ඇති අතර, ඓතිහාසික දත්ත විශ්ලේෂණයක් භාවිතා කරමින් සාර්ව ආර්ථික විචල්‍යයන් සහ ණය අවදානම සහ ණය අලාභ අතර සබඳතා ඇස්තමේන්තු කර ඇත.

ණය අවදානම සඳහා ප්‍රධාන ධාවක වන්නේ දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය, විරැකියා අනුපාත, උද්ධමනය, විනිමය අනුපාත සහ පොලී අනුපාත වේ.

බැංකුව මූලික අවස්ථාව, හොඳම අවස්ථාව සහ නරකම අවස්ථාව පිළිබිඹු කිරීම සඳහා බහු ආර්ථික තත්වයන් භාවිතා කරයි.

භූගෝලීය ප්‍රදේශයක් පාසා බහුවිධ ආර්ථික තත්ත්වයන් යටතේ අපේක්ෂිත ණය අලාභ ආකෘතිය වෙත ආදානයන් සම්බන්ධ විශ්ලේෂණය

අපේක්ෂිත ණය අලාභ තක්සේරු කිරීමේදී අනුගමනය කරනු ලැබෙන ප්‍රවේශය පිළිබඳ කෙටි සමාලෝචනයක් සටහන 5 - වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශය සහ සටහන 3 - වැදගත් ගිණුම්කරණ තීන්දු, තක්සේරුකරණයන් හා උපකල්පන සටහනේ ලබා දී ඇත. පරිපූර්ණත්වය හා නිරවද්‍යතාව තහවුරු කිරීම උදෙසා, බැංකුව මගින් තෙවන පාර්ශ්වයන්ගෙන් (ශ්‍රී.ලං.ම.බැ.) සහ ස්වකීය අවදානම් අංශයේ ආර්ථික විද්‍යාඥයින් කණ්ඩායමක් වෙතින් දත්ත රැස් කරගනිමින්, බහුවිධ තත්ත්වයන්ට ආරෝපනය කළ හැකි බර ඇතුළුව බැංකුවේ අපේක්ෂිත ණය අලාභ ආකෘතීන් වෙත ආදානයන් හි නිවැරදි බව සත්‍යාපනය කෙරේ. පහත වගුවෙහි, අපේක්ෂිත අලාභයෙහි ප්‍රධාන ගාමකයන් හා බැංකුවේ පදනම් තත්ත්ව ඇස්තමේන්තුව සඳහා යොදා ගත් උපකල්පන, පදනම් තත්ත්වය මත අපේක්ෂිත ණය අලාභ, මෙන්ම 2021 දෙසැම්බර් 31 දිනට, බහුවිධ ආර්ථික තත්ත්වයන් යොදා ගැනීමේ බලපෑමද ඉදිරිපත් කෙරේ.

අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීමේදී සලකා බැලෙන ඒ ඒ ආර්ථික තත්ත්වයට අදාළව යොදා ගන්නා ලද ඉදිරිගාමී ආර්ථික විචල්‍ය/උපකල්පනවල අගයන් මෙම වගුවෙන් දැක්වේ. ''විළැඹෙන වසර'' සඳහා වන අගයන් මගින් දිගු කාලීන සාමාන්‍යයක් පිළිබිඹු කෙරෙන අතර ඒවා සෑම තත්ත්වයක් සඳහාම එක සමාන වේ.

දෙසැම්බර් 31 දිනට

ප්‍රධාන ගාමකයන්	අ.ණ.අ. තත්ත්වය	2022	2023	2024	2025	එළැඹෙන වසර
		%	%	%	%	
ද.දේ.නි. වර්ධන %	පදනම් තත්ත්වය	-1.5%	-1.5%	-1.5%	-1.5%	-3.6%
	මනා තත්ත්වය	3.6%	4.2%	4.8%	5.4%	-3.6%
	නොමනා තත්ත්වය	-0.1%	0.7%	1.5%	2.2%	-3.6%
උද්ධමන අනුපාත %	පදනම් තත්ත්වය	4.6%	7.0%	7.0%	7.0%	4.6%
	මනා තත්ත්වය	6.7%	6.7%	6.6%	6.5%	4.6%
	නොමනා තත්ත්වය	7.2%	7.4%	7.5%	7.7%	4.6%
පොලී අනුපාත %	පදනම් තත්ත්වය	5.5%	5.5%	5.5%	5.5%	5.7%
	මනා තත්ත්වය	5.1%	5.1%	5.0%	4.9%	5.7%
	නොමනා තත්ත්වය	5.8%	6.0%	6.2%	6.5%	5.7%
විනිමය අනුපාත (ඇ.ඩො. - රු.)	පදනම් තත්ත්වය	211.44	224.80	238.99	254.09	186.40
	මනා තත්ත්වය	199.40	199.93	200.45	200.98	186.40
	නොමනා තත්ත්වය	237.92	284.61	325.00	325.00	186.40
විරැකියා අනුපාත %	පදනම් තත්ත්වය	5.2%	5.2%	5.2%	5.2%	5.4%
	මනා තත්ත්වය	5.1%	5.1%	5.1%	5.1%	5.4%
	නොමනා තත්ත්වය	5.2%	5.3%	5.3%	5.4%	5.4%

ECL මිනුම්

ECL මිනුම් සඳහා ප්‍රධාන යෙදවුම් පහත සඳහන් විචල්‍යයන්ගේ කාලීන ව්‍යුහය වේ:

- පැහැර හැරීමට ලක් වන සම්භාවිතාව (PD);
- අලාභය පැහැර හැරීම (LGD); සහ
- පැහැර හැරීමට නිරාවරණය වීම (EAD).

පැහැර හැරීමට ලක් වන නිරාවරණය (EAD) මගින් පැහැර හැරීම සම්බන්ධයෙන් හා සිදු කළ හැකි කල්තබා ආපසු ගෙවීම්ද සිදු කරන අතරතුර එහි නිරාවරණය ඉහළ නැංවීම සඳහා ගනුදෙනුකරු සතු හැකියාව යන කරුණු දෙකම සම්බන්ධයෙන් කටයුතු කරනු ලබන, හානිකරණ ගණනයට යටත්ව මූල්‍යමය උපකරණ වල දළ ධාරණ වටිනාකම නියෝජනය වේ.

අදියර 1 ණය මුදලක් සඳහා පැහැර හැරීමට ලක් වන නිරාවරණය ගණනය කිරීමට, බැංකුව මගින් මාස 12 අපේක්ෂිත ණය අලාභ ගණනයෙන් මාස 12 ක් ඇතුළත සිදුවිය හැකි පැහැර හැරීමේ සිදුවීම් ඇගයුමට ලක් කෙරේ. කෙසේ වුවද, අදියර 1 ණය මුදලක් ශේෂ පත්‍ර දිනයේ සිට මාස 12 ක් ඇතුළත් පැහැර හැරීමකට ලක්වීමට අපේක්ෂිත නම් සහ යථා තත්ත්වයට පත්ව නැවත පසුව පැහැර හැරීමකට ලක් වීමට අපේක්ෂිත නම්, එවිට සියළුම සම්බන්ධිත පැහැර හැරීමේ චීකකයන් සැළකිල්ලට ගැනේ. අදියර 2 සහ අදියර 3 ණය මුදල් සඳහා පැහැර හැරීමට ලක් වන නිරාවරණය උපකරණ වල ජීවකාලය පුරා සිදුවීම් සම්බන්ධයෙන් සැලකිල්ලට ගැනේ.

පැහැර හැරීමට ලක් වන නිරාවරණයන් බැංකුව විසින් නිර්ණය කරනු ලබන්නේ, බහුවිධ තත්ත්වයන් අනුරූපනය කරමින්, කාලයේ විවිධ අවස්ථාවන්හිදී සිදුවිය හැකි නිරාවරණ ප්‍රතිඵල රැසක් ආකෘතිගත කරමිනි. ඉන් අනතුරුව බැංකුවේ ආකෘතීන් මත පදනම්ව එක් එක් ආර්ථික තත්ත්වය වෙත SLFRS 9 පැහැර හැරීමේ සම්භාවිතාවන් (PD) ආදේශ කරනු ලැබේ.

අනාගත මුදල් ප්‍රවාහයන් ඇස්තමේන්තු කිරීමට අදාළ වන ප්‍රධාන ලක්ෂණ මත පදනම්ව බැංකුව සිය සිල්ලර ණය දෙන නිෂ්පාදන කුඩා සමජාතීය කළඹකට කොටස් කරයි. ව්‍යවහාරික දත්ත වෙතිහාසිකව එකතු කරන ලද පාඩු දත්ත මත පදනම් වන අතර පුළුල් ගනුදෙනු ලක්ෂණ සමූහයක් (උදා. නිෂ්පාදන වර්ගය, පුළුල් පරාසයක සමපාර්ශ්වික ඇපකර වර්ග) මෙන්ම ණය ගැනුම්කරුගේ ලක්ෂණ ද ඇතුළත් වේ.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

භාණ්ඩාගාර, වෙළඳාම හා අන්තර් බැංකු සබඳතා

බැංකුවේ භාණ්ඩාගාර, වෙළඳාම හා අන්තර් බැංකු සබඳතා සහ ප්‍රතිපාර්ශ්වයන් මූල්‍ය සේවා ආයතන, බැංකු, ප්‍රාථමික වෙළඳුන්, හුවමාරු හා නිශ්කාෂණ ආයතනවලින් සමන්විත වේ. මෙම සබඳතාවයන් සඳහා, බැංකුවේ භාණ්ඩාගාර අංශය මගින් මූල්‍යමය තොරතුරු වැනි ප්‍රසිද්ධියේ පවතින තොරතුරු විශ්ලේෂණය කරනු ලැබේ.

ණය පිළිබඳ ආංශික වර්ගීකරණය

වාර්තාකරණ කාර්යයන් උදෙසා බැංකුවේ ණය වර්ගීකරණය ශ්‍රී ලංකා මහ බැංකුවේ ආංශික වර්ගීකරණය අනුව ස්ථාපනය කොට ඇත.

සමස්ථ ආංශික වර්ගීකරණයෙන්, කළඹ වල විශාලත්වය අනුව, මෙම වාර්තාව මගින් ඒවා ප්‍රමුඛ ප්‍රධාන ක්ෂේත්‍රයන් තුනකට වර්ග කෙරිණි.

බැංකුවේ තබන ලද පොත් අනුව මෙම වර්ගීකරණය යටතේ 2021 වසරේ ඉහළම අංශය වනුයේ, නිවාස ණය වන අතර එයට පසු ප්‍රතිමූල්‍ය. වාණිජ, කෘෂිකාර්මික, උකස්, කාර්මික, වෙනත් ණය, තැන්පතු ඇප මත ණය, කාර්යමණ්ඩල ණය, කල් බදු, සුළු හා මධ්‍ය පරිමාණ හා ලිය ඉසුර ණය වේ.

ආංශික වශයෙන් ණය කළඹ	රු
කාලීන ණය - නිවාස	47,074,634,104
ප්‍රතිමූල්‍ය	33,018,825,759
කාලීන ණය වාණිජ	27,245,140,292
කාලීන ණය - කෘෂිකර්ම	23,569,333,294
උකස්කිරීම්	20,173,958,657
කාලීන ණය- කර්මාන්ත	18,431,628,533
කාලීන ණය- වෙනත්	7,244,407,422
තැන්පතු මත ණය	6,535,720,294
කාර්යමණ්ඩල ණය	4,614,968,345
කල්බදු	969,406,200
කුඩා සහ මධ්‍යම ව්‍යවසායකයින්ගේ ණය	123,862,856
ලිය ඉසුර	37,780,664

ආයතනික ණය (සේවා, නිෂ්පාදන හා කර්මාන්ත ණය)

ආයතනික ණය සඳහා, බැංකුවේ විශේෂඥ ණය වෘත්තිකයින් විසින් ණය අයැදුම්කරුවන් ඇගයුමට ලක් කෙරේ. ණය අවදානම් ඇගයුම ගනුදෙනුකරුගේ චර්යාව සහ අතීත හිඟ තත්ත්වයන් මත පදනම් වූ ණය ගුණාත්මකභාවය මත රඳා පවතී. තවද, බැංකුව මගින් ගනුදෙනුකරුවකුගේ අවදානම ඇගයුමට ලක් කිරීමේදී පහත දැක්වෙන පැතිකඩ පිළිබඳව සලකා බලනු ලැබේ :

- ගනුදෙනුකරු විසින් සකසන ලද පුරෝකථන හා අයවැය සමගින් ඓතිහාසික මූල්‍ය තොරතුරු. මෙම තොරතුරු අතරට යථාකරණය වූ සහ අපේක්ෂිත ප්‍රතිඵල, නුඹුන්වත් අනුපාතයන්, ද්‍රවශීලතා අනුපාතයන් හා ගනුදෙනුකරුගේ මූල්‍යමය කාර්යසාධනය මැනිය හැකි කවර හෝ වෙනත් අදාළ අනුපාතයන් ඇතුළත් වේ.

- බාහිර පාර්ශ්වයන්ගෙන් ගනුදෙනුකරුවන් සම්බන්ධ ප්‍රසිද්ධියේ පවතින තොරතුරු ලබා ගැනෙන අතර, එයට ණය තොරතුරු කාර්යාංශය මගින් සපයන ලද තොරතුරුද ඇතුළත් වේ. මෙයට ශ්‍රේණිගත කිරීමේ ආයතන මගින් නිකුත් කරන ලද බාහිර ශ්‍රේණිගත කිරීම්, ස්වාධීන විශ්ලේෂණ වාර්තා, මාධ්‍ය නිවේදන සහ ණය විශ්ලේෂණය සඳහා අදාළ වන තොරතුරු ඇතුළත් වේ.
- සමාගමෙහි කාර්යසාධනය කෙරෙහි ගනුදෙනුකරුගේ කළමනාකරණ හැකියාව සම්බන්ධ තත්වයන් නිරූපනය කෙරෙන කවර හෝ සහායක විෂය මූලික තොරතුරු.

පාරිභෝගික ණය දීම් හා සාමාන්‍ය ණය

පාරිභෝගික ණය ලබාදීම නිවාස ණය, පාරිභෝගික ණය හා පුද්ගලික ණය වලින් සමන්විත වේ. සිල්ලර, උකස් හා කුඩා ව්‍යාපාර ආශ්‍රිත මෙම සැලසුම් හිඟ තැබූ දින ගණන (ණය තොරතුරු කාර්යාංශ වාර්තා) මගින් ශ්‍රේණිගත කෙරේ. ආකෘතීන් වෙත සෙසු ප්‍රධාන ආදානයන් වනුයේ :

- පාරිභෝගික ණය ලබාදීමේ සැලසුම් : ආර්ථික තත්ත්වය, ආපසු ගෙවීමේ ධාරිතා වාර්තා මත පදනම්ව පුද්ගල ආදායම් හා වැටුප් මට්ටම් වෙනස්වීම්, ආපසු ගෙවීමේ මූලයන්, පුද්ගලික ණයගැතිභාවය සහ අපේක්ෂිත පොලී ප්‍රතිමිලකරණය සම්බන්ධ සීමාවන් හා ඒවායේ උච්ඡාවචනයන් භාවිත කෙරේ.
- සිල්ලර උකස් : දළ දේශීය නිෂ්පාදිත වර්ධනය, විරැකියා අනුපාතයන්, ජංගම ගිණුම් වාර්තා මත පදනම්ව පුද්ගල ආදායම්/වැටුප් මට්ටම් වල වෙනස්වීම්, පුද්ගලික ණයගැතිභාවය සහ අපේක්ෂිත පොලී ප්‍රතිමිලකරණය.

සාමූහික පදනමක් මත මිනුම්ගත කරන ලද වත්කම් කාණ්ඩගත කිරීම්

බැංකුව මගින් ඒකල පදනමක් මත අපේක්ෂිත ණය අලාභ ගණනය කරනු ලබන වත්කම් කාණ්ඩයන් අතරට, සමස්තයෙන් රු.මිලියන 5 ක ඒකල වශයෙන් සැළකිය යුතු මට්ටමට ඉහළ සියළුම ගනුදෙනුකරුවන් ඇතුළත් වේ.

බැංකුව මගින් සාමූහික පදනමක් මත අපේක්ෂිත ණය අලාභ මනිනු ලබන වත්කම් කාණ්ඩයන් පහත දැක්වේ:

- රු. මිලියන 5 ක සැලකිය යුතු කේවළ සීමාවකට වඩා පහළ ගනුදෙනුකරුවන්

බැංකුව මගින් පහත දැක්වෙන පරිදි මෙම කුඩා සමාන ආකාරයේ නිරාවරණයන් කාණ්ඩ ගත කෙරේ:

- නිෂ්පාදන වර්ගය
- පොලී අනුපාතය

45.2.2 ඇපකර රඳවා තබාගැනීම් සහ වෙනත් ණය වැඩි දියුණු කිරීම්

දේපළ මත උකස් අවශ්‍යතා, වත්කම්, ඉන්වෙන්ටරි සහ ඇපකර වලට වඩා වෙනත් ලියාපදිංචි සුරැකුම්පත් වශයෙන් ගනුදෙනුකරුවන්ට ණය සහ අත්තිකාරම් සඳහා බැංකුව ඇපකරයක් දරයි. සාධාරණ වටිනාකම පිළිබඳ ඇස්තමේන්තු පදනම් වී ඇත්තේ ණය ගැනීමේදී තක්සේරු කරන ලද ඇපකරයේ වටිනාකම මත වන අතර ඒවා නිතිපතා යාවත්කාලීන කරනු ලැබේ. අවශ්‍ය ඇප ප්‍රමාණය සහ වර්ගය ප්‍රතිපාර්ශවයේ ණය අවදානම තක්සේරු කිරීම මත රඳා පවතී. කළමනාකාරිත්වය සමපාර්ශවිකයේ වෙළඳපල වටිනාකම අධීක්ෂණය කරන අතර යටත් ගිවිසුමට අනුකූලව අතිරේක ඇපකරයක් ඉල්ලා සිටිනු ඇත.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

අතීතයේ ගෙවිය යුතු දෑ පිළිබඳ අර්ථ දැක්වීම

බැංකුව ඔවුන්ගේ ගිවිසුම්ගත ගෙවිය යුතු නියමිත දිනට වඩා දින තිස් එකක් හෝ ඊට වැඩි කාලයක දී එකතු නොකළ ඕනෑම ප්‍රමාණයක් 'අතීතයේ ගෙවිය යුතු' යැයි සැලැකේ.

ගනුදෙනුකරුවන්ට ණය සහ අත්තිකාරම් සඳහා රඳවා ඇති ඇපකරයේ සාධාරණ වටිනාකම සහ වෙනත් සුරැකුම් වැඩි දියුණු කිරීම් ණය ගැනීමේදී කරන ලද ඇස්තමේන්තුවක් පහත දැක්වෙන අතර ඇපකරයේ වටිනාකම හිඟ ශේෂයන්හි වටිනාකමට සීමා කර ඇත.

දෙසැම්බර් 31 වන දිනට	2021	2020
	රු.	රු.
සුරැකුම් වර්ගය		
ඉඩම් සහ ගොඩනැගිලි	**28,440,620,295**	23,499,745,872
යන්ත්‍රෝපකරණ	**1,002,307,447**	1,165,376,791
මෝටර් රථ	**2,003,005,196**	2,001,070,541
රත්තරන්	**20,172,426,918**	15,432,027,358
ස්ථාවර තැන්පතු	**6,669,463,537**	6,578,363,234
පුද්ගලික සහතික	**117,077,766,283**	113,686,168,356
බැංකු ඇපකර	**993,213**	1,199,090
වෙනත්	**13,673,083,531**	4,735,098,480
	189,039,666,420	167,099,049,722

දෙසැම්බර් 31 දිනට	2021		2020	
	ණය අවදානමට උපරිම නිරාවරණය වීම	ඇපකරණයට ශුද්ධ නිරාවරණය වීම	ණය අවදානමට උපරිම නිරාවරණය වීම	ඇපකරණයට ශුද්ධ නිරාවරණය වීම
	රු.	රු.	රු.	රු.
මුදල් හා මුදල් සමාන දෑ	**1,486,878,989**	**1,486,878,989**	3,758,858,141	3,758,858,141
බැංකුවල ස්ථානගත කිරීම්	**6,596,072,932**	**6,596,072,932**	8,436,353,244	8,436,353,244
ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට මනින ලද විකිණීම සඳහා තබා ඇති මූල්‍ය වත්කම්/ ස්කන්ධ උපකරණ	**188,140**	**188,140**	145,160	145,160
ක්‍රමක්ෂිත පිරිවැයට මූල්‍ය වත්කම් - වෙනත් ගනුදෙනුකරුවන්ගෙන් ණය හා ලැබිය යුතු දෑ	**189,039,666,420**	**130,751,843,027**	167,099,049,722	118,422,465,925
ක්‍රමක්ෂිත පිරිවැයට මූල්‍ය වත්කම් - ණය හා වෙනත් උපකරණ	**54,856,210,318**	**54,856,186,484**	46,962,354,137	46,962,354,137
ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට මනින ලද ස්කන්ධ උපකරණ	**2,289,919**	**2,289,919**	2,289,919	2,289,919
වෙනත් වත්කම්	**3,721,641,936**	**3,617,507,110**	1,788,634,829	1,788,634,829

පහත වගුව විවිධ වර්ගයේ මූල්‍ය වත්කම් වලට එරෙහිව පවත්වනු ලබන ප්‍රධාන වර්ගවල සමපාර්ශවීය සහ ඒවායේ ආසන්න සමපාර්ශවීය ප්‍රතිශතයන් සකසයි.

ණය නිරාවරණ වර්ගය	ඇපකරය පැවැත්වූ ප්‍රධාන වර්ගය	සමපාර්ශවීයකරණය අවශ්‍ය වන විධිවිධානයකට යටත් වන නිරාවරණ ප්‍රතිශතය	
		2021	2020
සිල්ලර ගනුදෙනුකරුවන්ට ණය සහ අත්තිකාරම්			
උකස් ණය	නේවාසික දේපල	17%	16%
පුද්ගලික ණය	පුද්ගලික ඇපකරය / වාණිජ දේපල / මෝටර් වාහන / උපකරණ යනාදිය.	62%	68%
ක්‍රෙඩිට් කාඩ් පත්	නැත	-	-
ආයතනික ගනුදෙනුකරුවන්ට ණය සහ අත්තිකාරම්			
මූල්‍ය කල්බදු	දේපල හා උපකරණ	-	-
වෙනත්	වාණිජ දේපල, පාවෙන ආයතනික වත්කම් පිළිබඳ ගාස්තු	-	-
ආපසු විකිණීම සහ නැවත මිලදී ගැනීමේ ගිවිසුම්	අලෙවි කළ හැකි සුරකුම්	-	-
අලෙවි කළ හැකි සුරැකුම්පත්			
ණයකර - DFCC		82%	100%
ණයකර - කොමර්ෂල් බැංකුව	කිසිවක් නැත	18%	-

2021 දෙසැම්බර් 31 වන දින ට බැංකුව විසින් ණය සහ අත්තිකාරම් සඳහා ඇප (පූර්වාපේක්ෂිත) ලෙස රඳවා ගෙන ලබාගත් මූල්‍ය හා මූල්‍ය නොවන වත්කම් පිළිබඳ විස්තර මෙන්ම ණය වැඩි දියුණු කිරීම සඳහා කරන ලද ඇමතුම් සහ වසර අවසානය වන විට පවතින තත්වය පහත දක්වා ඇත.

දෙසැම්බර් 31 දිනට	පූර්වාපේක්ෂිත ඇපකරයේ විකුණුම් වටිනාකම	
පූර්වාපේක්ෂිත දේපල	2021	2020
	රු.	රු.
ජනවාරි 01 ශේෂය	165,450,000	130,450,000
වර්ෂය තුළ එකතු කිරීම්	-	35,000,000
වර්ෂය තුළ බැහැර කිරීම්	-	-
ඇගයීම් වෙනස්කම්	-	-
දෙසැම්බර් 31 වන විට ශේෂය	165,450,000	165,450,000

බැංකුවේ ප්‍රතිපත්තිය වන්නේ ඇපකරය නිසි කලට ලබා ගැනීම ක්‍රමවත්ව සිදු කිරීමයි.

ණය වටිනාකම් අනුපාතය (LTV)

නේවාසික උකස් ණය

පහත වගුව තුළ ණය සහ අත්තිකාරම් වල සිට සිල්ලර ගනුදෙනුකරුවන් දක්වා වටිනාකම් අනුපාතයට ණය යන පරාසය තුළ ණය නිරාවරණය ස්ථර කර තිබේ. වටිනාකම් අනුපාතයට ණය ගණනය කරනු ලබන්නේ ඇපයේ අනුපාතයට ණයෙහි දළ ප්‍රමාණයේ හෝ ණය ගෙවීමට ඇති බැඳීම සඳහා බැඳී ඇති අනුපාතයේ ප්‍රමාණය අනුවයි. දළ මුදල් ප්‍රමාණය යම්කිසි හානිකරණ දීමනාවක් ඇත්නම් එය බැහැර කරයි. ඇපය තක්සේරු කිරීමේදී ඇපය ලබා ගැනීමේදී සහ විකිණීමේදී වන ගැලපුම් බැහැර කරනු ලැබේ. නේවාසික උකස් ණය සඳහා වන ඇපයේ වටිනාකම නිවාස මිල දර්ශකවල වෙනස්කම් පදනම් කර යාවත්කාලීන කල මුල් අවස්ථාවේ ඇප වටිනාකම මත පදනම් වේ.

දෙසැම්බර් 31 දිනට	2021	2020
	රු.	රු.
LTV අනුපාතය		
50% ට අඩු	-	-
51-70%	**28,440,620,295**	23,499,745,872
71-90%	-	-
91-100%	-	-
100% ට වැඩි	-	-
එකතුව	**28,440,620,295**	23,499,745,872

45.2.3 ණය අවදානම සංකේන්ද්‍රණය වීම

බැංකුව මගින් අංශය අනුව හා භූගෝලීය පිහිටීම අනුව ණය අවදානමෙහි සංකේන්ද්‍රණයන් අධීක්ෂණය කරනු ලැබේ.

ණය අවදානම සංකේන්ද්‍රණය වීම

ණය හා අත්තිකාරම්, ණය ලබාදීමේ බැඳීම්, මූල්‍යමය ඇපකර හා ආයෝජන සුරැකුම් සඳහා ණය අවදානමෙහි සංකේන්ද්‍රණය සම්බන්ධ විශ්ලේෂණයක් පහත දැක්වේ.

	ගනුදෙනුකරුවන්ට ණය සහ අත්තිකාරම්		ආයෝජන ණය සුරැකුම්පත්		ණය දීමේ බැඳීම් සහ මූල්‍ය ඇපකර	
	2021	2020	2021	2020	2021	2020
	රු.	රු.	රු.	රු.	රු.	රු.
ධාරණ අගය	**189,039,666,420**	167,099,049,722	**54,857,971,211**	46,964,547,449	**229,196,158**	204,377,009
පොරොන්දු වූ/සහතික කළ මුදල අංශය අනුව සංකේන්ද්‍රණය වීම						
ආයතනික:						
වෙනත්	-	-	-	-	**229,196,158**	204,377,009
රාජ්‍ය	-	-	**4,813,547,891**	3,771,096,580	-	-
බැංකු	-	-	**50,044,423,320**	43,193,450,869	-	-
සිල්ලර:						
පුද්ගල ඇප	**117,077,766,283**	113,686,168,356	-	-	-	-
උකස්	**58,287,823,393**	48,676,583,797	-	-	-	-
සුරක්ෂිත නොකළ ණය දීම්	**13,674,076,744**	4,736,297,569	-	-	-	-
	189,039,666,420	167,099,049,722	**54,857,971,211**	46,964,547,449	**229,196,158**	204,377,009

45.3 ද්‍රවශීලතා අවදානම

ද්‍රවශීලතා අවදානම යනු, බැංකුව විසින් මුදල් හෝ තවත් මූල්‍යමය වත්කමක් ලබාදීමෙන් පියවනු ලබන මූල්‍යමය වගකීම් ආශ්‍රිත බැඳීම් ඉටුකිරීමේදී මුහුණ පාන අවදානම වේ. එවිට සාමාන්‍ය හා ආතති තත්ත්වයන් ද්විත්වයම තුළ බැංකුව එහි ගෙවීමේ වගකීම් නියමිත වූ විට ඒවා සපුරාලීමට අපොහොසත් වනු ඇත.

ද්‍රවශීලතා අවදානම කළමනාකරණය

බැංකුව මගින් ද්‍රවශීලතා අවදානම කළමනාකරණ ක්‍රමෝපාය සකසනු ලැබ, අදාළ ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම අධීක්ෂණය කිරීමේ වගකීම වත්කම් හා වගකීම් කමිටුව වෙත පවරනු ලබයි. එම කමිටුව මගින් බැංකුවේ ද්‍රවශීලතා ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටීන් අනුමත කෙරේ. මධ්‍යම භාණ්ඩාගාරය මගින් දෛනික පදනමක් මත බැංකුවේ ද්‍රවශීලතා ස්ථාවරය කළමනාකරණය කරමින් වාර්තා කරනු ලැබේ. කවර හෝ ව්‍යතිරේකයන් සහ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ඇතුළත් සාරාංශ ගත වාර්තාවක්, නිතිපතා වත්කම් හා වගකීම් කමිටුව වෙත භාරදෙනු ලැබේ. ද්‍රවශීලතාවය කළමනාකරණය කිරීමේ බැංකුවේ ප්‍රවේශය වනුයේ, සාමාන්‍ය හා ආතතික තත්ත්වයන් ද්විත්වයම තුළ, නියමිත කලට සිය වගකීම් සපුරාලීම සඳහා ප්‍රමාණවත් ද්‍රවශීලතාවක් සෑමවිටම, හැකි උපරිම අයුරින් තහවුරු කරමින්, අනවශ්‍ය අලාභ වළකාගැනීම හා බැංකුවේ කීර්තිනාමය හානි වීමේ අවදානම මගහරවා ගැනීමයි. බැංකුවේ ද්‍රවශීලතා ක්‍රමෝපායෙහි ප්‍රධාන සංරචකයන් පහත දැක්වේ.

- ගනුදෙනුකාර තැන්පතු (සිල්ලර හා ආයතනික දෙපාර්ශ්වයම) සහ තොග වෙළඳපොල තැන්පතු වලින් සමන්විත විවිධාංගීකෘත අරමුදල් සම්පාදන -පදනමක් හා අවිනිශ්චිතතා පහසුකම් පවත්වාගෙන යාම.
- මුදල් ඒකකය හා කල්පිරීම මගින් විවිධාංගීකරණය කරන ලද, ඉහළ ද්‍රවශීල වත්කම් කළඹක් බැංකුව සතු කරගැනීම.
- බැංකුවේ මූල්‍යමය වත්කම් හා මූල්‍යමය වගකීම්වල ද්‍රවශීලතා අනුපාතයන්, කල්පිරීමේ නොගැලපීම්, චර්යාමය ගතිලක්ෂණ නිරීක්ෂණය සහ බැංකුවේ වත්කම් උකසට යටත් වන තාක් දුරට අරමුදල් ලබාගැනීම සඳහා අනාගතයේ ඇපයට තැබීම සඳහා පවතින බවට තහවුරු කිරීම.
- බැංකුවේ ද්‍රවශීලතා ස්ථාවරය සම්බන්ධ ආතති පරීක්ෂාවන් සිදු කිරීම.

වඩාත්ම වැදගත් කරුණ වනුයේ නියාමන අවශ්‍යතාවය සපුරාලීම සඳහා අවම 20% ද්‍රවශීල වත්කම් අනුපාතය පවත්වා ගෙන යාමයි. ද්‍රවශීල වත්කම් මුදල්, කෙටි කාලීන බැංකු තැන්පතු සහ වහා විකිණීම සඳහා යෙදවිය හැකි ද්‍රවශීල ණය සුරැකුම්වලින් සමන්විත වේ.

45.3.1 ද්‍රවශීලතා අවදානමට නිරාවරණයවීම

ද්‍රවශීලතා අවදානම කළමනාකරණය කිරීම සඳහා බැංකුව විසින් භාවිතා කරනු ලබන ප්‍රධාන මිනුම් දණ්ඩ වන්නේ ගනුදෙනුකරුවන්ගේ ද්‍රවශීල වත්කම් තැන්පතු සහ වෙනත් වගකීම් වල අනුපාතයයි. මේ සඳහා, ක්‍රියාකාරී හා ද්‍රවශීල වෙළඳපොළක් ඇති විට මුදල් හා මුදල් සමාන සහ ආයෝජන ඇතුළත් දේ ද්‍රවශීලි වත්කම් ලෙස සලකනු ලැබේ. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ස්ථාපිත කරන ලද ද්‍රවශීලතා සීමාවට බැංකුවේ අනුකූලතාව මැනීම සඳහා සමාන ගණනය කිරීමක් භාවිතා කරනු ලැබේ. වාර්තා කරන ලද දිනයේ දී සහ වර්ෂය තුළ ගනුදෙනුකරුවන්ගේ බැරකම් වලට ශුද්ධ ද්‍රවශීල වත්කම් වල වාර්තා ගත බැංකු අනුපාතය පිළිබඳ විස්තර පහත පරිදි විය:

දෙසැම්බර් 31 දිනට	2021	2020
	DBU %	DBU %
දෙසැම්බර් 31	**26.18%**	29.30%
වර්ෂය සඳහා සාමාන්‍ය	**27.64%**	30.17%
වර්ෂය සඳහා උපරිම	**28.46%**	31.64%
වසර සඳහා අවම	**26.18%**	26.62%

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2020 මැයි මාසයේ දී ක්‍රියාත්මක කරන ලද අතිවිශේෂ නියාමන ක්‍රියාමාර්ගයන්ට අනුව, කොවිඩ්- 19 වසංගත තත්ත්වය හේතුවෙන් 2021 ජුනි 30 දක්වා ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාතය ගණනය කිරීමේදී පහත සඳහන් වත්කම් ද්‍රවශීල වත්කම් ලෙස සලකා බැලීමට බලපත්‍රලාභී බැංකු වලට අවසර ලබා දී ඇත.

- ජ්‍යෙෂ්ඨ පුරවැසි විශේෂ තැන්පතු යෝජනා ක්‍රමය සඳහා ලැබිය යුතු පොලී සහනාධාරය.
- ශ්‍රී ලංකා රජය විසින් සහතික කරන ලද සහ 10% ක කපාහැරීමක් සහිත ව වසරකට නොවැඩි කල්පිරීමක් සහිත මූල්‍ය වාර්තාකරණ කටයුතු සඳහා ශ්‍රී ලංකා රජය විසින් සහතික කරන ලද SLFRS 9 මූල්‍ය උපකරණ යටතේ අදියර 1 හි වර්ගීකරණය කර ඇති රාජ්‍ය ආයතන වෙත නිරාවරණය වීම.
- වෙනත් බලපත්‍රලාභී බැංකු තුල ඇති බලපත්‍රලාභී බැංකු සතු ස්ථාවර තැන්පතු;

(අ) කල් පිරීමේ ඉතිරි කාලය වසර 1 ඉක්මවන නමුත් වසර 2 ට අඩු හෝ ඊට සමාන නම්, 20% ක කපාහැරීමක් සහිතව,

(ආ) කල් පිරීමේ ඉතිරි කාලය අවුරුදු 2 ඉක්මවූ නමුත් අවුරුදු 3 ට අඩු හෝ ඊට සමාන නම්, 30% ක කපාහැරීමක්.

- තැන්පතු වලින් 20% කට සමාන හිමිකම් යටතේ තැන්පතු මගින් සුරක්ෂිත කරන ලද ණය.
- ණය පියවීමේදී සේවක අර්ථසාධක අරමුදලෙන් ලැබිය යුතු මුදල්.

කෙසේ වෙතත්, බැංකුවේ ශක්තිමත් ද්‍රවශීලතා තත්ත්වය හේතුවෙන් බැංකුවට විතරම් බලපෑමක් සිදු නොවීය.

45.3.2 ඉතිරි ගිවිසුම්ගත කල් පිරීම් අනුව මූල්‍ය වත්කම් හා වගකීම් විශ්ලේෂණය

පහත වගුව මගින් 2021 දෙසැම්බර් 31 දිනට බැංකුවේ මූල්‍යමය වත්කම් හා වගකීම් වල වට්ටම් නොකල මුදල් ප්‍රවාහයන්හි කල්පිරීමේ ස්වභාවය සාරාංශ ගත කොට දැක්වේ. දැනුම්දීමට යටත් වන ආපසු ගෙවීම් වහාම දැනුම්දිය යුතු ඒවා ලෙස සැළකිල්ලට ගැනේ. කෙසේ වුවද, බොහොමයක් ගනුදෙනුකරුවන් එය ලබා ගත හැකි මුල්ම දිනයේදීම ආපසු ගෙවීම් ඉල්ලා නොසිටිනු ඇතැයි බැංකුව අපේක්ෂා කරන අතර වගුව මගින් එහි තැන්පතු රඳවාගැනීමේ ඉතිහාසය මගින් දක්වනු ලබන අපේක්ෂිත මුදල් ප්‍රවාහයන් පිළිබිඹු නොකෙරේ.

2021 දෙසැම්බර් 31 වන දින	ධාරණ අගය	මුළු වට්ටනාකම	මාස 3 කට වඩා අඩු	මාස 3 සිට 12 දක්වා	අවුරුදු 1 සිට 3 දක්වා	අවුරුදු 3 සිට 5 දක්වා	වසර 5 කට වැඩි
	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
ව්‍යුත්පන්න නොවන වගකීම්							
බැංකුවට ගෙවිය යුතු	**29,500,936,543**	**33,271,523,388**	**1,458,704,149**	**3,466,762,024**	**15,825,578,727**	**50,147,714**	**12,470,330,773**
වෙනත් ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු	**187,752,465,256**	**192,354,798,672**	**48,125,528,994**	**84,078,496,904**	**12,483,089,634**	**15,917,855,300**	**31,749,827,841**
නිකුත් කරන ලද ණය සහ වෙනත් ණයට ගත් අරමුදල්	**2,000,000,000**	**2,076,176,663**	**2,076,176,663**	**-**	**-**	**-**	**-**
වෙනත් වගකීම්	**7,693,300,812**	**7,693,300,812**	**1,497,536,500**	**2,065,274,787**	**1,844,186,327**	**992,306,358**	**1,293,996,840**
මුළු ව්‍යුත්පන්න නොවන වගකීම්	**226,946,702,610**	**235,395,799,534**	**53,157,946,306**	**89,610,533,715**	**30,152,854,688**	**16,960,309,372**	**45,514,155,454**

2020 දෙසැම්බර් 31 වන දින	ධාරණ අගය	මුළු වට්ටනාකම	මාස 3 කට වඩා අඩු	මාස 3 සිට 12 දක්වා	අවුරුදු 1 සිට 3 දක්වා	අවුරුදු 3 සිට 5 දක්වා	වසර 5 කට වැඩි
	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
ව්‍යුත්පන්න නොවන වගකීම්							
බැංකුවට ගෙවිය යුතු	21,796,679,350	23,576,993,879	968,288,106	3,399,689,205	9,065,477,173	3,344,864,864	6,798,674,532
වෙනත් ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු	172,882,632,278	177,114,072,929	43,812,101,922	74,654,617,236	11,828,465,103	15,988,292,852	30,830,595,817
නිකුත් කරන ලද ණය සහ වෙනත් ණයට ගත් අරමුදල්	2,000,000,000	2,387,676,663	-	-	2,387,676,663	-	-
වෙනත් වගකීම්	6,154,443,776	6,154,443,776	977,558,122	886,015,662	952,551,551	968,020,912	2,370,297,528
මුළු ව්‍යුත්පන්න නොවන වගකීම්	202,833,755,404	209,233,187,248	45,757,948,151	78,940,322,103	24,234,170,490	20,301,178,628	39,999,567,876

45.3.3 බැඳීම් හා අසම්භාව්‍යතා පිළිබඳ ගිවිසුම්ගත කල්පිරීම්

පහත වගුවේ දැක්වෙන්නේ බැංකුවේ බැඳීම් හා අසම්භාව්‍ය වගකීම් කල් පිරීම මගින් ගිවිසුම්ගත කල් ඉකුත් වීමයි. එක් එක් ලබා නොගත් ණය බැඳීම් කල් ඉකුත්වීම මුල්ම දිනය අඩංගු කාල පටියට ඇතුළත් කර ඇත. නිකුත් කරන ලද මූල්‍ය ඇපකර කොන්ත්‍රාත්තු සඳහා, ඇපකරයේ උපරිම මුදල ඇපකරය කැඳවිය හැකි මුල්ම කාල පරිච්ඡේදයට වෙන් කරනු ලැබේ.

2021 දෙසැම්බර් 31 වන දිනට	ඉල්ලුම මත	මාස 3 ට අඩු	මාස 3 සිට 12 දක්වා	අවුරුදු 1 සිට 5 දක්වා	අවුරුදු 5 කට වැඩි	එකතුව
අසම්භාව්‍ය වගකීම්	රු.	රු.	රු.	රු.	රු.	රු.
බැංකු ඇපකරය (හානිකරණයෙන් තොරව)		**687,730**	**164,137,728**	**12,941,508**	**-**	**177,766,966**
අනෙකුත් අසම්භාව්‍යතා අයිතම - විකතු කිරීම සඳහා යවන ලද බිල්පත්	**51,429,192**	**-**	**-**	**-**	**-**	**51,429,192**
මුළු අසම්භාව්‍ය වගකීම්	**51,429,192**	**687,730**	**164,137,728**	**12,941,508**	**-**	**229,196,158**

2020 දෙසැම්බර් 31 වන දිනට	ඉල්ලුම මත	මාස 3 ට අඩු	මාස 3 සිට 12 දක්වා	අවුරුදු 1 සිට 5 දක්වා	අවුරුදු 5 කට වැඩි	එකතුව
අසම්භාව්‍ය වගකීම්	රු.	රු.	රු.	රු.	රු.	රු.
බැංකු ඇපකරය (හානිකරණයෙන් තොරව)	-	16,750,000	116,601,668	5,095,500	-	138,447,168
අනෙකුත් අසම්භාව්‍යතා අයිතම - විකතු කිරීම සඳහා යවන ලද බිල්පත්	65,929,841	-	-	-	-	65,929,841
මුළු අසම්භාව්‍ය වගකීම්	65,929,841	16,750,000	116,601,668	5,095,500	-	204,377,009

45.3.4 ද්‍රවශීලතා සංචිතය

පහත වගුවේ ද්‍රවශීලතා අරමුණ සඳහා රඳවා ඇති බැංකුවේ ද්‍රවශීල වත්කම්වල සංරචක දක්වා ඇත.

	2021	
	ධාරණ වටිනාකම	සාධාරණ වටිනාකම
මුදල් සහ මුදල් සමාන දෑ	**1,486,878,989**	**1,482,282,740**
බැංකුවල ස්ථානගත කිරීම්	**2,126,552,877**	**2,126,552,877**
රෙපෝ	**4,469,520,055**	**4,469,520,055**
ස්ථාවර තැන්පතු	**49,420,476,709**	**49,420,476,709**
	57,503,428,630	**57,498,832,381**

රැගෙන ආ ප්‍රමාණයන් කෙටි කාලීන ස්වභාවයක් ගන්නා (මාස දොළහකට වඩා අඩු) බැවින් ඒවායේ සාධාරණ අගයන්ට ආසන්න වේ.

45.3.5 ද්‍රවශීලතා ආවරණ අනුපාතය

නියාමකයා විසින් අර්ථ දක්වා ඇති ද්‍රවශීලතා ආවරණ අනුපාතය (LCR) දින 30 ක කාලයක් තුළ බැංකුවක ද්‍රවශීලතා අවදානම් පැතිකඩෙහි කෙටිකාලීන ඔරොත්තු දීමේ හැකියාව ප්‍රවර්ධනය කිරීමට අදහස් කෙරේ. මෙම අනුපාතය අර්ථ දැක්වෙන්නේ ද්‍රවශීලතාව ඉහළ නැංවීම සඳහා භාවිතා කළ හැකි උසස් තත්ත්වයේ ද්‍රවශීල වත්කම් (HQLA) ප්‍රමාණය ලෙස වන අතර එය ආතතියට පත් වූ තත්වයක් තුළ සැබෑ හා අසම්භාව්‍ය නිරාවරණ වලින් පැන නගින ශුද්ධ මුදල් පිටතට ගලා යාමේ මුළු පරිමාවට සාපේක්ෂව මනිනු ලැබේ.

ද්‍රවශීලතා ආවරණ අනුපාතය (LCR) බැංකුවේ ආතති පරීක්ෂණ රාමුවට අනුපූරක වේ. අවම නියාමන අවශ්‍යතාවන්ට වඩා වැඩි අනුපාතයක් පවත්වා ගනිමින්, කෙටිකාලීන ද්‍රවශීලතා ආතතිය අවම කිරීම සඳහා බැංකුව සතුව ප්‍රමාණවත් ද්‍රවශීලතා සම්පත් ඇති බව සහතික කිරීමට ද්‍රවශීලතා ආවරණ අනුපාතය (LCR) උත්සාහ කරයි.

2015 අප්‍රේල් මස 1 වන දින සිට ආරම්භ වූ සියලුම බලපත්‍රලාභී විශේෂිත බැංකු විසින් රුපියල ද්‍රවශීලතාව දේශීය මුදල් මෙහෙයුම් සඳහා අවම අවශ්‍යතාවය සහ 2019 ජනවාරි 1 දින සිට ක්‍රියාත්මක වන පරිදි සමස්ත මෙහෙයුම් සඳහා සියලුම මුදල් ද්‍රවශීලතා අවම අවශ්‍යතාවය සම්බන්ධයෙන් CBSL විසින් නියම කරන ලද ද්‍රවශීලතා ආවරණ අනුපාත (LCR) පවත්වා ගෙන යන ලදී.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2020 මැයි මාසයේ දී ක්‍රියාත්මක කරන ලද අතිවිශේෂ නියාමන ක්‍රියාමාර්ග වලට අනුව, කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන්, වැඩි දියුණු කරන ලද අධීක්ෂණය සහ නිරන්තර වාර්තාකරණය සමඟ ද්‍රවශීලතා ආවරණ අනුපාතයේ අවම අවශ්‍යතාව 2021 ජුනි 30 දක්වා 90% දක්වා අඩු කරන ලදී.

අවම අවශ්‍යතාව (%) - සිට ක්‍රියාත්මක වේ	
2021 ජූලි 1	**2020 මැයි සිට 2021 ජූනි 30**
100	90

දෙසැම්බර් 31 වන විට බැංකුවේ ද්‍රවශීලතා ආවරණ අනුපාත (%) පහත දැක්වේ:

	2021	2020
දේශීය මෙහෙයුම් සඳහා ද්‍රවශීලතා ආවරණ අනුපාතය	**174**	146

45.3.6 ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාතය

2021 දෙසැම්බර් මාසය සඳහා	**26.18%**
2020 දෙසැම්බර් මාසය සඳහා	29.30%

45.3.7 බැංකු සහ වෙනත් ගනුදෙනුකරුවන් වෙත ගෙවිය යුතු (තැන්පතු) බැංකු සහ වෙනත් ගනුදෙනුකරුවන්ගෙන් ණය සහ ලැබිය යුතු මුදල් (අන්තිකාරම්) අනුපාතය

තම ණය ලබා දීමේ මෙහෙයුම් සඳහා අරමුදල් ප්‍රභවයක් ලෙස බැංකු සහ අනෙකුත් ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු මුදල් හි වැදගත්කම බැංකුව දනී.

පහත දැක්වෙන අනුපාතය භාවිතා කරමින් මෙය අධීක්ෂණය කරනු ලබන අතර එමඟින් බැංකු සහ අනෙකුත් ගනුදෙනුකරුවන් (තැන්පතු) වෙත ලබාදිය යුතු ණය සහ ලැබිය යුතු දෙයින් ප්‍රතිශතයක් ලෙස ගනුදෙනුකරුවන්ගේ ණය සහ ලැබිය යුතු දේ සංසන්දනය කෙරේ.

බැංකු සහ අනෙකුත් ගනුදෙනුකරුවන් බැංකු සහ වෙනත් ගනුදෙනුකරුවන්ගෙන් ලැබිය යුතු ණය හා ලැබීම් අතර අනුපාතය.

2021 දෙසැම්බර් 31 වන දින	**93.33%**
2020 දෙසැම්බර් මස 31 වන දින	90.64%

පහත වගුවේ 2021.12.31 සහ 2020.12.31 වන දින වන විට බැංකුව සතුව පවතින මූල්‍ය හා මූල්‍ය නොවන වත්කම් බැඳී තිබීම හෝ නොබැඳී පැවතීම මත පැවතීම දක්වා ඇත.

	2021				2020			
	බැඳි		නොබැඳි		බැඳි		නොබැඳි	
	ඇපයක් ලෙස පොරොන්දු වී ඇත	වෙනත්	වෙනත්	මුළු	ඇපයක් ලෙස පොරොන්දු වී ඇත	වෙනත්	වෙනත්	මුළු
මුදල් සහ මුදල් සමාන දෑ	-	-	1,486,878,989	1,486,878,989	-	-	3,758,858,141	3,758,858,141
බැංකුවල ස්ථානගත කිරීම්	-	-	6,596,072,932	6,596,072,932	-	-	8,436,353,244	8,436,353,244
ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට මනින ලද ස්කන්ධ උපකරණ	-	-	188,140	188,140	-	-	145,160	145,160
ක්‍රමක්ෂිත පිරිවැය අනුව මූල්‍ය වත්කම් - වෙනත් ගනුදෙනුකරුවන් වෙතින් ණය හා ලැබිය යුතු දෑ	-	-	175,229,666,656	175,229,666,656	-	-	156,694,052,473	156,694,052,473
ක්‍රමක්ෂිත පිරිවැය අනුව මූල්‍ය වත්කම් - ණය හා වෙනත් උපකරණ	2,690,695,651	-	52,165,490,833	54,856,186,484	2,492,634,173	-	44,469,719,964	46,962,354,137
විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ අගයට මනින ලද ස්කන්ධ උපකරණ -	-	-	2,289,919	2,289,919	-	-	2,289,919	2,289,919
වෙනත් වත්කම්	-	-	4,907,060,297	4,907,060,297	-	-	2,760,586,570	2,760,586,570
එකතුව	2,690,695,651	-	240,387,647,766	243,078,343,416	2,492,634,173	-	216,122,005,471	218,614,639,644

45.4 වෙළඳපොල අවදානම

වෙළඳපොල අවදානම යනු, බැංකුවේ ආදායමට හෝ එහි හිමිකාරිත්වය සහිත මූල්‍ය උපකරණ වල වටිනාකම කෙරෙහි හෝ බලපෑම් ඇති කරන්නා වූ, පොලී අනුපාතයන්, කොටස් මිළ ගණන්, විදේශ විනිමය අනුපාතයන් හා ණය ව්‍යාප්තීන් වැනි වෙළඳපොල මිළ ගණන්වල වෙනස්වීම් වේ. බැංකුවේ වෙළඳපොල අවදානම කළමනාකරණයෙහි අරමුණ වනුයේ බැංකුවේ අවදානම මත ආදායම ඉහළ නංවන අතරතුර නුබුන්වත් බව තහවුරු කරමින් වෙළඳපොල අවදානම් පරාමිතීන් පිළිගත හැකි මට්ටම් තුළ කළමනාකරණය හා පාලනය කිරීමයි.

වෙළඳපොල අවදානම සම්බන්ධ සමස්ත අධිකාරිත්වය වත්කම් හා වගකීම් කමිටුව වෙත පවරනු ලැබ ඇත. එමඟින් එක් එක් වර්ගයේ සමුච්චිත අවදානම් සහ කළඹ වෙත සීමාවන් සකසනු ලබන අතර, එහිදී වෙළඳාම් කළඹ සඳහා සීමා නිර්ණය කිරීමේදී මූලික සාධකය වශයෙන් වෙළඳපොල ද්‍රවශීලතාවය සැලකිල්ලට ගැනේ.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

පහත දැක්වෙන වගුව මගින් වෙළඳ හා වෙළඳ නොවන කළඹ අතර වෙළඳපොල අවදානමට යටත්ව වත්කම් හා වගකීම් වෙන්කිරීම දැක්වේ:

2021 දෙසැම්බර් 31 දිනට	ධාරණ අගය	වෙළඳපොල අවදානම මිනුම	
		වෙළඳ කළඹ	වෙළඳ නොවන කළඹ
වෙළඳපොල අවදානමට යටත් වත්කම්			
මුදල් හා මුදල් සමානයන්	**1,486,878,989**	**-**	**1,486,878,989**
බැංකුවල ස්ථානගත කිරීම්	**6,596,072,932**	**-**	**6,596,072,932**
ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට මනින ලද ස්කන්ධ උපකරණ	**188,140**	**188,140**	**-**
ක්‍රමක්ෂිත පිරිවැය අනුව මූල්‍ය ආයෝජන - ණය හා වෙනත් උපකරණ	**54,856,210,318**	**-**	**54,856,210,318**
ක්‍රමක්ෂිත පිරිවැය අනුව මූල්‍ය වත්කම් - වෙනත් ගනුදෙනුකරුවන් වෙතින් ණය හා ලැබිය යුතු දෑ	**175,229,666,656**	**-**	**175,229,666,656**
විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ අගයට මනින ලද ස්කන්ධ උපකරණ	**2,289,919**	**-**	**2,289,919**
වෙනත් වත්කම්	**3,721,641,936**	**-**	**3,721,641,936**
වෙළඳපොල අවදානමට යටත් වගකීම්			
බැංකු වෙත ගෙවිය යුතු	**29,500,936,543**	**-**	**29,500,936,543**
වෙනත් ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු	**187,752,465,256**	**-**	**187,752,465,256**
නිකුත් කළ ණය හා ණයට ගත් වෙනත් අරමුදල්	**2,000,000,000**	**-**	**2,000,000,000**
ප්‍රවර්තන බදු වගකීම්	**503,021,886**	**-**	**503,021,886**
වෙනත් වගකීම්	**5,514,857,775**	**-**	**5,514,857,775**

2020 දෙසැම්බර් 31 දිනට	ධාරණ අගය	වෙළඳපොල අවදානම මිනුම	
		වෙළඳ කළඹ	වෙළඳ නොවන කළඹ
වෙළඳපොල අවදානමට යටත් වත්කම්			
මුදල් හා මුදල් සමානයන්	3,758,858,141	-	3,758,858,141
බැංකුවල ස්ථානගත කිරීම්	8,436,353,244	-	8,436,353,244
ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට මනින ලද ස්කන්ධ උපකරණ	145,160	145,160	-
ක්‍රමක්ෂිත පිරිවැය අනුව මූල්‍ය ආයෝජන - ණය හා වෙනත් උපකරණ	46,962,354,137	-	46,962,354,137
ක්‍රමක්ෂිත පිරිවැය අනුව මූල්‍ය වත්කම් - වෙනත් ගනුදෙනුකරුවන් වෙතින් ණය හා ලැබිය යුතු දෑ	156,694,052,473	-	156,694,052,473
විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ අගයට මනින ලද ස්කන්ධ උපකරණ	2,289,919	-	2,289,919
වෙනත් වත්කම්	1,788,634,829	-	1,788,634,829
වෙළඳපොල අවදානමට යටත් වගකීම්			
බැංකු වෙත ගෙවිය යුතු	21,796,679,350	-	21,796,679,350
වෙනත් ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු	172,882,632,278	-	172,882,632,278
